UNIVERSITY OF
**KELANIYA**
SRI LANKA

# වාර්ෂික වාර්තාව සහ ගිණුම් 2023

**අභියෝග හමුවේ නැගී සිටීම**

*2023 වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ ඇතුළත් වන අතර එය පිළියෙළ කිරීම සඳහා සංකලිත වාර්තාකරණ ප්‍රවේශය උපයෝගී කර ගන්නා ලදී. 2023 ජනවාරි 1 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා විශ්වවිද්‍යාලයේ උපායමාර්ග, පාලනය, කාර්යසාධනය සහ ඉදිරි කටයුතු මෙම වාර්තාව මගින් ඉදිරිපත් කර ඇත.*

*මෙම වාර්තාවේ ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු, සිසුන්, පශ්චාද් උපාධිධාරීන් බිහි කිරීම, මානව සම්පත්, පර්යේෂණ, සංවර්ධන සහ නවෝත්පාදන, සම්මාන සහ ජයග්‍රහණ, ක්‍රීඩා කටයුතු සහ ජයග්‍රහණ, සුබසාධන පහසුකම්, යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ ක්‍රියාකාරකම් සහ පර්යේෂණ සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ. වාර්තාවේ දක්වා ඇති දත්ත සහ තොරතුරු කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලන අංශ සහ අධ්‍යයන අංශ, ඒකක සහ මධ්‍යස්ථානවලින් රැස් කර ගනු ලැබ ඇත. ශ්‍රී ලංකා අධ්‍යාපන අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව, විශ්වවිද්‍යාලයීය සංඛ්‍යාන සහ උපාය මාර්ගික සැලසුම් මධ්‍යස්ථානය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සහ ප්‍රකාශන අංශය විසින් මෙම වාර්තාව සම්පාදනය කරනු ලැබ ඇත.*



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

# පටුන


පටුන ..... iii
වගු ලැයිස්තුව ..... v
රූප සටහන් ලැයිස්තුව ..... vi
දැක්ම ..... ix
මෙහෙවර ..... ix
ඉලක්ක සහ අරමුණු ..... x
උපකුලපතිනියගේ පණිවුඩය ..... xiii
තොරතුරු සහ සංඛ්‍යා 2023 ..... xiv
  විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය ..... xiv
  විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන් ..... xvi
  විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන සුදුසුකම් ..... xvii
  පර්යේෂණ ප්‍රදාන සහ පර්යේෂණ සඳහා සනාතන සභාවෙන් පිරිනමන ලද සම්මාන ..... xviii

**1. හැඳින්වීම ..... 1**
1.1. සමාලෝචිත වර්ෂය ..... 3
1.2. ඉදිරි දැක්ම ..... 5

**2. විශ්වවිද්‍යාලයේ පාලනය ..... 7**
2.1. විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති, සහ නිලධාරීන් ..... 7
2.2. විශ්වවිද්‍යාල පාලක සභාව ..... 7
2.3. සනාතන සභාව ..... 9
2.4. පීඨ මණ්ඩල ..... 9
2.5. පාලන ලේඛන, උපායමාර්ගික සැලසුම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම ..... 9
2.6. ව්‍යවස්ථාපිත කමිටු ..... 10
2.7. සනාතන සභාවේ ස්ථාවර කමිටු ..... 11
2.8. පර්යේෂණ සඳහා ආචාර ධර්මානුකූල ප්‍රමිති ..... 12
2.9. සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම ..... 13
2.10. තත්ත්ව සහතික කිරීම ..... 14
2.11. විශ්වවිද්‍යාලය 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුකූල වීම ..... 15
2.12. අවදානම් කළමනාකරණය ..... 16
2.13. හරිත පරිචයන් ..... 17
2.14. බාහිර ආයතන සමඟ හවුල්කාරීත්වය ..... 22

**3. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් ..... 25**
3.1. අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් ..... 25
3.2. බාහිර උපාධි අපේක්ෂකයින් ..... 27
3.3. පශ්චාද් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයන් ..... 27
3.4. විදේශීය ශිෂ්‍යයන් ..... 30

**4. උපාධිධාරී නිමැවුම සහ කාර්යසාධනය ..... 33**
4.1. උපාධිධාරී නිමැවුම - ප්‍රථම උපාධි පාඨමාලා ..... 33
4.2. උපාධිධාරී නිමැවුම - බාහිර උපාධි පාඨමාලා ..... 33
4.3. උපාධිධාරී නිමැවුම - පශ්චාද් උපාධි පාඨමාලා ..... 33
4.4. 2023 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සව ..... 36

5. විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය ..... 37
5.1. අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය ..... 38
5.2. සේවක වර්ගීකරණය ..... 39
5.3. කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යාපනික සුදුසුකම් ..... 39

6. පර්යේෂණ සහ සංවර්ධනය ..... 41
6.1. පර්යේෂණ සහ ප්‍රකාශන – 2023 ..... 41
6.2. පර්යේෂණ පරිසංවාද – 2023 ..... 41
6.3. අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන – 2023 ..... 43
6.4. පේටන්ට් බලපත්‍ර – 2023 ..... 43
6.5. විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමැවුම– 2023 ..... 46

7. ශිෂ්‍ය සුබසාධන පහසුකම් ..... 47
7.1. ශිෂ්‍යත්ව ..... 47
7.2. නේවාසිකාගාර පහසුකම් ..... 49

8. ක්‍රීඩා ක්‍රියාකාරකම් ..... 51
8.1. ක්‍රීඩා පුහුණු වැඩසටහන් සහ ක්‍රීඩා ඉසව් ..... 52
8.2. 2023 වර්ෂයේ ජාත්‍යන්තර තරඟවලදී දැක් වූ කුසලතා ..... 52
8.3. 2023 වර්ෂයේ ජාතික හා අන්තර් විශ්වවිද්‍යාලීය මට්ටමේ තරඟවලදී දැක් වූ කුසලතා ..... 53
8.4. 2023 වර්ෂයේ අනුබද්ධිත ක්‍රීඩා පාලන මණ්ඩල ..... 54
8.5. 2023 වර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් දරන ලද ක්‍රීඩා සම්බන්ධ වෙනත් තනතුරු ..... 54

9. පීඨ, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, සහ පුස්තකාලය ..... 57
9.1. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය ..... 59
9.2. පරිගණක හා තාක්ෂණ පීඨය ..... 63
9.3. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ..... 69
9.4. මානවශාස්ත්‍ර පීඨය ..... 75
9.5. වෛද්‍ය පීඨය ..... 80
9.6. විද්‍යා පීඨය ..... 85
9.7. සමාජීය විද්‍යා පීඨය ..... 88
9.8. පුස්තකාලය ..... 91
9.9. දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ..... 94

10. තිරසාර සංවර්ධනය ..... 101
10.1. ප්‍රතිපත්ති ප්‍රකාශනය ..... 101
10.2. උපාය මාර්ග ..... 101
10.3. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම් ..... 102
10.4. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ පර්යේෂණ නිමැවුම ..... 105

11. මූල්‍ය ප්‍රකාශන 2023 ..... 107
11.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ..... 107
11.2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ..... 109
11.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ..... 111
11.4. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ..... 112
11.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත 2023 වර්ෂයේ සටහන් ..... 113

12. විගණකාධිපතිවරයාගේ වාර්තාව ..... 150
13. විගණකාධිපති වාර්තාව ආශ්‍රිතව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණ 157
14. විගණන කමිටු වාර්තාව 2023 ..... 165





# වගු ලැයිස්තුව

1 වගුව: විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයෝ ..... 8
2 වගුව: 2023 වර්ෂයේ දී පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව ..... 11
3 වගුව: තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුව 2023 දී තොරතුරු නිකුත් කිරීම ..... 15
4 වගුව: විශ්වවිද්‍යාලයේ කොම්පෝස්ට් නිෂ්පාදනය ..... 21
5 වගුව: විශ්වවිද්‍යාලයේ කඩදාසි ප්‍රතිචක්‍රීකරණය ..... 21
6 වගුව: අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් ..... 23
7 වගුව: අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව - දේශීය සිසුන් (2023 දෙසැම්බර් 31 දිනට) ..... 26
8 වගුව: බඳවා ගත් මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව - බාහිර උපාධි පාඨමාලා ..... 27
9 වගුව: බඳවා ගත් මුළු ශිෂ්‍යයන් සංඛ්‍යාව - පශ්චාද් උපාධි පාඨමාලා- දේශීය සිසුන් (2023 දෙසැම්බර් 31 දිනට) ..... 27
10 වගුව: විදේශීය ශිෂ්‍යයන් - ප්‍රථම උපාධි පාඨමාලා ..... 30
11 වගුව: විදේශීය ශිෂ්‍යයන් - පශ්චාද් උපාධි පාඨමාලා ..... 31
12 වගුව: ප්‍රථම උපාධිධාරීන් - බාහිර උපාධි පාඨමාලා ..... 33
13 වගුව: පශ්චාද් උපාධිධාරීන් පිළිබඳ සාරාංශය ..... 33
14 වගුව: ප්‍රථම උපාධිධාරීන් - අභ්‍යන්තර උපාධි පාඨමාලා ..... 34
15 වගුව: පශ්චාද් උපාධිධාරීන් ..... 35
16 වගුව: උපාධි ප්‍රදානෝත්සවය සහ උපාධිය පිරිනමන ලද ශිෂ්‍යයන් සංඛ්‍යාව ..... 36
17 වගුව: විශ්වවිද්‍යාලයේ වර්තමාන කාර්ය මණ්ඩලය ..... 38
18 වගුව: ස්ථිර කාර්ය මණ්ඩලයේ සේවක වර්ගීකරණය ..... 39
19 වගුව: ස්ථිර කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යාපන සුදුසුකම් ..... 39
20 වගුව: විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සහ ප්‍රකාශන නිමැවුම ..... 41
21 වගුව: පර්යේෂණ කවුන්සිලය විසින් අරමුදල් සම්පාදනය කර 2023 වර්ෂයේ දී පවත්වන ලද පර්යේෂණ සම්මන්ත්‍රණය ..... 41
22 වගුව: අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන පිළිබඳ විස්තර - 2023 ..... 43
23 වගුව: කැලණිය විශ්වවිද්‍යාලයට ලැබුණු පේටන්ට් බලපත්‍ර - 2023 ..... 43
24 වගුව: කැලණිය විශ්වවිද්‍යාලය මගින් ගොනු කරන ලද පේටන්ට් බලපත්‍ර - 2023 ..... 44
25 වගුව: කැලණිය විශ්වවිද්‍යාලය මගින් පේටන්ට් බලපත්‍ර සම්බන්ධයෙන් ඇතුළත් වූ ගිවිසුම් - 2023 ..... 45
26 වගුව: විද්‍යා සහ තාක්ෂණ සංවර්ධන නිමැවුම - 2023 ..... 46
27 වගුව: මහපොළ සහ ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව ..... 47
28 වගුව: නේවාසිකාගාර ලබා ගත් ශිෂ්‍යයන් - 2023 ..... 49
29 වගුව: ක්‍රීඩා පහසුකම් ..... 51
30 වගුව: ක්‍රීඩා ඉසව් ..... 51
31 වගුව: 2023 වර්ෂයේ පැවැත් වූ ක්‍රීඩා ඉසවු හා ඒ සඳහා සහභාගීවීම ..... 52
32 වගුව: ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩාවල නිපුණතා දැක්වීම - 2023 ..... 53
33 වගුව: කාර්ය මණ්ඩලය විසින් දරන ලද වෙනත් තනතුරු ..... 54
34 වගුව: පරිගණක හා තාක්ෂණ පීඨය සඳහා ශිෂ්‍යයන් බඳවා ගැනීම ..... 64
35 වගුව: පරිගණක හා තාක්ෂණ පීඨයේ කාර්ය මණ්ඩලය ..... 64
36 වගුව: මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන වැඩසටහන අනුව ශිෂ්‍යයන් ..... 75
37 වගුව: පුස්තකාලය භාවිත කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන ..... 91
38 වගුව: 2023 වසරේ පැවති විභාගය පිළිබඳ විස්තර ..... 95
39 වගුව: උපාධි ප්‍රදානෝත්සව පිළිබඳ විස්තර ..... 96
40 වගුව: බාහිර සමාලෝචන වාර්තාවල සාරාංශය ..... 96
41 වගුව: තිරසාර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත පර්යේෂණ නිමැවුම ..... 105
42 වගුව: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය ..... 107
43 වගුව: මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ..... 109
44 වගුව: මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ..... 111
45 වගුව: හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය ..... 112
46 වගුව: තක්සේරු කරන ලද වත්කම්වල ඵලදායි ජීව කාලය ..... 117
47 වගුව: අධිකරණ නඩු ..... 118
48 වගුව: විශ්‍රාම පාරිතෝෂිකය පිළිබඳ ආයුගණක තක්සේරුව ..... 122
49 වගුව: AHEAD ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ..... 127
50 වගුව: STHRD ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ..... 128
51 වගුව: මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ..... 129
52 වගුව: අයවැයගත සහ සත්‍ය ප්‍රමාණ සංසන්දනය කිරීමේ ප්‍රකාශනය ..... 148

# රූපසටහන් ලැයිස්තුව


1 රූපසටහන: කාණ්ඩ අනුව කාර්ය මණ්ඩලය (අධ්‍යයන කාර්ය මණ්ඩලයට පුස්තකාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 12 දෙනෙකු ඇතුළත් වේ.) .......... xiv
2 රූපසටහන: ස්ත්‍රී-පුරුෂභාවය අනුව කාර්ය මණ්ඩලය .......... xiv
3 රූපසටහන: තනතුරට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය හැර .......... xiv
4 රූපසටහන: කාර්ය මණ්ඩලයේ සුදුසුකම් - අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, පරිපාලන, මූල්‍ය සහ වෙනත් විධායක කාර්ය මණ්ඩලය .......... xiv
5 රූප සටහන: එක් එක් වර්ෂය තුළ මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර) .......... xv
6 රූපසටහන: කාර්ය මණ්ඩලයේ සුදුසුකම් - අනධ්‍යයන කාර්ය මණ්ඩල .......... xv
7 රූපසටහන: 2023 දෙසැම්බර් 31 දිනට පීඨය විසින් බඳවා ගන්නා ලද මුළු උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව .......... xvi
8 රූපසටහන: 2023 දෙසැම්බර් 31 දිනට වැඩසටහන් වර්ගය අනුව බඳවා ගන්නා ලද මුළු පශ්චාද් උපාධි සිසුන් සංඛ්‍යාව .......... xvi
9 රූපසටහන: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද නවකයින් (දේශීය) .......... xvi
10 රූපසටහන: මුළු අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රවණතාවය .......... xvi
11 රූපසටහන: පීඨය අනුව උපාධිධාරීන් නිමැවුම .......... xvii
12 රූපසටහන: පශ්චාද් උපාධිධාරීන් නිමැවුම .......... xvii
13 රූපසටහන : ලබා ගත් සාමාර්ථ්‍යය අනුව උපාධිධාරීන් නිමැවුම .......... xvii
14 රූපසටහන: පර්යේෂණ සභාවේ අරමුදලින් ලබා දුන් සම්මාන .......... xviii
15 රූපසටහන: පර්යේෂණ ප්‍රකාශන සඳහා සනාතන සභාවේ සම්මාන .......... xviii
16 රූපසටහන: සංවිධාන ව්‍යුහය .......... 2
17 රූපසටහන: 2023 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් .......... 25
18 රූපසටහන: සේවක වර්ගීකරණය .......... 37








# දැක්ම

තිරසාර සංවර්ධනයක් උදෙසා
දැනුම නිර්මාණය කිරීමේ හා බෙදාහැරීමේ
විශිෂ්ටතම කේන්ද්‍රස්ථානයක් බවට පත් වීම.

# මෙහෙවර

නිර්මාණශීලිත්වය හා නව්‍යකරණය තුළින්
ජාතික සංවර්ධනය උදෙසා බුද්ධිමත්
පුරවැසියන් බිහි කිරීම.




# ඉලක්ක සහ අරමුණු

## අරමුණු 01: ඉහළ ගුණාත්මකභාවයකින් යුත් නම්‍යශීලී ශික්ෂණ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

**අරමුණු**

- සිසුන්ට ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යාපනික වැඩසටහන් ලබාදීම.
- විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සහ වෙනත් රටවලින් විශ්වවිද්‍යාලයට ඇතුළු වන සිසුන් ඇතුළු විවිධ පරාසයකින් යුත් ශිෂ්‍ය ජනගහනයකට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමේ හැකියාව වැඩි දියුණු කිරීම.
- විශ්වවිද්‍යාලයෙන් පිටවන උපාධිධාරීන්ගේ සේවා නියුක්ති හැකියාව වැඩි කිරීම.
- උපාධිධාරීන්ට වාසිදායක සහ කාලෝචිත සේවා නියුක්තිය සඳහා උපකාර කිරීම පිණිස සේවා යෝජකයන් සමඟ සබඳතා වර්ධනය කිරීම.
- සියලුම අධ්‍යයන වැඩසටහන්වලදී ඉගැන්වීමේ විශිෂ්ටත්වයට අනුබල දෙන සංස්කෘතියක් නිර්මාණය කිරීම සහ පවත්වාගෙන යාම.
- සිසුන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම.
- සිසුන්ගේ ඉගෙනීමේ කටයුතු සඳහා ජාත්‍යන්තර අවස්ථා වැඩි දියුණු කිරීම.
- යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

## අරමුණු 02: විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සපුරාලනු වස් ඉහළම ගුණාත්මකභාවයකින් යුත් පීඨ සහ කාර්ය මණ්ඩලයක් ගොඩ නැඟීම.

**අරමුණු**

- විශ්වවිද්‍යාලය තුළ මානව සම්පත් සඳහා සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- ඉහළ ගුණාත්මකභාවයකින් යුත් අධ්‍යයන, පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම සහ රඳවා තබා ගැනීම.
- විශ්වවිද්‍යාලයේ සියලුම සේවකයින් සඳහා ආරක්ෂිත සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් නිර්මාණය කිරීම.
- ඉගෙනුම් අවස්ථා නිර්මාණය කිරීම සහ අදාළ වන පරිදි හා අවශ්‍යතාවය අනුව අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීම සඳහා සියලුම කාණ්ඩවල කාර්ය මණ්ඩල සඳහා ලබා දෙන සහාය (මූල්‍ය) වැඩි කිරීම.





## අරමුණු 03: ගෝලීය පිළිගැනීමක් ඇති බහු-විෂය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම

**අරමුණු**

- පර්යේෂණ ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි කිරීම මගින් විශ්වවිද්‍යාලය තුළ පර්යේෂණ සංස්කෘතියක් වර්ධනය කිරීම සහ විශ්වවිද්‍යාල ප්‍රාග්ධන අයවැයෙන් අවම වශයෙන් 10%ක් පර්යේෂණ ප්‍රදාන ලෙස වෙන් කිරීම.
- ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල විශ්වවිද්‍යාලයේ ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම.
- දේශීය සහ ජාත්‍යන්තර තීරක / සුවිගත අධ්‍යයන සඟරාවල ප්‍රකාශන වැඩි කිරීම.
- අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ වැඩි කිරීම.
- විශ්වවිද්‍යාල විද්‍යුත් පුස්තකාල පද්ධතිය ශක්තිමත් කිරීම.
- පර්යේෂණ සහ නව නිෂ්පාදන සංවර්ධනය සහ වාණිජකරණය තුළ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම.

## අරමුණු 04: ආර්ථික සහ සාමාජීය සහභාගීත්ව පරාසයන් පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.

**අරමුණු**

- විශ්වවිද්‍යාලය මගින් ප්‍රජාවට ලබාදෙන උපදේශන සේවා / ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි කිරීම.
- ජාතික සංවර්ධනය සඳහා උපකාරක සේවා සංඛ්‍යාව වැඩි කිරීම.
- වෘත්තීය ආයතන, කර්මාන්ත, සමාජ සංවිධාන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධතා වැඩි කිරීම.
- සමාජ වගකීම් සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩි කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.
- විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන් පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම.
- සමාජ හා අන්තර් සංස්කෘතික සමගිය වැඩි දියුණු කිරීම.
- හරිත විශ්වවිද්‍යාල සංකල්පය වැඩිදියුණු කිරීම.

## අරමුණු 05: කාර්යක්ෂම හා ඵලදායි පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය හරහා විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩ නැංවීම.

**අරමුණු**

- කාර්යක්ෂම පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.
- පරිපාලනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නවීන තාක්ෂණය ඇතුළත් කිරීම.
- සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රශස්ත කිරීම සඳහා අඛණ්ඩතාව සහ වගවීම ප්‍රවර්ධනය කරන අතරම, කාලෝචිත, ප්‍රතිචාරාත්මක සහ නිරවද්‍ය මූල්‍ය පරිපාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**
**උපකුලපතිනිය, කැලණිය විශ්වවිද්‍යාලය**



# උපකුලපතිනියගේ පණිවුඩය

## "පශ්චාද් උපාධි සිසුන් බඳවා ගැනීම් වැඩි දියුණු කිරීම, විදේශීය සිසුන් වැඩි වශයෙන් ආකර්ෂණය කර ගැනීම සහ ඩිජිටල්කරණය කඩිනම් කිරීම සම්බන්ධයෙන් ලබන වසරේ දී අවධානය යොමු කළ යුතු වේ."

2023 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය අධ්‍යයන කටයුතුවල විශිෂ්ටත්වය, බඳවා ගැනීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය යන අංශ වලින් සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. විශ්වවිද්‍යාලයට නවක සිසුන් 10,000කට ආසන්න සංඛ්‍යාවක් ඇතුළත් කර ගනු ලැබූ අතර ඒ අතරින් බාහිර උපාධි සඳහා උපාධි අපේක්ෂකයින් 4,103 ක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ලියාපදිංචි කර ගන්නා ලද අතර දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් උපාධි අපේක්ෂකයින් 3,546 ක් ද ඇතුළත් කර ගන්නා ලදී. ඩිප්ලෝමා, ශාස්ත්‍රපති, විද්‍යාපති සහ ආචාර්ය උපාධි ඇතුළුව නව පශ්චාද් උපාධි බඳවා ගැනීම් සංඛ්‍යාව 2,317 ක් පමණ විය.

2023 වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය මගින් සිසුන් 8,000 කට වඩා වැඩි සංඛ්‍යාවකට උපාධි ප්‍රදානය කර ඇති අතර, විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සහ උපාධි ප්‍රදානෝත්සව ක්‍රියාවලීන් විධිමත් කිරීමට ප්‍රයත්න දරන්නෙමු. 2024 වර්ෂයේ දී, ප්‍රාථමික උපාධි සඳහා බඳවා ගැනීම් වර්ධනය කර ගැනීම සඳහා කැපකිරීමක් සිදු කළ යුතු වන අතර පශ්චාද් උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව සහ විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීම කෙරෙහි ද උපායමාර්ගික අවධානයක් යොමු කළ යුතු වේ.

ප්‍රමුඛ පෙළේ රාජ්‍ය විශ්වවිද්‍යාලයක් වශයෙන්, විශිෂ්ටත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා අප ස්ථිරසාරව කැප වෙමු. 2023 වර්ෂයේ දී, පර්යේෂණ-තීව්‍ර විශ්වවිද්‍යාල සඳහා වන කීර්තිමත් Times Higher Education World University ශ්‍රේණිගත කිරීම්වල අප විශ්වවිද්‍යාලය පළමු වරට 1501+ කාණ්ඩයේ ලැයිස්තුගත කර ඇති බැවින්, විශ්වවිද්‍යාලයීය සංවර්ධනයේ ප්‍රධාන සන්ධිස්ථානයක් අප විසින් පසු කර ඇත. කැලණිය විශ්වවිද්‍යාලය මේ වන විට තවත් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් කිහිපයකම ලැයිස්තුගත කර ඇත: එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරන Times Higher Education Impact ශ්‍රේණිගත කිරීම්වල 601 - 800 කාණ්ඩයේ ද, විශ්වවිද්‍යාල පරිසරයට දක්වන කැපවීම ශ්‍රේණිගත කරන UI Green Metrics ys QS ආසියානු ශ්‍රේණිගත කිරීම්වල 551 - 600 කාණ්ඩයේ ද, විශ්වවිද්‍යාලය ලැයිස්තුගත කර ඇති අතර කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර 1 වන ස්ථානය ලබා ගැනිමට සමත්ව සිටින අතර ජාත්‍යන්තර වශයෙන් 226 වන ස්ථානයේ රැඳී සිටියි.

යටිතල පහසුකම් සංවර්ධන කටයුතු ද සාර්ථකව සිදු කරමින් පවතින අතර, පරිගණක හා තාක්ෂණ පීඨයේ ගොඩනැගිල්ලේ ඉදි කිරීම් කටයුතු අවසන් වෙමින් පවතියි. රාගම වෛද්‍ය පීඨයේ විශේෂිත අක්මා රෝග ප්‍රතිකාර මධ්‍යස්ථානය අති නවීන සේවා සැපයීමට හැකි වන ආකාරයෙන් සංවර්ධනය කර තිබේ. ප්‍රජා සහයෝගය ඉස්මතු කරමින් ත්‍යාගශීලීන්ගෙන් ලැබුණු පරිත්‍යාග මගින් අරමුදල් සම්බන්ධයෙන් පැවති අවහිරතා ජය ගැනිමට හැකි විය.

අභියෝග මධ්‍යයේ වුවද, විශ්වවිද්‍යාලය ස්ථාවරව පවතින අතර, දැනට ක්‍රියාත්මක ඉදිකිරීම් ව්‍යාපෘති සහ ඉදිරි දශකය සඳහා සැලසුම් මොරටුව විශ්වවිද්‍යාලයේ උපදේශකයින් කණ්ඩායමක් විසින් සකස් කරන ලද ප්‍රධාන සැලසුමකට ඇතුළත් කර ඇත. පහසුකම් වැඩි දියුණු කිරීම, ඉඩ පහසුකම් සම්බන්ධ අවහිරතා සඳහා විසඳුම් ලබා දීම, සහ කාර්යක්ෂමතාව සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ඩිජිටල් පරිවර්තන උනන්දුවෙන් හා උද්යෝගයෙන් පිළිගැනීම කෙරෙහි අවධානය යොමු කරමි.

අතිශය අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් මධ්‍යයේ වුවද, 2023 වර්ෂය කැලණිය විශ්වවිද්‍යාලය සම්බන්ධ තවත් එක් සාර්ථක වර්ෂයක් බවට පත්කිරීම සඳහා උනන්දුවෙන්, වෙහෙස නොබලා, පරාර්ථකාමීව හා කැපවීමෙන් කටයුතු කළ සියලුම අධ්‍යයන, විධායක, අධ්‍යයන සහායක සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සැබවින්ම අගය කොට සලකමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**
උපකුලපතිනිය,
කැලණිය විශ්වවිද්‍යාලය

# වර්ෂයේ තොරතුරු සහ සංඛ්‍යා 2023

## විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩලය




රූපසටහන 1: කාණ්ඩ අනුව කාර්ය මණ්ඩලය (අධ්‍යයන කාර්ය මණ්ඩලයට පුස්තකාල කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 12 දෙනෙකු ඇතුළත් වේ)




රූපසටහන 2: ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලය




රූපසටහන 3: තනතුර අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය, පුස්තකාල කාර්ය මණ්ඩලය හැර




රූපසටහන 4: කාර්ය මණ්ඩලයේ සුදුසුකම් - අධ්‍යයන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය, පරිපාලන, මූල්‍ය සහ අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය








රූපසටහන 5: එක් එක් වර්ෂය තුළ මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය (පුස්තකාල කාර්ය මණ්ඩලය හැර)




රූපසටහන 6: කාර්ය මණ්ඩලයේ සුදුසුකම් - අනධ්‍යයන කාර්ය මණ්ඩලය

## විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයන්




රූපසටහන 7: 2023 දෙසැම්බර් 31 දිනට එක් එක් පීඨය මගින් බඳවා ගන්නා ලද මුළු උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව




රූපසටහන 8: 2023 දෙසැම්බර් 31 වන විට වැඩසටහන් වර්ගය අනුව බඳවා ගන්නා ලද මුළු පශ්චාද් උපාධි සිසුන් සංඛ්‍යාව




රූපසටහන 9: අභ්‍යන්තර උපාධි අපේක්ෂක වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද නවක සිසුන් (දේශීය)




රූපසටහන 10: මුළු අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් බඳවා ගැනීමේ ප්‍රවණතාවය



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

## විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන සුදුසුකම්




රූපසටහන 11: පීඨයට අනුව උපාධිධාරීන් නිමැවුම




රූපසටහන 12: පශ්චාද් උපාධිධාරීන්




රූපසටහන 13: ලබා ගත් සාමාර්ථය අනුව උපාධිධාරීන් නිමැවුම

## පර්යේෂණ ප්‍රදාන සහ පර්යේෂණ සඳහා සනාතන සභාවෙන් පිරිනමනු ලබන සම්මාන




රූපසටහන 14: පර්යේෂණ සභාවේ අරමුදලින් ලබා දුන් සම්මාන




රූපසටහන 15: පර්යේෂණ ප්‍රකාශන සඳහා සනාතන සභාවේ සම්මාන





# 1 හැඳින්වීම

කැලණිය විශ්වවිද්‍යාලය ආරම්භ වන්නේ 1875 දී රත්මලානේ ශ්‍රී ධර්මාලෝක හිමියන් විසින් බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනික මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කරන ලද ඓතිහාසික විද්‍යාලංකාර පිරිවෙනෙනි. 1940 සහ 1950 දශකවල ශ්‍රී ලංකාවේ නවීන විශ්වවිද්‍යාල පිහිටුවීමත් සමඟ විද්‍යාලංකාර පිරිවෙන 1959 දී විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය බවටත්, පසුව 1972 දී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපය බවටත්, අවසානයේ 1978 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලය බවටත් පත් විය.

මෙම විශ්වවිද්‍යාලය පීඨ හතකින්, අධ්‍යයන අංශ 58 කින් සහ වෙනත් අධ්‍යයන ඒකක හතරක් සහ පාලි හා බෞද්ධ අධ්‍යයන පිළිබඳ පශ්චාද් උපාධි ආයතනය සහ පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාද් උපාධි ආයතනය යන අනුබද්ධ ආයතන දෙකකින් සමන්විත වේ.

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, උපාධි අධ්‍යයන, මානවශාස්ත්‍ර, විද්‍යා සහ සමාජීය විද්‍යා පීඨ දළුගම පිහිටි විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ ස්ථාපනය කර ඇති අතර වෛද්‍ය පීඨය රාගම පිහිටා ඇත. පරිගණක හා තාක්ෂණ පීඨය මේ වන විට කැලණිය බුළුගහ හන්දියේ නව ගොඩනැගිලි සංකීර්ණයකට රැගෙන ගොස් ඇත.

විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය, වෛද්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, ප්‍රධාන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය සහ මධ්‍යම පරිපාලන අංශ ද වෙනත් පහසුකම් සපයනු ලබන අංශ වශයෙන් ප්‍රධාන මණ්ඩපයේ පිහිටා ඇත. තවද, භික්ෂු නේවාසිකාගාරය මෙන්ම කාන්තා නේවාසිකාගාර සංකීර්ණය දළුගම පරිශ්‍රය තුළ ද, පිරිමි නේවාසිකාගාර සහ ඇතැම් කාන්තා නේවාසිකාගාර ප්‍රධාන විශ්වවිද්‍යාල පරිශ්‍රය අවට ද ස්ථාපනය කර ඇත. වෛද්‍ය පීඨයේ පරිපාලන අංශ, නේවාසිකාගාර සංකීර්ණය, ක්‍රීඩා පහසුකම් සහ පීඨ පුස්තකාලය රාගම පරිශ්‍රයේ පිහිටා ඇත.

සිංහල භාෂාවෙන් විද්‍යා පාඨමාලා පිරිනැමීම ආරම්භ කළ පළමු ආයතනය වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයයි. අදාළ අධ්‍යයන විෂය ධාරාවන්හි අධ්‍යයන දෙපාර්තමේන්තු ස්ථාපනය කිරීමේ දී ද කැලණිය විශ්වවිද්‍යාලය පුරෝගාමී කාර්යභාරයක් ඉටු කරන ලදී. විද්‍යා පීඨයේ කාර්මික කළමනාකරණ දෙපාර්තමේන්තුව සහ ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව ඒ ආකාරයෙන් ස්ථාපනය කරන ලද පළමුවන අධ්‍යයන අංශ විය. වාග් විද්‍යාව, ලලිත කලා, නූතන භාෂා සහ හින්දි සම්බන්ධ විෂයයන් ප්‍රථමයෙන් මානවශාස්ත්‍ර පීඨයේ පුරෝගාමී දෙපාර්තමේන්තු විසින් පිරිනමන ලද අතර, ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට ජනසන්නිවේදන අධ්‍යයන අංගය සහ පුස්තකාල හා විඥාපන අධ්‍යයන අංශය ස්ථාපනය කිරීමට සමාජීය විද්‍යා පීඨය පුරෝගාමී විය.

විශේෂිත වූ විශ්වවිද්‍යාල මධ්‍යස්ථාන සහ ඒකක සමූහයක් මගින් කැලණිය විශ්වවිද්‍යාලය සිය සිසුන්ට අත්‍යවශ්‍ය සේවා රැසක් සපයයි. ශිෂ්‍ය උපදේශන කටයුතු අංශය, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය, පුද්ගලික උපදේශන ඒකකය (කලණ මිතුරු සෙවණ), වෛද්‍ය මධ්‍යස්ථානය, ශාරීරික අධ්‍යාපන මධ්‍යස්ථානය, සංස්කෘතික මධ්‍යස්ථානය, කලා මණ්ඩලය, පුස්තකාලය (පීඨ පුස්තකාල ඇතුළුව), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය, සහ ජාත්‍යන්තර ශිෂ්‍ය කටයුතු ඒකකය ඒ අතරින් ප්‍රධාන වේ. කැලණිය විශ්වවිද්‍යාලය මගින් විශේෂිත අරමුණු සඳහා විශේෂිත මධ්‍යස්ථාන සහ ඒකක ද ස්ථාපනය කර ඇත. මේවාට තත්ත්ව සහතික මධ්‍යස්ථානය (CQA), උපාය මාර්ගික සැලසුම් සහ විශ්වවිද්‍යාල සංඛ්‍යාන සඳහා මධ්‍යස්ථානය (CSPS), මාධ්‍ය ඒකකය, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, තාක්ෂණ හා නවෝත්පාදන ආධාරක මධ්‍යස්ථානය, තිරසාර සංවර්ධන මධ්‍යස්ථානය (CSS), ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය (CGS), දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය (CDCE), උපායමාර්ගික සන්නාම අනන්‍යතා සංවර්ධනය සඳහා වූ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CBID), මොඩියුල පද්ධතිය සම්බන්ධීකරණය කිරීමේ අන්තර් පීඨ මධ්‍යස්ථානය (ICCMS) සහ විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා මැදිරිය ඇතුළත් වේ.

අධ්‍යයන කාර්ය මණ්ඩලය, පරිපාලන කාර්ය මණ්ඩලය, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් විශ්වවිද්‍යාලයේ මානව සම්පත් නියෝජනය කරනු ලබන අතර පහත සඳහන් රූපසටහන විශ්වවිද්‍යාලයේ ආයතනික ව්‍යුහය නිරූපණය කරයි. (රූප සටහන 16)




රූප සටහන 16 - සංවිධාන ව්‍යුහය





# 1.1. සමාලෝචිත වර්ෂය

## 1.1.1. හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ පසුගිය කාලපරිච්ඡේදයේ පැවති අර්බුදවලින් එල්ල වූ අභියෝගවලට සාර්ථකව මුහුණ දී සාමාන්‍ය තත්ත්වයට පත් වීමට 2023 වසරේ දී කැලණිය විශ්වවිද්‍යාලය සමත් ව තිබුණි. විශ්වවිද්‍යාලය අධ්‍යයන විශිෂ්ටත්වය සඳහා කැපවීමෙන් කටයුතු කරමින්, ශ්‍රී ලංකාවේ පැවති අර්බුදය මධ්‍යයේ බාධාවකින් තොරව අධ්‍යාපන කටයුතු සිදු කිරීම සහතික කිරීම සඳහා අඛණ්ඩව අනුගත වීම හා උපාය මාර්ගික ක්‍රියාමාර්ගවල අවශ්‍යතාවය හඳුනා ගන්නා අතරතුර නව්‍ය ප්‍රවේශ ක්‍රියාවට නංවමින් භෞතික ඉගෙනුම් පරිසරය ප්‍රශස්ත කිරීම සඳහා ද ප්‍රයත්න දරන ලදී. විශ්වවිද්‍යාලය ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සඳහා එහි පළපුරුද්ද සහ කැපවීම තුළින් අර්බුදයෙන් වඩාත් ශක්තිමත්ව ගොඩ නැඟී, දැනුම පෝෂණය කිරීමේ සහ එහි අධ්‍යයන ප්‍රජාවේ සහ පුළුල් සමාජයේ ප්‍රගමනයට දායක වීමේ මෙහෙවර ද අඛණ්ඩව පවත්වා ගන්නා ලදී.

සමාලෝචිත වර්ෂය තුළ සැලකිය යුතු පරිවර්තන කිහිපයක් සිදු විය. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ආර්. ද සිල්වා මහත්මිය කැලණිය විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමිය ලෙස නැවතත් පත් කරන ලදී. මහාචාර්ය ඩබ්ලිව්.එම්.සී.ඩී. වන්නිනායක වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ පීඨාධිපති ලෙස තේරී පත් වූ අතර මහාචාර්ය එම්.එන්. චන්ද්‍රතිලක මහතා වෛද්‍ය පීඨයේ පීඨාධිපතිවරයා ලෙස තේරී පත් විය. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී කාලිංග මුදලි මහතා විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා ලෙස නැවත තේරී පත් වූ අතර ආචාර්ය යූ.එස්. සෙනරත් මහතා ද මානවශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා ලෙස නැවත තේරී පත් විය.

කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිප දෙනෙකු වෙනත් ආයතනවල සහ සංවිධානවල ඉහළ තනතුරුවලට පත් කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සමානාත්මතාවය / සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය එස්.ඩී.පී.එම්. මනුරත්න මහත්මිය පත්වීම, මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පිළිබඳ උසස් අධ්‍යයන සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය පී. නාරංගොඩ මහත්මිය පත් වීම, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාද් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය එච්.ටී.සී.එස්. අබේසේන මහතා පත්වීම, කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනයේ අධ්‍යක්ෂ ලෙස මහාචාර්ය පී.ඩී. ගල්හේන මහතා පත්වීම සහ ආචාර්ය රොමෝලා රසූල් මහත්මිය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි පිළිබඳ පශ්චාද් උපාධි ආයතනයේ අධ්‍යක්ෂවරයා ලෙස පත්වීම ද මෙම පත්වීම්වලට ඇතුළත් විය.

## 1.1.2. අධ්‍යයන ක්‍රියාකාරකම්, සිසුන් බඳවා ගැනීම සහ උපාධිය ලබා දීම

කැලණිය විශ්වවිද්‍යාලය 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා අධ්‍යයන කටයුතු 2023 පෙබරවාරි මාසයේ ආරම්භ කළ අතර එදින සිට සියලුම දේශන භෞතිකව පවත්වන ලදී.

2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා නව අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 4,128ක් බඳවාගෙන ඇති අතර, 2023 වර්ෂයේදී කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ සමස්ත අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව 15,390 දක්වා ඉහළ ගොස් ඇත. ප්‍රථම උපාධි පාඨමාලා සඳහා 2021/2022 අධ්‍යයන වර්ෂයේ නවක විදේශ සිසුන් 25ක් බඳවා ගන්නා ලදී. බාහිර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් මුළු සිසුන් සංඛ්‍යාව 105,963ක් වූ අතර කැලණිය විශ්වවිද්‍යාලය මගින් පිරිනමනු ලබන පශ්චාද් උපාධි පාඨමාලා සඳහා සිසුන් 3,316ක් බඳවාගෙන ඇත.

අභ්‍යන්තර උපාධි වැඩසටහන්වලින් 2023 වසරේ දී උපාධිධාරීන් 3,160 ක් බිහි කරන ලද අතර බාහිර උපාධි වැඩසටහන්වලින් උපාධිධාරීන් 4,008 ක් සහ පශ්චාද් උපාධි වැඩසටහන්වලින් උපාධිධාරීන් 1,217 ක් බිහි කරන ලදී. තවද, 2023 වසර තුළ උපාධි ප්‍රදානෝත්සව 11ක් පවත්වා ඇත.

### 1.1.3. කාර්ය මණ්ඩල පත් කිරීම්, සහ ඉල්ලා අස්වීම් හෝ විශ්‍රාම ගැනීම්

2023 වර්ෂය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 31 දෙනෙකු බඳවා ගන්නා ලද අතර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 37 දෙනෙකු ඉල්ලා අස්වී හෝ විශ්‍රාම ගොස් හෝ ඇත. අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ 5 දෙනෙක් සිය සේවයෙන් ඉල්ලා අස්වූහ. අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා කිසිවකු බඳවා නොගත් අතර 18 දෙනෙකු සේවයෙන් විශ්‍රාම ගිය අතර 21 දෙනෙකු මෙම වසරේ විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස්වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විශ්වවිද්‍යාලය තුළ නව පත්වීම් 31ක් සිදු වී ඇති අතර කාර්ය මණ්ඩල සාමාජිකයන් 81ක් විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස්වී හෝ විශ්‍රාම ගොස් හෝ ඇත.

### 1.1.4. පර්යේෂණ සහ සංවර්ධනය සහ සම්මාන

2023 වර්ෂයේ දී, කැලණිය විශ්වවිද්‍යාලය විවිධ කාණ්ඩවලට අයත් ප්‍රකාශන 963 ක් ප්‍රකාශයට පත් කරන ලද අතර, SCOPUS-සුචිගත තීරක සඟරාවල සම්පූර්ණ පත්‍රිකා, සුචිගත නොවන තීරක සඟරාවල සම්පූර්ණ පත්‍රිකා, සාරාංශ සහ සම්මන්ත්‍රණ ක්‍රියාවලීන්හි සම්පූර්ණ පත්‍රිකා, පොත් පරිච්ඡේද සහ පෙළපොත් ඇතුළත් වේ. මේවා අතර ප්‍රකාශන 342ක් SCOPUS- තීරක සඟරාවල සුචිගත කර ඇත.

විද්වත් ජයග්‍රහණ ඇගයීම සහ පර්යේෂණ කටයුතු සඳහා විද්වතුන් දිරිගැන්වීම සඳහා 2021, 2022, සහ 2023 වර්ෂ තුළදී විද්‍යා උපුටා දැක්වීම් දර්ශකයේ (SCI), සමාජ විද්‍යා උපුටා දැක්වීම් දර්ශකයේ (SSCI) සහ මානව ශාස්ත්‍ර උපුටා දැක්වීම් දර්ශකයේ (AHCI) සුචිගත කර ඇති සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද ආදර්ශමත් ලිපි සඳහා පුද්ගලයින් 82 දෙනෙකුට සනාතන සභාවේ ගෞරව සම්මාන සහ මුදල් ත්‍යාග පිරිනමන ලදී. තවද, 2022 සහ 2023 වර්ෂවලදී, SCOPUS- සුචිගත සඟරාවල ලිපි පළ කළ විද්වතුන් සඳහා සනාතන සභාවේ ප්‍රශංසා සහ මූල්‍ය පරිත්‍යාග 54 ක් ප්‍රදානය කරන ලදී. එයට සමගාමීව, 2022 සහ 2023 වර්ෂවල SCOPUS-සුචිගත කිරීම මගින් සම්මන්ත්‍රණ කටයුතුවලදී ප්‍රකාශයට පත් කරන ලද සවිස්තරාත්මක පත්‍රිකා සඳහා සනාතන සභාවේ ප්‍රශංසා සහ මුදල් සම්මාන මෙන්ම විදේශ සංචාර ප්‍රදාන 3ක් ද පිරිනමන ලදී.

### 1.1.5. ශ්‍රේණිගත කිරීම්

ටයිම්ස් උසස් අධ්‍යාපන (THE) බලපෑම් ශ්‍රේණිගත කිරීම් අනුව කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ 3 වැනි ස්ථානයට පත් වූ අතර ගෝලීය වශයෙන් 601-800 කාණ්ඩයේ ශ්‍රේණිගත වී තිබුණි. කැලණිය විශ්වවිද්‍යාලය 2024 වර්ෂයේ දී ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලට ප්‍රථම වරට ඇතුළත් වූ අතර, එය ලොව පිළිගත් පර්යේෂණ-තීව්‍ර විශ්වවිද්‍යාලයක් බවට පත් වූ අතර 2024 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ 3 වැනි ස්ථානයට පත් විය. වඩාත් කීර්තිමත් සහ බලගතු ගෝලීය විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් වශයෙන් විස්තීර්ණ ලෙස පිළිගත් විශ්වවිද්‍යාල අතරට ලෝකයේ විශ්වවිද්‍යාල 30000 න් 2000කට අඩු සංඛ්‍යාවක් පමණක් ඇතුළත් වේ. තවද, 2024 වසරේ ටයිම්ස් උසස් අධ්‍යාපන ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල සායනික සහ සෞඛ්‍ය විෂය ශ්‍රේණිගත කිරීම්වල දී කැලණිය විශ්වවිද්‍යාලය 801-1000 දක්වා පරාසයක ශ්‍රේණිගත විය.

2023 වර්ෂයේ දී UI GreenMetric ශ්‍රේණිගත කිරීම සඳහා ඉල්ලුම් කළ විශ්වවිද්‍යාල 1,182 අතරින් කැලණිය විශ්වවිද්‍යාලය, 2022 වර්ෂයේ ශ්‍රේණිගත කිරීම වූ 241 සිට 2023 වර්ෂයේ 226 දක්වා ගෝලීය ශ්‍රේණිගත කිරීම්වල ඉදිරියට යමින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල අතර ප්‍රමුඛ හරිත විශ්වවිද්‍යාලය ලෙස ශ්‍රේණිගත කරනු ලැබ ඇත. 2022 ඔක්තෝබර් සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය තුළ UI GreenMetric ශ්‍රේණිගත කිරීම් කාර්යසාධනය මත පදනම් වූ ශ්‍රේණිගත කිරීම් විය. තිරසාර සංවර්ධන මධ්‍යස්ථානයේ (CSS) සක්‍රීය මැදිහත්වීමත් සමඟ කැලණිය විශ්වවිද්‍යාලය පාරිසරික ප්‍රතිපත්තියක් අනුගමනය කළ එමෙන්ම, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ එහි උපායමාර්ගික සැලැස්ම සහ ප්‍රධාන කාර්යසාධන දර්ශක පෙළගස්වන ලද ශ්‍රී ලංකාවේ පළමු රාජ්‍ය අංශයේ විශ්වවිද්‍යාලය බවට පත්විය.

2023 වර්ෂයේ දී, SCIMAGO සහ QS වැනි අනෙකුත් ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් ද පිළිගත් විශ්වවිද්‍යාලයක් බවට අප විශ්වවිද්‍යාලය පත් වී ඇත.





### 1.1.6. වෙනත් විශේෂ අවස්ථා

2023 ඔක්තෝම්බර් මාසයේදී ස්ටැන්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලය මගින් ප්‍රකාශයට පත් කරන ලද ලොව ප්‍රබලම විද්‍යාඥයින් අතරින් ද ඉහළම පිළිගැනීමට ලක් වී සිටින විද්‍යාඥයන්ගේ 2% ලැයිස්තුවට වෛද්‍ය පීඨයේ විද්‍යාඥයින් පස් දෙනෙකු ඇතුළත් කරනු ලැබ ඇත. මෙම ප්‍රකාශනය පදනම් වී ඇත්තේ 2022 උපුටා දැක්වීමේ වර්ෂය අවසානය දක්වා යාවත්කාලීන කරන ලද Elsevierzs Scopus දත්ත සමුදාය මතය.

කැලණිය විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයේ ඉලෙක්ට්‍රොනික නිර්මාණ සහ නවෝත්පාදන මධ්‍යස්ථාන (EDIC) කණ්ඩායම ඔවුන්ගේ එක් නවෝත්පාදනයක් වන "ස්වයංක්‍රීය හුදකලා රැහැන් රහිත ජල තත්ත්ව අධීක්ෂණ සහ වැසි ජලය රැස් කිරීමේ පද්ධතිය" වෙනුවෙන් 2023 දකුණු ආසියා තරුණ ජල අභියෝගය (SAYWC) යන සම්මානය දිනා ගන්නා ලදී. මෙම පද්ධතිය මගින් ස්වයංක්‍රීයව වැසි ජලය රැස් කර එම ජලය අධීක්ෂණය කරන ලද ගුණාත්මකභාවයට අනුව විවිධ ටැංකි වෙත යොමු කරනු ලබයි. තථ්‍යකාලීන ජල තත්ත්ව අධීක්ෂණ හැකියා සක්‍රීය කිරීම මගින් ශුෂ්ක සහ ග්‍රාමීය ප්‍රදේශ ස්මාර්ට් ලෝකයට සම්බන්ධ කිරීමට මෙම ස්මාර්ට් පද්ධතියට හැකි වේ.

2023 වසරේ චීනයේ Hangzhou හි පැවති ආසියානු ක්‍රීඩා උළෙලේ දී විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් සහභාගී වූ කාන්තා මීටර් 4o400 සහය දිවීමේ කණ්ඩායම රිදී පදක්කම දිනා ගැනීමට සමත් වීම මගින් 2023 වසරේ ක්‍රීඩා අංශයෙන් කැපී පෙනෙන ජයග්‍රහණ ලබා ගැනීමට ද විශ්වවිද්‍යාලයට හැකියාව ලැබුණි. මෙම ජයග්‍රහණයේ සුවිශේෂී වැදගත්කම වන්නේ කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයෙකු ආසියානු ක්‍රීඩා උළෙලේදී පදක්කමක් ජයග්‍රහණය කළ පළමු අවස්ථාව මෙය වීමත්, ආසියානු ක්‍රීඩා ඉතිහාසයේ පදක්කමක් දිනූ 2 වැනි ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයා මොහු වීමත්ය. තවද, බීච් වොලිබෝල් (පිරිමි), කැරම් (පිරිමි) සහ කරාටේ (පිරිමි) කණ්ඩායම් 2023 XIV ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ (SLUG) ශූරයන් බවට පත් වූහ.

අනෙකුත් විශේෂ අවස්ථාව වන්නේ, ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනයක ඉතිහාසය විස්තර කිරීම සඳහා විශේෂයෙන් ආරම්භ කරන ලද, ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රථම 'පුස්තකාල කෞතුකාගාරය' 2023 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මගින් ස්ථාපිත කිරීමය. තවද, කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මගින් නවීන ඩිජිටල් සම්පත්, සහායක පර්යේෂණ, ඉගෙනුම් සහ සහයෝගීතා ක්‍රියාකාරකම්වලින් සමන්විත වූ අන්තර්ක්‍රියාකාරී සහ සහයෝගී ඉගෙනුම් කලාපයක් ද උපාධි අපේක්ෂකයින් සඳහා එළිදක්වන ලදී.

## 1.2. ඉදිරි දැක්ම

කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රමෝපායික ඒකකවල සහයෝගීතාවෙන් පිළියෙළ කරන ලද කැලණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, උපාය මාර්ගික ඉලක්ක පහක් කරා ළඟා වීම පිණිස වූ 2022-2024 චක්‍රයට අනුකූල වන විශ්වවිද්‍යාලයීය උපාය මාර්ගික සැලැස්ම සමඟ සමපාත වේ. (1) ඉගැන්වීම සහ ඉගෙනීම, (2) මානව සම්පත් සංවර්ධනය, (3) පර්යේෂණ, (4) ආර්ථික සහ සමාජ වගකීම් සහ (5) පරිපාලනය සහ යහපාලනය යන විශ්වවිද්‍යාලයේ ප්‍රධාන උපාය මාර්ගික අංශ මෙම අරමුණු පහ මගින් ආවරණය කරනු ලබයි.

ඉලක්කය 1: උසස් තත්ත්වයේ සහ නම්‍යශීලී ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.

ඉලක්කය 2: විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ඉහළම ගුණාත්මක භාවයෙන් යුත් පීඨ සහ කාර්ය මණ්ඩලයක් සංවර්ධනය කිරීම.

ඉලක්කය 3: ගෝලීය වශයෙන් පිළි ගත් බහු-ක්ෂේත්‍ර පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම

ඉලක්කය 4: ආර්ථික හා සමාජීය සම්බන්ධතා පරාසය පුළුල් කිරීම මගින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.

ඉලක්කය 5: කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය තුළින් විශිෂ්ට පාලන පද්ධතියක් සංවර්ධනය කිරීම.

රට තුළ පවතින ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද, කැලණිය විශ්වවිද්‍යාලයට එහි ප්‍රධාන උපාය මාර්ගික අංශයන්ගෙන් විශිෂ්ටත්වයට පත් වීමට හැකියාව ලැබුණු අතර 2030 වසරෙන් පසුවද විශිෂ්ඨත්වයට පත් වීම එහි අපේක්ෂාවයි. 2023 වසරේ ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල උන්නතිය තුළින් ද විශ්වවිද්‍යාලයේ කාර්යසාධනය පිළිබිඹු වන අතර විශ්වවිද්‍යාලය ඉදිරි වසරවලදී එහි ශ්‍රේණිගත කිරීම් වැඩිදියුණු කර ගැනිමට ද අඛණ්ඩව ප්‍රයත්න දරයි.

පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් රජයේ මූල්‍යකරණ කටයුතු සීමා වී පවතින අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක සාක්ෂාත් කර ගැනීම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීම කාර්ය මණ්ඩලයට අභියෝගාත්මක කාර්යයක් බවට පත් වී ඇත. කෙසේ වුවද, ජාතික තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට දායක වීම සහ උපාධිධාරී රැකියා නියුක්තිය වැඩිදියුණු කිරීම කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ප්‍රමුඛතා වශයෙන් අඛණ්ඩව පවතිනු ඇත. යටිතල පහසුකම් සීමාකාරී වීම මගින් විශ්වවිද්‍යාලයේ කෙටි කාලීන අරමුණු සාක්ෂාත් කර ගැනීම අඛණ්ඩව අඩාල කර ඇත. වර්තමානයේ පවතින අභියෝග මධ්‍යයේ වුවද, ජාතික හා ජාත්‍යන්තර සහයෝගීතා තුළින් ජාතික හා ජාත්‍යන්තර වෙළඳපොළට නව අධ්‍යයන වැඩසටහන් හඳුන්වාදීමට සහ විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම්, ඉගෙනීම, පර්යේෂණ සහ තිරසාර සංවර්ධන ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීමට ද විශ්වවිද්‍යාලය මගින් මුල පිරීම් සමූහයක් ක්‍රියාත්මක කරනු ලැබ ඇත.

කැලණිය විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මේ සැලකිය යුතු යාවත්කාලීන කිරීමක් මේ වන විට සිදුවෙමින් පවතියි. මෙම සංශෝධනය මඟින් ක්‍රියාකාරීව සහ මනා සම්බන්ධීකරණයකින් කටයුතු කිරීමට සහ වර්ධනය වන අවස්ථා සමඟ විශ්වවිද්‍යාලයේ අරමුණු පෙළගැස්වීමට විශ්වවිද්‍යාලය දරන කැපවීම පිළිබිඹු කරයි. විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා සාමූහික ප්‍රයත්නවලට මඟ පෙන්වන 2025-2027 චක්‍රය වෙනුවෙන් වැඩි දියුණු කළ සැලැස්ම එළිදැක්වීමට විශ්වවිද්‍යාලය අපේක්ෂා කරයි.







# 2 විශ්වවිද්‍යාලයේ පාලනය

කැලණිය විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ දක්වා ඇති සංවිධාන ව්‍යුහය සහ වගකීම්වලට ද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ මගින් කලින් කලට පනවනු ලබන රෙගුලාසි සහ මාර්ගෝපදේශවලට අනුකූලව ද කටයුතු කරයි.

විශ්වවිද්‍යාල පාලක සභාව, සනාතන සභාව සහ පීඨ මණ්ඩල යනු විවිධ ක්‍රියාකාරී මට්ටම්වලදී මාර්ගෝපදේශ සම්පාදනය කරන ව්‍යවස්ථාපිත ආයතන වේ. කැලණිය විශ්වවිද්‍යාලයේ සංවිධාන ව්‍යුහය සියළුම කාර්ය මණ්ඩලයේ තනතුරු සහ ඔවුන්ගේ රාජකාරි, වගකීම් සහ විධාන දාමය නිර්වචනය කරයි.

## 2.1. විශ්වවිද්‍යාලයේ කුලපති, උපකුලපති සහ නිලධාරීන්

කුලපතිවරයා උපාධි ප්‍රදානෝත්සවය මෙහෙයවනු ලබන විශ්වවිද්‍යාලයේ ප්‍රධානියා වන අතර උපකුලපතිවරයා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරී සහ ගිණුම්කරණ නිලධාරියා ද වේ. උපකුලපතිවරයා විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් සාමාජිකයෙකු ද, සභාපතිවරයා ද වන අතර විශ්වවිද්‍යාල පාලක සභාව සහ සනාතන සභාව විසින් ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දරයි. පීඨාධිපතිවරයා සෑම පීඨයකම අධ්‍යයන හා පරිපාලන ප්‍රධානියා වන අතර එක් එක් පීඨ මණ්ඩලයේ නිල බලයෙන් සභාපතිවරයා ද වේ. ඔවුහු විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් සාමාජිකයෝ වෙති. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා, සනාතන සභාවේ මඟපෙන්වීමට සහ පාලනයට යටත්ව, විශ්වවිද්‍යාලය තුළ සිදුකරන පශ්චාද් උපාධි අධ්‍යයන මෙන්ම සුවිශේෂී හෝ බහු ශික්ෂණ පර්යේෂණ සම්බන්ධීකරණය සහ නියාමනය කිරීමේ වගකීම දරයි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ලේඛකාධිකාරිවරයා වගකිව යුතු වන අතර විශ්වවිද්‍යාලයේ වාර්තා සහ දේපළවල භාරකාරත්වය ද දරයි. ඔහු විශ්වවිද්‍යාල පාලක සභාවේ සහ සනාතන සභාවේ නිල බලයෙන් ලේකම්වරයා ද වේ. පුස්තකාලයාධිපතිවරයා විශ්වවිද්‍යාලීය පුස්තකාලයේ මෙහෙයුම් සම්බන්ධයෙන් වගකිව යුතු වන අතර සනාතන සභාවේ නිල බලයෙන් සාමාජිකයෙකු ද වේ. විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය සිදු කිරීම සහ එහි ගිණුම් පවත්වාගෙන යාමේ වගකීම මූල්‍යාධිකාරිවරයා සතු වේ.

## 2.2. විශ්වවිද්‍යාල පාලක සභාව

විශ්වවිද්‍යාල පාලක සභාව යනු විශ්වවිද්‍යාලයේ විධායක සහ පාලන අධිකාරියයි. උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන් සත් දෙනෙකු, සනාතන සභාව විසින් එහි සාමාජිකයින් අතරින් ඡන්දයෙන් තෝරා පත් කර ගත් සාමාජිකයන් දෙදෙනෙකු සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පත් කරන ලද සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව සමන්විත වේ. උපකුලපතිවරයා විශ්වවිද්‍යාල පාලක සභාවේ මුලසුන හොබවන අතර ලේඛකාධිකාරිවරයා පාලක සභාවේ ලේකම්වරයා ලෙස කටයුතු කරයි. අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ උසස් කිරීම සඳහා වන සියලුම තේරීම් කමිටුවල මෙන්ම පහත සඳහන් ව්‍යවස්ථාපිත කමිටුවල ද විශ්වවිද්‍යාල පාලක සභා සාමාජිකයෝ සේවය කරති:

- මූල්‍ය කමිටුව
- විගණන කමිටුව
- දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කළමනාකරණ කමිටුව

උපකුලපතිවරයා මුලසුන හොබවන තත්ත්ව ආරක්ෂණ සනාතන සභා ස්ථාවර කමිටුවේ, ඉඩම් සහ ගොඩනැගිලි කළමනාකරණ සහ සංවර්ධන කමිටුවේ සහ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ද විශ්වවිද්‍යාල පාලක සභාවේ සාමාජිකයෝ කාර්ය නියුක්ත වනු ලැබේ. මෙයට අමතරව, ඔවුහු ආචාර ධර්ම සමාලෝචන කමිටුව, කාර්ය මණ්ඩල සංවර්ධන කළමනාකරණ කමිටුව, පර්යේෂණ සභාව වැනි උප කමිටුවල ද කාර්ය නියුක්ත වේ.

වගුව 1: විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ සාමාජිකයෝ

| නම | රැස්වීම්වලට සහභාගී වීම (2023.01.01 සිට 2023.12.31 දක්වා) |
|---|---|
| **උප කුලපති** | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ආර්. ද සිල්වා මිය | 14 |
| **පීඨාධිපතිවරුන්** | |
| ආචාර්ය පී.එන්.ඩී ප්‍රනාන්දු[1] | 7 |
| මහාචාර්ය ඩබ්ලිව්.එම්.සී.බී. වන්නිනායක / වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය | 7 |
| ආචාර්ය ආර්.එල්.සී.එස්. පුෂ්පකුමාර / පරිගණක හා තාක්ෂණ පීඨය | 14 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න/ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය | 13 |
| ආචාර්ය යූ.එස්. සෙනරත්/ මානවශාස්ත්‍ර පීඨය | 14 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ජේ. ද එස්. හේවාවිසෙන්ති මිය[2] | 11 |
| මහාචාර්ය එම්.එන්. චන්ද්‍රතිලක / වෛද්‍ය පීඨය | 3 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි/ විද්‍යා පීඨය | 14 |
| මහාචාර්ය එම්.එම්. ගුණතිලක / සමාජීය විද්‍යා පීඨය | 14 |
| **සනාතන සභා නාමික** | |
| පූජ්‍ය (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ඉඳුරාගාරේ ධම්මරතන හිමි[3] | 0 |
| මහාචාර්ය ඩබ්ලිව්.එම්. සේමසිංහ | 13 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.එච්.සුමතිපාල | 1 |
| මහාචාර්ය එස්.එස්. වැලිගමගේ මිය | 13 |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පත්වීම්ලාභීන්** | |
| මහාචාර්ය හරිස්චන්ද්‍ර අබේගුණවර්ධන (2020.02.11-2023.01.15) (2023.01.16 -2026.01.15) | 5 |
| රඛිත ශ්‍රී දර්ශන අබේගුණවර්ධන මහතා[4] | 1 |
| මහාචාර්ය රංජිත් අර්ථනායක (2020.02.11-2023.01.15) (2023.01.16-2026.01.15) | 14 |
| සංජය බණ්ඩාර මහතා[5] | 0 |
| එස්.එම්. ගෝඨාභය ජයරත්න මහතා[6] | 1 |
| මහාචාර්ය ආනන්ද පටබැඳිගේ[7] | 1 |
| මහාචාර්ය නිමල් පෙරේරා[8] | 0 |
| මහාචාර්ය රොහාන් රාජපක්ෂ[9] | 1 |
| එල්.ඊ. සුසන්ත සිල්වා (2020.02.11-2023.01.15) (2023.01.16-2026.01.15) | 13 |
| එස්.කේ. සිරිල් සුදුවැල්ල (2020.02.11-2023.01.15) (2023.01.16-2026.01.15) | 13 |
| උපාලි විජයවීර මහතා[10] | 1 |
| මේරි ටී. ඩික්මන් මෙනවිය (2023.01.16-2026.01.15) | 10 |
| පූජ්‍ය වැලමිටියාවේ ඤාණරතන නායක හිමි (2023.01.16-2026.01.15) | 7 |
| මහාචාර්ය කල්‍යාණි පෙරේරා ((2023.01.16-2026.01.15) | 11 |
| සිරි රණසිංහ මහතා (2023.01.16-2026.01.15) | 7 |
| උදය රංජිත් සෙනෙවිරත්න මහතා (2023.01.24-2026.01.15) | 13 |
| ටී.ආර්. වරුණ ධනපාල මහතා (2023.06.08-2026.01.15) | 7 |
| අනුජ කෞශික ප්‍රේමරත්න මහතා (2023.06.08-2026.01.15) | 3 |
| **සභාවේ ලේකම් - ලේඛකාධිකාරී (නිල බලයෙන්)** | |
| කේ.කේ.කේ. ධර්මතිලක මහතා | 14 |

1 ආචාර්ය පී.එන්.ඩී. ප්‍රනාන්දු මහතාගේ පත්වීම් කාලය 2023 ජූනි 09 දිනෙන් අවසන් විය.
2 ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ජේ. ද එස්. හේවාවිසෙන්ති මහත්මියගේ පත්වීම් කාලය 2023 සැප්තැම්බර් 22 දින අවසන් විය.
3 පූජ්‍ය (ජ්‍යෙෂ්ඨ මහාචාර්ය) ඉඳුරාගාරේ ධම්මරතන හිමි 2020 ජනවාරි 26 සිට 2023 ජනවාරි 25 දක්වා සනාථන සභාවේ නාමිකයතු විය.
4 රඛිත ශ්‍රී දර්ශන අබේගුණවර්ධන මහතා 2020 පෙබරවාරි 11 සිට 2023 ජනවාරි 15 දක්වා වි.ප්‍ර.කො.ස. මගින් පත් කර ඇත.
5 සංජය බණ්ඩාර මහතා 2020 පෙබරවාරි 11 සිට 2023 ජනවාරි 15 දක්වා වි.ප්‍ර.කො.ස. මගින් පත් කර ඇත.
6 එස්.එම්. ගෝඨාභය ජයරත්න මහතා 2020 පෙබරවාරි 11 සිට 2023 ජනවාරි 15 දක්වා වි.ප්‍ර.කො.ස. මගින් පත් කර ඇත.
7 මහාචාර්ය ආනන්ද පටබැඳිගේ 2020 පෙබරවාරි 11 සිට 2023 ජනවාරි 15 දක්වා වි.ප්‍ර.කො.ස. මගින් පත් කර ඇත.
8 මහාචාර්ය නිමල් පෙරේරා 2020 පෙබරවාරි 11 සිට 2023 ජනවාරි 15 දක්වා වි.ප්‍ර.කො.ස. මගින් පත් කර ඇත.
9 මහාචාර්ය රොහාන් රාජපක්ෂ 2020 පෙබරවාරි 11 සිට 2023 ජනවාරි 15 දක්වා වි.ප්‍ර.කො.ස. මගින් පත් කර ඇත.
10 උපාලි විජයවීර මහතා 2020 පෙබරවාරි 11 සිට 2023 ජනවාරි 15 දක්වා වි.ප්‍ර.කො.ස. මගින් පත් කර ඇත.





## 2.3. සනාතන සභාව

සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන අධිකාරිය වන අතර උපකුලපතිවරයා නිලබලයෙන් සනාතන සභාවේ සභාපතිවරයා ද වේ. පුරාවිද්‍යා පශ්චාද් උපාධි ආයතනයේ (PGIAR) සහ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාද් උපාධි ආයතනයේ (PGIPBS) අධ්‍යක්ෂවරුන්, පීඨාධිපතිවරුන්, අධ්‍යයන අංශ ප්‍රධානීන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් සහ මහාචාර්යවරුන්, පුස්තකාලයාධිකාරී සහ අදාළ පීඨයේ ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතරින් තේරී පත්වන අධ්‍යයන සාමාජිකයින් දෙදෙනෙකුගෙන් ද සනාතන සභාව සමන්විත වේ.

සනාතන සභාව මගින් එහි රාජකාරි කටයුතු ඉටු කිරීමේ දී, පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා ස්ථාවර කමිටු කිහිපයක් පත් කර ඇත. එක් එක් කමිටුවේ සංයුතිය සහ අභිනියෝගය පිළිබඳ වැඩිදුර විස්තර මෙම වාර්තාවේ 2.7 වගන්තියේ දක්වා ඇත.

- ඇතුළත් කිරීම්
- විෂයමාලාව, ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම
- ගෞරව උපාධි
- නිවාඩු සහ සම්මාන
- පුස්තකාලය
- තත්ත්ව ආරක්ෂණය
- පර්යේෂණ සහ ප්‍රකාශන

## 2.4. පීඨ මණ්ඩල

සනාතන සභාවේ පාලනයට යටත්ව අදාළ පීඨවල ඉගැන්වීම්, විභාග සහ පර්යේෂණ සම්බන්ධ කරුණු නියාමනය කරනු ලබන්නේ පීඨ මණ්ඩල මගිනි. සියලුම අධ්‍යයන අංශ අදාළ පීඨ මණ්ඩලයේ විෂය පථය යටතට ඇතුළත් වේ. අදාළ අධ්‍යයන අංශයේ විෂයමාලා සංවර්ධනය, ඉගැන්වීම්, ඇගයීම්, පර්යේෂණ සහ අනෙකුත් අදාළ අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් අධ්‍යයන අංශ වගකිව යුතු වේ.

## 2.5. පාලන ලේඛනඃ උපාය මාර්ගික සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2022-2024 සඳහා වන උපායමාර්ගික සැලැස්ම පිළියෙළ කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ අත්‍යවශ්‍ය ආයතනික තීරණවලට බලපෑම් කරමින්, කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ ප්‍රමුඛ අවශ්‍යතා ඉටු කරන අතරම ඉදිරි වසර තුන සඳහා විශ්වවිද්‍යාලයේ සමස්ත දැක්ම එහි හවුල්කරුවන් සමඟ බෙදා ගැනීමට හැකි වන පරිදි ප්‍රායෝගික, තාත්වික සහ අදාළ වන පරිදිය. ඉදිරි වසර තුන තුළ විශ්වවිද්‍යාලයේ කටයුතු මෙහෙයවනු ලබන වටිනාකම් මාලාවක් ප්‍රකාශ කිරීමේ වේදිකාවක් ලෙස ද මෙය ක්‍රියා කරයි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් 2022-2024 කාලසීමාව සඳහා විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්මට අනුකූලව 2023 සඳහා වන ක්‍රියාකාරකම් කෙරෙහි සෘජුවම අවධානය යොමු කර ඇත. උපායමාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම ද විශ්වවිද්‍යාල පාලක සභාව විසින් අනුමත කර ඇත.

# 2.6. ව්‍යවස්ථාපිත කමිටු

## 2.6.1. මූල්‍ය කමිටුව

මූල්‍ය හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් මූල්‍ය කමිටුවක් (FC) පත් කර ඇත. මූල්‍ය කමිටුවේ සංයුතිය පහත දක්වා ඇති පරිදි වේ.

- උපකුලපති - සභාපති
- සියලුම පීඨවල පීඨාධිපතිවරු
- පාලක සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු
- ලේඛකාධිකාරී
- මූල්‍යාධිකාරී (කැඳවුම්කරු)

මූල්‍ය කමිටුව මසකට වරක් රැස්වී විශ්වවිද්‍යාලයේ මූල්‍ය සම්බන්ධ සියලු කාරණා සම්බන්ධයෙන් තීරණ ගනියි. වැඩසටහන් අයවැය ඇතුළු සියලුම මූල්‍ය කටයුතු පාලන රෙගුලාසිවලට අනුකූලව සහ විශ්වවිද්‍යාල සංවර්ධන සැලැස්මට අනුව නිසි ලෙස ඇගයීමට ලක් කෙරේ. මූල්‍ය කමිටුවේ නිර්දේශ පාලක සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ. උපකුලපතිවරයා, පීඨාධිපතිවරුන්, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, අධ්‍යයන අංශ ප්‍රධානීන්, අංශ ප්‍රධානීන් හෝ සනාතන සභාව විසින් යොමු කරන ලද කරුණු මූල්‍ය කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. මූල්‍ය කමිටුව යනු පාලක සභාවේ අනුකමිටුවලින් එකකි.

## 2.6.2. ප්‍රසම්පාදන කමිටු

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා එහි පසුකාලීන සංශෝධනවලට අනුකූලව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) කැලණිය විශ්වවිද්‍යාලය සඳහා ද පත් කර ඇත. මේ අනුව, ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සහ සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව වශයෙන් විශ්වවිද්‍යාලය තුළ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (DPC) වර්ග දෙකක් ක්‍රියාත්මක වේ. වත්මන් මාර්ගෝපදේශවලට අනුව සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් රුපියල් මිලියන 5 ට අඩු ප්‍රසම්පාදන සිදු කරන අතර ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව රුපියල් මිලියන 200 දක්වා ප්‍රසම්පාදන සිදු කරයි. මසකට වරක් රැස්වන ප්‍රධාන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව කමිටුවේ සභාපතිවරයා ද වන උපකුලපතිවරයාගෙන් ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද සාමාජිකයෙකුගෙන් සහ 3 වන සාමාජිකයා වශයෙන් මූල්‍යාධිකාරීවරයාගෙන් ද සමන්විත වේ. සතියකට වරක් රැස්වන සුළු දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ කමිටු සභාපතිවරයා වන උපකුලපතිවරයා ද, සාමාජිකයන් වන ලේඛකාධිකාරී සහ මූල්‍යාධිකාරී ද කටයුතු කරති. එමෙන්ම, ශ්‍රී ලංකා රුපියල් 500,000/- දක්වා ප්‍රසම්පාදන භාර ගැනීම සඳහා පාලක මණ්ඩලය විසින් සැපයුම් කමිටුවක් (SC) ද පත් කරනු ලබයි. ලෝක බැංකුව මගින් අරමුදල් සපයනු ලබන AHEAD ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද ප්‍රසම්පාදන අධීක්ෂණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරන ලද ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවක් (PPC) ද විශ්වවිද්‍යාලය තුළ ක්‍රියාත්මක වේ.

## 2.6.3. විගණන කමිටුව

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක P.E.D./31 අනුව, විගණන කමිටුව අවම වශයෙන් වසරකට හතර වතාවක් රැස්විය යුතු වේ. විගණන කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු කාර්යක්ෂමව සිදු කිරීම සහ ඒ ආශ්‍රිත කළමනාකරණ කටයුතු සිදු කිරීමට විශ්වවිද්‍යාල පාලක සභාවට සහාය වීමයි.

මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය සහ අධීක්ෂණය, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වාගෙන යාම, විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු හා සම්බන්ධ ඕනෑම කරුණක් පරීක්ෂා කිරීම, වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩසටහන් අනුමත කිරීම, අභ්‍යන්තර විගණන සැලැස්ම සහ වැඩසටහන





අධීක්ෂණය කිරීම, බාහිර හා අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශ පිළිබඳ පසු විපරම් සිදු කිරීම විගණන කමිටුවේ ප්‍රධාන වගකීම් වේ. එමෙන්ම, ඵලදායි කාර්යසාධනය සහතික කිරීම සඳහා පද්ධති පාලනයන්ට අනුකූල වීම සමාලෝචනය කිරීම, අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම, පිරිවැය-ඵලදායීතාවය සඳහා නියමිත කාල පරාස තුළ කාර්යසාධනය සමාලෝචනය කිරීම සහ නාස්තිකාර වියදම් අවම කිරීම යනාදිය, සහ ප්‍රඥප්ති, රෙගුලාසි, නීතිරීති සහ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කරනු ලබන්නේ ද යන්න නිශ්චය කර ගැනීම විගණන කමිටුවේ සියලු වගකීම්වලට අයත් වේ.

වගුව 2: 2023 වර්ෂය තුළ පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව

| ව්‍යවස්ථාපිත කමිටු | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව |
|---|---|
| විශ්වවිද්‍යාල පාලක සභාව | 14 |
| සනාතන සභාව | 12 |
| මූල්‍ය කමිටුව | 12 |
| ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) | 16 |
| ප්‍රසම්පාදන කමිටුව (සුළු) | 44 |
| විගණන කමිටුව | 6 |

# 2.7. සනාතන සභාවේ ස්ථාවර කමිටු

**ඇතුළත් කිරීමේ කමිටුව** උපකුලපතිවරයා සහ සියලුම පීඨාධිපතිවරුන්ගෙන් සමන්විත වන අතර අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. සෑම වසරකම විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන එක් එක් උපාධි පාඨමාලා සඳහා උපාධි අපේක්ෂකයින් ඇතුළත් කර ගැනීම සඳහා පවතින ස්ථාන සංඛ්‍යාව සම්බන්ධයෙන් මෙම කමිටුව විසින් සනාතන සභාව හරහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කරයි.

**විෂයමාලා, ඉගෙනුම්, ඉගැන්වීම් සහ ඇගයීම් කමිටුව** උපකුලපතිවරයා, සියලුම පීඨාධිපතිවරුන්, ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් සහ මහාචාර්යවරුන්ගෙන් සමන්විත වන අතර, අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා ලේකම්වරයා සහ කැඳවුම්කරු ලෙස කටයුතු කරයි. මසකට වරක් රැස්වන කමිටුව නව පාඨමාලාවල විෂයමාලා, පවතින පාඨමාලාවල විෂයමාලා සඳහා සිදු කළ යුතු සංශෝධන සහ අනෙකුත් අධ්‍යයන කටයුතු සම්බන්ධයෙන් සනාතන සභාවට නිර්දේශ ඉදිරිපත් කරයි.

**ගෞරව උපාධි කමිටුව** සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර, ඔවුන් සෑම පීඨයකින්ම නම් කරන ලද ජ්‍යෙෂ්ඨ විද්වතුන් වන අතර, එහි සභාපතිත්වය දරනු ලබන්නේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකයා විසිනි. ගෞරව උපාධි පිරිනැමීම සඳහා පීඨ මණ්ඩල විසින් කරන ලද නාමයෝජනා සමාලෝචනය කිරීමට සහ නාමයෝජනා අදාළ රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධයෙන් සනාතන සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීමට අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා අවශ්‍ය පරිදි රැස්වීම් කැඳවයි.

**නිවාඩු සහ සම්මාන කමිටුව** උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්ගෙන් සමන්විත වන අතර, අධ්‍යයන ආයතන අංශය භාර විධායක නිලධාරියා මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු වශයෙන් කටයුතු කරයි. අදාළ රෙගුලාසිවලට අනුකූල වීම කෙරෙහි ද, අදාළ අධ්‍යයන අංශයේ අවශ්‍යතා සම්බන්ධයෙන් ද විශේෂ අවධානයක් යොමු කරමින්, අධ්‍යයන කාර්ය මණ්ඩලය ස්ථිර කිරීම, අවශ්‍ය අවස්ථාවල පරිවාස කාලය දීර්ඝ කිරීම මෙන්ම අධ්‍යයන නිවාඩු සහ සබත් නිවාඩු ඉල්ලීම් පිළිබඳ කරුණු සමාලෝචනය කිරීමට කමිටුව මසකට වරක් රැස්වේ.

**පුස්තකාල කමිටුව** සමන්විත වන්නේ උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්, පුස්තකාලයාධිකාරී, විශ්වවිද්‍යාල පුස්තකාලවල සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩලය මෙන්ම සෑම පීඨ මණ්ඩලයකින්ම එක් නාමිකයෙකුගෙන් ය. පුස්තකාලයට අනුයුක්ත කර ඇති විධායක නිලධාරියා මසක් හැර මසක් රැස්වන මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු වේ. පුස්තකාල කමිටුව විශ්වවිද්‍යාලයේ සියලුම සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පුස්තකාලය මගින් ඉගෙනුම් සම්පත් ලබාදීමට අදාළ සියලු කටයුතු සිදු කරයි.

**තත්ත්ව ආරක්ෂණය පිළිබඳ සනාතන සභා ස්ථාවර කමිටුව** සමන්විත වන්නේ උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයින් අතරින් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් නම් කරන ලද සාමාජිකයන් දෙදෙනෙකු, ලේඛකාධිකාර සහ මූල්‍යාධිකාරී, විශ්වවිද්‍යාල තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාලයේ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යක්ෂවරයා, විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ, උපාය මාර්ගික සැලසුම් සහ සංඛ්‍යාලේඛන සඳහා වූ විශ්වවිද්‍යාල මධ්‍යස්ථානයේ අධ්‍යක්ධ සහ සෑම පීඨයකම තත්ත්ව සහතිකකරණ සම්බන්ධීකාරකවරුන්ගෙනි. විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන සියලුම අධ්‍යයන වැඩසටහන්වල අභ්‍යන්තර හා බාහිර තත්ත්ව සහතිකකරණයට අදාළ කරුණු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මසකට වරක් රැස් වන මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු අධ්‍යයන අංශය භාර විධායක නිලධාරියා වේ.

**පර්යේෂණ සහ ප්‍රකාශන කමිටුව** උපකුලපතිවරයා සහ පීඨාධිපතිවරුන්ගෙන් සහ එක් එක් පීඨ මණ්ඩලයේ නාමිකයෙකුගෙන් සමන්විත වේ. මසකට වරක් රැස්වන මෙම කමිටුවේ ලේකම්වරයා සහ කැඳවුම්කරු පර්යේෂණ සහ ප්‍රකාශන අංශය භාර විධායක නිලධාරියා වේ. භාණ්ඩාගාර අරමුදල්වලින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට පර්යේෂණ ප්‍රදාන ලබා දීම සහ උපාධි අපේක්ෂක වැඩසටහන්වල අත්‍යවශ්‍ය අංගයක් වන ක්ෂේත්‍ර චාරිකා සඳහා අරමුදල් ලබා දීම සම්බන්ධයෙන් කමිටුව නිර්දේශ ඉදිරිපත් කරයි. මෙම කමිටුව එම ප්‍රදාන භාවිතා කිරීමේ ප්‍රගතිය පිළිබඳව අධීක්ෂණය කරන අතර විශ්වවිද්‍යාල ප්‍රකාශන සඳහා විශ්වවිද්‍යාල අරමුදල් බෙදා හැරීම සම්බන්ධයෙන් නිර්දේශ ද ඉදිරිපත් කරයි.

## 2.8. පර්යේෂණ සඳහා වන ආචාර ධර්මානුකූල ප්‍රමිති

විශ්වවිද්‍යාලය සතුව ආචාර ධර්ම සමාලෝචන කමිටු (ERC) දෙකක් ඇත. වෛද්‍ය පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව උපාධි අපේක්ෂකයින්, පශ්චාද් උපාධි සිසුන්, විද්වතුන් සහ පුළුල් පර්යේෂක ප්‍රජාව අතර පර්යේෂණ ආචාර ධර්ම ප්‍රවර්ධනය කිරීම සඳහා 1995 වර්ෂයේ දී ස්ථාපනය කරන ලදී. එහි මූලික පරමාර්ථය වන්නේ ජෛව වෛද්‍ය පර්යේෂණ සඳහා සහභාගී වන මිනිසුන්ගේ ආරක්ෂාව සැලසීමය. මෙය සාක්ෂාත් කර ගනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ආචාර ධර්ම සමාලෝචන කමිටු සංසදයේ (FERCSL) මාර්ගෝපදේශ සහ අනෙකුත් අදාළ ජාතික සහ ජාත්‍යන්තර නීති සම්පාදන සහ මාර්ගෝපදේශ අනුව සිදු කෙරෙන සමාලෝචන සහ අධීක්ෂණ ක්‍රියාවලි මගිනි.

කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව උසස් තත්ත්වයේ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2016 වර්ෂයේ දී ස්ථාපනය කරන ලද අතර එහි දැක්ම සහ මෙහෙවර තුළ අන්තර්ගතව ඇති ඉහළම ආචාර ධර්ම ප්‍රමිති පවත්වාගෙන යාමට එම කමිටුව කැපවී සිටියි. කැලණිය විශ්වවිද්‍යාලයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව මගින් වාණිජ හා කළමනාකරණ, පරිගණක හා තාක්ෂණ, උපාධි අධ්‍යයන, මානව ශාස්ත්‍ර, විද්‍යා සහ සමාජ විද්‍යා පීඨ මගින් සිදු කරනු ලබන පර්යේෂණවලට අදාළ පර්යේෂණ ආචාර ධර්මවල අංශ කිහිපයක් ආවරණය කරයි.





## 2.9. සෞඛ්‍යය, ආරක්ෂාව සහ යහපැවැත්ම

විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය සේවාව විශ්වවිද්‍යාල සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට රෝගවලින් තොර ක්‍රියාශීලී ජීවිතයක් ගත කිරීමට උපකාර කිරීම සඳහා සංවිධානය කර ඇති අතර එය සිසුන්ගේ සමාජ යහපැවැත්ම සඳහා දායක වන අතර විස්තීර්ණ වෛද්‍ය සහ රෝග නිවාරණ සෞඛ්‍ය සේවාවක් සපයයි. "සුළු රෝගාබාධ සඳහා ද ප්‍රමාණවත් ප්‍රතිකාර සහ සැලකිල්ලක් දැක්වීමෙන් බරපතල රෝග ඇතිවීම වැළැක්විය හැකි වන අතර පන්තිවලට නොපැමිණීමේ අනුපාතය අවම කිරීම සහ අන් අයට ආසාදනය පැතිරීම පාලනය කිරීම" විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථාන කළමනාකරණයේ ප්‍රධාන අරමුණු වේ.

විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය මධ්‍යස්ථානය සාමාන්‍ය රෝහලක "බාහිර රෝගී" අංශයක් (OPD) ලෙස ක්‍රියාත්මක වන අතර, සියලුම උපාධි අපේක්ෂකයින්ගේ ද, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මෙන්ම ඔවුන්ගේ සමීප ඥාතීන්ගේ ද සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලයි. සියලුම ලියාපදිංචි සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට නොමිලේ උපදේශන, නොමිලේ මූලික ඖෂධ, රසායනාගාර සේවා සහ වෙනත් සේවාවන් ලබා ගැනීම සඳහා හිමිකම් ඇත.

රෝගීන්ව ඔවුන්ගේ අවශ්‍යතා සහ තත්ත්වය අනුව අදාළ සායනයට යොමු කිරීම හෝ තෘතියික සත්කාර සඳහා රෝහල් වෙත මාරු කිරීම හෝ මෙහිදී සිදු කළ හැකිය. මෙම සේවාවන් සැපයීම සඳහා, සෞඛ්‍ය මධ්‍යස්ථානයේ සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක්, සියලු පහසුකම්වලින් සමන්විත රසායනාගාරයක්, ඖෂධාගාරයක් සහ අවශ්‍ය අනෙකුත් පහසුකම් ද පවතී.

ඊට අමතරව, මෙම සෞඛ්‍ය මධ්‍යස්ථානයේ දන්ත සායනයක් සහ ආයුර්වේද වෛද්‍ය පහසුකම් ද පවතී.

මානසික සෞඛ්‍ය සායනය සඳහා පහසුකම් සපයනු ලබන්නේ වෛද්‍ය පීඨයේ මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යනාංශය මගිනි. විශේෂයෙන් තරුණ තරුණියන් අතර මානසික ගැටලු ඇති වන ක්ෂේත්‍ර සම්බන්ධ සියලුම උපදේශන සැසි සහ ප්‍රතිකාර උපදේශක මනෝ වෛද්‍යවරුන් විසින් සිදු කරනු ලබන අතර ඒ සම්බන්ධයෙන් දැඩි රහස්‍යභාවයක් පවත්වා ගෙන යනු ලැබේ.

තවද, වෛද්‍ය මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාල ප්‍රජාවගේ නිවාරණ වෛද්‍ය ප්‍රතිකාර සහ ප්‍රජා සෞඛ්‍ය සම්බන්ධයෙන් පසු විපරම් කිරීම සහ නිරීක්ෂණය කිරීම සිදු කරයි. COVID-19, ඩෙංගු උණ සහ ආහාර මගින් බෝවන රෝග වැනි බෝවන රෝග ව්‍යාප්ත වන අවස්ථාවලදී, විශ්වවිද්‍යාල වෛද්‍ය මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාල ප්‍රජාව වෙනුවෙන් රෝග වැළැක්වීමේ පියවර සහ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කරයි.

මීට අමතරව, ක්‍රීඩා ක්‍රියාකාරකම්වලට සම්බන්ධ සිසුන්ගේ මෙන්ම අධ්‍යාපන කටයුතු සඳහා හෝ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ හෝ තරඟාවලි සඳහා සහභාගී වීමට විදේශගත වන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ/හෝ ශිෂ්‍යයන්ගේ යෝග්‍යතාවය සහතික කිරීම සඳහා විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් වෛද්‍ය පරීක්ෂණ පවත්වයි. විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී (CMO) විසින් සේවයේ නියුක්ත වීම සඳහා සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය තහවුරු කිරීම සහ වෛද්‍ය පරීක්ෂණවල සොයාගැනීම් මත පදනම්ව කාර්ය මණ්ඩලයේ සේවා දීර්ඝ කිරීම සඳහා ද වගකීම දරයි. සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සියලුම වෛද්‍ය සහතික ප්‍රධාන වෛද්‍ය නිලධාරී (CMO) විසින් ඇගයීමට ලක් කර සහතික කරනු ලබයි.

## 2.10. තත්ත්ව සහතික කිරීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 2019/09 යටතේ ස්ථාපනය කරන ලද තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) මගින් විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සපයනු ලබයි. අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් කටයුතු කරන තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) තත්ත්ව සහතික කිරීමේ සනාතන සභා ස්ථාවර කමිටුව (SSC-QA) මගින් මෙහෙයවනු ලබයි. පීඨ හය තුළම පීඨ තත්ත්ව සහතික කිරීමේ ඒකක (FQACs) ස්ථාපනය කර ඇත. පීඨ තත්ත්ව සහතික කිරීමේ ඒකක (FQACs) හයට අමතරව, 2022 වර්ෂයේ දී, IQAC-CDCE, සහ IQAC-ADMIN, උපාධි අධ්‍යයන පීඨයේ (IQAC-FGS) සහ පුස්තකාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකක ද ස්ථාපනය කර ඇත. තත්ත්ව සහතික කිරීමේ සනාතන සභා ස්ථාවර කමිටුව (SSC-QA) මාසිකව රැස්වන අතර එහිදී පරිචය අභ්‍යන්තරීකරණය කිරීම වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම සම්බන්ධයෙන් යහපත් පරිචයන් බෙදා ගනිමින් පීඨ තත්ත්ව සහතික කිරීමේ ඒකක (FQACs) හතේ ප්‍රගතිය සහ IQAC තුනේ ප්‍රගතිය පිළිබඳව SSC-QA වෙත වාර්තා කරනු ලබයි.

2023 වර්ෂයේදී, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය මගින් පහත සඳහන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කරන ලදී.

### 2.10.1. බාහිර සමාලෝචන

- සමාලෝචන නිර්දේශ සැලකිල්ලට ගනිමින්, ආයතනික සමාලෝචන - 2021 සඳහා ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම 65% ක් වී තිබුණි.
- පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ BSc සහ BSc ගෞරව උපාධි වැඩසටහන් මෙන්ම කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ BSc සහ BSc ගෞරව උපාධි වැඩසටහන් පිළිබඳ වැඩසටහන් සමාලෝචනය සඳහා ක්‍රියාකාරී සැලසුම් පිළියෙළ කරන ලද අතර එම සැලසුම් පීඨ මණ්ඩලය සහ සනාතන සභා මණ්ඩලය මගින් අනුමත කරන ලදී. ලේඛන දෙකම QAC, UGC වෙත ඉදිරිපත් කර ඇත.
- බාහිර උපාධි වැඩසටහන් (EDPs): BA, BCom, BBMgt, සහ BSc (භෞත චිකිත්සාව) සඳහා ක්‍රියාකාරී සැලසුම් සනාතන සභාව විසින් පිළියෙළ කර අනුමත කරන ලදී. මෙම ලේඛන තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.
- මානවශාස්ත්‍ර පීඨය, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, සමාජීය විද්‍යා පීඨය සහ වෛද්‍ය පීඨය (MBBS වැඩසටහන) සඳහා වැඩසටහන් සමාලෝචන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සනාතන සභාව විසින් අනුමත කරන ලද අතර ඒවා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

### 2.10.2. ප්‍රතිපත්ති ලේඛන සහ මාර්ගෝපදේශ පිළියෙළ කිරීම

- කැලණිය විශ්වවිද්‍යාලයේ සුදුසුකම් රාමුව සංශෝධනය කරන ලදී.
- අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කාර්යසාධන ඇගයීම් පද්ධතිය පිළිබඳ ප්‍රතිපත්තිය.
- පශ්චාද් උපාධි නිබන්ධන අධීක්ෂණ ප්‍රතිපත්තිය.
- මානව සම්පත් ප්‍රතිපත්තියක් සංවර්ධනය වෙමින් පවතී.
- පරිපාලන අංශ සඳහා කාර්ය පටිපාටි අත්පොත සකස් කිරීම සිදු වෙමින් පවතී.

### 2.10.3. වැඩමුළු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

2023 වර්ෂයේ දී තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) මගින් අංශ කිහිපයක් සම්බන්ධයෙන් වැඩමුළු සහ පුහුණු සැසි පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලදී.

- අධ්‍යයන කාර්ය මණ්ඩල කාර්යසාධන ඇගයීම් පද්ධතිය.
- තත්ත්ව සහතික කිරීමේ දි පරිපාලන නිලධාරීන්ගේ කාර්යභාරය.
- විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය.





## 2.11. විශ්වවිද්‍යාලය 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුකූලව කටයුතු කිරීම

### 2.11.1. නිකුත් කරන ලද තොරතුරු පිළිබඳ විස්තර

කැලණිය විශ්වවිද්‍යාලයේ කළමනාකාරිත්වය විසින් රජයේ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතේ විධිවිධානවලට අනුකූල වීමේ වැදගත්කම හඳුනා ගන්නා ලදී. එය විශ්වවිද්‍යාල තීරණවල විනිවිදභාවය පිළිබඳ මූලධර්මයට ද අනුකූල විය. එබැවින්, කැලණිය විශ්වවිද්‍යාලය විසින් 2023 වසරේ ඉල්ලා සිටි කරුණු කිහිපයකට අදාළ සියලු තොරතුරු නිකුත් කර ඇත. එම ඉල්ලීම් පිළිබඳ විස්තර සහ විශ්වවිද්‍යාල තොරතුරු නිකුත් කිරීම පහත දක්වා ඇත (වගුව 3).

වගුව 3: තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනතට අනුව 2023 වර්ෂයේ දී තොරතුරු නිකුත් කිරීම

| තොරතුරු ඉල්ලුම් කරන ලද පුද්ගලයාගේ නම | ඉල්ලීම සිදු කළ දිනය | තොරතුරු ලබා දුන් දිනය | තොරතුරුවල ස්වභාවය |
|---|---|---|---|
| **1. එම්.එන්.එම්. සබ්රින් මහතා** | 2023.01.20 | 2023.03.03 | 2022.04.26 දින හෝ ඊට පසු සිදු කරන ලද නව පත් කිරීම් (තාවකාලික සහ ස්ථිර) පිළිබඳ තොරතුරු |
| **2. බී.ඒ.බී.එස්. ජයවර්ධන මහතා** | 2023.05.31 | 2023.07.13 | ඔහුගේ නිබන්ධනය සඳහා ලබා දුන් ලකුණු පිළිබඳ තොරතුරු |
| **3. යූ.ටී.එම්.අයි.ඩී. තෙන්නකෝන් මිය** | 2023.06.28 | 2023.07.07 | ප්‍රමාද වූ සේ.භා.අ. දායකත්වය සඳහා අධිභාරයක් ගෙවීම පිළිබඳ පරීක්ෂණය පිළිබඳ තොරතුරු |
| **4. පූජ්‍ය ලේල්වල අරියධම්ම හිමි** | 2023.07.09 | 2023.07.12 | පාලි සහ බෞද්ධ අධ්‍යයන දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා 2023.07.17 දිනට නියමිත සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් සභාව විසින් ගනු ලැබූ තීරණ |
| **5. ආචාර්ය එස්.බී.එච්. ප්‍රභාත් ඉන්දික පෙරේරා** | 2023.09.18 | 2023.11.16 | සමාජ විද්‍යාව පිළිබඳ කථිකාචාර්ය (පරිවාස) තනතුර සඳහා තෝරා ගත් අපේක්ෂකයින් වූ ආර්.එම්.ඒ.ඩී.බී. රත්නායක මහතාගේ සහ එච්.එස්.එන්. සිල්වා මහත්මියගේ උපාධිය සහ අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර. |
| **6. පී.ඒ.ඩී.බී. ප්‍රියංකර මහතා** | 2023.11.01 | 2023.11.22 | මානව ශාස්ත්‍ර පීඨයේ නාට්‍ය, සිනමා හා රූපවාහිනී අධ්‍යයන දෙපාර්තමේන්තුවේ කථිකාචාර්ය (පරිවාස)/ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II/I ශ්‍රේණිය) සහ කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුරු සඳහා තේරීම් කමිටුවේ තොරතුරු |

| | | |
|---|---|---|
| 2023 වර්ෂය තුළ ලැබුණු මුළු ඉල්ලීම් සංඛ්‍යාව | - | 06 |
| 2023 වර්ෂය තුළ තොරතුරු ලබා නොදුන් මුළු අවස්ථා ගණන | - | 00 |
| ඒ අනුව, 2023 වර්ෂය තුළ මුළු ප්‍රතිචාර සංඛ්‍යාව | - | 06 |
| මුළු ප්‍රතිචාර සංඛ්‍යාව ඉල්ලීම්වල ප්‍රතිශතයක් ලෙස | - | 100% |

## 2.12. අවදානම් කළමනාකරණය

### 2.12.1. රජයේ නියෝගවල වෙනස්කම්

රජයේ නියෝගවලට අනුව, විශ්වවිද්‍යාල විසින් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා සිදු කළ යුතුය. කෙසේ වුවද, එවැනි අවබෝධතා ගිවිසුම් සැකසීම සඳහා යෝජිත යාන්ත්‍රණය ඉතා දුෂ්කර වන අතර සාධාරණීකරණය නොකළ හැකි ප්‍රමාදයන් හෝ අඩුපාඩු කිහිපයක් හේතුවෙන් විදේශීය විශ්වවිද්‍යාල හෝ සංවිධානවල අවශ්‍යතා සපුරාලිය නොහැකිය. මේ අතර, 1978 අංක 16 දරන වත්මන් විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීම සඳහා ඉහළ බලධාරීන් විසින් සාකච්ඡා කරන ලද අතර 2023 වසර අවසානය වන තුරු සංශෝධන අවසන් කර නොතිබුණි. යෝජිත වෙනස්කම් වසර පුරා ප්‍රමාද වීම හෝ නැවතී තිබීම හේතුවෙන් විශ්වවිද්‍යාල කළමනාකාරිත්වයට එහි අධ්‍යයන කටයුතු සහ සෙසු වැඩසටහන් සැලසුම් කිරීමේ දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය. කෙසේ වුවද, විශ්වවිද්‍යාල ප්‍රතිපත්තිවල යෝජිත වෙනස්කම්, වෙනස්කම් කළමණාකරණ දෘෂ්ටිකෝණයට අනුව අභියෝගාත්මක විය. ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතුවෙන් ඇති වන නව සේවා තත්ත්වවලට කාර්ය මණ්ඩලය හුරු කිරීම සහතික කිරීම සඳහා පුළුල් පුහුණු හා සංවර්ධන වැඩසටහන් අවශ්‍ය විය. මේ සඳහා විශ්වවිද්‍යාල පාර්ශ්වයෙන් අමතර ආයෝජන අවශ්‍ය විය.

### 2.12.2. විශ්වවිද්‍යාල මෙහෙයුම් කටයුතු සඳහා ආර්ථික පසුබෑමේ බලපෑම

2022 වර්ෂයේ දි ඇති වූ ආර්ථික අර්බුදයේ සෘණාත්මක බලපෑම් සහ ඉන් අනතුරුව ඇති වූ බාධා හේතුවෙන් 2023 වර්ෂය මුළුල්ලේ කැලණිය විශ්වවිද්‍යාලයට අඛණ්ඩ බලපෑම් ඇති විය. ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2022 සහ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 4/2022 ඇතුළුව මුදල් අමාත්‍යාංශය විසින් 2022 වර්ෂයේ දී නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව කැලණිය විශ්වවිද්‍යාලය කටයුතු කරන ලදි. එම චක්‍රලේඛ මගින් පනවන ලද සීමා හේතුවෙන් විශ්වවිද්‍යාලයේ පරිපාලනයට 2023 වසර සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට සිදු වූ අතර එය විශ්වවිද්‍යාලයේ වර්ධනයට සහ තිරසාරභාවයට අභියෝගාත්මක වූ කරුණක් විය.

### 2.12.3. මූල්‍ය සම්පත් ප්‍රතිපාදනවල පරතර

රජය මගින් මූල්‍ය සම්පත් ප්‍රතිපාදනවල දැඩි සීමා ඇති කිරීම හේතුවෙන් 2023 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්මට ප්‍රබල බලපෑමක් සිදු විය. රජයේ අරමුදල් සීමිත සැපයුමක් පැවතීම හේතුවෙන්, විශේෂයෙන්ම ප්‍රාග්ධන වියදම් සම්බන්ධ ක්‍රියාකාරකම්වලට ප්‍රමුඛත්වය ලබා දීමට විශ්වවිද්‍යාලයට සිදු විය. උසස් තත්ත්වයේ පර්යේෂණ දිරිමත් කිරීම සහ භෞතික හා ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම වැනි 2022-2024 උපායමාර්ගික සැලැස්ම තුළ ආරම්භ කරන ලද ඉදිරි ක්‍රියාමාර්ග අඛණ්ඩව සිදු කිරීම අභියෝගාත්මක වූ අතර, විශ්වවිද්‍යාලය මගින් උපයන ආදායම ප්‍රවේශමෙන් භාවිතා කිරීමට විශ්වවිද්‍යාලයට සිදු විය. රජයේ ඩිජිටල් පරිවර්තන නියෝගවලට අනුකූල වීමට විශ්වවිද්‍යාලය සමත් වූ නමුත් අරමුදල් හිඟය හේතුවෙන් විශ්වවිද්‍යාලයේ සැලසුම් ඒවායේ උපරිම ධාරිතාවෙන් ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි විය. මුදල් අමාත්‍යාංශයෙන් ලැබෙන සීමිත වූ ප්‍රදාන සහ විශ්වවිද්‍යාල පර්යේෂණ ව්‍යාපෘතිවලට සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පත්‍රිකා ප්‍රකාශනය කිරීමට සහාය ලබා දෙන අතරම විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව අතර ඇති පරතරය සඳහා අරමුදල් සැපයීම සඳහා විශ්වවිද්‍යාලය මගින් උත්පාදනය කරන ලද ආදායම පූර්ණ වශයෙන් උපයෝගී කර ගන්නා ලදී.





### 2.12.4. කාර්ය මණ්ඩල සචලතාව

දුෂ්කර ආර්ථික තත්ත්ව හේතුවෙන් ඉහළ කාර්ය මණ්ඩල සචලතාවක් සිදු වීම 2023 වර්ෂයේ සැලකිය යුතු අභියෝගයක් විය. නිසි පුහුණුව ලත් සහ පළපුරුදු අනධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉල්ලා අස් වීම් සිදු වන අතරතුර, අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය අතර ඉල්ලා අස්වීමේ /සේවය අතහැර යෑම / සබත් නිවාඩු ලබා ගැනීමේ කැපී පෙනෙන ප්‍රවණතාවක් 2023 වර්ෂයේ දී නිරීක්ෂණය කළ හැකි විය. අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ සීමා යම් ප්‍රමාණයකට ලිහිල් කළද, බොහෝ විෂය ක්ෂේත්‍ර / පුහුණු කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා සුදුසු ආදේශක සෙවීම අභියෝගාත්මක කරුණක් විය. විධායක, අධ්‍යයන සහායක සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා බඳවා ගැනීම් නැවැත්වීම හේතුවෙන් කාර්යභාරයේ ප්‍රමාණය සම්බන්ධයෙන් දැනට සිටින කාර්ය මණ්ඩලයට සැලකිය යුතු පීඩනයක් එල්ල විය. අවශ්‍ය සම්පත් ලබා නොදී උපාධි පාඨමාලා සඳහා අලුතින් බඳවා ගැනීම් වැඩි වීම හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් අයහපත් වී ඇත. අත්තිකාරම්, පුද්ගල ආදායම් බද්ද සහ රට තුළ ශීඝ්‍රයෙන් ඉහළ යන ජීවන වියදම හේතුවෙන් විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය රට සහ විශ්වවිද්‍යාලය හැර දමා යෑමට පෙළඹෙති. ඉහත දක්වා ඇති සංකීර්ණ වාතාවරණය හේතුවෙන් පළපුරුදු සහ ඉහළම පුහුණුවක් ලබා ඇති අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් තරඟකාරී මූල්‍ය පැකේජ යටතේ විදේශයන්හි හෝ පෞද්ගලික ආයතනවල රැකියාවේ නියුක්ත වීමට පෙළඹී ඇත.

## 2.13. හරිත පරිචයන්

කැලණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ හරිත විශ්වවිද්‍යාලය වශයෙන් පිළි ගැනීමට පාත්‍ර වෙමින් තිරසාර පරිචයන්හි පුරෝගාමියා බවට පත් වී ඇත. 2014 දෙසැම්බර් 10 වැනි දින පාරිසරික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම සහ ආයතනය පුරා තිරසාරභාවය අභ්‍යන්තරීකරණය කිරීමට ස්ථාවර කැපවීමක් දැක්වීම තුළින් මෙම පිළිග ැනීම ලබා ගැනීමට පියවර ගන්නා ලදී. එතැන් සිට, කැලණිය විශ්වවිද්‍යාලය එහි කටයුතු පාරිසරික, ආර්ථික සහ සමාජ වගකීම් මූලධර්ම සමඟ පෙළගස්වමින්, විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ක්ෂේත්‍රය තුළ පමණක් නොව එහි පුළුල් ප්‍රජාවේ ද සහභාගීත්වය ලබා ගනිමින් ඒ සඳහා සමාරම්භක පියවර ගෙන ඇත.

තිරසාර සංවර්ධනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ කැපවීම එහි විෂයමාලාව, පර්යේෂණ ඉලක්ක, උපාය මාර්ගික තීරණ, කළමනාකරණ පරිචයන් සහ ප්‍රජා ක්‍රියාකාරකම්වලට විධිමත්ව ඇතුළත් වී ඇත. එබැවින්, කැලණිය විශ්වවිද්‍යාලය මගින් විශ්වවිද්‍යාලය තුළ පාරිසරික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා තිරසාර විසඳුම් මධ්‍යස්ථානය ස්ථාපනය කරන ලදී. තිරසාර විසඳුම් මධ්‍යස්ථානයේ දැක්ම වන "යහපත් පාරිසරික ප්‍රවේශයන් සහ භාවිතයන් තුළින් රටේ තිරසාර සංවර්ධනයට දායක වීම" තුළින් විශ්වවිද්‍යාලීය දැක්ම වන "ආසියාවේ ප්‍රමුඛ හරිත විශ්වවිද්‍යාලය බවට පත්වීම" සාක්ෂාත් කර ගැනීමට දායක වීම සඳහා තිරසාර විසඳුම් මධ්‍යස්ථාන කණ්ඩායම අප්‍රතිහත ධෛර්යෙන් කටයුතු කරයි.

තිරසාර විසඳුම් මධ්‍යස්ථානය ආරම්භයේ සිටම එම මධ්‍යස්ථානයේ මෙහෙයුම් කටයුතුවලට අදාළ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සිදු කළ අතර, අභ්‍යන්තර භාවිතයන්, යථාර්ථවාදී ඉලක්ක නියම කිරීම සහ කාර්යසාධනය නිරීක්ෂණය කිරීම යනාදිය ද එම මධ්‍යස්ථානයේ මෙහෙයුම්වලට ඇතුළත් වේ. තිරසාර ඉලක්කවල ජයග්‍රහණ, වගවීම සහතික කිරීම සහ ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සම්බන්ධයෙන් සහතික කිරීම පිළිබඳව විනිවිදභාවයෙන් ක්‍රියා කරමින්, ඒ සම්බන්ධයෙන් වාර්තා තබා ගැනිමට ද තිරසාර විසඳුම් මධ්‍යස්ථානය කටයුතු කරයි. එමෙන්ම, මෙම මධ්‍යස්ථානයේ උපායමාර්ගික අවධානය වන්නේ වසර 2030 වන විට, කැලණිය විශ්වවිද්‍යාලය මගින් එහි ධාරිතාවය තුළ එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සියල්ල සාක්ෂාත් කර ගැනිම සඳහා දායක වීමය. එමෙන්ම, මෙම මධ්‍යස්ථානය සිය දැක්ම සඳහා කේන්ද්‍ර වූ මූලික මූලධර්ම හයක් ක්‍රමෝපායිකව දක්වා ඇත.

ඒ අතරම තිරසාර විසඳුම් මධ්‍යස්ථානය ධනාත්මක ආකල්ප වෙනස් කිරීම සම්බන්ධයෙන් පෙළඹවීමක් ඇති කිරීම, යථාර්ථවාදී ඉලක්ක නියම කිරීම සහ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය මෙහෙයුම් කටයුතු සඳහා පාරිසරික වශයෙන් යහපත් භාවිතයන් සමෝධානය කිරීම කෙරෙහි ක්‍රියාකාරීව අවධානය යොමු කරයි. මෙම මූලධර්ම අවධාරණය කිරීම මගින් කැලණිය විශ්වවිද්‍යාලය සඳහා තිරසාර අනාගතයක් ස්ථාපනය කිරීම වෙනුවෙන් දායක වීම පමණක් නොව, එහි අධ්‍යයන ප්‍රජාව තුළ වගකීම් සහ දැනුවත්භාවය පිළිබඳ සංස්කෘතියක් පෝෂණය කිරීම ද සිදු කරයි.

මෙම මධ්‍යස්ථානය බලශක්තිය, ජලය, වාසස්ථාන සහ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කර ඇති අතර, එම මධ්‍යස්ථානයේ ප්‍රයත්නයන් තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) 17 සමඟ පෙළගස්වා ඇත.

- කාර්යක්ෂම භාවිතය, නැවත භාවිතය සහ ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම මගින් අපද්‍රව්‍ය ජනනය වීම අවම කිරීම.
- කාබනික අපද්‍රව්‍ය සඳහා කොම්පෝස්ට් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.
- ලෝහ, වීදුරු, ප්ලාස්ටික්/පොලිතීන් සහ කඩදාසි එකතු කිරීම සහ ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණ කටයුතු සිදු කරන පුද්ගලයන් මගින් ඒවා විධිමත් පරිදි බැහැර කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.
- වගකිවයුතු අන්දමින් ප්‍රතිචක්‍රීකරණ කටයුතු සිදු කරන පුද්ගලයන් මගින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එකතු කිරීම සහ ඒවා නිසි ලෙස බැහැර කිරීම.
- රසායනික හා සායනික අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිසි ක්‍රම ස්ථාපනය කිරීම.
- නව ගොඩනැගිලි සහ නවීකරණ කටයුතු සඳහා තිරසාර ඉදිකිරීම් මූලධර්ම ප්‍රවර්ධනය කිරීම.
- කාබන් කළමනාකරණ සැලැස්ම ඇතුළු විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් දේශගුණික විපර්යාසවල අහිතකර බලපෑම් අවම කිරීම.
- පරිසර හිතකාමී ප්‍රසම්පාදන සැලසුම් හරහා පාරිසරික බලපෑම් අවම කිරීම.
- වාතයට විමෝචනය කිරීම සහ ජලයට මුදා හැරීම කළමනාකරණය කිරීම සහ අවම කිරීම මගින් දූෂණය වැළැක්වීම.
- වැසි ජල සංරක්ෂණය හඳුන්වා දීම.
- අපජලය එකතු කිරීම, පිරිපහදු කිරීම සහ ගෙවතු වගා කටයුතු සඳහා නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- බලශක්තිය කාර්යක්ෂම අන්දමින් භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම.
- ජෛව විවිධත්ව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම තුළින් වනජීවී වාසස්ථාන නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල පරිශ්‍රය කළමනාකරණය කිරීම.
- පාරිසරික අධ්‍යාපනය ප්‍රාථමික මෙවලමක් ලෙස යොදා ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රජාව අතර සහ සමාජය තුළ පරිසරය කෙරෙහි ගෞරවනීය හැසිරීමක් ප්‍රවර්ධනය කිරීම.

වැනි උපාය මාර්ග අනුගමනය කිරීම මගින් සියලුම පාර්ශ්වකරුවන්ගේ උපරිම සහයෝගය ලබා ගනිමින්, කැලණිය විශ්වවිද්‍යාලය දිවයිනේ ප්‍රමුඛතම හරිත විශ්වවිද්‍යාලය බවට පත් කිරීමට තිරසාර විසඳුම් මධ්‍යස්ථානයට හැකි විය.




වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

## 2.13.1. ජයග්‍රහණ සහ පිළිගැනීම

### UI Green Metric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල ශ්‍රී ලංකාවේ ප්‍රමුඛයා බවට පත්වීම.

තිරසාර විසඳුම් මධ්‍යස්ථානය කැලණිය විශ්වවිද්‍යාලය වෙනුවෙන් වාර්ෂිකව UI GreenMetric ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් සඳහා අයදුම් කරයි. පාරිසරික තිරසාරත්වය සම්බන්ධයෙන් කැලණිය විශ්වවිද්‍යාලය දක්වන කැපවීම මනාව ප්‍රදර්ශනය කරමින් 2023 වර්ෂයේ UI GreenMetric ශ්‍රේණිගත කිරීම් මගින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හරිත විශ්වවිද්‍යාලය බවට කැලණිය විශ්වවිද්‍යාලය පත් විය.

### Green Insights ඊ-සඟරාව

විශ්වවිද්‍යාලයේ තිරසාර මුලපිරීම් කළමනාකරණය කිරීමේ භූමිකාවෙන් ඔබ්බට ගොස්, 2023 ජුනි මාසයේදී ආරම්භ කරන ලද 'Green Insights' වාර්ෂික සඟරාව ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධ කටයුතු ද තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් අභිමානවත්ව ඉදිරියට පවත්වාගෙන යයි. මෙම විද්‍යුත් සඟරාව තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරන පර්යේෂකයන්ට ඔවුන්ගේ කාර්යයන් ප්‍රදර්ශනය කිරීම සඳහා අගනා වේදිකාවක් නිර්මාණය කර ඇත.

### ජල කළමනාකරණය සඳහා කැපවීම

තිරසාර විසඳුම් මධ්‍යස්ථානය විශ්වවිද්‍යාලය තුළ ජල සංරක්ෂණ ප්‍රයත්නයන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙයි, ඒ අනුව වාණිජ හා කළමනාකරණ පීඨ පරිශ්‍රයේ වැසි ජලය රැස්කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. 2023 වර්ෂයේ දී, මෙම සමාරම්භකය මගින් ජලය ලීටර් 50,000 ක් සාර්ථකව රැස් කරන ලදී. විශ්වවිද්‍යාල නේවාසිකාගාරවල අපජලය පිරිපහදු කර එම ජලය ගෙවතු වගාව සඳහා උපයෝගී කර ගනියි. 2018 වර්ෂයේ දී, ශාක තවාන සහ තණ පිට්ටනි සඳහා විසිරි වාරිමාර්ග පද්ධතියක් හඳුන්වා දීම මගින් තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්නා ලදී. ඉඩම් සහ ජල දූෂණ අවදානම සම්බන්ධයෙන් විසඳුම් සෙවීම සඳහා අවසාදිත කළමනාකරණ සැලැස්මක්, අපජල පිරිපහදු කිරීම්, මලාපවහන ජල පිරිපහදු ඒකක සහ ප්‍රතිචක්‍රීකරණය සඳහා පිරිපහදු කළ ජලය වැසිකිළි පිරිසිදු කිරීම සඳහා භාවිතා කිරීම අමතර ආයෝජන සහ සැලසුම්වලට ඇතුළත් වේ - මෙමගින් තිරසාර ජල කළමනාකරණය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ කැපවීම පෙන්නුම් කරයි.

### බලශක්ති කළමනාකරණය සඳහා කැපවීම

බලශක්ති කළමනාකරණය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ කැපවීම ප්‍රබල සමාරම්භක සහ ප්‍රතිපත්ති මාලාවක් තුළින් පැහැදිලි වේ. උෂ්ණත්වය සීමා කිරීම (කාමර උෂ්ණත්වයට වඩා +/- 2 C අඩු වීම) සහ ක්‍රියා විරහිත වේලාවන් (පෙ.ව.10.30 සිට ප.ව. 3.30 දක්වා) යනාදී විචක්ෂණශීලී පිළිවෙත් ඉස්මතු කරමින්, තිරසාර විසඳුම් මධ්‍යස්ථානයේ මෙහෙයවීම යටතේ සහ උපකුලපතිවරයාගේ සහාය ඇතිව විශ්වවිද්‍යාලය මගින් වායු සමීකරණ භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා මාර්ගෝපදේශ ක්‍රියාවට නංවා ඇත. LED බල්බ, ඉන්වර්ටර් වායු සමීකරණ සහ සූර්ය තාක්ෂණය ඇතුළු බලශක්ති කාර්යක්ෂම පියවර අනුගමනය කිරීම තුළින් කැලණිය විශ්වවිද්‍යාලයේ කාබන් පියසටහන අඩු කිරීම සම්බන්ධයෙන් එහි කැපවීම පිළිබිඹු කෙරේ. සියළුම පාර්ශ්වකරුවන් මෙන්ම මහජනතාව දැනුවත් කිරීමේ බහුවිධ වැඩසටහන්, බලශක්තිය නාස්තිය අවම කිරීමේ ක්‍රියාමාර්ග සහ තිරසාර බලශක්ති භාවිතයන් සහ පරිසර සංරක්ෂණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ ප්‍රයත්න ප්‍රදර්ශනය කරමින් කාර්යක්ෂම බලශක්ති භාවිතය සමඟ තාප සුවපහසුව වැඩි කිරීමේ කටයුතු විශ්වවිද්‍යාලයේ සාකල්‍ය ප්‍රවේශයට ඇතුළත් වේ.

එපමණක් නොව, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී ප්‍රවේශය මගින් තිරසාරත්වය සඳහා වන එහි කැපවීම තවදුරටත් විදහා දක්වයි. එමෙන්ම, පරිගණක හා තාක්ෂණ පීඨයේ 250KW ක සැලකිය යුතු සූර්ය පැනල පද්ධතියක් සමඟ එකතුව 5KW බැගින් වූ ධාරිතාවක් සහිත සූර්ය පැනල ප්‍රධාන මණ්ඩපයේ ස්ථාපනය කිරීම මගින් හරිත බලශක්තිය ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කැපවීම සංකේතවත් කෙරේ. පුනර්ජනනීය බලශක්ති කළඹ තවදුරටත් විවිධාංගීකරණය කරමින් පරිගණක හා තාක්ෂණ පීඨයේ 5KW සුළං විදුලි බල පද්ධතියක් ද සමෝධානය කරන ලදී. එපමණක් නොව, ප්‍රදර්ශනය කිරීමේ අරමුණු සඳහා පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීම සහ අනාගත ඉංජිනේරු සිසුන් තිරසාර බලශක්ති ප්‍රභවයන්ගේ විභවය පිළිබඳව දැනුවත් කිරීම සහ ඒ සම්බන්ධයෙන් ඔවුන් තුළ පෙළඹවීමක් ඇති කිරීම විශ්වවිද්‍යාලය මගින් සිදු කරන ලද සමාරම්භකවලට ඇතුළත් වේ. ජීව වායු නිෂ්පාදනය එහි තිරසාර ප්‍රයත්නවලට ඇතුළත් කරමින්, කැලණිය විශ්වවිද්‍යාලය ජීව වායු ඒකක දෙකක් ක්‍රියාත්මක කරන අතර, මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය ජීව වායුව සහ

දියර කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා යොදා ගනියි. එක් ඒකකයක් මගින් මුළුතැන්ගෙයි අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 30 ක් දෛනිකව සැකසීම මගින් ජීව වායු කිලෝග්‍රෑම් 2 ක් සහ කොම්පෝස්ට් ලීටර් 100 ක් නිෂ්පාදනය කිරීම මගින් බලශක්ති කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් ආයතනයේ කැපවීම පැහැදිලි වේ.

**වාසස්ථාන කළමනාකරණය සඳහා කැපවීම**

කැලණිය විශ්වවිද්‍යාලයේ වාසස්ථාන කළමනාකරණය සඳහා කැපවීම යනු පීඨ හරහා හරිත ප්‍රායෝගික කමිටු / හරිත සමාජ මගින් මෙහෙයවනු ලබන රුක් රෝපණ සමාරම්භක ඇතුළු පුළුල් වැඩසටහන් වේ. මෙම සාමූහික ප්‍රයත්න තුළින් ශාක ආවරණය වැඩි කිරීමට දායක වීම පමණක් නොව, විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ විවිධ වාසස්ථාන පෝෂණය කිරීමේ වැදගත්කම ද අවධාරණය කරමින් තිරසාරභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ සාකල්‍ය ප්‍රවේශය ද ඉස්මතු කරයි. මීට අමතරව, භූමි අලංකරණ අංශවල සහාය ඇතිව, විශේෂයෙන් සමනල විශේෂ සහ පක්ෂි විශේෂ ආකර්ෂණය කරන ජෛව විවිධත්වය වැඩි දියුණු කරන පළතුරු, මල්, ඔසු සහ දුර්ලභ ශාක විශේෂ රෝපණය කිරීමට ද කැලණිය විශ්වවිද්‍යාලය සමත් විය.

තවද, වෛද්‍ය පීඨයේ හරිත ප්‍රායෝගික කමිටුවේ (GPC) සහයෝගීතාවයෙන් සහ හිතවතුන්ගේ සහයෝගය ඇතිව, කැලණිය විශ්වවිද්‍යාලය මගින් අක්කර 3 ක භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි දැවැන්ත එළවළු උද්‍යාන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙමගින් නෙළා ගන්නා ලද නිෂ්පාදන ක්‍රමෝපායිකව වාසි සහගත වන පරිදි ආපනශාලාවලට අලෙවි කරන ලද අතර විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ද සහන මිලකට ලබා දෙන ලදී. විශේෂයෙන්, මෙම ගෙවතු වගා ව්‍යාපෘති විශ්වවිද්‍යාලයේ කොම්පෝස්ට් කම්හල්වල නිපදවන ලද කොම්පෝස්ට් භාවිතයෙන් කාබනිකව වගා කර ඇති අතර එම ව්‍යාපෘති මගින් සංවෘත තිරසාර ආකෘතියක් ප්‍රදර්ශනය කරන අතර තිරසාර සංවර්ධන ඉලක්ක කිහිපයක් සාක්ෂාත් කර ගැනීම සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර පුරුදු ප්‍රවර්ධනය කිරීම ද සිදු කරයි. මීට අමතරව, එළවළු උද්‍යානය 'ශ්‍රමදාන' ව්‍යාපාර මගින් විෂය බාහිර ශිෂ්‍ය ක්‍රියාකාරකම් සඳහා ද අවස්ථා සපයයි. කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රජා සාමාජිකයින් සඳහා තිරසාර කෘෂිකාර්මික භාවිතයන් හඳුන්වා දීම සහ ආහාර සුරක්ෂිතතාව සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ කැපවීම ද මෙම බිම් මට්ටමේ සහභාගීත්වය තුළින් විදහා දක්වයි. ගෘහස්ථ බෝග වගා කිරීම මගින් විශ්වවිද්‍යාලය සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ ක්ෂණික පෝෂණ අවශ්‍යතා සපුරාලීම පමණක් නොව ආර්ථික අභියෝගවලට ඔරොත්තු දෙන තිරසාර කෘෂිකර්මාන්තයක් සඳහා මනා ආදර්ශයක් වශයෙන් ද කටයුතු කරයි.

**දැනුවත් කිරීම සඳහා කැපවීම**

තිරසර විසඳුම් මධ්‍යස්ථානය වැඩමුළු, සම්මන්ත්‍රණ, තරඟ සහ වෙනත් ක්‍රියාකාරකම් තුළින් දේශීයව සහ ගෝලීය වශයෙන් දැනුවත් කිරීම්, අධ්‍යාපන අවස්ථා සහ ව්‍යාප්ත කිරීමේ ප්‍රයත්න ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. තිරසාර නායකත්ව සහතික වැඩසටහන මූලික පියවරක් ලෙස කැපී පෙනෙන අතර සියලුම පීඨවල උපාධි අපේක්ෂකයින්ට එමඟින් පුළුල් විෂය මාලාවක් පිරිනමයි. 2023 වර්ෂයේ දී, සිසුන් 100 කට අධික සංඛ්‍යාවක් මෙම වැඩසටහනට සහභාගී වූ අතර, ඔවුන්ගේ පාඨමාලාවල කොටසක් වශයෙන් තිරසාරභාවය සම්බන්ධ විවිධ ව්‍යාපෘතිවලට ද සහභාගී වූහ. මොඩියුල 15 කින් සමන්විත මෙම වැඩසටහන මගින් මානව සමාජය, පාරිසරික ගැටළු සහ තිරසාර සංවර්ධනය, තිරසාර ජීවන රටාව සහ හරිත විලාසිතාව සඳහා තරුණයින්ගේ භූමිකාව වැනි තීරණාත්මක මාතෘකා සම්බන්ධයෙන් ද කටයුතු කරයි. එය සාම්ප්‍රදායික නොවන බලශක්තිය, බලශක්ති කළමනාකරණය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණයේ සම්පතක් ලෙස අපද්‍රව්‍ය, පරිසර දූෂණය, මානව සෞඛ්‍යය, ජල කළමනාකරණය, හරිත ගොඩනැගිලි, තිරසාර නිෂ්පාදනය සහ පාරිභෝජනය සහ පාරිසරික තිරසාර නායකත්වය පිළිබඳව ද තවදුරටත් ගවේෂණය කරයි. තිරසර විසඳුම් මධ්‍යස්ථානය මගින් මෙම වැඩසටහන සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (SLQF) ප්‍රමිතිය ලබා ගැනීමටත්, උසස් පෙළ සුදුසුකම් සහිතව පාසල් හැර යන සිසුන්ට එහි ප්‍රවේශය පුළුල් කිරීමටත්, එමඟින් තිරසාර අධ්‍යාපනයේ බලපෑම පුළුල් කිරීමටත් ක්‍රියාකාරීව කටයුතු කරයි.

**ප්‍රජා ව්‍යාප්ති වැඩසටහන් සඳහා කැපවීම**

2023 වර්ෂයේ දී තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් වසර පුරා ප්‍රබල ක්‍රියාකාරකම් 10 කට වැඩි ප්‍රමාණයකට මූලිකත්වය ලබා දෙමින් ප්‍රජා ව්‍යාප්ති වැඩසටහන් සඳහා එහි නොසැලෙන කැපවීම අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. වෙරළබඩ පරිසර පද්ධති සංරක්ෂණය කිරීම සහ පාරිසරික භාරකාරත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගත් වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් ඇතුළුව තිරසාරභාවය කේන්ද්‍ර කරගත් ව්‍යාපෘති රාශියක් මෙම සමාරම්භකවලට ඇතුළත් විය. හරිත අවකාශ වැඩි දියුණු කිරීමට සහ වන විනාශයට එරෙහිව සටන් කිරීමට විශ්වවිද්‍යාලය දරන ප්‍රයත්නයට දායක වෙමින් රුක් රෝපණ වැඩසටහන සඳහා උද්යෝගිමත් සහභාගීත්වයක් දක්නට ලැබුණු අතර, මීට අමතරව, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් අපද්‍රව්‍ය කළමනාකරණය, තිරසාර පිළිවෙත් සහ අධ්‍යාපනය සම්බන්ධයෙන්





අවධානය යොමු කළ ප්‍රජා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සහභාගී විය. දේශීය ප්‍රජා තුළ දැනුම බෙදා හැරීම සහ පාරිසරික වගකීම පිළිබඳ හැඟීමක් ඇති කිරීම සඳහා මෙම වැඩසටහන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙම විවිධ ව්‍යාප්ති සමාරම්භකවල සක්‍රියව නියැලීම මගින්, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල සීමාවෙන් පිටත ද තිරසාර සහ පරිසර හිතකාමී අනාගතයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කැපවීම ප්‍රදර්ශනය කරන ලදී.

ඊට අමතරව, කැලණිය විශ්වවිද්‍යාලයේ භූමි අලංකරණ අංශය, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය සමඟ සමායෝජනයෙන් පාරිසරික ගැටළු, සම්පත් සීමා සහ නිෂ්පාදන ඉල්ලුම වැඩි කිරීම අරමුණු කර ගත් තිරසාර ව්‍යාපෘති කිහිපයකට ක්‍රියාකාරීව සම්බන්ධ වී ඇත.

**කසළ කළමනාකරණය සඳහා කැපවීම**

තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් විශ්වවිද්‍යාලය තුළ කසළ වෙන් කිරීමේ සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ  වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. මධ්‍යම පරිසර අධිකාරියේ සහාය ඇතිව තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් සංවර්ධනය කරන ලද පහසුකමක් උපයෝගි කර ගනිමින් විශ්වවිද්‍යාලය තුළ ජනනය වන දිරායන අපද්‍රව්‍යවලින් 75% කට වඩා ප්‍රමාණයක් කොම්පෝස්ට් බවට පත් කර ඇත. තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් කැලණිය විශ්වවිද්‍යාලයේ පොලිතින් භාවිතය තහනම් කරමින් විශ්වවිද්‍යාල චක්‍රලේඛයක් නිකුත් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ආපනශාලා තුළ කෑම ඔතන පොලිතීන් කොළ භාවිතය තහනම් කරන ලද අතර ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරකම් / සැරසිලිවලදී පොලිතින් භාවිත කිරීමෙන් සිදුවන අහිතකර පාරිසරික බලපෑම් පිළිබඳව ශිෂ්‍ය සංගමය දැනුවත් කිරීම සඳහා ශිෂ්‍ය සංගමය සමඟ ඵලදායි සාකච්ඡා පවත්වන ලදී. තවද, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා භාවිතා කරන ලද කඩදාසි එකතු කිරීමේ අරමුණින්, විශ්වවිද්‍යාලයේ සෑම දෙපාර්තමේන්තුවක් සඳහාම තද නිල් පැහැති බඳුන් හඳුන්වා දෙන ලදී. එකතු කරන ලද සියලුම කඩදාසි ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණය කරන්නෙකුට භාර දෙනු ලැබේ. තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් හැකි සෑම අවස්ථාවකම මෘදු පිටපත් භාවිතා කිරීම සහ හැකි සෑම අවස්ථාවේම කඩදාසියේ දෙපැත්තේම මුද්‍රණය කිරීම, කඩදාසියේ තනි පැත්තක් පමණක් මුද්‍රණය කරන ලද කඩදාසි නැවත භාවිතා කිරීම දිරිමත් කරන අතර හැකි සෑම අවස්ථාවකම ද්‍රව පෙට්‍රෝලියම් වායු  සඳහා විකල්පයක් ලෙස ජීව වායුව භාවිතා කිරීම ප්‍රවර්ධනය කරන අතර විශ්වවිද්‍යාලයේ ආපනශාලා දෙකක ජීව වායු පහසුකම් දෙකක් මගින් දිනකට ජීව වායු කිලෝග්‍රෑම් 4 කට වඩා නිෂ්පාදනය කරයි.

මෙයට අමතරව, තිරසාර විසඳුම් මධ්‍යස්ථානය මගින් උපදේශන සේවා ඉල්ලා සිටින අවස්ථාවලදී කසළ කළමනාකරණය පිළිබඳ උපදේශන සේවා සපයනු අතර පරිගණක හා තාක්ෂණ පීඨය මගින් අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය සැලසුම් කිරීමේදී ඒ සඳහා උපදේශන ලබා දෙන ලදී. එසේම, කොම්පෝස්ට් තාක්ෂණය පිළිබඳ පුහුණුව ලත් කාර්ය මණ්ඩලය කොම්පෝස්ට් අංගන ක්‍රියාත්මක කිරීමට කැමති කුඩා පරිමාණ ව්‍යවසායකයන් වෙත උපදෙස් හා දැනුම ලබා දෙයි.

තිරසාර විසඳුම් මධ්‍යස්ථානය සමඟ සහයෝගයෙන්, කැලණිය විශ්වවිද්‍යාලයේ භූමි අලංකරණ අංශය කොම්පෝස්ට් නිෂ්පාදනය තුළින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කරමින් ද, පාරිසරික තිරසාරභාවයට දායකත්වය සපයමින් ද සාර්ථකව කටයුතු කරයි. පසුගිය වසර තුනේ (2020-2023) නිෂ්පාදන අගයන් මගින් මේ සම්බන්ධයෙන් දරන ලද ස්ථාවර ප්‍රයත්න පෙන්නුම් කරයි.

වගුව 4: විශ්වවිද්‍යාලයේ කොම්පෝස්ට් නිෂ්පාදනය

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| **නිෂ්පාදනය (කි.ග්‍රෑම්)** | 11670 | 9061 | 20294 | 6084 |
| **උත්පාදනය කරන ලද ආදායම (ශ්‍රී ලංකා රුපියල්)** | 198330 | 175160 | 405880 | 121680 |

කඩදාසි ප්‍රතිචක්‍රීකරණය කිරීම සිදු කරන ලද සමාරම්භක පාරිසරික වශයෙන් ප්‍රයෝජනවත් වන බව සහ ආර්ථික වශයෙන් ශක්‍ය බව ඔප්පු කර ඇත:

වගුව 5: විශ්වවිද්‍යාලයේ කඩදාසි ප්‍රතිචක්‍රීකරණය

| වර්ෂය | 2020 | 2021 | 2022 | 2023 |
|---|---|---|---|---|
| **ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි ප්‍රමාණය (කි.ග්‍රෑ.)** | 5857 | 4465 | 20780 | 6842.5 |
| **උත්පාදනය කරන ලද ආදායම (ශ්‍රී ලංකා රුපියල්)** | 58570 | 44650 | 415600 | 136850 |

එබැවින්, ප්‍රතිචක්‍රීකරණය කරන ලද කඩදාසි කිලෝග්‍රෑම් 6,842.5 කින් පමණක් ගණනය කළ ඉතුරුම් ප්‍රමාණය දළ වශයෙන් පහත දැක්වේ.

- වැඩුණු ගස් 115.82
- ජලය ලීටර් 182,138.53
- විදුලිය කිලෝවොට් පැය 4,109.38
- තෙල් ලීටර් 1,495.86
- කාබන් විමෝචනය කි.ග්‍රෑ. 1,371.33

පසුගිය වසර කිහිපය තුළ ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවම කිරීම සඳහා ප්‍රශංසනීය උත්සාහයක් දරා ඇති බව ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථාන වෙත යවන ලද මෙම ප්‍රමාණවලින් පැහැදිලි වේ: 2018 වර්ෂයේ දී කි.ග්‍රෑ.50, 2019 වර්ෂයේ දී කි.ග්‍රෑ.82, 2020 වර්ෂයේ දී කි.ග්‍රෑ.22, සහ 2023 වර්ෂයේ දී කි.ග්‍රෑ.102.6 ක් යවා ඇත. මෙම ඒකාබද්ධ සමාරම්භක මගින් කාබන් පියසටහන අඩු කිරීම තුළින් ධනාත්මක පාරිසරික බලපෑමක් සඳහා දායක වනවා පමණක් නොව, ප්ලාස්ටික් වගකීම් සහිතව අලෙවි කිරීම තුළින් රු. 7000 ක කැපී පෙනෙන ආදායමක් උපයා ගැනීමටද හැකියාව ලැබී ඇත. පාරිසරික භාරකාරත්වයේ සහ ආර්ථික ශක්‍යතාවේ ද්විත්ව ප්‍රතිලාභ ඉස්මතු කරමින් තිරසාරභාවය සඳහා වූ කැපවීම මෙම සාමූහික ක්‍රියාවලින් පිළිබිඹු වේ.

තවද, 2023 වර්ෂයේ දී, පරිසර සංරක්ෂණය සහ හරිතකරණය වැඩි දියුණු කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින්, භූ දර්ශන අංශය ගස් 300 කට අධික ප්‍රමාණයක් සිටුවා ප්‍රශංසනීය කාර්යභාරයක් ඉටු කරන ලදී. මෙම අභිලාෂකාමී ව්‍යාපෘතිය මගින් වටපිටාව අලංකාර කිරීම පමණක් නොව, වැවිලි ක්‍රියාවලිය පුරාම තිරසාර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම ද අරමුණු කර ඇත. මෙම රුක් රෝපණ ප්‍රයත්නයේ එක් සුවිශේෂී අංගයක් වූයේ භූ දර්ශන අංශය විසින්ම නිපදවන ලද කොම්පෝස්ට් පමණක් භාවිතා කිරීමයි. අලුතින් රෝපණය කරන ලද ගස්වල නිරෝගී වර්ධනය සහ ජීව ශක්තිය සහතික කිරීම සඳහා කාබනික සහ පෝෂ්‍ය පදාර්ථ බහුල ද්‍රව්‍ය පසට ඇතුළත් කිරීමේ වැදගත්කම කණ්ඩායම විසින් හඳුනා ගන්නා ලදී. ඔවුන්ගේ ස්වයං-නිෂ්පාදිත කොම්පෝස්ට් භාවිතා කිරීමෙන්, මෙම අංශය මගින් අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම පමණක් නොව, පරිසර හිතකාමී සහ තිරසාර භාවිතයන් සඳහා පවතින කැපවීම ද ප්‍රදර්ශනය කරන ලදී.

**එළවළු වගාව:**

පවතින අර්බුද මධ්‍යයේ, කැලණිය විශ්වවිද්‍යාලය එළවළු වගා කිරීමේ වැඩසටහනක් ආරම්භ කරමින් තම විශ්වවිද්‍යාල ප්‍රජාවගේ ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇත. භූ දර්ශන ඒකකය සමඟ සමායෝජනයෙන් තිරසාර විසඳුම් මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ එළවළු වගා වැඩසටහනක් සාර්ථකව ක්‍රියාත්මක කර ඇත. එළවළු වර්ධනය වන කාලයේ දී තවමත් ආදායම් උත්පාදනය කිරීමට නොහැකි වුවද, ස්වයංපෝෂිතභාවයට සහ යහපැවැත්මට දායක වන මුල පිරීම පූර්ණ ලෙස ක්‍රියාත්මක වේ.

## 2.14. බාහිර ආයතන සමඟ හවුල්කාරිත්වය

කැලණිය විශ්වවිද්‍යාලය අධ්‍යයන හා පර්යේෂණ ක්‍රියාකාරකම් ඇතුළු විවිධ අරමුණු සඳහා ජාතික හා ජාත්‍යන්තර හවුල්කරුවන් රැසක් සමඟ විධිමත් හවුල්කාරිත්වයක් ඇති කර ගෙන ඇත. 2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය විසින් අත්සන් කරන ලද ගිවිසුම් සහ අවබෝධතා ගිවිසුම්වල සාරාංශයක් පහත වගුව දක්වා ඇත.





වගුව 6: අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම්

| අංකය | ගිවිසුමේ / අවබෝධතා ගිවිසුමේ නම | අත්සන් කළ දිනය |
|---|---|---|
| අවබෝධතා ගිවිසුම් - ජාත්‍යන්තර | | |
| 1 | TOC H විද්‍යා හා තාක්ෂණ ආයතනය, කේරළ (TIST) | 2023.01.20 |
| 2 | චීනයේ බීජිං ටුමෝරෝ ටෙක්නොලොජි එඩියුකේෂන් සෙන්ටර් (ව්‍යාපාර අධ්‍යයන විද්‍යාපති උපාධි වැඩසටහන) | 2023.02.03 |
| 3 | චීනයේ බීජිං ටුමෝරෝ ටෙක්නොලොජි එඩියුකේෂන් සෙන්ටර් (ව්‍යාපාර පරිපාලන විද්‍යාපති උපාධි වැඩසටහන) | 2023.02.03 |
| 4 | නවෝත්පාදන සහ තාක්ෂණ කළමනාකරණ උපාධි පාසල, යමගුචි විශ්වවිද්‍යාලය, ජපානය | 2023.02.21 |
| 5 | පුන්යාශ්ලෝක් ආහිල්යාදේවි හෝල්කර් සොලාපූර් විශ්වවිද්‍යාලය, ඉන්දියාව | 2023.02.23 |
| 6 | බ්‍රැඩ්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලය, බටහිර යෝක්ෂයර්, එක්සත් රාජධානිය | 2023.03.09 |
| 7 | ඩේලියන් සාගර විශ්වවිද්‍යාලය සහ දූපත් පර්යේෂණ මධ්‍යස්ථානය, ස්වභාවික සම්පත් අමාත්‍යාංශය, චීනය | 2023.03.23 |
| 8 | චීනයේ බීජිං ටුමෝරෝ ටෙක්නොලොජි එඩියුකේෂන් සෙන්ටර් (ව්‍යාපාර ගණකාධිකරණ විද්‍යාපති උපාධි වැඩසටහන) | 2023.04.03 |
| 9 | සීමාසහිත ශ්‍රී ධූතපාපේශ්වර්, ඉන්දියාව | 2023.09.12 |
| 10 | Universitas Budi Luhur, ඉන්දුනීසියාව | 2023.09.13 |
| 11 | Universitas Budi Luhur (ශාස්ත්‍රීය සහයෝගීතාව සඳහා වූ අභිප්‍රාය ප්‍රකාශ කිරීමේ ලිපිය), ඉන්දුනීසියාව | 2023.09.13 |
| අවබෝධතා ගිවිසුම් - දේශීය | | |
| 12 | සහතිකලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමය (ACCA) - ශ්‍රී ලංකාව සහ මාලදිවයින | 2023.01.24 |
| 13 | ශ්‍රී ලංකා ටයිකොන්ඩෝ සම්මේලනය | 2023.02.13 |
| 14 | ඇල්ට්‍රියා කන්සල්ටින් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2023.02.23 |
| 15 | KPMG ශ්‍රී ලංකා | 03.03.2023 |
| 16 | ශ්‍රී ලංකා වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM) | 2023.03.16 |
| 17 | ජනශක්ති ලිමිටඩ් | 2023.04.10 |
| 18 | සීමාසහිත සාගර සම්පත් විශ්ලේෂණ (ඇපකාර) ආයතනය (INORA) | 2023.04.10 |
| 19 | H R Mates Lanka (Pvt) LTD | 2023.04.20 |
| 20 | ලංකා බැංකුව | 2023.04.25 |
| 21 | Orel IT (Private) Limited | 2023.07.13 |
| 22 | Sri Siddhartha Palm Leaf Manuscript Study & Research Institute (SSPLMSRT) | 2023.07.18 |
| 23 | එන්ඩීබී කැපිටල් හෝල්ඩින්ග්ස් ලිමිටඩ් | 2023.08.10 |
| 24 | ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍ය ආයතනය, ක්‍රීඩා සහ යෞවන කටයුතු අමාත්‍යාංශය | 2023.08.11 |
| 25 | මාස්ටර්කාර්ඩ් සිංගපෝර් හෝල්ඩින්ග්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | 2023.08.15 |
| 26 | Fortude (Pvt) Limited | 01.09.2023 |
| 27 | හෙට්ටිගොඩ ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් - සිද්ධාලේප | 2023.09.15 |
| 28 | LOLC Life Assurance Ltd / LOLC General Insurance PLC | 2023.12.15 |
| ගිවිසුම් - ජාත්‍යන්තර | | |
| 29 | New Zealand Institute of Skills & Teachnology Trading as Unitec, Auckland, New Zealand | 2023.01.01 |
| 30 | නවෝත්පාදන සහ තාක්ෂණ කළමනාකරණ උපාධි පාසල, යමගුචි විශ්වවිද්‍යාලය, ජපානය | 2023.02.21 |
| 31 | The Right Mindfulness Training Academy, Augusta, MO, USA (අතිරේක ගිවිසුම) | 2023.03.31 |
| 32 | The Right Mindfulness Training Academy, Augusta, MO, USA (සාමාන්‍ය ගිවිසුම) | 2023.03.31 |
| 33 | වයිකාටෝ විශ්ව විද්‍යාලය, නවසීලන්තය | 2023.04.11 |
| 34 | Szczecin විශ්ව විද්‍යාලය, පෝලන්තය | 2023.04.19 |
| 35 | කේම්බ්‍රිජ් එන්ටර්ප්‍රයිස් ලිමිටඩ්, කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලය | 2023.05.30 |
| 36 | Benhuan Academy of Hongfa Monastery, Shenzhen, චීනය | 2023.12.14 |
| ගිවිසුම් - දේශීය | | |
| 37 | Susen Holdings (Pvt) Ltd – පේටන්ට් අංකය: 20365 | 2023.05.26 |
| 38 | Susen Holdings (Pvt) Ltd – පේටන්ට් අංකය: 22121 | 2023.05.26 |
| ගිවිසුම් - දේශීය | | |
| 39 | මොරටුව විශ්වවිද්‍යාලය (STHRD ව්‍යාපෘතිය) | 2023.06.01 |
| 40 | කොළඹ විශ්වවිද්‍යාලය (STHRD ව්‍යාපෘතිය) | 2023.06.01 |
| 41 | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය | 2023.06.16 |
| 42 | සබරගමුව විශ්වවිද්‍යාලය (STHRD ව්‍යාපෘතිය) | 2023.07.18 |
| 43 | ශ්‍රී ලංකා මහ බැංකුව | 2023.09.25 |





# 3 විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්

අභ්‍යන්තර උපාධි අපේක්ෂකයෝ, බාහිර උපාධි අපේක්ෂකයෝ සහ පශ්චාද් උපාධි අපේක්ෂකයෝ යන ශිෂ්‍ය කාණ්ඩ තුන මෙම විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබති. 2023 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 15,390 ක්, බාහිර උපාධි අපේක්ෂකයින් 105,963 ක් සහ පශ්චාද් උපාධි සිසුන් 3,316 ක් ඇතුළුව සිසුහු 124,669 ක් අධ්‍යාපනය ලැබූහ.




රූපසටහන 17: 2023 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ සිසුන්

## 3.1. අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින්

කැලණිය විශ්වවිද්‍යාලය මගින් අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා උපාධි පාඨමාලා 89ක් පිරිනමනු ලබන අතර, ඉන් 84ක්ම විවිධ විෂයයන් පිළිබඳ විශේෂීකරණ අධ්‍යයන සහිත ගෞරව උපාධි වේ. 2023 පෙබරවාරි මාසයේ දී, 2021/2022 කණ්ඩායමට දේශීය සිසුන් 4103ක් බඳවා ගන්නා ලදී. දෙසැම්බර් 31 දිනට, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර උපාධි වැඩසටහන් හැදෑරීම සඳහා දේශීය සිසුන් 15,310ක් ඇතුළත්ව සිටියහ.

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ වැඩිම අභ්‍යන්තර උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව (24%) අධ්‍යාපනය ලබන අතර, සමාජීය විද්‍යා පීඨයේ (21%) එනම්, එයට ආසන්න ශිෂ්‍ය සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබති. පරිගණක හා තාක්ෂණ පීඨයේ අඩුම අභ්‍යන්තර උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව (6%) අධ්‍යාපනය ලබති.

වගුව 7: අභ්‍යන්තර උපාධි පාඨමාලා සඳහා බඳවා ගත් මුළු සිසුන් සංඛ්‍යාව - දේශීය ශිෂ්‍යයන් (2023 දෙසැම්බර් 31 දිනට)

| පීඨය | වැඩසටහන | 2016/17 | | 2017/18 | | 2018/19 | | 2019/20 | | 2020/21 | | 2021/22 | | Total | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | පි | කා | පි | කා | පි | කා | පි | කා | පි | කා | පි | කා | පි | කා | |
| FCMS | ව්‍යාපාර කළමනාකරණය | - | - | - | - | 182 | 365 | 213 | 481 | 245 | 479 | 249 | 493 | 889 | 1818 | 2707 |
| | වාණිජ්‍යය | - | - | - | - | 64 | 126 | 81 | 207 | 76 | 191 | 90 | 205 | 311 | 729 | 1040 |
| FCT | පරිගණක විද්‍යාව | - | - | - | - | 40 | 8 | 49 | 16 | 45 | 28 | 51 | 17 | 185 | 69 | 254 |
| | ඉංජිනේරු තාක්ෂණය | - | - | - | - | 71 | 15 | 89 | 17 | 83 | 17 | 85 | 12 | 328 | 61 | 389 |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | - | - | - | 43 | 31 | 64 | 33 | 65 | 25 | 12 | 27 | 184 | 116 | 300 |
| FHU | චිත්‍රපට සහ රූපවාහිනී අධ්‍යයනය | - | - | - | - | 14 | 33 | 18 | 49 | 18 | 44 | 22 | 46 | 72 | 172 | 244 |
| | මානව ශාස්ත්‍ර | - | - | - | - | 103 | 404 | 89 | 493 | 100 | 537 | 85 | 471 | 377 | 1905 | 2282 |
| | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම | - | - | - | - | 2 | 33 | 2 | 37 | 3 | 41 | 1 | 29 | 8 | 140 | 148 |
| | භාෂා පරිවර්තන අධ්‍යයනය | - | - | - | - | 2 | 22 | 1 | 27 | 2 | 38 | 1 | 27 | 6 | 114 | 120 |
| FMED | වෛද්‍යවේදී සහ ශල්‍යවේදී උපාධිය | 68 | 99 | 63 | 103 | 58 | 108 | 71 | 128 | 77 | 122 | 65 | 134 | 402 | 694 | 1096 |
| | වෘත්තීය චිකිත්සාව | - | - | - | - | - | - | - | - | 8 | 39 | 6 | 34 | 14 | 73 | 87 |
| | කථන සහ ශ්‍රවණ විද්‍යාව | - | - | - | - | 6 | 43 | 3 | 79 | 10 | 86 | 3 | 79 | 22 | 287 | 309 |
| FSC | ව්‍යවහාරික රසායන විද්‍යාව | - | - | - | - | - | - | - | - | 17 | 35 | 17 | 40 | 34 | 75 | 109 |
| | ජීව විද්‍යාව | - | - | - | - | 18 | 45 | 41 | 150 | 52 | 166 | 51 | 180 | 162 | 541 | 703 |
| | ඉලෙක්ට්‍රොනික සහ පරිගණක විද්‍යාව | - | - | - | - | - | - | - | - | 59 | 14 | 61 | 15 | 120 | 29 | 149 |
| | පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය | - | - | - | - | 4 | 11 | 16 | 65 | 18 | 75 | 12 | 73 | 50 | 224 | 274 |
| | කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය | - | - | - | - | 50 | 30 | 57 | 52 | 68 | 61 | 67 | 55 | 242 | 198 | 440 |
| | භෞතික විද්‍යාව | - | - | - | - | 21 | 36 | 123 | 143 | 143 | 151 | 154 | 152 | 441 | 482 | 923 |
| | භෞතික විද්‍යාව -තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව) | - | - | - | - | 1 | 1 | 34 | 22 | 39 | 21 | 35 | 30 | 109 | 74 | 183 |
| | මෘදුකාංග ඉංජිනේරු | - | - | - | - | 37 | 11 | 40 | 11 | 43 | 21 | 40 | 22 | 160 | 65 | 225 |
| | ක්‍රීඩා විද්‍යාව | - | - | - | - | - | - | - | - | 18 | 35 | 22 | 29 | 40 | 64 | 104 |
| FSS | සාමය සහ ගැටුම් නිරාකරණය | - | - | - | - | 6 | 28 | 6 | 26 | 5 | 26 | 3 | 31 | 20 | 111 | 131 |
| | සමාජ විද්‍යාව | - | - | - | - | 97 | 710 | 95 | 716 | 83 | 622 | 91 | 679 | 366 | 2727 | 3093 |
| | **එකතුව** | **68** | **99** | **63** | **103** | **819** | **2060** | **1092** | **2752** | **1277** | **2874** | **1223** | **2880** | **4542** | **10768** | **15310** |

**FCMS**: වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
**FSC**: විද්‍යා පීඨය
**FCT**: පරිගණක හා තාක්ෂණ පීඨය
**FSS**: සමාජ විද්‍යා පීඨය
**FHU**: මානව ශාස්ත්‍ර පීඨය
**කා**: කාන්තා
**FMED**: වෛද්‍ය පීඨය
**පි**: පිරිමි





## 3.2. බාහිර උපාධි අපේක්ෂකයින්

කැලණිය විශ්වවිද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ බාහිර පළමු උපාධි වැඩසටහන් 6ක් සඳහා සිසුන් 105,963ක් බඳවාගෙන ඇත.

වගුව 8: මුළු ශිෂ්‍ය බඳවා ගැනීම - බාහිර උපාධි වැඩසටහන්

| අධ්‍යයන වැඩසටහන | නවක ශිෂ්‍ය ඇතුළත් කිරීම් | | | ලියාපදිංචි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | පිරිමි | කාන්තා | එකතුව | පිරිමි | කාන්තා | එකතුව |
| ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය | 356 | 2,502 | 2,858 | 17,250 | 74,503 | 91,753 |
| ව්‍යාපාර කළමනාකරණ (සාමාන්‍ය)උපාධිය | 165 | 425 | 590 | 3,974 | 9,399 | 13,373 |
| වාණිජවේදී (විශේෂ) උපාධිය | 27 | 71 | 98 | 178 | 431 | 609 |
| විද්‍යාවේදී (සාමාන්‍ය) උපාධිය | - | - | - | 83 | 112 | 195 |
| වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | - | - | - | 10 | 1 | 11 |
| භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | - | - | - | 14 | 8 | 22 |
| **එකතුව** | **548** | **2,998** | **3,546** | **21,509** | **84,454** | **105,963** |

## 3.3. පශ්චාද් උපාධි පාඨමාලා හදාරන ශිෂ්‍යයන්

2023 වර්ෂයේ දී උපාධි අධ්‍යයන පීඨයේ අධ්‍යාපනය ලබන මුළු දේශීය සිසුන් සංඛ්‍යාව 3,245 ක් විය. පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා බඳවා ගන්නා ලද සිසුන්ගෙන් බහුතරයක් ශාස්ත්‍රපති හා විද්‍යාපති උපාධි හදාරන අතර, ඔවුන්ගෙන් බහුතරයක් වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයට අනුබද්ධ වැඩසටහන් හදාරති.

වගුව 9: මුළු ශිෂ්‍ය බඳවා ගැනීම් - පශ්චාද් උපාධි පාඨමාලා - දේශීය ශිෂ්‍යයන් (2023 දෙසැම්බර් 31 දිනට)

| අධ්‍යයන මණ්ඩලය | අධ්‍යයන වැඩසටහන | ඇතුළත් වූ නවක ශිෂ්‍ය සංඛ්‍යාව | | | ඇතුළත් කර ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | පි | කා | එකතුව | පි | කා | එකතුව |
| වාණිජ සහ ව්‍යාපාර කළමනාකරණය | **ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි** | | | | | | |
| | ව්‍යාපාර (ගිණුම්කරණය / මූල්‍ය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 92 | 72 | 164 | 92 | 72 | 164 |
| | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 56 | 46 | 102 | 112 | 100 | 212 |
| | ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය | 7 | 4 | 11 | 7 | 4 | 11 |
| | මූල්‍ය ශාස්ත්‍රපති උපාධිය | 3 | 3 | 6 | 3 | 3 | 6 |
| | අලෙවිකරණය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ශාස්ත්‍රපති උපාධිය | 27 | 12 | 39 | 65 | 24 | 89 |
| | ව්‍යාපාර අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය | 54 | 55 | 109 | 54 | 55 | 109 |
| | වාණිජ ශාස්ත්‍රපති උපාධිය | 14 | 17 | 31 | 14 | 17 | 31 |
| | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 32 | 55 | 87 | 57 | 86 | 143 |
| | වෘත්තීය මූල්‍ය ශාස්ත්‍රපති උපාධිය | 37 | 44 | 81 | 37 | 44 | 81 |
| | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 1 | 2 | 3 | 2 | 3 | 5 |
| | **දර්ශනශූරී අධ්‍යයන** | | | | | | |
| | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශනශූරී උපාධිය | 26 | 8 | 34 | 70 | 20 | 90 |
| | දර්ශනශූරී උපාධිය | 2 | 2 | 4 | 4 | 3 | 7 |
| | **එකතුව** | **351** | **320** | **671** | **517** | **431** | **948** |
| පරිගණක | **විද්‍යාපති උපාධි** | | | | | | |
| | පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 2 | 3 | 5 | 12 | 15 | 27 |
| | අධ්‍යාපනය පිළිබඳ තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධිය | 0 | 0 | 0 | 12 | 16 | 28 |
| | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 0 | 1 | 1 | 0 | 1 | 1 |
| | **එකතුව** | **2** | **4** | **6** | **24** | **32** | **56** |

වගුව 9: (සම්බන්ධයි).

| අධ්‍යයන මණ්ඩලය | අධ්‍යයන වැඩසටහන | ඇතුළත් වූ නවක ශිෂ්‍ය සංඛ්‍යාව | | | ඇතුළත් කර ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | පි | කා | එ | පි | කා | එ |
| තාක්ෂණය | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 0 | 2 | 2 | 0 | 2 | 2 |
| | **එකතුව** | **0** | **2** | **2** | **0** | **2** | **2** |
| මානව ශාස්ත්‍ර | **ශාස්ත්‍රපති උපාධිය** | | | | | | |
| | බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - සිංහල (වසර 1) | 18 | 5 | 23 | 18 | 5 | 23 |
| | බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ඉංග්‍රීසි (වසර 1) | 3 | 1 | 4 | 3 | 1 | 4 |
| | බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය -සිංහල (වසර 2) | 63 | 16 | 79 | 63 | 16 | 79 |
| | බෞද්ධ අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ඉංග්‍රීසි (වසර 2) | 15 | 2 | 17 | 15 | 2 | 17 |
| | ක්‍රිස්තියානි අධ්‍යයන ශාස්ත්‍රපති උපාධිය (වසර 1) | 10 | 4 | 14 | 10 | 4 | 14 |
| | නාට්‍ය සහ රංග කලා ශාස්ත්‍රපති උපාධිය (වසර 1) | 21 | 25 | 46 | 21 | 25 | 46 |
| | ලලිත කලා ශාස්ත්‍රපති උපාධිය (වසර 2) | 0 | 0 | 0 | 17 | 14 | 31 |
| | වාග් විද්‍යා ශාස්ත්‍රපති උපාධිය - ඉංග්‍රීසි (වසර 1) | 4 | 36 | 40 | 4 | 36 | 40 |
| | වාග් විද්‍යා ශාස්ත්‍රපති උපාධිය - ඉංග්‍රීසි (වසර 2) | 9 | 85 | 94 | 17 | 164 | 181 |
| | වාග් විද්‍යා ශාස්ත්‍රපති උපාධිය - සිංහල (වසර 1) | 0 | 2 | 2 | 0 | 2 | 2 |
| | වාග් විද්‍යා ශාස්ත්‍රපති උපාධිය - සිංහල (අවුරුදු 2) | 1 | 2 | 3 | 1 | 3 | 4 |
| | සංගීතය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (අවුරුදු 2) | | | | 40 | 44 | 84 |
| | සිංහල ශාස්ත්‍රපති උපාධිය (අවුරුදු 2) | 19 | 73 | 92 | 34 | 131 | 165 |
| | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 12 | 9 | 21 | 24 | 19 | 43 |
| | **දර්ශනශූරී අධ්‍යයන** | | | | | | |
| | දර්ශනශූරී උපාධිය | 3 | 3 | 6 | 15 | 11 | 26 |
| | **එකතුව** | **203** | **287** | **490** | **282** | **477** | **759** |
| වෛද්‍ය විද්‍යාව | **විද්‍යාපති උපාධිය** | | | | | | |
| | මහජන සෞඛ්‍ය පිළිබඳ විද්‍යාපති උපාධිය | 0 | 0 | 0 | 6 | 15 | 21 |
| | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 1 | 1 | 2 | 7 | 16 | 23 |
| | **දර්ශනශූරී අධ්‍යයන** | | | | | | |
| | දර්ශනශූරී උපාධිය | 1 | 2 | 3 | 1 | 5 | 6 |
| | **එකතුව** | **2** | **3** | **5** | **14** | **36** | **50** |
| විද්‍යා | **විද්‍යාපති උපාධිය** | | | | | | |
| | තොරතුරු තාක්ෂණ විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 39 | 33 | 72 | 39 | 33 | 72 |
| | විශ්ලේෂණ රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි | 25 | 13 | 38 | 33 | 42 | 75 |
| | ව්‍යවහාරික ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 0 | 0 | 0 | 1 | 12 | 13 |
| | ජලජීවී වගාව සහ ධීවර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 5 | 6 | 11 | 7 | 10 | 17 |
| | ජෛව රසායනය සහ ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 2 | 27 | 29 | 12 | 66 | 78 |
| | බෝග ආරක්ෂණය සහ ශාක ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය (වසර 1) | 0 | 0 | 0 | 0 | 3 | 3 |
| | බෝග ආරක්ෂණය සහ ශාක ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය (වසර 2) | 0 | 0 | 0 | 3 | 20 | 23 |
| | දත්ත විශ්ලේෂණ විද්‍යාපති උපාධිය (වසර 1) | 42 | 29 | 71 | 42 | 29 | 71 |
| | පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (වසර 1) | 4 | 2 | 6 | 4 | 2 | 6 |
| | පාරිසරික කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (වසර 2) | 3 | 10 | 13 | 8 | 28 | 36 |
| | ආහාර සහ පෝෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය | 0 | 0 | 0 | 2 | 18 | 20 |
| | කාර්මික සහ පාරිසරික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 7 | 31 | 38 | 18 | 65 | 83 |
| | සංඛ්‍යාලේඛන විද්‍යාපති උපාධිය | 11 | 10 | 21 | 15 | 19 | 34 |
| | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 1 | 7 | 8 | 1 | 14 | 15 |
| | **දර්ශනශූරී අධ්‍යයන** | | | | | | |
| | දර්ශනශූරී උපාධිය | 0 | 1 | 1 | 0 | 1 | 1 |
| | **එකතුව** | **139** | **169** | **308** | **185** | **362** | **547** |



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

වගුව 9: (සම්බන්ධයි).

| අධ්‍යයන මණ්ඩලය | අධ්‍යයන වැඩසටහන | ඇතුළත් වූ නවක ශිෂ්‍ය සංඛ්‍යාව | | | ඇතුළත් කර ගත් මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|---|
| | | පි | කා | එ | පි | කා | එ |
| සමාජ විද්‍යා | **පශ්චාද් උපාධි ඩිප්ලෝමා** | | | | | | |
| | මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කළමනාකරණය | 24 | 9 | 33 | 24 | 9 | 33 |
| | **ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි** | | | | | | |
| | පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 6 | 11 | 17 | 6 | 11 | 17 |
| | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 32 | 42 | 74 | 32 | 42 | 74 |
| | ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 4 | 16 | 20 | 4 | 16 | 20 |
| | භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 9 | 19 | 28 | 9 | 19 | 28 |
| | ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 8 | 20 | 28 | 8 | 20 | 28 |
| | පුස්තකාල විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 0 | 20 | 20 | 0 | 20 | 20 |
| | ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 28 | 67 | 95 | 28 | 67 | 95 |
| | දර්ශන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 7 | 17 | 24 | 7 | 17 | 24 |
| | දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | 19 | 31 | 50 | 19 | 31 | 50 |
| | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍ය) | 5 | 15 | 20 | 5 | 15 | 20 |
| | සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (සිංහලමාධ්‍යය) | 54 | 169 | 223 | 54 | 169 | 223 |
| | ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 4 | 16 | 20 | 4 | 16 | 20 |
| | ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (සිංහල මාධ්‍යය) | 32 | 42 | 74 | 32 | 42 | 74 |
| | භූගෝල විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 0 | 5 | 5 | 0 | 5 | 5 |
| | ඉතිහාසය පිළිබඳ විද්‍යාපති උපාධිය | 0 | 5 | 5 | 0 | 5 | 5 |
| | පුස්තකාල විඥාපන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 3 | 18 | 21 | 3 | 18 | 21 |
| | ජන සන්නිවේදනය පිළිබඳ විද්‍යාපති උපාධිය | 9 | 40 | 49 | 9 | 40 | 49 |
| | දේශපාලන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය | 0 | 4 | 4 | 0 | 4 | 4 |
| | සමාජ විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (ඉංග්‍රීසි මාධ්‍යය) | 0 | 3 | 3 | 0 | 3 | 3 |
| | සමාජ විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (සිංහල මාධ්‍යය) | 1 | 4 | 5 | 1 | 4 | 5 |
| | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 4 | 3 | 7 | 13 | 9 | 22 |
| | **දර්ශනශූරී අධ්‍යයන** | | | | | | |
| | දර්ශනශූරී උපාධිය | 0 | 0 | 0 | 7 | 8 | 15 |
| | **එකතුව** | **249** | **576** | **825** | **265** | **590** | **855** |
| බහු විෂයික අධ්‍යයන | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 0 | 1 | 1 | 2 | 3 | 5 |
| | **දර්ශනශූරී අධ්‍යයන** | | | | | | |
| | බහු විෂයික අධ්‍යයන පිළිබඳ දර්ශනශූරී උපාධිය | 5 | 4 | 9 | 7 | 6 | 13 |
| | **එකතුව** | **5** | **5** | **10** | **9** | **9** | **18** |
| ඩිජිටල් ඉගෙනීම | **දර්ශනපති අධ්‍යයන** | | | | | | |
| | දර්ශනපති උපාධිය | 0 | 0 | 0 | 0 | 1 | 1 |
| | **දර්ශනශූරී අධ්‍යයන** | | | | | | |
| | ඩිජිටල් ඉගෙනීම පිළිබඳ දර්ශනශූරී උපාධිය | 0 | 0 | 0 | 4 | 5 | 9 |
| | **එකතුව** | **0** | **0** | **0** | **4** | **6** | **10** |
| | **මුළු එකතුව** | **951** | **1366** | **2317** | **1300** | **1945** | **3245** |

**කා:** කාන්තා **පි:** පිරිමි **එ:** එකතුව

## 3.4. විදේශීය ශිෂ්‍යයන්

කැලණිය විශ්වවිද්‍යාලය මගින් 2023 වසරේ දී මානව ශාස්ත්‍ර පීඨය සහ වෛද්‍ය පීඨය මගින් 2021/22 අධ්‍යයන වර්ෂය සඳහා පවත්වනු ලබන උපාධි වැඩසටහන් සඳහා විදේශීය උපාධි අපේක්ෂකයින් 25 දෙනෙකු අලුතින් බඳවාගෙන ඇත. තවද, කැලණිය විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන පශ්චාද් උපාධි පාඨමාලා 12ක් සඳහා සිසුන් 60 දෙනෙකු ද බඳවාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ සමස්ත විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රථම උපාධි පාඨමාලා සඳහා සිසුන් 80 ක් සහ පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා සිසුන් 71 ක් විය. පසුගිය වසරට වඩා මුළු විදේශීය ශිෂ්‍ය බඳවා ගැනීම් සංඛ්‍යාව 66% කින් ඉහළ ගොස් ඇත.

වගුව 10: විදේශීය ශිෂ්‍යයන් - ප්‍රථම උපාධි පාඨමාලා

| පීඨය | අධ්‍යයන පාඨමාලාව | අධ්‍යයන වර්ෂය | රට | ඇතුළත් කර ගත් වර්ෂය | ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | පි | කා | එ |
| FHU | මානව ශාස්ත්‍ර | 1 | ඇමෙරිකාව | 2021/22 | 1 | - | 1 |
| | | | බංගලාදේශය | | 12 | - | 12 |
| | | | චීනය | | 1 | - | 1 |
| | | | කොරියාව | 2021/22 | 1 | - | 1 |
| | | | මැලේසියාව | | 1 | - | 1 |
| | | | මියන්මාරය | | 2 | - | 2 |
| | | | වියට්නාමය | | 1 | - | 1 |
| | | 2 | බංගලාදේශය | 2020/21 | 3 | - | 3 |
| | | | චීනය | | - | 2 | 2 |
| | | | මැලේසියාව | | - | 1 | 1 |
| | | | වියට්නාමය | | 1 | 2 | 3 |
| | | 3 | බංගලාදේශය | 2019/20 | 2 | - | 2 |
| | | | කාම්බෝජය | | 1 | - | 1 |
| | | | හොංකොං | | 1 | - | 1 |
| | | | මියන්මාරය | | 3 | - | 3 |
| | | | නෝර්වේ | | - | 1 | 1 |
| | | | වියට්නාමය | | 1 | 1 | 2 |
| | | 4 | බංගලාදේශය | 2018/19 | 1 | - | 1 |
| | | | මියන්මාරය | | 1 | - | 1 |
| | | | වියට්නාමය | | 1 | 2 | 3 |
| FMED | වෛද්‍ය විද්‍යාව | 1 | ඕස්ට්‍රේලියාව | 2021/22 | - | 1 | 1 |
| | | | භූතානය | | 1 | 2 | 3 |
| | | | සවුදි අරාබිය | | - | 2 | 2 |
| | | 2 | භූතානය | 2020/21 | 1 | 5 | 6 |
| | | | ඉන්දියාව | | - | 1 | 1 |
| | | | කටාර් | | - | 1 | 1 |
| | | | සවුදි අරාබිය | | 1 | 1 | 2 |
| | | | එ.අ.එ. | | 1 | - | 1 |
| | | 3 | භූතානය | 2019/20 | 2 | 4 | 6 |
| | | | කැනඩාව | | - | 1 | 1 |
| | | | කටාර් | | 1 | - | 2 |
| | | | සවුදි අරාබිය | | 1 | 1 | 1 |
| | | 4 | සවුදි අරාබිය | 2018/19 | - | 1 | 1 |
| | | 5 | භූතානය | 2017/18 | - | 3 | 3 |
| | | | ඇ.එ.ජ. | | - | 1 | 1 |
| | | | භූතානය | 2016/17 | - | 5 | 5 |
| | | | | **මුළු එකතුව** | **42** | **38** | **80** |

**FHU:** මානව ශාස්ත්‍ර පීඨය **FMED:** වෛද්‍ය පීඨය **කා:** කාන්තා **පි:** පිරිමි **එ:** එකතුව





වගුව 11: විදේශීය ශිෂ්‍යයන් - පශ්චාද් උපාධි පාඨමාලා

| අධ්‍යයන මණ්ඩලය | අධ්‍යයන වැඩසටහන | රට | නවක සිසුන් ඇතුළත් කිරීම (2023) | | | සිසුන් ඇතුළත් කිරීම | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | පි | කා | එ | පි | කා | එ |
| වාණිජ හා ව්‍යාපාර කළමනාකරණ | ශාස්ත්‍රපති / විද්‍යාපති වැඩසටහන් | | | | | | | |
| | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධිය | බංගලාදේශය | 0 | 0 | 0 | 5 | 4 | 9 |
| | ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධිය | චීනය | 20 | 12 | 32 | 20 | 12 | 32 |
| | දර්ශනශූරි වැඩසටහන් | | | | | | | |
| | ව්‍යාපාර පරිපාලනය පිළිබඳ දර්ශනපති උපාධිය | චීනය | 0 | 0 | 0 | 1 | 1 | 2 |
| | දර්ශනශූරි උපාධිය | බංගලාදේශය | 1 | 1 | 2 | 1 | 1 | 2 |
කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය ශ්‍රී ලංකාවේ ශීඝ්‍රයෙන් දියුණු වන පීඨයක් වන අතර එය 1976 දී සමාජීය විද්‍යා පීඨයෙන් වෙන්ව ස්ථාපනය කර පවත්වා ගෙන යන ලදී. මේ වන විට, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ කීර්තිමත් පීඨයක් බවට පත්ව ඇත. එහි කාර්ය මණ්ඩලයේ, සිසුන්ගේ හා අනෙකුත් අධ්‍යයන අංශවල දැඩි පරිශ්‍රමයෙන් කටයුතු කිරීම, නොපසුබට උත්සාහය, සහ කැපවීම හේතුකොට ගෙන 1995 දී එයට පීඨයක් වශයෙන් පිළිගැනීමක් ලබා ගත හැකි විය. මෙම පීඨය අංශ පහක් (5) යටතේ වැඩසටහන් රාශියක් පවත්වයි. වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය (DCFM), මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය (DHRM), ගණකාධිකරණ අධ්‍යයන අංශය (DoA), අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය (DMM), සහ මුල්‍ය අධ්‍යයන අංශය (DFin) යන අධ්‍යයනාංශ යටතේ උපාධි පාඨමාලා දාහතරක් (14) මෙම පීඨය මඟින් පිරිනමනු ලබයි. එක් (01) ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධි (DBA) වැඩසටහනක්, ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් අටක් (08), ඩිප්ලෝමා පාඨමාලා හයක් (06), සහ උසස් ඩිප්ලෝමා වැඩසටහන් හයක් මෙයට ඇතුළත් වේ. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 132 ක්, පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩල සාමාජිකයින් 5ක්, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 28 ක් මෙම පීඨයේ සේවයේ නිරතව සිටින අතර ප්‍රථම උපාධි අපේක්ෂකයින් 3763 ක් ද මෙම පීඨයේ අධ්‍යාපනය හදාරති. පීඨය තුළ බහු සංස්කෘතික සහ බහු වාර්ගික සිසුන් සිටින අතර සමාජ සංහිඳියාව සහ සංස්කෘතික විවිධත්වයෙන් යුතුව ඔවුන් සහයෝගීව කටයුතු කරන අතර ප්‍රථම උපාධි අපේක්ෂකයෝ විවිධ අංශ මඟින් පවත්වනු ලබන විෂය බාහිර ක්‍රියාකාරකම් තුළින්ද තම ජීවිත හැඩ ගස්වා ගනු ලබති.

මෙම පීඨය ඉහළ ප්‍රමිතියක් පවත්වා ගනිමින් සාර්ථක අන්දමින් විශ්වවිද්‍යාල පාර්ශ්වකරුවන්ගේ සහ ප්‍රජාවගේ ආකර්ෂණය දිනා ගැනීමට සමත්ව ඇත. උපාධිධාරීන්ටෙග් ගුණාත්මකභාවය ඉහළ මට්ටමක පවත්වා ගනිමින් මෙරට කළමනාකරණ පීඨ අතරින් ඉහළම උපාධිධාරී සේවා නියුක්ති අනුපාතය වන 85% ක් වාර්තා කිරීමට මෙම පීඨය සමත්ව ඇත. තවද, අලෙවි කළමනාකරණ අධ්‍යයන අංශය සහ මුල්‍ය අධ්‍යයන අංශය සහ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධී වැඩසටහන සඳහා ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයේ (ISO) සහතිකය ලබා ගැනීමෙන් ද, මූල්‍ය පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය, මූල්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ ව්‍යාපාර කළමනාකරණ ගෞරව උපාධිය, වෘත්තීය මූල්‍ය දර්ශනපති උපාධිය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ වරලත් මූල්‍ය විශ්ලේෂකයන්ගේ (CFA) ආයතනයේ පිළිගැනීම හිමි කර ගැනීම මගින් ද පීඨය මගින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්වල ගුණාත්මක බව පිළිබිඹු වෙයි. එමෙන්ම, 2023 වසර සඳහා AACSB (The Association to Advance Colegiate Schools of Business) ආයතනයෙහි සාමාජිකත්වය අලුත් කිරීම මගින් 2023 වර්ෂයේදී ද පීඨය සතු ගුණාත්මක බව පෙන්නුම් කරයි. මේ වන විට පීඨය මඟින් පවත්වනු ලබන සියලුම විශේෂ උපාධි වැඩසටහන් ගෞරව උපාධි වැඩසටහන් බවට පරිවර්තනය කර ඇත.

### 9.1.3. අධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨය මගින් ලබා දෙන සහයෝගය හේතු කොට ගෙන, කාර්ය මණ්ඩල සාමාජිකයින් තම පර්යේෂණ කටයුතු වැඩිදියුණු කර ගැනීමට පෙළඹීම මගින් එහි අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මක බවද වැඩිදියුණු වෙයි. 2023 දී, උසස් තත්ත්වයේ පර්යේෂණ ප්‍රකාශන සඳහා උපකුලපති සම්මාන 7ක් දිනා ගැනීමට පීඨ කාර්ය මණ්ඩලය සමත් විය. තවද, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් 55 දෙනෙකු ආචාර්ය උපාධිධාරීන් (PhD) වන අතර සාමාජිකයින් 115 දෙනෙකු ශාස්ත්‍රපති උපාධිය ලබා ගෙන ඇත. තවත් සාමාජිකයින් 18 දෙනෙක් දැනට ආචාර්ය උපාධිය හදාරමින් සිටිති.

### 9.1.4. නවෝත්පාදන

ප්‍රථම උපාධි අපේක්ෂකයින්ට සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන පරිදි අධ්‍යාපනයට හිතකර පරිසරයක් ගොඩ නැඟීමට පීඨය මගින් පියවර ගෙන ඇත. කථිකාචාර්යවරුන් සහ සිසුන් අතර මිශ්‍ර පන්ති කාමර ප්‍රවර්ධනය කිරීම සඳහා නවීන පන්නයේ පන්තිකාමර ඉදිකිරීම, උපාධි හා පශ්චාද් උපාධි වැඩසටහන්වල නව නිෂ්පාදන සංවර්ධනය ප්‍රවර්ධනය නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා නවෝත්පාදන විද්‍යාගාරයක් ඉදි කිරීම, වැඩිදියුණු කිරීම සහ සිසුන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ඩිජිටල් අන්තර්ගත සංවර්ධනය සඳහා උපකාර කිරීමට A1 මැදිරිය (Studio AI) ඉදි කිරීම වැනි විවිධ යටිතල පහසුකම් සංවර්ධනය මඟින් මාර්ගගත ඉගැන්වීම් සහ අධ්‍යයන ක්‍රම වැඩිදියුණු කරනු ලබයි.

### 9.1.5. යටිතල පහසුකම් සංවර්ධනය

දේශන ශාලා ප්‍රතිසංස්කරණය කිරීම සහ ආනන්ද පටබැඳිගේ ගොඩනැගිල්ලේ සහ F4 ගොඩනැගිල්ලේ ඇතැම් පොදු පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සාර්ථකව නිම කරන ලදී. තවද, පීඨයේ මාර්ගගත අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් සැලසීමට ලැප්ටොප් හා ග්‍රැෆික් ඩ්‍රෝයින් ටැබ්ලට් විසිපහක්ද මිලදී ගන්නා ලදී.

### 9.1.6. 2023 වසරේ විශේෂ අවස්ථා

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ප්‍රමුඛතම සමුළුව වන ව්‍යාපාර සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICBI) 14 වැනි වරටත් නොවැම්බර් 09 සහ 10 යන දෙදින තුළ වත්තල පෙගසස් රීෆ් හෝටලයේදී පැවැත්විණි. එහි තේමාව වූයේ “ඩිජිටල් පරිවර්තනය, යහපැවැත්ම සහ ව්‍යාපාර තිරසාරත්වය” වැඩිදියුණු කිරීම” යන්නයි.

පීඨයේ දක්ෂතම සිසුන් හඳුනාගෙන ඔවුන්ට සම්මාන පිරිනැමීම සඳහා පීඨයේ තත්ත්ව සහතික අංශය (FQAC) මඟින් සංවිධානය කරනු ලබන 2019/2020, 2023 අධ්‍යයන වර්ෂය සඳහා පීඨයේ විශිෂ්ටතා සම්මාන ප්‍රදානය “පීඨාධිපති ලැයිස්තුව” සහ “පීඨ සම්මාන” යන කාණ්ඩ දෙක යටතේ 2024 දී සිදු කිරීමට නියමිතය.

එපමණක් නොව, අදාළ ක්ෂේත්‍ර චාරිකා, කර්මාන්ත හා සම්බන්ධ උපාධි සහතිකය; “සහතික කළ වෘත්තීය අලෙවිකරණ උපාධි (CPMG)” යනාදිය සහ කර්මාන්ත හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට හා හවුල්කාරිත්ව ගොඩනගා ගැනීමට කටයුතු කිරීම 2023 වර්ෂයේ ඉගැන්වීමේ ගුණාත්මක භාවය වැඩිවීමට හේතු වූ ප්‍රමුඛ ක්‍රියාකාරකම් වේ.

ශ්‍රී ලංකා තත්ත්ව සහ ඵලදායිතා දියුණුව සඳහා වූ සංගමය (SLAAQP) විසින් සංවිධානය කරන ලද 2023 පෙබරවාරි 21 වැනි දින පැවති තත්ත්ව සහ ඵලදායිතාව තරඟය-2022 පිළිබඳ ජාතික සම්මුතියේදී (NCQP) රන් සම්මාන දෙකක් දිනා ගැනීමට පීඨය සමත් විය. එක් රන් පදක්කමක් “ශිෂ්‍ය තොරතුරු සහ ප්‍රතිඵල කළමනාකරණ ක්‍රමය ඩිජිටල්කරණය” සඳහා ද අනෙක් රන් පදක්කම “FCMS හි සීමාවාසික ක්‍රමයේ ඩිජිටල්කරණය” සඳහා ද ප්‍රදානය කරන ලදී.





උපකුලපති සම්මාන කාණ්ඩය යටතේ, විශ්වවිද්‍යාලයේ හොඳම වෙබ් අඩවිය තරඟයෙන් පීඨයට දෙවන ස්ථානයද හොඳම වෙබ් අඩවිය හිමි අංශ අතරින් අලෙවි කළමනාකරණ අධ්‍යනාංශයේ වෙබ් අඩවියට දෙවන ස්ථානය ද හිමි විය.

මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේදී, සමාජ සුබසාධනයට අත්‍යවශ්‍ය තීරණ ගැනීමේ හැකියාව, කුසලතා සහ ආකල්ප සහිත ලෝකය සඳහා විශිෂ්ට නායකයින් බිහි කිරීමේ සේවාව පීඨය මගින් සිදු කෙරෙයි. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය මේ වන විට උපාධිධාරීන් 15,000 කට වැඩි පිරිසක් බිහි කර ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කළමනාකරණ ක්ෂේත්‍රයේ ඉහළ තනතුරු දරන අතර ඇතැම් උපාධිධාරීහු රටේ ප්‍රමුඛ ව්‍යවසායකයින් ලෙස ද කටයුතු කරති.

**මහාචාර්ය ඩබ්. එම්. සී. බී. වන්නිනායක**
**පීඨාධිපති/ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**







# 9.2. පරිගණක හා තාක්ෂණ පීඨය

කැලණිය විශ්වවිද්‍යාලයේ හත්වන පීඨය ලෙස 2016 වසරේදී පරිගණක හා තාක්ෂණ පීඨය (FCT) ස්ථාපනය කරන ලදී. දැනට පරිගණක හා තාක්ෂණ පීඨය (FCT) මඟින් පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, ඉංජිනේරු තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය (BET) සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය (BICT) යන උපාධි පාඨමාලා තුන පිරිනමයි. මීට අමතරව, එක් පශ්චාද් උපාධි වැඩසටහනක් එනම්, අධ්‍යාපනය පිළිබඳ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ MSc උපාධිය (MSc in ICT) 2023 සිට පිරිනමනු ලබයි. ජෛව පද්ධති තාක්ෂණ (BBST) ගෞරව උපාධිය සඳහා වන විෂය මාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

2022 දී ආරම්භ වූ කාර්ය මණ්ඩල ඉල්ලා අස්වීමේ ප්‍රවණතාවය 2023 දෙවන කාර්තුව දක්වාම පැවතුණි. කෙසේ වුවද, 2023 වර්ෂය තුළදී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 05 දෙනෙකු බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

## 9.2.1. දැක්ම

තිරසාර සංවර්ධනය සඳහා උපයෝගි වන පරිගණක හා තාක්ෂණය පිළිබඳ දැනුම නිර්මාණය කිරීමේ කිරීමේ හා බෙදා හැරීමේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

## 9.2.2. මෙහෙවර

ජාතියේ සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා නවෝත්පාදන, දැනුම බෙදා හැරීම හා ධාරිතා ගොඩ නැංවීම තුළින් පරිගණක හා තාක්ෂණයේ විශිෂ්ටත්වය ළඟා කරගැනීමට පරිගණක හා තාක්ෂණ පීඨය ප්‍රයත්න දරයි.

## 9.2.3. සංවිධාන ව්‍යුහය පිළිබඳ සාරාංශය

පරිගණක හා තාක්ෂණ පීඨය (FCT) පහත සඳහන් අංශ තුනෙන් සමන්විත වේ:

- ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශය
- පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය
- මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයන අංශය

එයට අමතරව, පුළුල් ප්‍රජාවකට සේවය සැලසීම සඳහා පහත මධ්‍යස්ථාන සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි.

- පරිගණක හා තාක්ෂණය සඳහා වන කාර්මික අන්තර්ක්‍රියාකාරී මධ්‍යස්ථානය (IICFCT)

කර්මාන්ත අංශය සමඟ සම්බන්ධ වන පීඨයේ කේන්ද්‍රස්ථානය ලෙස මෙම මධ්‍යස්ථානය (IICFCT) කටයුතු කරයි. පීඨය වෙනුවෙන් උපදේශන පැවරුම් සිදු කිරීම සඳහා අවසන් වසරේ සියලුම සිසුන් කර්මාන්ත වෙත ස්ථානගත කිරීමේ කටයුතු සම්බන්ධීකරණය ඇතුළු විවිධ කාර්යයන් මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කරයි. IICFCT මඟින් විශ්වවිද්‍යාල සිසුන්ට අධ්‍යයන අත්දැකීමක් මෙන්ම පීඨ සාමාජිකයින්ට සහයෝගී පර්යේෂණ අවස්ථා ලබා දීමට ද කටයුතු කරන අතර කර්මාන්ත සඳහා විශ්වසනීය පිරිවැය ඵලදායි ක්‍රම පිළිබඳව දැනුම සපයනු ලබයි. මෙම මධ්‍යස්ථානය මඟින් පරිගණක සහ ඉංජිනේරු තාක්ෂණ විෂය පථය කේන්ද්‍ර කර ගනිමින් ඉතා සාර්ථක කර්මාන්ත සංසද දෙකක් 2023 ජූලි මාසයේදී පවත්වන ලදී. පීඨයේ විෂයමාලා සංශෝධන ක්‍රියාවලියේදී කර්මාන්ත ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් විසින් වටිනා අදහස් සහ යෝජනා ලබා දීමෙන් සහයෝගය ලබා දෙන ලදි. මෙම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා වූ ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශයේ ආචාර්ය ප්‍රදීප් සමරසිංහ මහතා විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධීකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා වශයෙන් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ වාණිජකරණ කටයුතු සඳහා දායක විය.

- තාක්ෂණ අධ්‍යාපනයේ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CETE)

2022 නොවැම්බර් මස ආරම්භ කරන ලද තාක්ෂණ අධ්‍යාපනයේ විශිෂ්ටතා මධ්‍යස්ථානය, වැඩමුළු කිහිපයක් සංවිධානය කරමින් පීඨයේ ඉගැන්වීමේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා අඛණ්ඩව අගනා සේවාවක් සපයන ලදී. මෙයට අමතරව, 2023 මැයි මාසයේදී කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද ඉගැන්වීම් සහ ඉගෙනුම් ශිෂ්‍යත්ව පිළිබඳ ප්‍රථම වරට පවත්වන ලද පර්යේෂණ සමුළුවේ සම සංවිධායකයෙකු ලෙස තාක්ෂණ අධ්‍යාපනයේ විශිෂ්ටතා මධ්‍යස්ථානය (CETE) කටයුතු කරන ලදී. ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශයේ ආචාර්ය තිළිණි රූපසිංහ මහත්මිය මෙම සමුළුවේ සභාපති ලෙස කටයුතු කළාය.

- උසස් ද්‍රව්‍ය සහ ස්මාර්ට් නිෂ්පාදන සඳහා මධ්‍යස්ථානය (CAMSM)

2022 දී පිහිටුවන ලද CAMSM හි ප්‍රධාන අරමුණු වන්නේ ඉංජිනේරු සහ ජෛව පද්ධති තාක්ෂණ පිළිබඳ පරිවර්තන අධ්‍යයන පර්යේෂණ පැවැත්වීම, පීඨය තුළ පර්යේෂණ පරිසර පද්ධතියක් ගොඩනැගීම, තාක්ෂණය මත පදනම් වූ ව්‍යවසායකත්වය හා ධාරිතා සංවර්ධනය කරමින් අධ්‍යාපනය, පුහුණුව හා උපදේශනය තුළින් පරිවර්තන අධ්‍යයන පර්යේෂණ පැවැත්වීම සඳහා පහසුකම් සැපයීමය. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ අරමුදල් යොදා ගනිමින් මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු 2023 දී අඛණ්ඩව සිදු කරන ලදී.

## 9.2.4. 2023 වර්ෂයේ නව බඳවාගැනීම් - සාරාංශය

වගුව 34: පරිගණක හා තාක්ෂණ පීඨයේ බඳවා ගැනීම්

| අංශය | බඳවා ගැනීම් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික | සහායකයන් |
| ***අධ්‍යයන කාර්ය මණ්ඩලය*** | | | |
| ව්‍යවහාරික පරිගණක | 03 | 03 | - |
| මෘදුකාංග ඉංජිනේරු | 01 | 01 | - |
| පරිගණක පද්ධති ඉංජිනේරු | 02 | 04 | 02 |
| ***අනධ්‍යයන කාර්ය මණ්ඩලය*** | | | |
| පීඨ කාර්යාලය | නැත | - | - |
| තාක්ෂණික නිලධාරීන් | නැත | - | - |
| රසායනාගාර සහායකයින් | 01 | - | - |

## 9.2.5. මුළු ස්ථිර කාර්ය මණ්ඩලය

වගුව 35: පරිගණක හා තාක්ෂණ පීඨයේ කාර්ය මණ්ඩලය

| අංශය | පුරුෂ | ස්ත්‍රී | මුළු ගණන | දර්ශනශූරී | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/ මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය (පරිවාස) |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යවහාරික පරිගණක** | 08 | 04 | 12 | 09 | - | 09 | 03 |
| **පරිගණක පද්ධති ඉංජිනේරු** | 08 | 03 | 11 | 06 | 01 | 05 | 05 |
| **මෘදුකාංග ඉංජිනේරු** | 04 | 06 | 10 | 05 | - | 06 | 04 |
| **මුළු ගණන** | **20** | **13** | **33** | **20** | **01** | **20** | **12** |

මහාචාර්ය/ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය - 3.03%
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - 60.6%
කථිකාචාර්ය (පරිවාස) - 36.36%





සංවර්ධනය වෙමින් පවතින ලෝකය සඳහා විද්‍යාව පිළිබඳ කාන්තා සංවිධානය (OWSD) හා එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් පිරිනමනු ලබන US$ 50,000 ක් වටිනා මුල් වෘත්තීය සාමාජිකත්වය 2023 දී ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශයේ ආචාර්ය ඉඳුනි ඩබ්ලිව්. සිරිවර්ධන මහත්මියට හිමි විය. 2023- උප කුලපති සම්මාන ප්‍රදානෝත්සවයේදී පරිගණක පද්ධති ඉංජිනේරු අංශයේ ආචාර්ය රසික රාජපක්ෂ මහතා පරිගණක හා තාක්ෂණ පීඨයේ විශිෂ්ටතම තරුණ පර්යේෂකයා ලෙසත් පරිගණක හා තාක්ෂණ පීඨයේ සුචිගත සඟරාවේ වැඩිම ප්‍රකාශන සංඛ්‍යාවක පළ කිරීම් සහිත පර්යේෂකයා සඳහා වන සම්මානයත් ලබා ගන්නා ලදී.

මෙයට අමතරව, අධ්‍යයන කාර්ය මණ්ඩලයේ බොහෝ සාමාජිකයින් ඔවුන්ගේ පර්යේෂණ ප්‍රකාශන සඳහා සනාතන සහා සම්මාන ලබා ඇත.

## 9.2.6. පීඨය මගින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

පරිගණක හා තාක්ෂණ පීඨය විසින් උපාධි පාඨමාලා තුනක් පිරිනමනු ලබයි.

- පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය

මෙම උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරාගනු ලබන්නේ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ ගණිත විෂය ධාරාවෙන් වන අතර 2023 වසරේ බඳවා ගත් පිරිස 65කි. පළමු සිසුන් කණ්ඩායම 2023 දී උපාධිය ලබා ගන්නා ලදී.

- ඉංජිනේරු තාක්ෂණවේදය පිළිබඳ ගෞරව උපාධිය (BET)

මෙම උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරාගනු ලබන්නේ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ධාරාවෙන් වන අතර 2023 දී සිසුන් 100ක් බඳවා ගන්නා ලදි. මෙම වැඩසටහනේ දෙවන සිසුන් කණ්ඩායම 2023 දී උපාධි ලබා ගන්නා ලදි.

- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ ගෞරව උපාධිය (BICT)

මෙම උපාධි වැඩසටහන සඳහා සිසුන් තෝරාගනු ලබන්නේ අ.පො.ස (උසස් පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ධාරාවෙන් වන අතර 2023 වසරේ බඳවා ගත් සිසුන් සංඛ්‍යාව 89 කි. මෙම වැඩසටහනේ දෙවන සිසුන් කණ්ඩායම 2023 දී උපාධිය ලබා ගන්නා ලදි.

යෝජිත ජෛව පද්ධති තාක්ෂණ උපාධි වැඩසටහන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ යෝජනා 2023 වසර අවසානයේදී ලැබුණි.

## 9.2.7. පර්යේෂණ

2023 දී, පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශයේ ආචාර්ය අනුරාධි වෙල්හෙන්ගේ විසින් මාර්ගගත අධ්‍යාපනය සඳහා උපකාර වන Virtual reality embedded systems electronic lab simulator පිළිබඳ සිය පර්යේෂණය අවසන් කළ අතර මේ සඳහා අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන මඟින් අරමුදල් ලබා දී ඇත.

2021 සහ 2022 වර්ෂවලදී කාර්ය මණ්ඩලය විසින් ආරම්භ කර ඇති පහත අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන යටතේ සිදු කෙරෙන පර්යේෂණ මෙම වර්ෂයේදී ද ක්‍රියාත්මක වේ.

1. ආචාර්ය කසුන් ප්‍රනාන්දු- උස් ගොඩනැගිලි සංකීර්ණවල විදුලිය නිපදවීමට ප්‍රශස්ත සුළං මෝල් තල පද්ධතිය
2. ආචාර්ය ලාලිත ලියනගේ - පරිගණක හා තාක්ෂණ පීඨය අවට පහසුවෙන් ගෙන යා හැකි ජල තත්ත්ව තක්සේරුව
3. ආචාර්ය ඉඳුනි ඩබ්ලිව් සිරිවර්ධන - අගය එකතු කළ පෝෂණීය නිෂ්පාදන සඳහා Nano-encapsulation of tea polyphenols

4. ආචාර්ය ආර්.ආර්.එල්.යූ.අයි.රාජපක්ෂ - විවේකී තත්වයේදී ක්‍රියාකාරී මොළයේ සම්බන්ධතාවය සඳහා "FMRI analysis using machine learning" deep learning algorithms"
5. ආචාර්ය ප්‍රදීප් ඩබ්ලිව් සමරසේකර - ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ CKDu සඳහා අවම අවදානමක් සහිත භූගත ජල මූලාශ්‍ර හඳුනා ගැනීම

2023 වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් නව අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන තුනක් යටතේ පහත සඳහන් පර්යේෂණ සිදු කර ඇත.

1. ආචාර්ය අමිල ජීවන්දර - ශ්‍රී ලංකාවේ පාම් ඔයිල් කර්මාන්තයේ ජනනය වන අපද්‍රව්‍ය යොදා ගනිමින් බිත්ති පුවරුවක් ඉදිකිරීම.
2. ආචාර්ය ඩබ්ලිව්.ඩී.සී. උදයංග - වෛද්‍ය අංශයෙන් බැහැර කරන ප්ලාස්ටික් අපද්‍රව්‍ය pyrolysis conversion tomaterial energy නිපදවීම සඳහා යොදාගැනීම.
3. ආචාර්ය ශකිලා පතිරණ - තෙල් සහිත කාර්මික අපජලය සඳහා ජීව විද්‍යාත්මක පිරිපහදු පද්ධතියක් නිර්මාණය කිරීම.

2023 දී පීඨ සාමාජිකයින් පර්යේෂණ සඳහා සැලකිය යුතු මට්ටමක බාහිර අරමුදල් ලබා ගෙන ඇත.

ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශයේ ආචාර්ය චානක උදයංග සහ ආචාර්ය ශකිලා පතිරණ විසින් විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ ඔවුන්ගේ පර්යේෂණ යෝජනාව වූ " Pyrolysis- based thermochemical conversion of textile sludge into energy and value-added products" සඳහා රු. 139,105,000 ක් සහ ඇ.එ.ඩො. 5000 ක් ලබා ගන්නා ලදි. මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ මහාචාර්ය ජගත් මනතුංග මහතා මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ සම විමර්ශකයෙකු ලෙස කටයුතු කරයි.

සංවර්ධනය වෙමින් පවතින ලෝකය සඳහා විද්‍යාව පිළිබඳ කාන්තා සංවිධානය (OWSD) හා එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) විසින් එක්ව පිරිනමනු ලබන මුල් වෘත්තීය සාමාජිකත්වය 2023 වර්ෂයේ දී ව්‍යවහාරික පරිගණක අධ්‍යයන අංශයේ ආචාර්ය ඉඳුනි ඩබ්ලිව්. සිරිවර්ධන මහත්මියට හිමි විය. වසර 3ක සාමාජිකත්ව කාලය තුළ පර්යේෂණ ව්‍යාපෘති සිදු කිරීම සඳහාත් පරිගණක හා තාක්ෂණ පීඨයේ උසස් භෞතික සහ ස්මාර්ට් නිෂ්පාදන සඳහා වන මධ්‍යස්ථානයේ (CAMSM) පර්යේෂණ ආරම්භ කිරීම සඳහාත් ඇයට ඇ.ඩො. 50,000 දක්වා මුදලක් ලැබෙනු ඇත. ඇයගේ පර්යේෂණ ව්‍යාපෘතිය "value-added nutraceutical products from Sri Lankan elderberry (Sambucus nigra) using nano-encapsulation techniques" දක්වා වැඩිදියුණු කෙරෙනු ඇත.

පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශයේ ආචාර්ය රසික රාජපක්ෂ මහතා විසින් විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ තරඟකාරී පර්යේෂණ ප්‍රදාන යෝජනා ක්‍රමය යටතේ ඔහුගේ පර්යේෂණ යෝජනාව වූ "to develop an Automated AI job recommendation, optimisation and analysis system" සඳහා රු. මිලියන 9කට අධික මුදලක් ලබාගෙන ඇත.

පරිගණක පද්ධති ඉංජිනේරු අංශයේ ආචාර්ය රසික රාජපක්ෂ, මෘදුකාංග ඉංජිනේරු අංශයේ ආචාර්ය සිදත් ලියනගේ සහ ව්‍යවහාරික පරිගණක අධ්‍යයනාංශයේ ආචාර්ය චමිලි පුෂ්පකුමාර යන අය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය විසින් මෙහෙයවන ලද පර්යේෂණ කණ්ඩායමකට එකතුව කටයුතු කරන ලදී. පාකිස්ථානයේ ස්ථාපිත දකුණු ආසියාව සඳහා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය සඳහා කෘතිම බුද්ධිය යොදා ගැනීමේ සහයෝගිතා සංවිධානය (AI-Sarosh) මඟින් කැනේඩියානු ඩොලර් 60,000 ක් මේ සඳහා ලබා දී ඇති අතර එහි පර්යේෂණ මාතෘකාව වූයේ "ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ AI-Powered Population-based Birth Cohort Study" යන්නයි.





## 9.2.8. 2023 වර්ෂයේ දී පීඨය මගින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ

තාක්ෂණය සහ පරිගණකකරණයේ ප්‍රගතිය පිළිබඳ 8 වැනි ජාත්‍යන්තර සමුළුව (ICATC 2023) 2023 දෙසැම්බර් 15 වැනි දින "තිරසාර ආර්ථිකයක් සඳහා තාක්ෂණය" යන තේමාව යටතේ දෙමුහුන් ආකාරයෙන් පැවැත්විණි. ලොව පුරා සිටින විද්වතුන් ඔවුන්ගේ තාක්ෂණික, විද්‍යාත්මක සහ සමාජ-ආර්ථික සොයාගැනීම් එක්රැස් කිරීමට සහ බෙදා ගැනීමටත් ඔවුන් අතර සහයෝගීතාවයන් ආරම්භ කිරීමටත් පවත්නා වාර්ෂික උත්සවයක් ලෙස මෙම වැඩසටහන සංවිධානය කරන ලදි. මෘදුකාංග ඉංජිනේරු අංශයේ ආචාර්ය සඳලි කස්තුරිආරච්චි මෙම සම්මන්ත්‍රණයේ මූලාසනය ගෙන කටයුතු කළාය. ඕස්ට්‍රේලියාවේ සිඩ්නිහි තාක්ෂණ විශ්ව විද්‍යාලයේ ආචාර්ය Yu-Kai Wang විසින් "multi disciplinary research based on computational intelligence and neuro science" යන මාතෘකාව යටතේ ප්‍රධාන දේශනය පවත්වන ලදී. AI සහ රොබෝ තාක්ෂණය, Wi-Fi ජාල සුරක්ෂිත කිරීම පිළිබඳ වැඩමුළු දෙකක් සහ ශිෂ්‍ය පර්යේෂණ සම්මන්ත්‍රණයක් ද සමුළුවේ කොටසක් ලෙස සංවිධානය කර තිබුණි.

## 9.2.9. පරිගණක හා තාක්ෂණ පීඨයේ යටිතල පහසුකම් සංවර්ධනය

පරිගණක හා තාක්ෂණ පීඨ ඉතිහාසයේ ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, පෑලියගොඩ පිහිටි තාවකාලික පරිශ්‍රයේ සිට 2023 ජනවාරි 26 වන දින මෙම පීඨය නව ගොඩනැගිලි සංකීර්ණයේ විද්‍යාගාර ගොඩනැගිල්ල වෙත ගෙන යන ලදී. ඉතිරි ගොඩනැගිලිවල කටයුතු 2023 වසර අවසන් වන විට නිම කිරීමට නියමිතය. ගොඩනැගිලි 6 කින් සමන්විත සම්පූර්ණ ගොඩනැගිලි සංකීර්ණය විවෘත කිරීම 2024 වසරේ මුල් භාගයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත. විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් ව්‍යාපෘතිය මගින් අරමුදල් සපයන මෙම නව ගොඩනැගිලි සංකීර්ණය සඳහා ශ්‍රී ලංකා හරිත ගොඩනැගිලි කවුන්සිලය සහ නාගරික සංවර්ධන අධිකාරියේ හරිත ගොඩනැගිලි ශ්‍රේණිගත කිරීමේ යෝජනා ක්‍රම යටතේ ප්ලැටිනම් ශ්‍රේණිගත කිරීමක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

## 9.2.10. අදාළ ක්ෂේත්‍රයේ කර්මාන්ත සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ හවුල්කාරිත්වය

පරිගණක හා තාක්ෂණය සඳහා වන කර්මාන්ත අන්තර් ක්‍රියාකාරී මධ්‍යස්ථානය (IICfCT) පරිගණක හා තාක්ෂණ පීඨයේ කර්මාන්ත හවුල්කාරිත්වය සහ සහයෝගිතාව හා සම්බන්ධ ක්‍රියාකාරකම් කළමනාකරණය කරන කාර්මික අංශය ලෙස කටයුතු කරයි. පරිගණක හා තාක්ෂණය සඳහා වන කර්මාන්ත අන්තර් ක්‍රියාකාරී මධ්‍යස්ථානය (IICfCT) විසින් ආසියානු සංවර්ධන බැංකුවේ ප්‍රදානයක් යටතේ ශ්‍රී ලංකාවේ නියමු වැඩසටහනක් ලෙස "දැනුම හුවමාරු හවුල්කාරිත්වය - KXP නම් වැඩසටහනක් ආරම්භ කර ඇත. KXP යනු පීඨය මඟින් ආරම්භ කළ ප්‍රධාන පර්යේෂණ වැඩසටහනක් වන අතර එමඟින් විශ්වවිද්‍යාල සහ සහයෝගිතා අංශය අතර පූර්ණ අරමුදල් සහිත පර්යේෂණ සිදු කිරීම සඳහා මග පාදයි. මෙහිදී විද්වතුන් සහ සමාගම් විශේෂඥයින් තරඟකාරිත්වය සහ ඵලදායිතාව වැඩි කර ගැනීමේ අරමුණෙන් ඔවුන්ගේ සමාගම් හා සම්බන්ධ කටයුතුවලදී එම වැඩසටහන් හවුල්ව අධීක්ෂණය කරයි. දැනුම හුවමාරු හවුල්කාරිත්ව වැඩසටහන යටතේ, ප්‍රධාන ව්‍යාපෘති දෙකක් 2022 වර්ෂයේදී විශ්වවිද්‍යාල-කර්මාන්ත පර්යේෂණ සහයෝගිතා වැඩසටහන් ලෙස ආරම්භ කළ අතර, එම වැඩසටහන් දෙක 2023 දී විධිමත් ලෙස නිම කරන ලදී. මෙම හවුල්කාරිත්ව වැඩසටහන් MAS Holdings සහ Orel Corporation යන ආයතන සමඟ සිදු කරන ලදි.

2023 වර්ෂයේදී සිසුන් 250 ක් පමණ ප්‍රායෝගික පුහුණු සඳහා කර්මාන්තවලට අනුයුක්ත කර ඇත. බොහෝ සිසුන් කර්මාන්ත සහයෝගී පර්යේෂණ ව්‍යාපෘතිවල වැඩ කරමින් කර්මාන්ත අවශ්‍යතා ඉටු කර සාර්ථක ප්‍රගතියක් අත් කර ගෙන ඇත. එයට අමතරව, පීඨයේ උපාධි අපේක්ෂකයින් සඳහා ඔවුන්ගේ කර්මාන්ත සූදානම වැඩිදියුණු කිරීමටත් ඔවුන්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීමත් සඳහා පීඨය විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ පූර්ණ දින වැඩමුළු රාශියක් පවත්වා ඇත.

## 9.2.11. පීඨ සාමාජිකයින්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය

කාර්ය මණ්ඩල සාමාජිකයින් ඔවුන්ගේ අඛණ්ඩ වෘත්තීය දියුණුව සඳහා වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සහතිකලත් විවිධ වැඩසටහන්වලට සහභාගී විය.

2023 ජූනි මස 27 හා 28 යන දිනවල ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් පවත්වන ලද ISO 21001:2018 හා 21001:2018 ප්‍රමිති සහ අධ්‍යාපනික සංවිධාන කළමනාකරණ පද්ධති ක්‍රියාත්මක කිරීම පිළිබඳ දෙදින වැඩමුළුවකට ආචාර්ය ඉඳුනි ඩබ්ලිව්. සිරිවර්ධන සහභාගී වුවාය.

## 9.2.12. ශිෂ්‍ය ක්‍රියාකාරකම්

පරිගණක හා තාක්ෂණ පීඨයේ සිසුන් ශිෂ්‍ය සමාජ සහ සංවිධාන හරහා විවිධ විෂය බාහිර ක්‍රියාකාරකම්වල සහ CSR ව්‍යාපෘතිවල ක්‍රියාකාරීව නිරත වේ. පරිගණක හා තාක්ෂණ පීඨයේ හරිත සමාජය, පරිගණක හා තාක්ෂණ පීඨයේ ශිෂ්‍ය සංගමය, ඉංජිනේරු තාක්ෂණ ශිෂ්‍ය සංගමය (ETSA), තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය සංගමය (ITSA), තොරතුරු පද්ධති විගණන සහ පාලන සංගමය (ISACA), කැලණිය විශ්වවිද්‍යාලයේ Legion සමාජය සහ පරිගණක විද්‍යා ශිෂ්‍ය සංගමය යන ඒවා ක්‍රියාශීලී ශිෂ්‍ය සංගම් වේ. විවෘත මූලාශ්‍ර මෘදුකාංග සංවර්ධන ප්‍රජාවක් 2023 වර්ෂයේ දී පිහිටුවන ලදී.



**ආචාර්ය ආර්.එම්.සී.එස්. පුෂ්පකුමාර**
**පීඨාධිපති/ පරිගණක හා තාක්ෂණ පීඨය**





## 9.3. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

### 9.3.1. දැක්ම

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ (FGS) දැක්ම පුරාණ කාලයේ සිට පැවත එන අධ්‍යාපනයේ අරමුණ මත පදනම්ව නිර්මාණය වී ඇත. එනම් "දැනුම හා සැසඳිය හැකි අන් බලයක් නොමැත" හෝ පාලියෙහි එන නත්ථි විජ්ජා සමාම්පන්න හෝ "දැනුම යනු බලයයි" යන අදහස ඉදිරිපත් කරන, ipsa scientia potestas est යන ලතින් වැකිය.' එබැවින්, එහි උපාධිධාරීන් පර්යේෂණ සඳහා කැපවීම, නව අදහස්වලට විවෘතවීම සහ විශ්ලේෂණ නිපුණතා ප්‍රගුණ කිරීම තුළින් විවිධ ක්ෂේත්‍ර පිළිබඳ ඔවුන්ගේ දැනුම මනාව භාවිත කරමින් ලෝකය වඩාත් යහපත් ස්ථානයක් බවට පත් කරනු ඇතැයි උපාධි අධ්‍යයන පීඨය අපේක්ෂා කරයි.

### 9.3.2. මෙහෙවර

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ මෙහෙවර වන්නේ පශ්චාද් උපාධි මට්ටමින් පර්යේෂණ කිරීම සහ බෙදා හැරීම දිරිමත් කිරීමයි. පශ්චාද් උපාධි අධ්‍යාපනයේ විශිෂ්ටත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන් සහ පරිපාලන කාර්ය මණ්ඩලය සමඟ එක්ව කටයුතු කරයි. එබැවින්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සිය සිසුන් සඳහා ක්‍රියාශීලී බුද්ධිමය වාතාවරණයක් නිර්මාණය කිරීම සඳහා පශ්චාද් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති උපාධි, දර්ශනපති උපාධි සහ දර්ශනශූරි උපාධි යන පශ්චාද් උපාධි වැඩසටහන් පිරිනැමීම සඳහා විශ්වවිද්‍යාලය තුළ ඇති සියලුම අධ්‍යයන අංශ සමඟ එක්ව කටයුතු කරයි.

### 9.3.3. ආයතනික ව්‍යුහය පිළිබඳ සාරංශය

පීඨයේ අධ්‍යයන හා පරිපාලන කටයුතුවල ප්‍රධානියා වන්නේ උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයාය. පීඨයේ පරිපාලන කටයුතු සඳහා නියෝජ්‍ය ලේඛකාධිකාරීවරයකු සිටින අතර පශ්චාද් උපාධි මට්ටමේ වැඩසටහන්වල ගාස්තු අයකිරීමේ මූල්‍ය කටයුතු පහසු කිරීම සඳහා සහකාර මූල්‍යාධිකාරීවරයෙකු සහිත මූල්‍ය අංශයක් විධිමත් ලෙස ස්ථාපනය කර ඇත.

### 9.3.4. පීඨය විසින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මඟින් පහත දැක්වෙන අධ්‍යයන මණ්ඩලවල (BoS) පුළුල් විෂය ක්ෂේත්‍ර යටතේ පශ්චාද් උපාධි වැඩසටහන් 60ක් පිරිනමනු ලබයි.

- i. වාණිජ හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- ii. පරිගණක විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- iii. ඩිජිටල් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- iv. මානවශාස්ත්‍ර පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- v. විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- vi. සමාජීය විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- vii. වෛද්‍ය විද්‍යා පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- viii. බහු විධ අධ්‍යයන පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
- ix. තාක්ෂණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

Covid-19 වසංගතය සහ රටේ පැවති ආර්ථික අර්බුදය හේතු කොට ගෙන ඇති වූ විවිධ බාධක මධ්‍යයේ වුවද, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට 2300 කට අධික සිසුන් සංඛ්‍යාවක් බඳවා ගැනීමට හැකි විය. තවද, පහත සඳහන් නව වැඩසටහන් තුන ආරම්භ කර එහි අධ්‍යයන කටයුතු ද ආරම්භ කරන ලදී.

i. මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව

ii. වෘත්තීය මූල්‍ය පිළිබඳ පශ්චාද් උපාධිය

## 9.3.5. තාක්ෂණ අධ්‍යයන මණ්ඩලය පිහිටුවීම

2023 වර්ෂයේදී පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සිය නවවන අධ්‍යයන මණ්ඩලය සාර්ථක ලෙස ස්ථාපනය කිරීමට සමත් විය. මෙම අධ්‍යයන මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූයේ තාක්ෂණ විෂය ධාරාවේ ඉගැන්වීම් සහ පර්යේෂණ ශක්තිමත් කිරීමය. පරිගණක හා තාක්ෂණ පීඨය මෙම අධ්‍යයන මණ්ඩලය පිහිටුවීමට මූලිකත්වය ගන්නා ලදී. එම වසරේදීම පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයට එහි පළමු දර්ශනපති උපාධිය සඳහා  අයදුම්පත් ලැබුණි.

## 9.3.6. පර්යේෂණ

### අ. 2023 වර්ෂයේ දී පීඨය විසින් සංවිධානය කරන ලද සම්මන්ත්‍රණ

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් නොවැම්බර් මාසයේදී ජාත්‍යන්තර පශ්චාද් උපාධි පර්යේෂණ සමුළුව (IPRC) සංවිධානය කරන ලදී. එය පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් අඛණ්ඩව සංවිධානය කරනු ලැබූ 23 වැනි සමුළුව විය. සම්මන්ත්‍රණයේ තේමාව වූයේ "පර්යේෂණ තුළින් අධ්‍යයන ශක්තිය සාරවත් කිරීම" වන අතර, සමාරම්භක උත්සවයේ ප්‍රධාන දේශනය ඉන්දියාවේ, බෙංගාලූරුහි ජෛව විද්‍යා පිළිබඳ ජාතික මධ්‍යස්ථානයේ (NCBS) මහාචාර්ය පද්මනාභන් බාලරාම් මහතා විසින් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයේ ගෞරවනීය ආරාධිත අමුත්තා වූ ඉන්දියාවේ ජවහර්ලාල් නේරු උසස් විද්‍යාත්මක පර්යේෂණ මධ්‍යස්ථානයේ අණුක ජීව විද්‍යාව සහ ජාන විද්‍යා අංශයේ මහාචාර්ය හේමලතා බාලරාම් මහත්මිය සම්මන්ත්‍රණයට සහභාගී වූවාය. ඉන් අනතුරුව නවසීලන්තය, චීනය සහ ඉන්දියාවේ මහාචාර්යවරුන්ගේ සහභාගීත්වයෙන් සැසි හතරක් පවත්වන ලදී. සාරාංශ පත්‍රිකා 200 කට අධික ප්‍රමාණයක් ලැබුණු අතර, සමුළුවට ඉදිරිපත් කිරීම සඳහා එම සාරාංශ පත්‍රිකා අතරින් 100 ක් පමණ තෝරා ගන්නා ලදී. සමුළුව දෙමුහුම් ආකාරයෙන් සංවිධානය කර තිබුණු අතර සාරාංශ, වැඩසටහන් පොත ඇතුළු සියලුම ප්‍රකාශන ඩිජිටල් ක්‍රමයට ප්‍රකාශයට පත් කරන ලදී.

### ආ. පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ සඟරාව

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් එහි සඟරාව වසරකට කලාප දෙකක් නිකුත් කිරීමටත් සුචිගත කිරීමටත් සැලසුම් කර ඇත. තවද, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ සුචිගත කිරීමේ අවශ්‍යතාවලට සරිලන පරිදි සඟරාවේ නම වෙනස් කිරීම පිළිබඳව පීඨ මණ්ඩලයේදී සාකච්ඡා කෙරිණි. මේ සඳහා 2024 මුල් භාගය වන විට පීඨ මණ්ඩලයෙන් සහ සනාතන සභාවෙන් අවසන් අනුමැතිය ලබා ගැනීමට සැලසුම් කර ඇත. 2023 නොවැම්බර් මාසයේ පැවති ජාත්‍යන්තර පශ්චාද් උපාධි පර්යේෂණ සමුළුව සඳහා උපුටා ගැනීම් ඉදිරිපත් කළ පර්යේෂකයන් සහ කතුවරුන්ගෙන් සම්පූර්ණ පත්‍රිකා ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. තවද, සම්මන්ත්‍රණයේ සමාලෝචන මණ්ඩල සහ සැසි සභාපතිවරුන් විසින් නිර්දේශ කරන ලද සාරාංශ පත්‍රිකාවල කතුවරුන්ගෙන් ද සම්පූර්ණ පත්‍රිකා ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. කැලණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද 'විද්වත් කෘතීන් ප්‍රකාශයට පත් කිරීමට පිළිගත් සඟරා සොයා ගැනීමේ මාර්ගෝපදේශයී හි ඇතුළත් සඟරාවක අවම වශයෙන් එක් සම්පූර්ණ පත්‍රිකාවක්වත් පළ කිරීම සියලුම MPhil සහ PhD අපේක්ෂකයින්ට අනිවාර්ය කරන ලදී. වසර අවසන් වන විට, සියලුම සම්පූර්ණ පත්‍රිකා සමාලෝචනය කර 2024 පළමු කාර්තුව තුළ ප්‍රකාශයට පත් කිරීමට නියමිත විය.





## 9.3.7. ඩිජිටල්කරණය

### අ. වවුචර් සහ අයවැය කළමනාකරණ ක්‍රමය

පශ්චාද් උපාධි වැඩසටහන් අයවැය සහ වවුචර සම්බන්ධ ක්‍රියාවලීන් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට පහසුකම් සැලසීම සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ ප්‍රථම වරට මාර්ගගත අයවැය සහ වවුචර් ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. ඉලක්කම් 16 කින් යුත් කේතය 2021 දී දියත් කරන ලද අතර, එය 2022-2023 වසර සඳහා පශ්චාද් උපාධි වැඩසටහන්වලින් හඳුනා නොගත් ආදායම අඩු වීමට හේතු විය. සේවා ශක්තිමත් කිරීම සඳහා පද්ධතිය අඛණ්ඩව වැඩිදියුණු කිරීම් වසර පුරා සිදු කරන ලදී.

### ආ. M.Phil/ Ph.D පද්ධතිය සහ සම්පූර්ණ ගෙවීම් විසඳුම ක්‍රියාත්මක කිරීම

අයදුම්පත්‍ර බාර ගැනීමේ සිට උපාධිය දක්වා වු M.Phil සහ Ph.D උපාධි ආශ්‍රිත ක්‍රියාවලීන් ඩිජිටල්කරණය කිරීම සඳහා සභාවෙන් මූල්‍ය සහ නියාමන අනුමැතිය ලබා ගන්නා ලදී. ඒ අනුව, පද්ධතියේ අවශ්‍යතා පිරිවිතර, සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම 2023 මුල් භාගයේදී ආරම්භ කෙරිණි. තවද, උප පද්ධතියක් ලෙස, M.Phil /Ph.D පද්ධතියට, පාර්ශවකරුවන් සඳහා සම්පූර්ණ ගෙවීම පිළිබඳ විසඳුම් පැකේජයක් හඳුන්වා දීම සඳහා මහජන බැංකුව සමඟ සාකච්ඡා මාලාවක් පවත්වන ලදී. එයට මාර්ගගත සහ මාර්ගගත නොවන හා තත්‍ය කාලීනව සිදු කරන ගෙවීම් යාවත්කාලීන කිරීම්, ආයතනික බැංකුකරණය, මහජන බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සඳහා මාස 24ක 0% පොලී වාරික සැලැස්මක්, QR මත පදනම් වූ ගෙවීම්, Point of Sales (POS) යන්ත්‍ර හඳුන්වාදීම යනාදිය ඇතුළත් වේ. මෙම සම්පූර්ණ ගෙවීම් විසඳුම් පැකේජය ක්‍රියාත්මක කිරීම සඳහා පාලක සභාවේ අනුමැතිය වසරේ අග භාගයේදී ලබා ගන්නා ලදී.

### ඇ. උපාධි වැඩසටහන් කළමනාකරණ තොරතුරු පද්ධතිය

පාඨමාලා අනුව ශාස්ත්‍රපති උපාධි ලබන සියලුම සිසුන්ට සපයන වත්මන් පරිගණක පද්ධතිය පාර්ශ්වකරුවන්ගේ වර්තමාන සහ ඉදිරි අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩිදියුණු කළ යුතු බවට නිරීක්ෂණය විය. එබැවින් ඒ සඳහා නව ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය මූලික සැලසුම් පිළිබඳව සාකච්ඡා පවත්වන ලදී. තවද, සිසුන්ට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පරිගණක පද්ධතියට ප්‍රවේශ වීම සඳහා ජංගම දුරකථන යෙදුමක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය අනුමැතිය ද ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, සම්පත් සීමාවීම හේතු කොට ගෙන පැරණි පද්ධතිය වෙනුවට සම්පූර්ණයෙන්ම නව පද්ධතියක් ස්ථාපනය කිරීමට නොහැකි විය. එබැවින් තාවකාලික විසඳුමක් ලෙස පවතින පද්ධතියට නව විශේෂාංග /මොඩියුල ප්‍රශස්ත මට්ටමින් වැඩිදියුණු කිරීමට සැලසුම් කරන ලදී. සැලසුම් කර ඇති වැඩිදියුණු කිරීම් සහ ප්‍රශස්තකරණය 2024 මැද භාගය වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## 9.3.8. විදේශීය හවුල්කරුවන් සමඟ අධ්‍යයන සහයෝගීතාව

### අ. බංගලාදේශයෙන් පිරිනමනු ලබනු MBA උපාධිය

කැලණිය විශ්වවිද්‍යාලය 2019 වසරේ සිට බංගලාදේශයේ Cambrian ජාත්‍යන්තර අධ්‍යයන මධ්‍යස්ථානය (CISC) සමඟ සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කරගෙන යනු ලබයි. මෙම සහයෝගීතාවයට අනුව බංගලාදේශයෙන් MBA උපාධිය පිරිනමනු ලබන අතර, 2023 වසර දක්වා කණ්ඩායම් තුනක් බඳවා ගෙන ඇත.

### ආ. බංගලාදේශයෙන් පිරිනමනු ලබන M.Phil /PhD උපාධි

2022 නොවැම්බර් මාසයේදී, කැලණිය විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ MPhil සහ PhD උපාධි පිරිනැමීම සඳහා එම ආයතනය සමඟ වෙනම ගිවිසුමක් අත්සන් කරන ලදී. 2022 නොවැම්බර් මාසයේදී බංගලාදේශයට ගිය කැලණිය විශ්වවිද්‍යාල කණ්ඩායම විසින් සුදුසු අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයකට යොමු කර අයදුම්පත්

සලකා බැලීම සඳහා වාණිජ හා ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ අධ්‍යයන මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. 2023 වර්ෂයේ දී මුහුණු පොත හරහා ප්‍රචාරණ ව්‍යාපාරයක් සිදු කරන ලද අතර එයට ප්‍රතිචාර 100 කට වඩා වැඩි ප්‍රමාණයක් ලැබිණි. 2023 අවසානය වන විට, බංගලාදේශයෙන් ලැබුණු අයදුම්පත් 20 න් MPhil /PhD උපාධි සඳහා සිසුන් තිදෙනෙකු ලියාපදිංචි වී ඇත.

**ඇ. බංගලාදේශයේ පැවති අධ්‍යාපන ප්‍රදර්ශනය**

සිසුන්, කාර්ය මණ්ඩලය සහ අධ්‍යයන ප්‍රජාව සමඟ අන්තර් සම්බන්ධතා පැවැත්වීමට සහ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීමටත් සමාලෝචනය කිරීමටත් 2023 මාර්තු 1 සිට 13 දක්වා විශ්ව විද්‍යාලයේ එක් සාමාජිකයෙක් බංග්ලාදේශයේ සංචාරය කළේය ගියේය. කැලණිය විශ්වවිද්‍යාලය සහ බංග්ලාදේශයේ BSB Cambrian අධ්‍යාපන කණ්ඩායම එක්ව සංවිධානය කරන ලද 2023 මාර්තු 1 සිට 9 දක්වා පැවති අධ්‍යාපන ප්‍රදර්ශනයකට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය ද සහභාගී විය. අධ්‍යාපන ප්‍රදර්ශනය බංගලාදේශය පුරා Dhaka, Sylhet, Jessore, Chattogram සහ Cumilla යන නගරවලදී පවත්වන ලදී.

වැඩිදුර අධ්‍යාපනය ලබා ගැනීමට අපේක්ෂා කරන බංග්ලාදේශයේ උසස් උපාධි පර්යේෂණ සිසුන්ට විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමට එමඟින් අවස්ථාවක් සැලසේ.

**ඈ. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - චීන බඳවා ගැනීම (MBSC)**

වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශය විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MBSC) - චීන සිසුන් ඇතුළත් කර ගැනීමට අදාළ පළමු කණ්ඩායම සඳහා සිසුහු 30 දෙනෙක් ඇතුළත්ව නිටියහ. ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් ඔවුන් එම වැඩසටහන සාර්ථකව නිම කරන ලද අතර කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී (BMICH) 2024 ජනවාරි 4 වන දින පැවැත්වීමට නියමිත 140 වැනි උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලබා ගැනීමට නියමිතය.

## 9.3.9. ශාස්ත්‍රපති උපාධි වැඩසටහන් සඳහා කළමනාකරණ මාර්ගෝපදේශ

සුදුසු ලේඛනගත මාර්ගෝපදේශ නොමැතිකම හේතුවෙන් බොහෝ වැඩසටහන් සම්බන්ධීකාරකවරුන්ට තම කාර්යභාරයන් සහ වගකීම් ඉටු කිරීම අභියෝගාත්මක වී ඇති බව හඳුනාගෙන ඇත. අධ්‍යයන අංශ, අධ්‍යයන මණ්ඩල සහ උපාධි අධ්‍යයන පීඨය ඇතුළු මෙයට සම්බන්ධ වන විවිධ පාර්ශ්ව අතර අකාර්යක්ෂම සන්නිවේදන කටයුතු ද මෙම තත්ත්වය ඇති වීමට හේතු වී ඇත. එපමණක් නොව, තරඟකාරී ව්‍යාපාරික පරිසරයක පැවැත්ම උදෙසා සිසුන්ට උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීම සඳහා පශ්චාද් උපාධි වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ විශිෂ්ට ක්‍රම පිළිබඳව කැලණිය විශ්වවිද්‍යාලයේ සියලුම පාර්ශ්වයන් දැනුවත් කිරීම අවශ්‍ය වේ. මෙම සාධක සැලකිල්ලට ගනිමින්, පශ්චාද් උපාධි වැඩසටහන් කළමනාකරණය කිරීමේ සංකීර්ණතා මඟහැරවීමටත්, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන්ට මනා අවබෝධයක් සහ මග පෙන්වීමක් ලබා දීමත් අරමුණු කර ගනිමින් කළමනාකරණ මාර්ගෝපදේශ මාලාවක් සැකසීමට පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් කටයුතු ආරම්භ කරන ලදි. සන්නිවේදනය වැඩිදියුණු කිරීම, අපේක්ෂාවන් පැහැදිලි කිරීම සහ ඵලදායී සම්බන්ධීකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම මගින් මෙම වැඩසටහන්වල සමස්ත සාර්ථකත්වය සහ පිළිගැනීම සහතික කිරීම සඳහා මෙම මාර්ගෝපදේශ ඵලදායී යාන්ත්‍රණයක් වනු ඇත.





## 9.3.10. මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්ති වැඩි දියුණු කිරීම

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කර ඇතත්, ඇතැම් ප්‍රධාන ක්ෂේත්‍රවලට අදාළ උපදෙස් මඟ හැරී ඇත. එබැවින්, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය විසින් වරින් වර මාර්ගෝපදේශ සකස් කර අනුමැතිය සඳහා පීඨ මණ්ඩලයට සහ සනාතන සභාවට ඉදිරිපත් කරන ලදී. සිසුන්ට, අධීක්ෂකවරුන්ට, විභාග පරීක්ෂකවරුන්ට සහ අනෙකුත් අදාළ පාර්ශවකරුවන්ට අදාළ උපදෙස් මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්තිවලට ඇතුළත් විය. ඒ අනුව, පහත සඳහන් ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ, ආකෘති පත්‍ර සහ ආදර්ශ සකස් කර අනුමැතිය ලබා ගන්නා ලදී;

- සිසුන් ප්‍රථම වර සිසුන් ලෙස සැලකීමේ යාන්ත්‍රණය
- විභාගවලට අයදුම් කිරීම සඳහා ඇති මාර්ගෝපදේශ
- ආපසු හැරීමේ විකල්පය ඉල්ලා සිටීම සඳහා ලබා දෙන උපරිම කාලය
- MPhil / PhD සිසුන්ගේ උපාධි සම්පූර්ණ කිරීමේ අවශ්‍යතා නිදහස් කිරීම සඳහා වන නිර්ණායක
- අධීක්ෂකවරුන් සහ සිසුන් සඳහා සාධාරණව සැලකීම පිළිබඳ ප්‍රකාශය
- යෝජනා ශක්තිමත් කිරීම, ප්‍රගතිය සහ වාචික ඉදිරිපත් කිරීම් සඳහා උපදෙස්, මාර්ගෝපදේශ සහ ආකෘති
- යෝජනා ශක්තිමත් කිරීම, ප්‍රගති ඉදිරිපත් කිරීම් සහ ආචාර්ය උපාධියට උසස් කිරීමේ ඉදිරිපත් කිරීම් ඇගයීමේ නිර්ණායක
- ආචාර්ය උපාධියට උසස් කිරීමේ වාර්තාව ලිවීම පිළිබඳ ප්‍රතිපත්ති සහ උපදෙස්
- අවසාන නිබන්ධනයේදී පරීක්ෂකගේ අදහස් දැක්වීම
- පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ අධීක්ෂකවරුන්, පරිපාලනය සහ සේවය සම්බන්ධයෙන් සිසුන්ගෙන් පසුවිපරමක් ලබා ගැනීම සඳහා ආකෘති පත්‍ර
- කළමනාකරණ තොරතුරු පද්ධතියට ප්‍රතිඵල උඩුගත කිරීම සඳහා පශ්චාද් උපාධි වැඩසටහන් සම්බන්ධීකාරකවරුන්ට මාර්ගෝපදේශ
- පශ්චාද් උපාධි වැඩසටහන්වල ප්‍රගතිය අධ්‍යයන මණ්ඩලයට වාර්තා කිරීම සඳහා පවතින ආකෘති
- පරීක්ෂකයින්/සමාලෝචනය කරන්නන් විසින් නිබන්ධන ඇගයීම්/සමාලෝචන වාර්තා ඉදිරිපත් කිරීමේ ආකෘතිය

## 9.3.11. පීඨය සඳහා තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයක් පිහිටුවීම

විශ්ව විද්‍යාල තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ අතුරු නීතිවලට අනුකූලව පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය සඳහා වෙනම තත්ත්ව සහතික මධ්‍යස්ථානයක් පිහිටුවන ලදී.

## 9.3.12. නිපුණතා සංවර්ධන වැඩසටහන

MPhil /PhD සිසුන් සඳහා වන නිපුණතා සංවර්ධන වැඩසටහන වසර තුළදී සාර්ථකව නිම කරන ලදී. විශ්වවිද්‍යාලයේ MPhil සහ PhD සිසුන් හැරුණු විට බාහිර අපේක්ෂකයන් රැසක් ද මෙම වැඩසටහනට සහභාගී විය. තොරතුරු සාක්ෂරතාව, පර්යේෂණ ක්‍රමවේද, විද්‍යාත්මක ලේඛන සහ සංඛ්‍යානමය විශ්ලේෂණ පිළිබඳ පශ්චාද් උපාධි සිසුන්ගේ කුසලතා වර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය. මේ සඳහා 240 දෙනෙක් අයදුම් කළ අතර අපේක්ෂකයින් 130 ක් ලියාපදිංචි කරන ලදි. ලියාපදිංචි වූ අපේක්ෂකයන් 130 දෙනාගෙන් සිසුන් 101 දෙනෙකු ඇගයීම් සැසියට මුහුණ දීමෙන් අනතුරුව වැඩසටහන සාර්ථකව නිම කරන ලදී.

## 9.3.13. පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා අතුරු ව්‍යවස්ථා

පශ්චාද් උපාධි වැඩසටහන් සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට විධිමත් මාර්ගෝපදේශ සහ කමිටුවක් ස්ථාපිත කරන ලදී.

## 9.3.14. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා පර්යේෂණ පැවැත්වීම (SDG)

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලීම සඳහා සියලුම MPhil / PhD ව්‍යාපෘති සකස් කර ඇත. උසස් උපාධි පර්යේෂණ අයදුම්පත් සහ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවේ දී කිසියම් පර්යේෂණයක් මගින් ආවරණය වන අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගැනීම සඳහා යාන්ත්‍රණයක් ස්ථාපනය කරන ලදී.

## 9.3.15. යටිතල පහසුකම් සංවර්ධනය

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ කටයුතුවලට වැඩිවෙමින් පවතින ඉල්ලුම හා ව්‍යාප්තීන් හේතු කොටගෙන, උපාධි අධ්‍යයන පීඨ ගොඩනැගිල්ල සඳහා නව ගොඩනැගිලි කොටසක් මෙම වසර තුළ දී ඉදිකරන ලදී.



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඒ.කේ.පී.ජේ. සෙනෙවිරත්න**
**පීඨාධිපති / පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය**





# 9.4. මානවශාස්ත්‍ර පීඨය

## 9.4.1. දැක්ම

මානවශාස්ත්‍ර ක්ෂේත්‍රයේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

## 9.4.2. මෙහෙවර

භාෂාව, කලා සහ ආගමික ක්ෂේත්‍රවල අධ්‍යාපනය සහ පර්යේෂණ තුළින් මානව සම්පත් ශක්තිමත් කිරීම.

## 9.4.3. ආයතනික ව්‍යුහය පිළිබඳ සාරශය

කැලණිය විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර පීඨය සංස්කෘතීන්, සම්ප්‍රදායන් සහ භාෂාවල සම්මිශ්‍රණයකින් ගොඩනැගී ඇති අතර එහි පවත්නා බහු භාෂාමය, බහු සංස්කෘතික ප්‍රවේශය සංස්කෘතිය සහ ශිෂ්ටාචාරය අධ්‍යයනය සඳහා පොළඹවයි. එය පහත සඳහන් අධ්‍යයන අංශවලින් සමන්විත වේ.

- නාට්‍ය, සිනමා සහ රූපවාහිනී අධ්‍යයනාංශය
- ඉංග්‍රීසි අධ්‍යයනාංශය
- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය
- ලලිත කලා අධ්‍යයන අධ්‍යයනාංශය
- හින්දි අධ්‍යයනාංශය
- වාග්විද්‍යා අධ්‍යයනාංශය
- නූතන භාෂා අධ්‍යයනාංශය
- පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය
- සංස්කෘත සහ පෙරදිග ශාස්ත්‍ර අධ්‍යයනාංශය
- සිංහල අධ්‍යයනාංශය
- බටහිර සම්භාව්‍ය සංස්කෘති සහ ක්‍රිස්තියානි සංස්කෘති අධ්‍යයනාංශය
- අධ්‍යාපන ඒකකය
- සීමාවාසික සහ නිපුණතා සංවර්ධන ඒකකය

## 9.4.4. පීඨය මඟින් පිරිනමනු ලබන අධ්‍යයන වැඩසටහන්

වගුව 36 : මානවශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන වැඩසටහන් අනුව සිසුන්

| අංකය | අධ්‍යයන වැඩසටහන | සිසුන් සංඛ්‍යාව 2021/2022 |
|---|---|---|
| 1 | ශාස්ත්‍රවේදී සාමාන්‍ය කලා උපාධි වැඩසටහන | 902 |
| 2 | ව්‍යාපාර සහ චීන අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී කලා උපාධිය | 137 |
| 3 | චිත්‍රපට සහ රූපවාහිනී අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 247 |
| 4 | බෞද්ධ සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 41 |
| 5 | බෞද්ධ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 35 |
| 6 | බෞද්ධ මනෝ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 32 |
| 7 | ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 14 |
| 8 | පරිගණක අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 8 |

Table 36: (සම්බන්ධයි).

| අංකය | අධ්‍යයන වැඩසටහන | සිසුන් සංඛ්‍යාව 2021/2022 |
|---|---|---|
| 9 | නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 38 |
| 10 | ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 27 |
| 11 | ප්‍රංශ භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 28 |
| 12 | ජර්මන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 71 |
| 13 | හින්දි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 25 |
| 14 | මූර්ති කලා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 23 |
| 15 | ජපන් භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 81 |
| 16 | කොරියානු භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 45 |
| 17 | වාග් විද්‍යා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 38 |
| 18 | සාහිත්‍ය විචාරය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 6 |
| 19 | ප්‍රාසාංගික කලාව (නැටුම්) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 64 |
| 20 | පාලි භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 18 |
| 21 | ප්‍රාසාංගික කලාව (සංගීතය) පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 37 |
| 22 | රුසියානු භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 11 |
| 23 | සංස්කෘත භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 18 |
| 24 | සිංහල භාෂාව පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 185 |
| 25 | දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 151 |
| 26 | පරිවර්තන අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය් | 120 |
| 27 | වාස්තු ශාස්ත්‍ර පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 81 |
| 28 | දෘශ්‍ය කලා පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය (කලා, පරිගණක නිර්මාණ | 58 |
| 29 | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය පිළිබඳ ශාස්ත්‍රවේදී ගෞරව උපාධිය | 9 |
| | **මුළු සංඛ්‍යාව** | **2550** |

## 9.4.5. පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ විස්තර

2023 අවසන් වන විට මානශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ස්ථිර සේවක සංඛ්‍යාව 120ක් සහ තාවකාලික සේවක සංඛ්‍යාව 78ක් විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් (40.83%) ආචාර්ය උපාධිධාරීන් වන අතර, හතරෙන් එකක් (24.17%) පමණ මහාචාර්ය හෝ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු දරයි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 120 න් 56 ක්ම (46.67%) කාන්තාවන්ය.

## 9.4.6. 2023 වර්ෂයේදී කාර්ය මණ්ඩලය විසින් දිනාගත් බාහිර සම්මාන

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් බොහෝ දෙනෙක් 2023 දී ජාතික හෝ ජාත්‍යන්තර සම්මාන දිනා ගැනීමට සමත් වූහ. එම සම්මාන පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

- ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමානාත්මතා කටයුතු හඳුනා ගැනීම වෙනුවෙන් ගෞරව සම්මානයක් සහ මහාචාර්ය පදවියක් ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මහත්මියට පිරිනමන ලදි - එක්සත් රාජධානියේ වොල්වර්හැම්ප්ටන් විශ්ව විද්‍යාලය
- ජපාන විදේශ අමාත්‍යවරයාගේ ප්‍රශංසාව නූතන භාෂා  අධ්‍යයන අංශයේ මහාචාර්ය දිල්රුක්ෂි රත්නායක මහත්මිය වෙත පිරිනමන ලදී.
- නූතන භාෂා  අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එල්.කේ.එන්.සී. ප්‍රේමවර්ධන මහතාට 2023 මැයි





මාසයේදී එස්තෝනියාවේ ටැලින් විශ්වවිද්‍යාලයෙන් පිරිනමන Erasmus+ Staff Teaching Mobility ශිෂ්‍යත්වය ලබා දෙන ලදි.

- ජර්මනියේ සීගන් විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය තානාපති වැඩසටහන වෙනුවෙන් ජර්මනියේ අධ්‍යයන හුවමාරු සේවාව සහ සීගන් විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යත්ව සම්මානය නූතන භාෂා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කේ.එල්.කේ.එන්.සී. ප්‍රේමවර්ධන මහතාට 2023 ඔක්තෝබර් මාසයේ දී පිරිනමන ලදි.

## 9.4.7. පර්යේෂණ

පීඨ සාමාජිකයින්ගේ පර්යේෂණ නිමැවුම්වලින් පොත් පරිච්ඡේද 2ක් සහ සඟරා ලිපි 3ක් සම සමාලෝචනය සඳහා ඇතුළත් කර ඇති අතර සාරාංශ පත්‍රිකා 19 ක් සහ සම්පූර්ණ පත්‍රිකා සම්මන්ත්‍රණ සඳහා ඇතුළත් කර ඇත.

පහත සඳහන් සම්මන්ත්‍රණ 2023 දී පීඨය/ අධ්‍යයන අංශ විසින් සංවිධානය කරන ලදි.

- 2023 ජූලි 27 සහ 28 යන දිනවලදී පවත්වන ලද 2023 මානව ශාස්ත්‍ර පිළිබඳ 6 වැනි ජාත්‍යන්තර සමුළුව
- 2023 පෙබරවාරි 23 වන දින පවත්වන ලද 4 වන මානවශාස්ත්‍ර උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය -2022
- ලලිත කලා අධ්‍යයන අංශය විසින් සංවිධානය කරන ලද ICTM හි සංගීතය සහ සුළු ජාතීන් පිළිබඳ අධ්‍යයන කණ්ඩායමේ 12 වැනි සම්මන්ත්‍රණය
- ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ අංශය විසින් සංවිධානය කරන ලද TESL සිසුන් සඳහා උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය
- දලයි ලාමා තුමාගේ 88 වැනි ජන්ම දිනය වෙනුවෙන් මනුෂ්‍යත්වය සඳහා බෞද්ධ කැපවීම පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය.
- ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර සංස්කෘතික හා අධ්‍යාපනික බැඳීම් කේන්ද්‍ර කර ගනිමින් නූතන ජීවිතය සඳහා බුදුදහම් පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව
- සිංහල අධ්‍යයන අංශය විසින් සංවිධානය කරන ලද සිංහල අධ්‍යයන පිළිබඳ ජාතික සමුළුව-2023 (NCSS)

## 9.4.8. යටිතල පහසුකම් සංවර්ධනය සහ ඩිජිටල්කරණය

2023 දී පීඨයේ භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. නාට්‍ය, සිනමා සහ රූපවාහිනී පිළිබඳ අධ්‍යයන අංශය තුළ අංශ ප්‍රධානියාට සහ ඔහුගේ කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා නව මැදිරි දෙකක් සහ අලුතින් බඳවා ගත් අධ්‍යයන සාමාජිකයින් සඳහා නව මැදිරි දෙකක් ඉදි කිරීමටත් කටයුතු කරන ලදි. එසේම, නූතන භාෂා අධ්‍යයන අංශයේ ජර්මානු අධ්‍යයන පිළිබඳ ශ්‍රාස්ත්‍රවේදී හා ගෞරව උපාධි වැඩසටහන් සඳහා සමකාලීන හා අසමකාලීන අධ්‍යයන වැඩිදියුණු කිරීම සඳහා අදාළ ලේඛන කඩදාසි රහිත ඩිජිටල් ඉගැන්වීම් සහ ඉගෙනීම සඳහා CAL (විශ්ව විද්‍යාලයේ LMS) වෙත උඩුගත කරන ලදී, තවද, එම අංශයේ ජර්මානු මධ්‍යස්ථානය වෙත ජර්මානු සංස්කෘතික ආයතනය විසින් පුටු විසිපහක් පරිත්‍යාග කරන ලද අතර ස්පාඤ්ඤ ඒකකය සදහා වෙනම මැදිරියක් වෙන් කරන ලදී. එමෙන්ම, පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශය සඳහා නවීන Wi-Fi ප්‍රවේශය  සහිත වැඩිදියුණු කරන ලද අන්තර්ජාල පහසුකම් ලබා දෙන ලදි.

## 9.4.9. අදාළ ක්ෂේත්‍රවල කර්මාන්ත සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ හවුල්කාරිත්වය

කර්මාන්ත සහ අදාළ ක්ෂේත්‍රවල අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ පහත සඳහන් හවුල්කාරිත්වයන් ස්ථාපනය කරන ලදි.

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහනක් පැවැත්වීම සඳහා වාග් විද්‍යා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.
- කොළඹ Goethe ආයතනය සමඟ නූතන භාෂා අධ්‍යයන අංශය ඇති කර ගත් හවුල්කාරිත්වය.
- නූතන භාෂා අධ්‍යයන අංශයේ මූල්‍ය දුෂ්කරතා සහිත කොරියානු භාෂාව ඉගෙන ගන්නා සිසුන් සඳහා ශ්‍රී ලංකාවේ ඇති කොරියානු සිංහ සමාජය මඟින් ශිෂ්‍යත්ව හයක් ප්‍රදානය කරන ලදී.
- චීනයේ ෂෙන්සෙන් හි බෙන්හුආන් ඇකඩමිය සමඟ පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශය අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- පාලි සහ බෞද්ධ අධ්‍යයන අංශය, ඇමරිකා එක්සත් ජනපදයේ ඔගස්ටා, MO හි පිහිටි Right Mindfulness පුහුණු ඇකඩමිය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

## 9.4.10. විදේශීය හවුල්කරුවන් සමඟ අධ්‍යයන සහයෝගීතාව

ඉංග්‍රීසි අධ්‍යයන අංශය ඉන්දියාවේ සෝලාපූර්හි Karmveer Bhaurao Patil විද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය සහ ක්‍රිස්තියානි සංස්කෘතිය පිළිබඳ අධ්‍යයන අංශය විසින් තුන්වන ලෝක දේවධර්මවාදීන්ගේ කිතුනු සංගමය “Ecumenical Association of Third World Theologians (EATWOT)” සමඟ සහයෝගීතා වැඩසටහන් පවත්වන ලදී.



**ආචාර්ය සුදත් සෙනරත්**
**පීඨාධිපති/ මානවශාස්ත්‍ර පීඨය**



# 9.5. වෛද්‍ය පීඨය

## 9.5.1. දැක්ම

වෛද්‍ය විද්‍යා පිළිබඳ දැනුම උත්පාදනය කිරීමට සහ බෙදා දීම උපකාරී වන විශිෂ්ටත්වයේ සහ නිරවද්‍යභාවයේ සංස්කෘතියක් තුළ ජාත්‍යන්තරව පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් වීමට පීඨය අපේක්ෂා කරයි.

## 9.5.2. මෙහෙවර

**වෛද්‍ය පීඨය**

විමර්ශනය, මුලපිරීම, සමානාත්මතාවය සහ සමාජ වගකීම් පිළිබඳ උනන්දුව පෝෂණය කරන උසස් තත්ත්වයේ අධ්‍යාපනික පරිසරයක් තුළ,

- වෛද්‍ය සිසුන්, පශ්චාද් උපාධි වෛද්‍යවරුන්, සම සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සහ මහජනතාව දැනුවත් කරයි,
- මානව රෝග වැළැක්වීම, හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම සඳහා රෝගියාට නැඹුරු වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සහ
- මූලික, ව්‍යවහාරික සහ සායනික පර්යේෂණ පවත්වයි.

ගෝලීයකරණය වූ සෞඛ්‍ය සේවා පරිසරයක් තුළ පුද්ගලයන් සහ මතධාරී නායකයන් ලෙස ප්‍රජාවට, රටට සහ ඉන් ඔබ්බට සාර්ථකව සේවා සැපයීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා සහ ආකල්ප මෙම පීඨයේ උපාධිධාරීන් සතු වේ.

වෛද්‍ය පීඨයේදී, ඉගැන්වීම, ශිෂ්‍ය පුහුණුව සහ විද්‍යාත්මක විමසීම් සඳහා මහත් ලැදිකමක් ඇති අධ්‍යයන ප්‍රජාවක් විසින් දැනුම දියුණු කරනු ලබයි. ඉගෙනීමට සහ පර්යේෂණ සඳහා විශිෂ්ට පරිසරයක් ලබා දීම මගින් පීඨය ඉහළම මට්ටමේ පාණ්ඩිත්‍යයක් ඇති කිරීම සඳහා දිරි ගන්වයි.

## 9.5.3. සංවිධාන ව්‍යුහය

කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යයනාංශය, ජෛව රසායන විද්‍යා අධ්‍යයනාංශය, භෞතවේදය අධ්‍යයනාංශය, පරපෝෂවේද අධ්‍යයනාංශය, වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයනාංශය, ව්‍යාධිවේද අධ්‍යයනාංශය, භිෂග්වේදය අධ්‍යයනාංශය, අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, මහජන සෞඛ්‍ය අධ්‍යයනාංශය, පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, මනෝ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ළමා රෝග අධ්‍යයනාංශය, වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ශල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය, ප්‍රසව හා නාරිවේද අධ්‍යයනාංශය සහ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය හා ආබාධිතතා අධ්‍යයනාංශය යන අධ්‍යනාංශ 17  න් වෛද්‍ය පීඨය සමන්විත වේ. අණුක වෛද්‍ය ඒකකය, රිකට්සියල් සහ වාහක මගින් බෝවන රෝග රසායනාගාර මගින් රෝග විනිශ්චය සේවා සපයන අතර ආසාදන පිළිබඳ පර්යේෂණ ද සිදු කරයි. මඳසරුබව, ආමාශ ආන්ත්‍රයික, ස්වයංසාධක ක්‍රියාකාරිත්වය, රක්තපාත විද්‍යාව, පටක ව්‍යාධි විද්‍යාව, සෛල ව්‍යාධි විද්‍යාව සහ ක්ෂුද්‍රජීව විද්‍යා රසායනාගාර ප්‍රධාන වශයෙන් සායනික පර්යේෂණ සඳහා දායක වන අතරම රෝග විනිශ්චය සේවා සපයයි. ස්වාභාවික නිෂ්පාදන පිරික්සුම් රසායනාගාරය, සායනික පරීක්ෂණ ඒකකය සහ ජෛව මාත්‍රාමිතික රසායනාගාර පර්යේෂණ මධ්‍යස්ථාන ලෙස ක්‍රියා කරයි. ළමා පියස/ ළමා ආරක්ෂණ ඒකකය, තැලසීමියා මධ්‍යස්ථානය, ආඝාත ඒකකය, අයති මධ්‍යස්ථානය සහ අක්මා රෝග සඳහා කොළඹ උතුරු මධ්‍යස්ථානය විශිෂ්ට අන්දමින් තෘතියික සත්කාර සපයනු ලබන පහසුකම් වේ.

සෞඛ්‍ය දත්ත විද්‍යා ඒකකය 2021/2022 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර, එමඟින් තොරතුරු තාක්ෂණය පිළිබඳ කුසලතා සහ දැනුම ලබා දෙන අතර පීඨයේ පර්යේෂණ කටයුතු සඳහා ද එහි දායකත්වය ලබා දෙයි. සියලුම සිසුන්ගේ විෂය බාහිර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ ශිෂ්‍ය උපදේශනය, වෘත්තීය මාර්ගෝපදේශනය සහ ශිෂ්‍ය සුභසාධන කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා ශිෂ්‍ය කටයුතු අංශයක් පිහිටුවා ඇත.





## 9.5.4. අධ්‍යයන වැඩසටහන් සහ සිසුන්

පස් අවුරුදු MBBS අධ්‍යයන වැඩසටහන අවයව පද්ධති මත පදනම් වූ, සමෝධානික විෂයමාලාවක් ලෙස පවත්වනු ලැබේ. එහි අධ්‍යයන අදියර තුනක් ඇති අතර එක් එක් අධ්‍යයන අදියර අවසානයේ දී කඩඉම් විභාග යක් ඇති අතර තොරතුරු තාක්ෂණය සහ ඉංග්‍රීසි, මූලික සහ ව්‍යවහාරික විද්‍යා, වෘත්තීය සංවර්ධන සහ පවුල් වෛද්‍ය විද්‍යාව, ප්‍රජා සෞඛ්‍ය සහ සායනික කුසලතා තීරුව යනුවෙන් සංරචක පහක් ඇත.

MBBS වැඩසටහන ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රතීතන ඒකකය (එබැවින්, ලෝක වෛද්‍ය අධ්‍යාපන සම්මේලනය - WFME) මගින් ප්‍රතීතනය කර ඇති අතර, ඇගයීමට ලක් කරන ලද ප්‍රමිත අටෙන්ම ඉතා සතුටුදායක - සතුටුදායක ලෙස ශ්‍රේණිගත කර බර තැබූ ලකුණු ප්‍රතිශතය මත ඉහළ ශ්‍රේණියක් ලබා ගන්නා ලදී.

වෛද්‍ය පීඨය විසින් පිරිනමනු ලබන කථන සහ ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී වැඩසටහන ශ්‍රී ලංකාවේ කථන සහ ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධියක් (කථන සහ භාෂා චිකිත්සක හෝ ශ්‍රව්‍ය විද්‍යාව විශේෂීකරණය) සඳහා මඟ පෙන්වන පළමු අනුමත වෘත්තීය පුහුණු වැඩසටහන වේ. කථන සහ ශ්‍රවණ විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය වසර හතරක අධ්‍යයන වැඩසටහනකි. විෂය මාලාව පාඨමාලා ඒකක ක්‍රමය මත පදනම් වේ. "ආයති" මධ්‍යස්ථානය මෙම සිසුන්ට මෙන්ම අනෙකුත් අනුබද්ධ සෞඛ්‍ය පිරිස් සඳහා සායනික පුහුණුව අඛණ්ඩව ලබා දෙන අතර මේ වන විට බාහිර රෝගීන් 10,000 කට ආසන්න සංඛ්‍යාවක් ලියාපදිංචි කර ඇත. මීට අමතරව, ශිෂ්‍යයෝ සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ශික්ෂණ රෝහල් කිහිපයක සායනික පුහුණුවීම්වල නිරතව සිටිති.

2023 වර්ෂයේ දී, 28 වන වෛද්‍ය සිසුන් කණ්ඩායම (2015/2016) සහ 11 වන කථන සහ කථන සහ ශ්‍රවණ විද්‍යා උපාධි වැඩසටහනේ 11 වන කණ්ඩායමේ සිසුන් කණ්ඩායම මෙම පීඨයෙන් උපාධිය ලබා ගත්හ. 34 වන කණ්ඩායමේ (2021/22 ඇතුළත් වූ) සිසුන් 205 ක් MBBS උපාධි වැඩසටහන සඳහා ලියාපදිංචි වී 2023 ජනවාරි 30 වන දින ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කළහ. කථන සහ ශ්‍රවණ විද්‍යා උපාධි වැඩසටහනේ 15 වන කණ්ඩායමේ සිසුන් අනූ දෙදෙනෙකු වෘත්තීය චිකිත්සක උපාධි වැඩසටහනේ දෙවන කණ්ඩායමේ සිසුන් 81 දෙනෙකු සමඟ ඔවුන්ගේ අනුස්ථාපන වැඩසටහන 2023 ජූනි 26 වැනි දින ආරම්භ කළහ. 2023 දෙසැම්බර් වන විට පීඨයේ මුළු උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව 1520 (MBBS - 1134, SHS- 305, OT- 87) ක් වූ අතර භූතාන සිසුන් 25 ක් ද මෙයට ඇතුළත් වේ. 2022 ට සාපේක්ෂව සිසුන් 141 ක වර්ධනයක් (MBBS-65, SHS-42, OT- 40) සිදු වී ඇත.

පීඨය විසින් පිරිනමනු ලබන පශ්චාද් උපාධි වැඩසටහන් අතර මහජන සෞඛ්‍ය (වසංගත රෝග) පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය සහ දර්ශනපති උපාධි පිරිනැමීම  සඳහා මඟ පෙන්වන පර්යේෂණ උපාධි ඇතුළත් වේ. වෛද්‍ය පීඨය විවිධ විශේෂීකරණ ක්ෂේත්‍ර යටතේ වෛද්‍ය පශ්චාද් උපාධි ආයතනයේ MD අභ්‍යාසලාභීන් සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් ද ක්‍රියාත්මක වේ. වසංගත රෝග පිළිබඳ මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහනේ 7 වැනි කණ්ඩායම 2023 මාර්තු මාසයේදී ලියාපදිංචි කිරීමට නියමිතය.

මෙම පීඨය දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සමඟ ඒකාබද්ධව වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය යන බාහිර උපාධි වැඩසටහන් දෙකක් ද පිරිනමයි. සිසුන් 24 දෙනෙකුගෙන් සමන්විත වන තුන්වන කණ්ඩායම භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන හදාරති. අපරාධ විමර්ශනය පිළිබඳ උසස් ඩිප්ලෝමාවක් සමාජ විද්‍යා පීඨයේ සහයෝගීතාවයෙන් පොලිස් නිලධාරීන් සඳහා පිරිනමනු ලබන අතර, දැනට දෙවන නිලධාරී කණ්ඩායම මෙම වැඩසටහන හදාරති.

## 9.5.5. අධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨයේ ස්ථිර සේවක සංඛ්‍යාව වශයෙන් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 124 ක් ද, තාවකාලික සේවක සංඛ්‍යාව වශයෙන් 40 දෙනෙකු පමණ ද, අනුබද්ධ ශික්ෂණ රෝහල්වලට අනුයුක්තව සිටින වෛද්‍ය උපදේශකයින්, කථන චිකිත්සකයින්, ශ්‍රව්‍ය විද්‍යාඥයින් සහ වෘත්තීය චිකිත්සකයින් ඇතුළු 50 කට අධික බාහිර කාර්ය මණ්ඩලයක් ද සිටිති. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකු බඳවා ගැනීම 2023 වර්ෂය තුළ සිදු කරන ලද නමුත් පීඨයේ කීර්තිමත් මහාචාර්යවරු ඇතුළු ජ්‍යෙෂ්ඨ විද්වතුන් දෙදෙනෙකු විශ්‍රාම ගැනීම,

අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකු ඉල්ලා අස්වීම සහ නව බඳවා ගැනීම් සීමා කිරීම මගින් ස්ථිර කාර්ය මණ්ඩල සංඛ්‍යාව වැඩි දියුණු කළ නොහැකි විය.

මෙම අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් අතර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් 13 දෙනෙකු, මහාචාර්යවරුන් 33 දෙනෙකු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් 40 දෙනෙකු, කථිකාචාර්යවරුන් (පරිවාස) 06 දෙනෙකු (ස්ථිර නොකළ) සහ කථිකාචාර්යවරුන් (පරිවාස) 18 දෙනෙකු ඇතුළත් වේ. කාන්තා සහ පිරිමි කාර්ය මණ්ඩලය අතර අනුපාතය 70:54 කි.

## 9.5.6. පර්යේෂණ

මෙම පීඨය එහි පර්යේෂණ ක්‍රියාකාරකම් පිළිබඳව අභිමානයට පත් වන අතර, ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨවල උසස්ම නිමැවුම් අතරට මෙම විශ්වවිද්‍යාලයේ නිමැවුම් ද ඇතුළත් වේ. Times Higher Education මගින් මෙම පීඨය 2023 වසරේ ලොව ප්‍රථම වෛද්‍ය විද්‍යාල 1000 අතර ශ්‍රේණිගත කරන ලද අතර ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම වෛද්‍ය පීඨ තුන අතර ද ශ්‍රේණිගත කර ඇත. Standford විශ්වවිද්‍යාලය විසින් මෙම වසරේ මෙම වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් 4 දෙනෙකු ලොව පුරා පර්යේෂකයන් අතර ඉහළම මට්ටමේ පර්යේෂකයන් 2% වශයෙන් නම් කර ඇත. විශ්වවිද්‍යාලයේ විද්‍යුත් සුරක්ෂිතාගාරය සඳහා පීඨයේ දායකත්වය 312ක් වන අතර සඟරා ලිපි 199 ක් (2023 වර්ෂයේ දී 165ක් සහ වෙනත් පූර්ව වසරවල 34ක්), සම්මන්ත්‍රණ සාරාංශ පත්‍රිකා 28, නිබන්ධන 11, ග්‍රන්ථ පරිච්ඡේද 49 සහ ශිෂ්‍ය සම්මන්ත්‍රණ 25 තුළ IN FOCUS (15) සහ තරුණ පර්යේෂකයන්ගේ සම්මන්ත්‍රණය (10) එයට ඇතුළත් වේ. පීඨ කාර්ය මණ්ඩලය විසින් Scopus හි සුචිගත සඟරා ප්‍රකාශන 117ක කර්තෘවරුන් වශයෙන් කටයුතු කර ඇත.

කැලණිය විශ්වවිද්‍යාලය මගින් මෙම පීඨයට එකතුව රු.3,250,000ක් වන අභ්‍යන්තර පර්යේෂණ ප්‍රදාන 9ක් ප්‍රදානය කරන ලද අතර මීට අමතරව, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රදාන කිහිපයක්, NSF ප්‍රදාන, තැලසීමියා ආශ්‍රිත ප්‍රදාන, ජෛව ස්කන්ධ, ගෝලීය සෞඛ්‍ය අභියෝග, LEAPS, ළමා අරමුදල, IAEA, BTI, ළමා ලිංගික සංචාරක කර්මාන්තය, ELBS, ඕස්ට්‍රේලියාවේ ආහාර පරිසර පර්යේෂණ ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනය, ජාතික පර්යේෂණ සභාව, Cerebral Palsy Alliance, ඕස්ට්‍රේලියාවේ, Research Foundation of Cerebral Palsy Alliance, සහ එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ පිළිබඳ ජාතික ආයතනය (NIHR) ඇතුළු බාහිර පර්යේෂණ ප්‍රදාන 20කට අධික ප්‍රමාණයක් ද වෛද්‍ය පීඨයට ලැබී තිබුණි.

## 9.5.7. යටිතල පහසුකම් සංවර්ධනය සහ ඩිජිටල්කරණය

2021 වසරේ ආරම්භ කරන ලද උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අක්මා රෝග සඳහා වූ මධ්‍යස්ථානයේ රෝහල් පහසුකම් ඉදිකිරීම ආර්ථික හා ඉන්ධන අර්බුදය හේතුවෙන් ප්‍රමාද විය. පරිත්‍යාගශීලීන්ගේ ආධාර ලබා ගනිමින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම නිර්දේශ කර ඇති අතර, 2024 මුල් භාගයේදී මෙම පහසුකම එහි මෙහෙයුම් කටයුතු වෙනුවෙන් විවෘත කරනු ඇත. මෙම ආදර්ශ රෝහල කැලණිය විශ්වවිද්‍යාලයට අයත් වන අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සමඟ සමීප සහයෝගයෙන් එය ක්‍රියාත්මක වේ. සිදු කරන ලද අනෙකුත් සියලුම ගොඩනැගිලි ව්‍යාපෘති ප්‍රධාන වශයෙන් සුළු එකතු කිරීම්, ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන ව්‍යාපෘති විය.

යාබදව පිහිටි ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ භාරකරුවන් සහ කැලණිය විශ්වවිද්‍යාලය විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුම යටතේ කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මගින් පවත්වාගෙන යනු ලබන ඉඩම අංගසම්පූර්ණ එළවළු වත්තක් වශයෙන් සංවර්ධනය කර ඇත. මෙම ප්‍රදේශයේ එළිමහන් විවේකය ලබා ගැනීම සහ ස්වායු අභ්‍යාස කිරීම සඳහා උපයෝගී කර ගැනීමට පහසුකම් ලබා දීමේ සැලසුම් සකස් කර ඇත.

ශිෂ්‍ය අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා කාලසටහන් පිළියෙළ කිරීම සහ විභාග හා රැස්වීම් උපලේඛනගත කිරීම සම්බන්ධයෙන් පරිපාලන ක්‍රියාවලිය ඩිජිටල්කරණය කර අවසන් කර ඇත. මෙමගින් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පරිපාලනමය කාර්යභාරය ලිහිල් කර පරිපාලන ක්‍රියාවලිවල කාර්යක්ෂමතාව ඉහළ නංවා ඇති අතර වැඩ ප්‍රමාණය සහ ක්‍රියාකාරකම් විගණනය කිරීම සඳහා පහසුකම් සලසා ඇත. විශ්වවිද්‍යාලයට අමතර වියදම් නොමැතිව ගෘහස්ථ මෘදුකාංග වැඩසටහන් සංවර්ධනය කිරීමට HDSU උපකාරී වේ.





ඉදිරියේදී ඇතිවිය හැකි මූල්‍ය අභියෝගවලට මුහුණ දීම සඳහා පීඨ සංවර්ධන අරමුදල් ශක්තිමත් කිරීම සඳහා පීඨය මගින් පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතන වෙත සේවා ලබා දීම ආරම්භ කර ඇත. ව්‍යාධි විද්‍යා හා කායව්‍යවච්ඡේද විද්‍යා අධ්‍යනාංශ එවැනි වැඩසටහන් සඳහා කෞතුකාගාර සහ රසායනාගාර සැසි පිරිනැමීම ආරම්භ කර ඇත.

## 9.5.8. අනාගත අපේක්ෂා

පීඨයේ සමාජ වගකීම වැඩි කිරීම සහ පීඨ සංවර්ධන අරමුදල ශක්තිමත් කිරීම සඳහා පීඨය මගින් රෝගීන් සඳහා ගාස්තු අය කරනු ලබන උපදේශන සේවාවක් සැපයීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.

ඇතුළත් කිරීමේ කමිටුව පිහිටුවා ඇති අතර, එය පීඨය විසින් පිරිනමනු ලබන වැඩසටහන් සඳහා විදේශීය සිසුන් වැඩ සංඛ්‍යාවක් ආකර්ෂණය කර ගැනීමට කටයුතු කරයි. විකල්ප ඉගෙනුම් අවස්ථා ලබා දීමට සහ වැඩසටහන් හුවමාරු කර ගැනීම සඳහා ගමනාන්තයක් ලෙස පීඨය ප්‍රවර්ධනය කිරීම සඳහා අදාළ බාහිර පාර්ශ්ව සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීමට පීඨය අදහස් කරයි.

පීඨයේ පුස්තකාලය සඳහා උපාය මාර්ගික ප්‍රවේශය නවීකරණය කරනු ලබන අතර, එය දැනුම මධ්‍යස්ථානයක් සහ පර්යේෂණ සඳහා සහාය දක්වන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය කරනු ඇත.



**මහාචාර්ය මාධව චන්ද්‍රතිලක**
**පීඨාධිපති / වෛද්‍ය පීඨය**





# 9.6. විද්‍යා පීඨය

## 9.6.1. මෙහෙවර

කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ මෙහෙවර වන්නේ ජාතික සංවර්ධනයට සහ මානව වර්ගයාගේ යහපැවැත්මට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හා ස්වභාවික සම්පත් තිරසාර ලෙස භාවිතය සහ සංරක්ෂණය සඳහා පරිසරය පිළිබඳ වඩා යහපත් අවබෝධයක් පවත්වාගෙන යාමට විවිධ විද්‍යාත්මක විෂයයන්ට අදාළව උපදේශන සහ උපදේශක සේවා සැපයීම සඳහා ඉහළ පෙළඹවීමක් ඇති උපාධිධාරීන් සහ පශ්චාද් උපාධිධාරීන් බිහි කිරීමයි.

## 9.6.2. පීඨය පිළිබඳ හැඳින්වීම

1967 දී ආරම්භ කරන ලද විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ පීඨ හතෙන් එකකි. විද්‍යා පීඨය වර්තමානයේ දී රසායන විද්‍යාව, කර්මාන්ත පරිපාලන, ගණිතය, ක්ෂුද්‍රජීව විද්‍යාව, භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව, ශාක හා අණුක ජීව විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ පරිගණක විද්‍යාව, සහ සත්ව විද්‍යාව සහ පරිසර කළමනාකරණය යන අධ්‍යයන අංශ අටකින් සමන්විත වේ. මෙයට අමතරව, මෘදුකාංග ඉංජිනේරු ඉගැන්වීම් ඒකකය සහ ක්‍රීඩා සහ ව්‍යායාම විද්‍යා ඒකකය යන ඒකක දෙක ද එයට ඇතුළත් වේ.

විද්‍යා පීඨය මගින් වසර තුනක විද්‍යාවේදී උපාධි පාඨමාලා පහක් සහ වසර හතරක කාලසීමාවකින් යුත් විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහන් 19ක් පිරිනමයි. ජීව විද්‍යා සහ භෞතික විද්‍යා විෂය ධාරා සඳහා අනුපිළිවෙලින් සිසුන් 221ක් සහ 362ක් ඇතුළත් කර ඇති අතර, පීඨය සඳහා වාර්ෂික සිසුන් බඳවා ගැනීම 1,136ක් විය. ව්‍යවහාරික රසායන විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 60 ක් ද, ඉලෙක්ට්‍රොනික හා පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 80 ක් ද, පරිසර සංරක්ෂණ හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 109 ක්, කළමනාකරණය සහ තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 119 ක්, භෞතික විද්‍යාව සහ ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය සඳහා සිසුන් 76 ක්, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 59 ක්, සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සඳහා සිසුන් 50 ක් වශයෙන් විශේෂීකරණ වැඩසටහන් සඳහා වෙනම කවුළු හරහා සිසුන් ඇතුළත් කර ගැනීම ද විද්‍යා පීඨය මගින් සිදු කරයි. 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුළත් කර ගන්නා ලද සිසුන් සංඛ්‍යාව 1,055 කි. භෞතික විද්‍යා සහ ජීව විද්‍යා සිසුන්ට වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා පීඨවලින් සහායක පාඨමාලා ඒකක හැදෑරීමට අවස්ථාව සලසා තිබේ.

විද්‍යා පීඨය මගින් වර්තමානයේ දී විද්‍යාපති උපාධි වැඩසටහන් 15ක්, පශ්චාද් උපාධි ඩිප්ලෝමා වැඩසටහන් 3ක් සහ ඩිප්ලෝමා වැඩසටහනක් පිරිනමයි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 138 දෙනෙකුගේ ද, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ 3 දෙනෙකුගේ ද, අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 94 දෙනෙකුගේ ද සහාය ඇතිව පීඨය මගින් මුළු උපාධි අපේක්ෂකයින් 3,136 දෙනෙකු සඳහා සේවය සපයයි. විද්‍යා පීඨය තුළ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රියාකාරකම් සඳහා පහසුකම් වැඩිදියුණු කරමින් නව දේශන රඟහල සංකීර්ණයක් ඉදිවෙමින් පවතී.

පීඨය සිසුන්ට, අධ්‍යයන ප්‍රජාවට සහ අළුත්වැඩියා සහ උපකරණ ඒකකය, ජාතික වීදුරු පිඹීමේ මධ්‍යස්ථානය, ආසියානු කුහුඹු පර්යේෂණ සඳහා කලාපීය මධ්‍යස්ථානය, සූර්ය විසඳුම් මධ්‍යස්ථානය, මධ්‍යම උපකරණ රසායනාගාරය, මල් වගා පර්යේෂණ මධ්‍යස්ථානය පොල්තෙල් සඳහා පර්යේෂණ සහ උපදේශන මධ්‍යස්ථානය, විශ්වවිද්‍යාල-කර්මාන්ත ප්‍රජා අන්තර්ක්‍රියා මැදිරිය (පරිසර හා සංවර්ධන උපදේශකවරුන් - EDCON), සහ පර්යේෂණ සහ සේවා මධ්‍යස්ථානය. වැනි ආයතන හරහා මහජනතාවට ද විවිධ සේවා සපයයි.

## 9.6.3. 2023 වසරේ විශේෂ අවස්ථා

2023 වර්ෂයේදී විද්‍යා පීඨයට පහත දැක්වෙන සම්මාන හිමි විය.

අ. ජාත්‍යන්තර සම්මාන

- සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ විද්‍යාව පිළිබඳ කාන්තාවන් සඳහා වූ සංවිධානය (OWSD) - 2023 Early-Career Women Scientists සඳහා වන Elsevier පදනමේ සම්මානය.
- සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ විද්‍යාව පිළිබඳ කාන්තාවන් සඳහා වූ සංවිධානය (OWSD) - 2023 Early Career Fellowship සඳහා වන සම්මානය.
- දකුණු ආසියාතික තරුණ ජල අභියෝගය - COP 28 දේශගුණ සමුළුවේදී පිළිගත් Youth Water Change Maker සම්මානය

ආ. ජාතික සම්මාන

- කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකු 2019 සහ 2020 වසරවල (ජාතික පර්යේෂණ සභාව විසින් සංවිධානය කරන ලද) ප්‍රකාශන සඳහා "2023 විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන" ලබා ගත්හ.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුට පහත සඳහන් "නව නිපැයුම් සඳහා ජනාධිපති සම්මාන" හිමි විය. (ශ්‍රී ලංකා නව නිපැයුම් කොමිසම විසින් සංවිධානය කරන ලදී).
- 2019 දී ලෝකඩ පදක්කම, 2020 දී ලෝකඩ පදක්කම සහ 2020 දී කුසලතා සම්මානය
- කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු "2020/2021 දී පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා ආධාර යෝජනා ක්‍රමය (SUSRED) සම්මානය" ලබා ගත්හ. (ජාතික විද්‍යා පදනම විසින් සංවිධානය කරන ලදී).
- කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකු 2023 ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ වාර්ෂික සම්මාන උළෙලේ දී සාමාන්‍ය පර්යේෂණ කමිටු පශ්චාද් උපාධි සම්මානය සහ සාමාන්‍ය පර්යේෂණ කමිටු පශ්චාද් උපාධි කුසලතා සම්මානය ලබා ගත්හ.
- කාර්ය මණ්ඩල සාමාජිකයෙකුට ස්වභාවික විද්‍යා ක්ෂේත්‍රයේ විශිෂ්ටතම ජ්‍යෙෂ්ඨ පර්යේෂකයාට හිමි වන 2022 වර්ෂයේ CVCD විශිෂ්ටතා සම්මානය හිමි විය.

විද්‍යා පීඨයේ සාමාජිකයින් පහත කමිටුවල සේවය කරයි.

1. ජාත්‍යන්තර න්‍යෂ්ටික විද්‍යා ඔලිම්පියාඩ් සඳහා වූ මෙහෙයුම් කමිටුවේ ලේකම් ලෙස තේරී පත් විය.
2. ජාත්‍යන්තර කනිෂ්ඨ විද්‍යා ඔලිම්පියාඩ් සඳහා රටේ සම්බන්ධීකාරක ලෙස පත් විය.
3. ශ්‍රී ලංකා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභා සාමාජික.

## 9.6.4. පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම්

විද්‍යා පීඨය 2023 වර්ෂයේදී කාර්මික සැලසුම් සඳහා පහත දැක්වෙන පේටන්ට් බලපත්‍ර සහ ලියාපදිංචි සහතික ලබාගෙන ඇත.

1. ෆීනෝලික් ප්‍රතිඔක්සිකාරකවල අන්තක අවශෝෂණය වැඩි දියුණු කිරීම සඳහා වූ සංයුතිය, ශ්‍රී ලංකා පේටන්ට් බලපත්‍ර අංක 21819. ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය, ශ්‍රී ලංකාව
2. තීරු මත පදනම් වූ ඝන-අදියර නිස්සාරණය සඳහා රික්ත බහුවිධ, ශ්‍රී ලංකා පේටන්ට් අංක 21821. ජාතික බුද්ධිමය දේපල කාර්යාලය, ශ්‍රී ලංකාව
3. අන්තර්ජාලයෙන් ස්වාධීන රැහැන් රහිත තථ්‍ය කාලීන ජල තත්ත්ව අධීක්ෂණ ඒකකය, ශ්‍රී ලංකා කාර්මික සැලසුම් අංක 13786. ජාතික බුද්ධිමය දේපල කාර්යාලය, ශ්‍රී ලංකාව
4. ආරක්ෂිත ස්මාර්ට් විදුලි ස්විචය, ශ්‍රී ලංකා කාර්මික සැලසුම් අංක 13787. ජාතික බුද්ධිමය දේපල කාර්යාලය, ශ්‍රී ලංකාව





## 9.6.5. වාණිජකරණය කළ පේටන්ට් බලපත්‍ර සහ කාර්මික සැලසුම්

විද්‍යා පීඨය විසින් සංවර්ධනය කරන ලද නවෝත්පාදනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලය ව්‍යාපාරික අංශය සමඟ පහත බලපත්‍ර ගිවිසුම් අත්සන් කරන ලදී.

1. ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය සහ ඉන්ෆොසොෆ්ට් ලංකා ප්‍රයිවට් ලිමිටඩ් අතර බලපත්‍ර ගිවිසුම, දුරස්ථ විදුලි සංදේශ අඩවි අධීක්ෂණය සහ ස්වයංක්‍රීයකරණය, ශුද්ධ අලෙවියෙන් 3%
2. ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලය සහ Susen Holdings (Pvt) Ltd අතර බලපත්‍ර ගිවිසුම. ගෑස් පරිභෝජනය සඳහා පාරිභෝගික නිෂ්පාදන
3. ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය සහ Susen Holdings (Pvt) Ltd, අතර බලපත්‍ර ගිවිසුම, ආරක්ෂාව සඳහා පාරිභෝගික නිෂ්පාදන
4. ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලය සහ OREL Corporation (Pvt) Ltd අතර බලපත්‍ර ගිවිසුම, ආරක්ෂිත ස්මාර්ට් විදුලි ස්විචය
5. ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය සහ OREL Corporation (Pvt) Ltd, Industrial IoT අතර බලපත්‍ර ගිවිසුම
6. ශ්‍රී ලංකාවේ කැලණිය විශ්වවිද්‍යාලය සහ OREL Corporation (Pvt) Ltd, Residential IoT අතර බලපත්‍ර ගිවිසුම
7. ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලය සහ OREL Corporation (Pvt) Ltd, IoT Compatible Smart Electric Switch අතර බලපත්‍ර ගිවිසුම
8. ශ්‍රී ලංකා කැලණිය විශ්වවිද්‍යාලය සහ OREL Corporation (Pvt) Ltd අතර බලපත්‍ර ගිවිසුම, Smart Hydrophonic පද්ධතිය

විද්‍යා පීඨය විසින් සංවිධානය කරන ලද ව්‍යවහාරික හා ශුද්ධ විද්‍යා පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - ICAPS 2023, "විද්‍යා හා තාක්ෂණ අභිවර්ධනය තුළින් තිරසාර සංවර්ධනය" යන තේමාව යටතේ 2023 ඔක්තෝබර් 13 දින පවත්වන ලදී.

දත්ත විද්‍යාව හා විශ්ලේෂණ විද්‍යාවේදී උපාධි වැඩසටහන, "3 plus 1" විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා, මෘදුකාංග ඉංජිනේරු (බාහිර) උපාධි වැඩසටහන සහ පරිගණක විද්‍යාව සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා කෙටි කාලයක් තුළ හඳුන්වා දීමට ද පීඨය සැලසුම් කර ඇත.

කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ කැපවීම සහ උත්සාහයෙන් කටයුතු කිරීම හේතුවෙන් කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය ශ්‍රී ලංකාවේ තෘතීයික අධ්‍යාපනයේ විශිෂ්ටතා මධ්‍යස්ථානයක් වශයෙන් පිළිගැනීමට ලක් වී ඇත. සිතීමේ නිදහස, නවෝත්පාදන සහ නිර්මාණශීලිත්වය දිරිගැන්වීම සඳහා පීඨය මගින් හිතකර පරිසරයක් පෝෂණය කර ඇත. මෙම ගුණාංගවලින් සමන්විත විද්‍යා පීඨයේ උපාධිධාරීන් ගෝලීය ප්‍රගතියට සහ මානව වර්ගයාගේ යහපැවැත්ම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට සූදානම්ව සිටිති.

මෙම ධාරිතාවය සහිතව සහ පීඨයේ මෙහෙවරට අනුකූලව, ආර්ථිකය මෙහෙයවීමට, සිවිල් සමාජයට සහ රජයට සහාය වීමට සහ මානව වර්ගයාගේ උනන්දුව උදෙසා අත්‍යවශ්‍ය තීරණ ගැනීමට අවශ්‍ය හැකියාවන්, කුසලතා සහ ආකල්ප සහිත විද්වතුන් සහ වෘත්තිකයන් සූදානම් කිරීමට සහ බිහි කිරීමට විද්‍යා පීඨය විශිෂ්ට සේවාවන් සපයයි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී. කාලිංගමුදලි**
**පීඨාධිපති / විද්‍යා පීඨය**



# 9.7. සමාජීය විද්‍යා පීඨය

## 9.7.1. දැක්ම

විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ සහ පොදුවේ දකුණු ආසියාවේ සංවර්ධනය සඳහා කැපවීමෙන් බහු-විනය සහ අන්තර්-විනය සහයෝගීතාව තුළින් ස්වාධීන චින්තනය, විවේචනාත්මක විශ්ලේෂණය, සමාජ වගකීම පිළිබඳ දැනුවත්භාවය, සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම සහ සදාචාරාත්මක වටිනාකම් පෝෂණය කිරීම තුළින් විශිෂ්ටත්වය පවත්වා ගැනීම.

## 9.7.2. මෙහෙවර

ඉගැන්වීම, පර්යේෂණ, නවෝත්පාදන සහ බුද්ධිමය නායකත්වය තුළින් ශ්‍රී ලාංකේය සමාජයේ සමාජ-ආර්ථික, දේශපාලන, සංස්කෘතික සහ ශාස්ත්‍රීය සංවර්ධන  ය ඉදිරියට ගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම.

## 9.7.3. දළ විශ්ලේෂණය

සමාජීය විද්‍යා පීඨය කැලණිය විශ්වවිද්‍යාලයේ පැරණිතම සහ විශාලතම පීඨය වේ. 1981/82 අධ්‍යයන වර්ෂයේදී එය වෙනම පීඨයක් ලෙස ආරම්භ කළද, පීඨයේ ඉතිහාසය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ආරම්භය දක්වා දිව යයි.

එහි ආරම්භක අවධියේදී, කැලණිය විශ්වවිද්‍යාලයේ පූර්වගාමියා වූ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, පීඨ කිහිපයකින් සමන්විත වූ අතර, ඒ අතරින් ශාස්ත්‍ර පීඨය, පසුව සමාජීය විද්‍යා පීඨය සහ මානවශාස්ත්‍ර පීඨය ලෙස දෙකට බෙදී තිබුණි. ඔවුන්ගේ පොදු සම්භවය හේතුවෙන්, මෙම පීඨ දෙක ශක්තිමත් සම්බන්ධතාවක් අඛණ්ඩව පවත්වා ගෙන යයි.

විද්වතුන්ගේ සහ වෘත්තිකයන්ගේ කදිම සම්මිශ්‍රණයක් අධ්‍යනාංශවල අධ්‍යයන කාර්ය මණ්ඩලය මගින් නියෝජනය කෙරේ. ඉතිහාසය, පුරාවිද්‍යාව, භූගෝල විද්‍යාව, දර්ශනය, ආර්ථික විද්‍යාව සහ සමාජ විද්‍යාව යන සාම්ප්‍රදායික විෂයයන් පීඨයේ අධ්‍යයන අන්තර්ගතය ශක්තිමත් කරන අතරම, ජන සන්නිවේදනය, ජාත්‍යන්තර අධ්‍යයන, පුස්තකාලය සහ විඥාපන විද්‍යාව, සමාජ සංඛ්‍යාලේඛන, ක්‍රීඩා විද්‍යාව සහ ශාරීරික අධ්‍යාපනය වැනි අනෙකුත් අංශ වෘත්තිකයන්ට ඔවුන්ගේ දොරටු විවෘත කර ඇත. කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨය තුළ ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයක ස්ථාපනය කරන ලද ප්‍රථම ජනසන්නිවේදන අධ්‍යනාංශය සහ ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යනාංශය ස්ථාපනය කරන ලදී.

පීඨය වර්තමානයේ පහත සඳහන් කර ඇති අධ්‍යයන දෙපාර්තමේන්තු 13 සමන්විත වන අතර එම අධ්‍යනාංශ 13 යටතේ එහි සේවාවන් සපයනු ලබයි.

1. පුරාවිද්‍යා අධ්‍යනාංශය
2. ආර්ථික විද්‍යා අධ්‍යනාංශය
3. ඉතිහාසය අධ්‍යනාංශය
4. ජාත්‍යන්තර අධ්‍යනාංශය
5. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යනාංශය
6. දර්ශනය අධ්‍යනාංශය
7. දේශපාලන විද්‍යා අධ්‍යනාංශය
8. සමාජ විද්‍යා අධ්‍යනාංශය
9. සමාජ සංඛ්‍යානය අධ්‍යනාංශය
10. ක්‍රීඩා විද්‍යා හා ශාරීරික අධ්‍යාපන අධ්‍යනාංශය
11. භූගෝලවිද්‍යා අධ්‍යනාංශය
12. ජනසන්නිවේදන අධ්‍යනාංශය
13. තොරතුරු තාක්ෂණ අධ්‍යනාංශය





පීඨය විෂය ක්ෂේත්‍ර 18 ක උපාධි පිරිනමයි. ඇතුළත් වූ සිසුන්ට අධ්‍යයන විශිෂ්ටත්වය මත පදනම් වූ විශේෂිත විෂය ප්‍රවාහයක සාමාන්‍ය උපාධි වැඩසටහන හෝ ගෞරව උපාධි වැඩසටහන හෝ හැදෑරිය හැකිය. සමාජීය විද්‍යා පීඨය සිසුන්ට කලාව පිළිබඳ වසරක ශාස්ත්‍රපති උපාධි වැඩසටහනක් සහ සමාජ විද්‍යාව පිළිබඳ වසර දෙකක ශාස්ත්‍රපති උපාධි වැඩසටහනක් සම්පූර්ණ කිරීම සඳහා පශ්චාද් උපාධි වැඩසටහන් පිරිනමයි. එපමණක් නොව, පර්යේෂකයන්ට සහ විද්වතුන්ට ඔවුන්ගේ දර්ශනපති සහ දර්ශනශූරි උපාධි සඳහා ලියාපදිංචි වී වැඩ කටයුතු කිරීමට ද හැකි වේ.

## 9.7.4. පීඨය මගින් පිරිනමනු ලබන ඩිප්ලෝමා පාඨමාලා

1. භූගෝලීය තොරතුරු පද්ධතිය පිළිබඳ ඩිප්ලෝමාව
2. ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
3. ඉතිහාසය පිළිබඳ ඩිප්ලෝමාව
4. ජාත්‍යන්තර අධ්‍යයන පිළිබඳ ඩිප්ලෝමාව
5. තොරතුරු කළමනාකරණය සහ තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව
6. පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව
7. ජන සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාව
8. මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
9. උපදේශන ඩිප්ලෝමාව
10. බන්ධනාගාර නිලධාරීන් සඳහා නිවැරදි කිරීම් සහ පුනරුත්ථාපනය පිළිබඳ ඩිප්ලෝමාව (DCRP)
11. ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
12. ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව
13. තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා ගාස්තුවෙන් නිදහස් කිරීමේ පදනම මත)
14. පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ උසස් ඩිප්ලෝමාව
15. සන්නිවේදනය සහ මහජන සම්බන්ධතා පිළිබඳ උසස් ඩිප්ලෝමාව
16. විශෝධනය හා පුනරුත්ථාපනය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
17. ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
18. මහජන සම්බන්ධතා සහ මාධ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා

## 9.7.5. පීඨය මගින් පිරිනමනු ලබන ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි වැඩසටහන්[15]

සමාජීය විද්‍යා පීඨය උපාධි අධ්‍යයන පීඨය තුළින් පහත සඳහන් එක් අවුරුදු සහ දෑ අවුරුදු උපාධී වැඩසටහන් ඉදිරිපත් කරයි.

1. පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
2. පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
3. ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
4. පුස්තකාල සහ විඥාපන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
5. ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
6. දර්ශනය පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
7. දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
8. සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන්
9. භූගෝල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති/ විද්‍යාපති වැඩසටහන

15 ශාස්ත්‍රපති / විද්‍යාපති උපාධි වැඩසටහන්වල වර්තමානයේ පවතින විෂයමාලා මේ මොහොතේ සංශෝධනය වෙමින් පවතී. එම නිසා ලබන වසර වන විට උපාධි පාඨමාලා දෙකේ නම් වෙනස් කරනු ලැබේ.

## 9.7.6. 2023 වසරේ විශේෂ අවස්ථා

2023 වර්ෂයේදී පීඨය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රකාශන නිමැවුමේ සාමාන්‍ය අභිවෘද්ධියක් ඇති විය.

සමාජීය විද්‍යා පීඨය (FSS) සහ ජපානයේ Kanasawa විශ්වවිද්‍යාලය අතර අධ්‍යයන සහයෝගීතාව සඳහා අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.

2023 වර්ෂය තුළ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ වැඩමුළු කිහිපයක් පවත්වන ලද අතර ඒවා පුරාවිද්‍යා, පුස්තකාල සහ විඥාපන විද්‍යා, ජනසන්නිවේදන හා භූගෝල විද්‍යා අධ්‍යනාංශ සහ සමාජ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානය (RCSS) මගින් සංවිධානය කර තිබීම විශේෂත්වයකි.

විභාග ආශ්‍රිත ක්‍රියාකාරකම් පිළිබඳව තරුණ සහ මුල් වෘත්තීය ශාස්ත්‍රඥයින් දැනුවත් කිරීම අරමුණු කරගත් වැඩමුළු කිහිපයක් මෙම පීඨයේ තත්ත්ව සහතික මැදිරිය මගින් සාර්ථකව සංවිධානය කරන ලදී.

2023 වර්ෂය තුළ පශ්චාද් උපාධි (ශාස්ත්‍රපති / විද්‍යාපති) පාඨමාලාවල විෂයමාලා යාවත්කාලීන කරන ලදී.

## 9.7.7. අනාගත අපේක්ෂා

සමාජීය විද්‍යා පීඨය මගින් 2024 වර්ෂයේ දී සියලුම මූලික උපාධි වැඩසටහන්වල විෂයමාලා යාවත්කාලීන කිරීමට සැලසුම් කරයි. මීට අමතරව, ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමඟ අධ්‍යයන හවුල්කාරිත්වයන් ඇති කර ගැනීමට අවස්ථා සෙවීමේ අපේක්ෂාවක් ද ඇත. තවද, තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සමඟ ගළපන ලද පර්යේෂණවල නිරත වීමට සහ ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් උදා වන 2024 වර්ෂයේ දී ඉහළ බලපෑමක් සහිත ශාස්ත්‍රීය සඟරාවල පළ කිරීමට පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සියලු දෙනා දිරිමත් කළ යුතු වේ.



**මහාචාර්ය එම්.එම්.ගුණතිලක**
**පීඨාධිපති / සමාජීය විද්‍යා පීඨය**





## 9.8. පුස්තකාලය

2023 වර්ෂය කැලණිය විශ්වවිද්‍යාලයේ පුස්තකාලය සඳහා කැපී පෙනෙන සිදුවීම්වලින් සංලක්ෂිත වූ වැදගත් කාලපරිච්ඡේදයක් සනිටුහන් කළ අතර, පුස්තකාලය මගින් බලපෑම්කාරී ක්‍රියාකාරකම් මාලාවක් උපයෝගී කර ගනිමින් අධ්‍යයන ප්‍රජාව සඳහා සුවිශේෂී තොරතුරු සේවාවක් සාර්ථකව සපයන ලද අතර, ඉගැන්වීම, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා විශ්වවිද්‍යාලයේ ප්‍රයත්නයන්ට ද පුස්තකාලයේ සහාය හිමි විය.

සියලුම පීඨ හරහා සම්පත් සඳහා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම සඳහා සිදු කරනු ලබන කැපවීමක් වශයෙන් පුස්තකාලය මගින් රු. 347,771.00 ක පිරිවැයකට මුද්‍රිත ග්‍රන්ථ 252 ක් ලබා ගන්නා ලදී. තවද, අතිරේක මුද්‍රිත පොත් 41ක් මිලදී ගැනීමට නියමිත අතර ඒ සඳහා අනුමත වූ වියදම රු. 899,881.58 ක් විය. පුස්තකාලය මගින් රු.7,833,966.81ක් වැය කරමින් EBSCO Host, JSTOR, සහ Research4Life වැනි ප්‍රධාන දත්ත සමුදායන් සඳහා පැවති දායකත්වය අළුත් කරන ලදී. එමෙන්ම, Shibboleth ද්වාරය හරහා දුරස්ථ ප්‍රවේශය පරිශීලකයින් වෙත ලබා දී ඇත. එමරල්ඩ්, ටේලර් සහ ෆ්‍රැන්සිස්, සහ ඔක්ස්ෆර්ඩ් යුනිවර්සිටි ප්‍රෙස් වැනි දත්ත සමුදායන් වෙත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සමූහයේ ප්‍රවේශය 2023 වර්ෂයේ දී ද අඛණ්ඩව පැවතුනි.

2023 වර්ෂයේ දී, පුස්තකාලය පරිත්‍යාගශීලීන් 81 දෙනෙකුගෙන් පරිත්‍යාග ලෙස ලැබුණු පොත් 541 ක් ලබා ගෙන සකසන ලදී. එම පරිත්‍යාගයේ වටිනාකම රු. 1,116,061.05ක් විය. කලා, මානව ශාස්ත්‍ර, කළමනාකරණය, විද්‍යාව සහ සමාජ විද්‍යාව ඇතුළු විවිධ විෂය ක්ෂේත්‍රවලින් මෙම පරිත්‍යාග ලැබී තිබුණි.

විෂය සම්බන්ධ පුස්තකාලයාධිකාරිවරු උප කුලපති සම්මාන, මහාචාර්ය ධුරය සඳහා අයදුම්පත්, සනාතන සභා සම්මාන සහ උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටු (CVCD) සම්මාන සඳහා ඉදිරිපත් කිරීම් සමාලෝචනය කිරීමට සහාය වීමෙන් ශාස්ත්‍රීය ප්‍රකාශනවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළහ. පර්යේෂණ ප්‍රයත්නවල ප්‍රමිතිය පවත්වා ගැනීම සඳහා ඔවුන්ගේ ප්‍රවීණත්වය සැලකිය යුතු දායකත්වයක් ලබා දී තිබුණි.

පසුගිය වසර තුළ උපාධි ප්‍රබන්ධ සහ නිබන්ධන 30ක් ඇතුළුව පර්යේෂණ නිමැවුම් 919ක් එක් කරමින් පුස්තකාලය විශ්වවිද්‍යාලයේ ආයතනික සුරක්ෂිතාගාරයට ක්‍රියාකාරී දායකත්වයක් ලබා දෙන ලදී. CEPPS/NDI සමඟ සහයෝගීතාවෙන් කොළඹ පිහිටි විවිධ විශ්වවිද්‍යාල පර්යේෂණ සුරක්ෂිතාගාර පාර්ලිමේන්තු පර්යේෂණ අංශය සමඟ සුමටව සම්බන්ධ කරන මධ්‍යම පර්යේෂණ සුරක්ෂිතාගාරයක් නිර්මාණය කිරීමේදී කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන ලදී. විවිධ විශ්වවිද්‍යාල හයක සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයන්හි සොයාගැනීම් ඇතුළත් කරමින් මෙම සහයෝගීතා ව්‍යාපෘතිය එහි ආරම්භක අදියර සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම මගින් පරිශීලක ඇතුළුවීම සහ පිටවීම අධීක්ෂණය කිරීම සඳහා ඇතුළුවීම්/පිටවීම් පද්ධතියක් හඳුන්වා දීම මගින් පුස්තකාලයේ සේවා පුළුල් කරන ලදී. මෙම පද්ධතිය පුස්තකාලය භාවිත කිරීමේ රටාවන් පිළිබඳ අගනා අවබෝධයක් ලබා දෙමින් දෛනික, සතිපතා සහ මාසික පදනමින් පරිශීලක සංඛ්‍යාලේඛන රැස් කිරීමට පහසුකම් සලසා ඇත. 2023 වසර සඳහා පුස්තකාලය භාවිත කිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන පහත විස්තර කර ඇත.

වගුව 37: පුස්තකාලය භාවිත කිරීම සම්බන්ධ සංඛ්‍යාලේඛන

| අංශය / සේවය | සංඛ්‍යාලේඛන |
|---|---|
| විමර්ශන සහ බැහැර දෙන පුස්තකාල භාවිතා කළ සාමාජිකයින් විසින් සිදු කරන ලද පැමිණීම් සංඛ්‍යාව | 212,071 |
| ආපසු භාර දෙන ලද ග්‍රන්ථ සංඛ්‍යාව | 60,559 |
| බැහැර දෙන ලද ග්‍රන්ථ සංඛ්‍යාව | 58,883 |
| විමර්ශන අංශය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් සංඛ්‍යාව | 412,117 |
| නිත්‍ය විමර්ශන අංශය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් සංඛ්‍යාව | 20,446 |
| වාර ප්‍රකාශන අංශය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් සංඛ්‍යාව | 5,114 |
| පුස්තකාල අවකාශය භාවිතා කළ සාමාජිකයන්ගේ පැමිණීම් සංඛ්‍යාව | 149,671 |
| පුස්තකාල කෞතුකාගාරය භාවිත කළ සාමාජිකයන්ගේ පැමිණීම් සංඛ්‍යාව | 458 |
| පුස්තකාල පරිගණක විද්‍යාගාරය භාවිත කළ සාමාජිකයන්ගේ පැමිණීම් සංඛ්‍යාව | 302 |
| ශ්‍රී ලංකා එකතුව භාවිත කළ සාමාජිකයන්ගේ පැමිණීම් සංඛ්‍යාව | 11,017 |

පුස්තකාලය මගින් එහි තාක්ෂණික සේවා අංශය තුළ ග්‍රන්ථ 1,461ක් සකසන ලද අතර, ISBN 19ක් නිකුත් කරන ලදී. අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ ප්‍රකාශන සහ විශ්වවිද්‍යාල මුද්‍රිත ප්‍රකාශන සඳහා ISSN 10ක් ද නිකුත් කරන ලදී.

විෂය සම්බන්ධ පුස්තකාල සේවය, පරිශීලක විමසුම්වලට පිළිතුරු සැපයීම, පුහුණු සැසි පැවැත්වීම සහ ලේඛනය සඳහා සහාය ලබා දීම වැනි සේවා රැසක් පිරිනමමින් පීඨ හයම සමඟ සමීපව කටයුතු කරන ලදී. 2023 වර්ෂයේ දී, විෂය සම්බන්ධ පුස්තකාලයාධිකාරීවරු විසින් විවිධ මාධ්‍ය තුළින් විෂය මත පදනම් වූ පරිශීලක විමසීම් 37කට ප්‍රතිචාර දැක්වූ අතර ලේඛන බෙදා හැරීමේ සේවාව මගින් ලිපි සහ ග්‍රන්ථ පරිච්ඡේද 249 ක් සපයන ලදී. මීට අමතරව, ඔවුන් විශ්වවිද්‍යාල ප්‍රජාවේ අධ්‍යාපන සංවර්ධනයට දායක වෙමින් පරිශීලක අධ්‍යාපනික වැඩසටහන් 57 ක් සහ පොදු වෙබිනාර් සංවිධානය කළහ.

ලිවීමේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය කරමින්, පුස්තකාලය මගින් "Grammarly" සඳහා වාරික දායකත්වයක් මිලදී ගන්නා ලදී. 2023 වර්ෂයේ දී, පුස්තකාලය මගින් විවිධ කාණ්ඩවල විශ්වවිද්‍යාල සාමාජිකයින් සඳහා පහසුකම් සපයමින්, අමතර පරිශීලකයින් 950 දෙනෙකු සඳහා ද පහසුකම් සපයන ලදී.

දෘෂ්‍යාබාධිත සිසුන්ට ප්‍රතිලාභ සලසමින් ග්‍රන්ථ 40ක් ශ්‍රව්‍ය ආකෘතියට පරිවර්තනය කරන ලද ශ්‍රව්‍ය ග්‍රන්ථ ව්‍යාපෘතිය ඇතුළත් කිරීම් ඉලක්ක කර ගත් වැදගත් සමාරම්භකයක් විය. මීට අමතරව, පුස්තකාලය මෙම කණ්ඩායම සඳහා සකස් කරන ලද විෂය-සුවිශේෂී කියවීම් 30ක් සංවිධානය කිරීම, ඉදිරිපත් කිරීම සහ බෙදා හැරීම සිදු කරන ලදී.

පුස්තකාලයේ ජංගම යෙදුම හඳුන්වා දීම මගින් සිසුන්ට සහ කාර්ය මණ්ඩලය සඳහා පුස්තකාල ප්‍රවේශය සහ පහසුව වැඩි දියුණු කළ හැකි විය. 2023 වර්ෂය අවසානයේ දී, මෙම යෙදුම මගින් පරිශීලකයින් 8,460 කට අධික සංඛ්‍යාවක් සමඟ KOHA පද්ධතියට ප්‍රවේශ වීම, මාර්ගගත නාමාවලිය, විද්‍යුත්-සුරක්ෂිතාගාරය, දායක වූ දත්ත සමුදා, විද්‍යුත් ග්‍රන්ථ සහ විද්‍යුත් සඟරා වැනි විශේෂාංග ලබා දෙයි. "පුස්තකාලයාධිකාරීවරයාගෙන් අසන්න" යන විශේෂාංගය මගින් පුස්තකාලයාධිකාරීවරුන් සමඟ සෘජු සන්නිවේදනයේ නිරත විය හැකිය. "නිවේදනය" විශේෂාංගය මගින් පුස්තකාල පුවත්, සිදුවීම් සහ යාවත්කාලීන කිරීම් පිළිබඳව පරිශීලකයන් දැනුවත් වේ.

2023 ජුනි මාසයේදී, පුස්තකාලය උපාධි අපේක්ෂකයින් සඳහා පර්යේෂණ, ඉගෙනීම සහ සහයෝගී ක්‍රියාකාරකම් සඳහා සහාය දක්වන නවීන ඩිජිටල් සම්පත්වලින් අනූන අන්තර් ක්‍රියාකාරීත්ව සහයෝගී ඉගෙනුම් කලාපයක් වශයෙන් එළි දක්වන ලදී. ඒකකය තුළ ඇති තොරතුරු ශාලා තුන සිසුන් විසි එක් දෙනෙකුට සුවපහසු අන්දමින් පුස්තකාලය පරිහරණය කළ හැකි වන පරිදි සංවිධානය කර ඇති අතර, 2023 ජුනි සහ දෙසැම්බර් අතර, සිසුන් කණ්ඩායම් 400 කට අධික සංඛ්‍යාවක් ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා මෙම පහසුකම් භාවිතා කළහ.

ලෝක බ්‍රේල් දිනය සැමරීම සඳහා ප්‍රදර්ශනයක් සංවිධානය කිරීම, "ගෞරව සහිතව විශ්‍රාමලත් මහාචාර්යවරුන් සඳහා තොරතුරු විවේකාගාරයක්" විවෘත කිරීම, "පුස්තකාල පොත් සාප්පුවක්" විවෘත කිරීම සහ පුස්තකාල කෞතුකාගාරයක් පිහිටුවීම, කවි පුස්තකාලය, උපකුලපතිවරුන්ගේ එකතුව සහ විශ්වවිද්‍යාලයේ කලාගාරය ඇතුළු වැදගත් සන්ධිස්ථාන කිහිපයක් සාක්ෂාත් කර ගැනීමට 2023 වර්ෂයේ දී පුස්තකාලයට හැකි විය. කෞතුකාගාරය "අතිපූජ්‍ය නාත්තණ්ඩියේ ප්‍රඥාකර නාහිමි අනුස්මරණ කෞතුකාගාරය" ලෙස නම් කර ඇත. එය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ආයතනයක ඉතිහාසය විස්තර කිරීම සඳහා විශේෂයෙන් ආරම්භ කරන ලද මෙම කෞතුකාගාරය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පවත්නා ප්‍රථම කෞතුකාගාරය වේ. එම අවස්ථාවේදීම, "කැලණි සරසවි පුනරාවලෝකනය: කැලණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාසය" නමින් විශිෂ්ට කෘතියක් නිල වශයෙන් එළි දක්වන ලදී. මෙම කෘතිය සම්පාදනය කැලණිය විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරීවරුන් තිදෙනෙකු විසින් සිදු කරන ලදී. පුස්තකාලය මගින් ආසියාවේ ප්‍රථම බහුවිධ ඩෙස්ක් පර්යේෂණ සමුළුව (DRC 2023) ද පවත්වන ලදී. ද්විතීයික දත්ත සහ ද්විතීයික තොරතුරු මූලාශ්‍ර මත පදනම් වූ පර්යේෂණ ප්‍රයත්න ඉදිරියට ගෙන යාමේ අරමුණින් පුස්තකාලය මගින් සංවිධානය කරන ලද මෙම සම්මන්ත්‍රණය 2023 දෙසැම්බර් 6 වන දින පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයට කලා හා මානවශාස්ත්‍ර, වාණිජ හා කළමනාකරණ අධ්‍යයන, විද්‍යා, තාක්ෂණ, වෛද්‍ය විද්‍යා සහ සමාජ විද්‍යා යන පුළුල් පරාසයක විහිදුණු ක්ෂේත්‍ර ගණනාවක් ඇතුළත් විය. ඉංග්‍රීසි සහ සිංහල භාෂා දෙකෙන්ම පවත්වන ලද සමාන්තර තාක්ෂණික සැසි අටක (08) දී සම්පූර්ණ පත්‍රිකා හැට හතක් (67) ඉදිරිපත් කරන ලදී. මෙම සම්මන්ත්‍රණයට සම්මන්ත්‍රණ පූර්ව වැඩමුළු හතරක් ඇතුළත් වූ අතර, එමඟින් ලොව පුරා රටවල් නියෝජනය කරමින් මෙම සම්මන්ත්‍රණයට සහභාගිවන්නන්ට මේස පර්යේෂණයේ මූලධර්ම, එහි ක්‍රමවේදයන් සහ එයින් ලබා ගත හැකි විභව ප්‍රතිදාන





පිළිබඳව විද්වත් අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. මෙම උත්සවයේ කැපී පෙනෙන විශේෂත්වයක් වූයේ, කලාප දෙකකින් සමන්විත "The Journal of Desk Research Review and Analysis" (ISSN: 3030-7007, e-ISSN: 3030-7015) නමින් නව ද්විවාර්ෂික සඟරාවක් එළිදැක්වීමයි.

මෙම භාරදූර අවස්ථාව මගින් පර්යේෂණ මාතෘකාවල විවිධත්වය ප්‍රදර්ශනය කළා පමණක් නොව, මේස පර්යේෂණ ක්‍රමවේද සඳහා කැප වූ විද්වත් වේදිකාවක් පිහිටුවීම ද සනිටුහන් කරන ලදී.

2023 නොවැම්බර් 23 වන දින පුස්තකාලය විසින් පොත් පරිත්‍යාග වැඩසටහනක්, ප්‍රජා පුස්තකාලයක් පිහිටුවීම, සෞඛ්‍ය කඳවුරක්, ජංගම මහා ශාලාවක්, පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක්, දානයක් දීම හා විනෝදාස්වාද වැඩසටහනක් වැනි විවිධ ක්‍රියාකාරකම් හරහා ප්‍රජාව සමඟ සම්බන්ධ වෙමින්, බඩල්ගම, මාකඳුර පිහිටි "Welcome Village"හි ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘතියක් සංවිධානය කරන ලදී. විද්‍යා පීඨයට අනුබද්ධ පශ්චාද් උපාධි පුස්තකාලය මගින් 2023 වර්ෂයේ දී KOHA පුස්තකාල කළමනාකරණ පද්ධතිය හරහා පුස්තකාල ග්‍රන්ථ ස්වයංක්‍රීයකරණය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. 2023 වර්ෂයේ දී පරිශීලකයෝ 9,655ක් පුස්තකාලයට පැමිණියහ.

වෛද්‍ය පීඨ පුස්තකාලය වෙත අවධානය යොමු කිරීමේ දී, 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂයේ දී පුස්තකාලය භාවිත කිරීම සම්බන්ධයෙන් සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණු අතර, 2023 වර්ෂයේ දී, පුස්තකාලයට පැමිණීම් 16,953ක් වාර්තා වී තිබුණි. පුස්තකාලය මගින් ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ව්‍යාපෘතිය හරහා සිසුන්ට දිගුකාලීන පිරුළු සේවාව මගින් පොත් 265ක් නිකුත් කිරීම සහ පසුගිය ප්‍රශ්නපත්‍ර 77ක්, සඟරා ලිපි 341ක්, සම්මන්ත්‍රණ සාරාංශ පත්‍රිකා සහ නිබන්ධන 11ක් විශ්වවිද්‍යාලයේ විද්‍යුත් සුරක්ෂිතාගාරයට ලබා දීම ඇතුළු විවිධ ක්‍රියාකාරකම් ද සිදු කරන ලදී. මීට අමතරව, වෛද්‍ය පුස්තකාලය මගින් ද 2023 වර්ෂයේදී විවිධ නව සමාරම්භක සංවිධානය කරන ලදී. වෛද්‍ය පුස්තකාලය, පීඨයේ පුස්තකාල ශිෂ්‍ය කටයුතු කමිටුව හා සමායෝජනයෙන් විශිෂ්ටම පුස්තකාල පරිශීලකයන් ඇගයීම සඳහා සම්මාන උළෙලක් පවත්වන ලදී. ඊට සමගාමීව, 2023 ජූලි 28 වන දිනට යෙදෙන ලෝක හෙපටයිටිස් දිනය අනුස්මරණයට සමගාමීව, මාර්ගගත පුස්තකාල ප්‍රශ්න විචාරාත්මක තරඟයක් පවත්වන ලදී. මෙම සම්මාන ප්‍රදානෝත්සවයේදී පුස්තකාල ශිෂ්‍ය කටයුතු කමිටුවේ විද්‍යුත්-පුස්තකාල පුවත් පත්‍රිකාවේ සමාරම්භක සංස්කරණය නිල වශයෙන් හඳුන්වා දෙන ලදී. ඔක්තෝම්බර් මාසයේදී, වෛද්‍ය පුස්තකාලය විසින් පියයුරු පිළිකා පිළිබඳව දැනුවත් කිරීමේ මාසය සැමරීම සඳහා සිසුන් අතර පෝස්ටර් තරඟයක් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. තවද, කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිතුමාගේ සහ ආදි වෛද්‍ය ශිෂ්‍ය සංගමයේ සභාපතිතුමාගේ සක්‍රීය දායකත්වයෙන් පුස්තකාල සංවර්ධන අරමුදලක් සැප්තැම්බර් 14 වැනි දින ආරම්භ කරන ලදී. පුස්තකාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මූල්‍ය සම්පත් රැස් කිරීම මෙම අරමුදලේ මූලික අරමුණයි.

සිසුන්ගේ සහ පීඨයේ අධ්‍යයන අත්දැකීම් සම සේ පෝෂණය කරන විශිෂ්ටත්වය, ඇතුළත් කිරීම් සහ නව්‍ය සමාරම්භක සඳහා කැලණිය විශ්වවිද්‍යාල පුස්තකාලයේ කැපවීම තුළින් 2023 වර්ෂයේ දී ද නොමැකෙන සලකුණක් සනිටුහන් කිරීමට සමත්ව ඇත.

**ආචාර්ය සී.සී. ජයසුන්දර**
**පුස්තකාලයාධිපති**



# 9.9. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## 9.9.1. හැඳින්වීම

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය (CDCE) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 932 හි දක්වා ඇති චක්‍රලේඛ විධිවිධාන යටතේ සහ විශ්වවිද්‍යාලයේ නීතිවලට අනුකූලව ක්‍රියාත්මක වේ. ඒ අනුව, එය උපකුලපතිවරයාට සෘජුව වගකිව යුතු අධ්‍යක්ෂවරයෙකු යටතේ ක්‍රියාත්මක වේ. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් තිදෙනෙකු ලියාපදිංචි කිරීම් සහ විභාග, ඉගෙනුම් සම්පත් සහ පුහුණුව යන අංශ තුන මෙහෙයවයි. සනාතන සභාවේ සහ විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය සහිතව අධ්‍යයන මණ්ඩල සහ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ (CDCE) කළමනාකරණ කමිටුව විසින් අදාළ වන පරිදි අධ්‍යයන සහ පරිපාලන තීරණ ගනු ලැබේ.

## 9.9.2. අපගේ මෙහෙවර

අපගේ මෙහෙවර වන්නේ අධ්‍යාපනය ලබන තැනැත්තන් වෙත ජීවිතයේ වටිනාකමට ගරු කරමින් ලොවට සේවය සැලසීම සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කිරීමට අවස්ථා සලසා දීම මගින් විශිෂ්ටත්වයට පත් වීමයි.

## 9.9.3. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් පිරිනමනු ලබන උපාධි වැඩසටහන්

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වසර 30 කට පෙර ආරම්භ කරන ලද අතර, එහි ආරම්භයේ සිටම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි වැඩසටහන පිරිනමනු ලබයි. එය දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වැඩිම ඉල්ලුමක් ඇති බාහිර උපාධි වැඩසටහන ද වේ. 2021 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ශාස්ත්‍රවේදී බාහිර උපාධි වැඩසටහන සඳහා නව මාර්ගෝපදේශයක් නිකුත් කරන ලද අතර පිරිනමනු ලබන ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන එම මඟපෙන්වීමට අනුකූලව පවත්වනු ලබයි.

වර්තමානයේ බාහිර උපාධි වැඩසටහන් පීඨ පහක් මගින් පිරිනමනු ලබයි:

1. මානවශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ
   - ශාස්ත්‍රවේදී උපාධිය - BA (බාහිර) - අවුරුදු 3 යි
2. විද්‍යා පීඨය
   - විද්‍යාවේදී උපාධිය - BSc. (බාහිර) - අවුරුදු 3 යි
3. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය
   - වාණිජවේදී උපාධිය - BCom. (බාහිර) - අවුරුදු 4 යි
   - ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය - BBMgt. (බාහිර) - අවුරුදු 3 යි
4. වෛද්‍ය පීඨය
   - භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බාහිර) - අවුරුදු 4 යි
   - වෘත්තීය චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (බාහිර) - අවුරුදු 4

## 9.9.4. බාහිර උපාධී වැඩසටහන් සඳහා නව ලියාපදිංචි කිරීම්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස්වලට අනුව, 2016 අධ්‍යයන වර්ෂයෙන් පසුව නව ලියාපදිංචි කිරීම් අත්හිටුවන ලද අතර ශාස්ත්‍රපති (බාහිර) උපාධිය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 01/2021 චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් මෙම උපාධි වැඩසටහනේ විෂයමාලාව ප්‍රතිව්‍යුහගත කිරීමට කටයුතු කර ඇත.

2023 වසරේ දී, 2022 අධ්‍යයන වර්ෂය සඳහා වෙනත් උපාධි වැඩසටහන් සමඟ සංශෝධිත ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ තුන්වන කණ්ඩායම සඳහා නව අයදුම්පත් කැඳවන ලද අතර මෑතකාලීනව පවත්වන ලද අ.පො.ස. උසස්පෙළ විභාගය සඳහා පෙනී සිටි සිසුන් උසස් පෙළ ප්‍රතිඵල නිකුත් වූ විගස සහ අභ්‍යන්තර ශිෂ්‍ය ලියාපදිංචි කිරීම්වලින් වහාම පසුව ලියාපදිංචි කිරීමට හැකි වීම කැපී පෙනෙන ජයග්‍රහණයක් විය.





2023 වර්ෂයේ දී, අධ්‍යයන දින දර්ශනය හඳුන්වා දුන් අතර අධ්‍යයන දින දර්ශනයට අනුව පහත පරිදි අධ්‍යයන කටයුතු ආරම්භ විය.

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් අංක 04 අයිතමයේ ඉහත සඳහන් කර ඇති පරිදි, කැලණිය විශ්වවිද්‍යාලයේ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨයේ ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයන්ට පාර්ශ්වික ප්‍රවේශයක් වශයෙන් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධි වැඩසටහනේ තුන්වන වසරට සෘජුවම ලියාපදිංචි වීම සඳහා අවස්ථාවක් සලසා ඇත. මෙම සිසුන්ගේ තෙවන වසර අධ්‍යයන කටයුතු ද 2023.05.01 දින ආරම්භ විය.

## 9.9.5. විභාග

COVID-19 වසංගතය සහ වෙනත් හේතූන් මත පසුගිය වසරවල එක්රැස් වී ඇති විභාග පවත්වා අවසන් කිරීම සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය 2023 වර්ෂයේදී ඵලදායී ක්‍රියාමාර්ග ගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍ර ඉතිහාසයේ ප්‍රථම වතාවට, 2023 වර්ෂයේ දී පහත දක්වා ඇති පරිදි විභාග 21ක් පවත්වන ලදී. ප්‍රතිඵල නිකුත් කිරීම කඩිනම් කිරීම සඳහා සම්මන්ත්‍රණ ලකුණු දීමේ ක්‍රමය ඇතුළු ක්‍රියාමාර්ග කිහිපයක් ගෙන ඇත.

වගුව 38: 2023 වර්ෂයේ දී පවත්වන ලද විභාග පිළිබඳ විස්තර

| No | විභාගයේ නම | මාසය | විෂයයන් |
|---|---|---|---|
| 01 | BA තෙවන වසර - 2016 (පැරණි) | ජනවාරි | 35 |
| 02 | BA දෙවන වසර - 2016 (පැරණි) | පෙබරවාරි | 35 |
| 03 | BA දෙවන (1 වන කොටස) වසර - 2015 (පැරණි) | මාර්තු | 10 |
| 04 | BA තෙවන (II වන කොටස) වසර - 2015 (පැරණි) | මාර්තු | 10 |
| 05 | BSc. පළමු / දෙවන / තෙවන (පැරණි) - 2019 | මාර්තු | 06 |
| 06 | BBMgt පළමු වසර - 2019 | අප්‍රේල් | 07 |
| 07 | BCom පළමු වසර - 2019 | අප්‍රේල් | 07 |
| 08 | BA පළමු වසර - 2019 (පැරණි) | අප්‍රේල් | 34 |
| 09 | BBMgt දෙවන වසර - 2019 | මැයි | 06 |
| 10 | BA පළමු වසර - 2019 (නව) | ජූනි | 34 |
| 11 | BCom දෙවන වසර - 2019 | ජූලි | 06 |
| 12 | BCom තෙවන වසර - 2019 | ජූලි | 06 |
| 13 | BCom සිව් වන වසර - 2019 | ජූලි | 06 |
| 14 | BSc. දෙවන වසර 1 වන සමාසිකය - 2021 | අගෝස්තු | 10 |
| 15 | BA දෙවන වසර - 2019 (පැරණි) | අගෝස්තු | 30 |
| 16 | BBMgt තෙවන වසර - 2019 | සැප්තැම්බර් | 06 |
| 17 | BA පළමු වසර (නව) - 2021 | ඔක්තෝබර් | |
| 18 | BBMgt පළමු වසර - 2021 | ඔක්තෝබර් | |
| 19 | BCom පළමු වසර - 2021 | ඔක්තෝබර් | 07 |
| 20 | BA පළමු වසර (ELTU& COMP) - 2019 (පැරණි) | නොවැම්බර් | 02 |
| 21 | BA තෙවන වසර - 2019 (පැරණි) | දෙසැම්බර් | 35 |
| | | **එකතුව** | **337** |

## 9.9.6. උපාධි ප්‍රදානෝත්සව

2023 වර්ෂයේදී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ උපාධිධාරීහු 5131 දෙනෙක් පහත පරිදි උපාධි ප්‍රදානෝත්සවලට සහභාගී වූහ. අවසාන ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත බොහෝ සිසුන්ට උපාධි ප්‍රදානෝත්සවයට සහභාගි විය හැකි වීම 2023 වසරේ දී ලබා ගත් තවත් සුවිශේෂී ජයග්‍රහණයකි.

වගුව 39: උපාධි ප්‍රදානෝත්සව පිළිබඳ විස්තර

| දිනය | සැසිය | උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව |
|---|---|---|
| 2023 පෙබරවාරි 09 වන දා | 3 සැසිය | 515 |
| 2023 පෙබරවාරි 27 වන දා | 3 සැසිය | 516 |
| 2023 මාර්තු 21 වන දා | 2 සැසිය | 520 |
| | 3 සැසිය | 515 |
| 2023 ජුනි 26 වන දා | 1 සැසිය | 532 |
| සැප්තැම්බර් 14 වන දා | 1 සැසිය | 503 |
| | 2 සැසිය | 500 |
| | 3 සැසිය | 500 |
| නොවැම්බර් 21 වන දා | 1 සැසිය | 515 |
| | 2 සැසිය | 515 |
| | **එකතුව** | **5131** |

## 9.9.7. බාහිර උපාධි වැඩසටහන් පිළිබඳ බාහිර සමාලෝචනය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද කණ්ඩායම් විසින් පහත සඳහන් උපාධි වැඩසටහන් හතර සඳහා ස්වයං-ඇගයුම් වාර්තා (SER) සකස් කර, සමාලෝචනය කර ස්ථානීය පරීක්ෂා කිරීම් ද සිදු කරන ලදී. පහත දක්වා ඇති ශ්‍රේණි සමඟ සමාලෝචන වාර්තා 2023 වර්ෂයේ දී ලැබී තිබුණි.

වගුව 40: බාහිර සමාලෝචන වාර්තාවල සාරාංශය

| අංකය | උපාධි වැඩසටහන | ලකුණු | ශ්‍රේණිය |
|---|---|---|---|
| **01** | ශාස්ත්‍රවේදී උපාධිය | 61.5 | C |
| **02** | වාණිජවේදී උපාධිය | 58.34 | C |
| **03** | භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය | 62.0 | C |
| **04** | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය | 66.1 | B |

ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලසුම් සහ සමාලෝචන මණ්ඩල විසින් සිදු කරන ලද නිර්දේශය 2023 වර්ෂයේ දී පිළියෙළ කර ගන්නා ලද අතර සනාතන සභාව සහ විශ්වවිද්‍යාල පාලක සභාව විසින් ඒවා අනුමත කරන ලදී.

## 9.9.8. මව්කිරි පෝෂණ කාමරය

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත විභාග සහ වෙනත් අවශ්‍යතා සඳහා පැමිණෙන කිරි දෙන මව්වරුන්ගේ (ශිෂ්‍යයින්ගේ) පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා 2022 වර්ෂයේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ මව්කිරි පෝෂණ කාමරයක් විවෘත කරන ලද අතර එය 2023 වර්ෂයේදී අමතර පහසුකම් සහිතව තවදුරටත් නවීකරණය කරන ලදී.

## 9.9.9. ඊ-පුස්තකාලය

ඉගෙනුම් අවශ්‍යතා සපුරාලීම සඳහා සිසුන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින්, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය සඳහා නව විද්‍යුත් පුස්තකාලයක් ඉදිකිරීමට මෙම අධ්‍යාපන කේන්ද්‍රය තීරණය කර ඇත. දිවයිනේ සෑම ප්‍රදේශයකම සිසුන් දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ලියාපදිංචි වී ඇති අතර ඔවුන්ට ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා නිරන්තරයෙන් මෙම අධ්‍යාපන කේන්ද්‍රය වෙත යාමට නොහැකි වේ. එසේ වුවද, ඊ-පුස්තකාලය භාවිතා කිරීම මගින් ඔවුන්ට නිර්දේශ කරන ලද කියවීමේ ද්‍රව්‍ය සඳහා අන්තර්ජාලය ඔස්සේ විශ්වසනීයව ප්‍රවේශ වීමට හැකි වේ. 2023 වර්ෂයේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ විද්‍යුත් පුස්තකාලයේ සිසුන්ගේ විමර්ශන සඳහා විවිධ ග්‍රන්ථ ලබා දී තිබේ.





## 9.9.10. මාර්ගගත ඉගෙනීම

2023 වර්ෂයේ දී, දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය ශිෂ්‍යයන්-ගුරුවරුන් අතර අන්තර්ක්‍රියා සහ සිසුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) භාවිත කිරීම වැඩි දියුණු කරන ලදී. එසේම, මධ්‍යස්ථානය සඳහා මනා ප්‍රගතියක් ලබා දෙන බැවින්, COVID-19 වසංගත තත්ත්වයට විසඳුමක් ලෙස ආරම්භ කරන ලද LMS පිටු භාවිතයෙන් සිසුන්ට දේශන සහ සම්මන්ත්‍රණ සැපයීම සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් Zoom පහසුකම අඛණ්ඩව භාවිතා කරන ලදී.

## 9.9.11. විද්‍යුත් තැපෑල හරහා ශිෂ්‍ය සහාය සහ තොරතුරු

සිසුන් විසින් විද්‍යුත් තැපෑලෙන් අසනු ලබන ප්‍රශ්නවලට කඩිනමින් ප්‍රතිචාර දැක්වීම මගින් සහ ඔවුන්ට අවශ්‍ය තොරතුරු විද්‍යුත් තැපෑලෙන් ලබා දීම මගින් සිසුන්ගේ කටයුතු සඳහා සහාය ලබා දීමට දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය පියවර ගෙන ඇත.

## 9.9.12. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය ප්‍රතිසංස්කරණය කිරීම

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවිය 2023 වර්ෂයේ දී වඩාත් ආකර්ශණීය සහ පැහැදිලි අන්දමින් ප්‍රතිසංස්කරණය කරන ලදී. නවීකරණය කරන ලද CDCE වෙබ් අඩවිය මගින් සිසුන්ට යාවත්කාලීන කරන ලද තොරතුරු වඩාත් පැහැදිලිව ලබා දෙන අතර අවශ්‍ය අවස්ථාවල තොරතුරු සඳහා ප්‍රවේශ වීමේ පහසුකම ද සිසුන්ට ලබා දී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ කැලණිය විශ්වවිද්‍යාලයේ මධ්‍යස්ථාන අතර විශිෂ්ටම වෙබ් අඩවිය සඳහා වන උපකුලපති සම්මානය දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් දිනා ගන්නා ලදී.

## 9.9.13. අධ්‍යයන ක්‍රියාකාරීත්වය විධිමත් කිරීම සඳහා වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් සහ විෂය සම්බන්ධීකාරකවරුන් පත් කිරීම

අධ්‍යයන ක්‍රියාකාරිත්වය විධිමත් කිරීම සඳහා එක් එක් උපාධි වැඩසටහන් සඳහා වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් සහ ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ එක් එක් විෂයයන් සඳහා විෂය සම්බන්ධීකාරකවරුන් ද පත් කරන ලදී.

## 9.9.14. රැස්වීම්

මෙම අධ්‍යාපන කේන්ද්‍රයේ අධ්‍යයන හා සාමාන්‍ය පරිපාලන කටයුතු විධිමත්ව සිදු කිරීම සඳහා 2023 වර්ෂයේදී පහත සඳහන් කර ඇති රැස්වීම් පවත්වන ලදී.

1. නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් සමඟ රැස්වීම් - 08
2. අධ්‍යයන සම්බන්ධීකාරකවරුන් සමඟ රැස්වීම් - 08
3. විෂය සම්බන්ධීකාරකවරුන් සමඟ රැස්වීම් - 02
4. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම - 12

## 9.9.15. ගොඩනැගිල්ල සමඟ ඉඩම බදු ගැනීම

විශ්වවිද්‍යාලයට අයත් වාහන සහ අනෙකුත් වාහන නැවැත්වීමේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයට මුහුණ පෑමට සිදු වූ දිගුකාලීන දුෂ්කරතා මඟහරවා ගැනීම සඳහා වාහන නැවැත්වීම සඳහා වෙන් කිරීම සඳහා ද, විභාග අතරතුර සිසුන්ට හා ඔවුන්ගේ දෙමාපියන්ට රැඳී සිටීමේ පහසුකම් සැපයීම සඳහා ද යාබද ඉඩම ගොඩනැගිල්ලක් සමඟ බදු පදනම මත ලබා ගැනීමට දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය කටයුතු කර ඇත.

## 9.9.16. පරිගණක විද්‍යාගාරය යාවත්කාලීන කිරීම

ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහනේ ප්‍රතිව්‍යුහගත විෂයමාලාවට අනුව, වෘත්තීය පදනම් කර ගත් තොරතුරු තාක්ෂණය (CBIT) වසර තුනේම අනිවාර්ය විෂයයන්ගෙන් එකකි. මෙම විෂයයන්වල ඇගයීම කටයුතු පැවරුම්, ලිඛිත විභාග සහ ප්‍රායෝගික විභාග මගින් සිදු කෙරේ.

2023 වසරේදී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් මෙම විෂයයේ ප්‍රායෝගික විභාග සඳහා පහසුකම් සැලසීම වෙනුවෙන් ඩෙස්ක්ටොප් පරිගණක 100 ක් සහ ලැප්ටොප් පරිගණක 20ක් මිලදී ගෙන දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ පරිගණක විද්‍යාගාරය යාවත්කාලීන කරන ලදී. තවද, ප්‍රායෝගික විභාග ප්‍රමාදයන් වළක්වා ගැනීම සඳහා අන්තර්ජාල සම්බන්ධතාවේ කලාප පළල වැඩි කිරීමට ද කටයුතු කරයි.

## 9.9.17. මූල්‍ය කටයුතු

2023 වර්ෂයේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් එක් එක් උපාධි වැඩසටහන සඳහා වෙනම අයවැයක් සකස් කරන ලදී. එක් එක් උපාධි වැඩසටහනේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වැඩසටහන් අනුව ආදායම් සහ වියදම් ප්‍රකාශන පිළියෙළ කිරීම මගින් දක්වනු ලැබේ. දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මනා විනිවිද පෙනෙන මූල්‍ය කළමනාකරණ යාන්ත්‍රණයක් යටතේ ක්‍රියාත්මක වන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ, මුදල් අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ සහ අනෙකුත් අදාළ රෙගුලාසිවල දක්වා ඇති සියලුම ක්‍රියා පටිපාටිවලට අනුකූලව මෙම කේන්ද්‍රය කටයුතු කරයි. අවශ්‍ය අවස්ථාවලදී, විශ්වවිද්‍යාල මූල්‍ය කමිටුවෙන් සහ පාලක සභාවෙන් අදාළ අනුමැති ලබා ගැනේ.

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ සියලුම මූල්‍ය කාර්යයන් සිදු කරනු ලබන්නේ අභ්‍යන්තරිකව සංවර්ධනය කරන ලද MIS මගිනි. අනන්‍ය ඉලක්කම් 16 ක ගනුදෙනු කේතයක් භාවිතා කරමින් සිසුන්ගෙන් ලබා ගන්නා සියලුම මුදල් බැංකුව හරහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ජංගම ගිණුමට ලබා ගන්නා අතර සියලුම ගෙවීම් MIS පද්ධතිය හරහා මාර්ගගතව සකසනු ලැබේ.

2023 වර්ෂයේ දී දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය මගින් ඉහත විභාග කටයුතු සහ නව ලියාපදිංචි කිරීම් මගින් ශ්‍රී ලංකා රුපියල් මිලියන 400 ක මුදලක් රැස් කර තිබුණි.



**පූජ්‍ය ආචාර්ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි**
**අධ්‍යක්ෂ/ දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**







# 10 තිරසාර සංවර්ධනය

## 10.1. ප්‍රතිපත්ති ප්‍රකාශනය

- විශ්වවිද්‍යාලය රටේ පවතින අදාළ පාරිසරික නීති සහ රෙගුලාසිවලට අනුකූලව සිය ක්‍රියාකාරකම් සිදු කරයි.
- ධාරිතා ගොඩනැගීම, ව්‍යවස්ථාදායක මෙවලම් සහ වැඩිදියුණු කරන ලද අන්තර් ආයතනික සම්බන්ධීකරණය සහ සම්බන්ධතා තුළින් විශ්වවිද්‍යාලය මනා පරිසර කළමනාකරණයක් සඳහා වූ ආයතනික රාමුව ශක්තිමත් කරනු ලබයි.
- ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම කළමනාකරණය කරනු ලබන්නේ අඛණ්ඩව යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබන පූර්වයෙන් නිර්වචනය කරන ලද පාරිසරික කළමනාකරණ පද්ධතියක් මගිනි
- ආයතනයේ ක්‍රියාකාරකම්වල පාරිසරික බලපෑම අඛණ්ඩව තක්සේරු කර පුළුල් දර්ශක සමූහයක් මත පදනම්ව යෝග්‍ය සහ ආයතනගත කරන ලද අධීක්ෂණ රාමුවක් හරහා වාර්තා කරනු ලබන අතර අවශ්‍ය වැඩිදියුණු කිරීම් ද සිදු කරනු ලැබේ.
- පාරිසරික අරමුණු සහ ඉලක්ක සැකසීම සහ සමාලෝචනය කිරීමේ රාමුව විශ්වවිද්‍යාලය විසින් සපයනු ලැබේ.
- විශ්වවිද්‍යාලයේ පාරිසරික ප්‍රතිපත්තිය සඳහා ප්‍රවේශය මහජනතාවට ලබා දී ඇති අතර සෑම පාර්ශ්වකරුවෙකුම ආයතනයේ පාරිසරික ප්‍රතිපත්තිය සහ මෙම ප්‍රතිපත්තිය යටතේ ඔහුගේ/ඇයගේ වගකීම් පැහැදිලිව අවබෝධ කර ගත යුතු අතර සෑම පාර්ශ්වකරුවෙකුම පාරිසරික කළමනාකරණ පද්ධතියේ අන්තර්ගතයට අනුකූලව කටයුතු කළ යුතුය.
- විශ්වවිද්‍යාලයේ යහපත සඳහා පාරිසරික සේවාවල තිරසාර බව සහතික කිරීම සඳහා එවැනි සේවාවල ආර්ථික වටිනාකම පිළි ගනු ලැබේ.

## 10.2. උපාය මාර්ග

- කාර්යක්ෂම භාවිතය, නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය (3R) ප්‍රවර්ධනය කිරීම මගින් අපද්‍රව්‍ය උත්පාදනය අඩු කිරීම
- කාබනික අපද්‍රව්‍ය සඳහා කොම්පෝස්ට් ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම.
- ලෝහ, වීදුරු, ප්ලාස්ටික්/පොලිතීන් සහ කඩදාසි එකතු කර, ඒවා ලියාපදිංචි ප්‍රතිචක්‍රීකරණය කරන්නන් මගින් නිතිපතා බැහැර කිරීමට යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම.
- අඛණ්ඩව බැහැර කිරීම නිර්මාණය කිරීම මගින් ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීමට පහසුකම් සැලසීම.
- වගකිවයුතු ප්‍රතිචක්‍රීකරණය කරන්නන් වෙත යොමු කිරීම.
- රසායනාගාරවලින් ප්‍රමිතිගත රසායනික අපද්‍රව්‍ය එකතු කිරීම සහ ගබඩා කිරීම ස්ථාපනය කර ලියාපදිංචි සමාගම් වෙත ප්‍රවාහනය කිරීම.
- ජෛව අන්තරායකර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්වයංක්‍රීය ක්ලේව්ං ක්‍රමය හඳුන්වා දීම.
- නව ඉදිකිරීම් සහ ප්‍රතිසංස්කරණය කිරීමේදී තිරසාර ඉදිකිරීම් මූලධර්ම ප්‍රවර්ධනය කිරීම සහ නව ඉදිකිරීම් වලදී හරිත ගොඩනැගිලි මූලධර්ම ප්‍රගුණ කිරීම.
- කාබන් කළමනාකරණ සැලැස්ම ඇතුළු විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් දේශගුණික විපර්යාසවල ඍණාත්මක බලපෑම අඩු කිරීම
- පරිසර හිතකාමී ප්‍රසම්පාදන සැලසුම් හරහා පාරිසරික බලපෑම අවම කිරීම.

- වාතයට විමෝචනය වීම සහ ජලයට මුදා හැරීම කළමනාකරණය කිරීම සහ අඩු කිරීම මගින් දූෂණය වැළැක්වීම.
- වැසි ජලය රැස් කිරීම.
- ගෙවතු වගා කටයුතු සඳහා අපජලය රැස් කිරීම, පිරිපහදු කිරීම සහ නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- බලශක්ති කාර්යක්ෂම භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- ජෛව විවිධත්ව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින් වනජීවී වාසස්ථාන නිර්මාණය කිරීම සහ වැඩිදියුණු කිරීම.
- පාරිසරික අධ්‍යාපනය මූලික මෙවලමක් ලෙස යොදා ගනිමින් විශ්වවිද්‍යාල ප්‍රජාව සහ සමාජය අතර පරිසරය කෙරෙහි ගෞරවනීය හැසිරීමක් ප්‍රවර්ධනය කිරීම.

# 10.3. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ ක්‍රියාකාරකම්

කැලණිය විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය විවිධ තිරසාර සංවර්ධන ඉලක්ක යටතේ සංවිධානය කළ හැකි තිරසාරභාවයට අදාළ ක්‍රියාකාරකම් සහ පර්යේෂණ කිහිපයක නිරත වී ඇත.

## 10.3.1. SDG 01: සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

පාලි සහ බෞද්ධ අධ්‍යයනාංශය මගින් සිව්වන වරටත් Glorious Sun නම් හොංකොං පදනම් කරගත් පුණ්‍යායතනයක සහාය ඇතිව මූල්‍ය ආධාර ව්‍යාපාරයක් සංවිධානය කරන ලදී. පාලි, බෞද්ධ දර්ශනය, බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ මනෝවිද්‍යාව අනුගමනය කරන සියලුම සිසුන් මෙම වැඩසටහන යටතේ මූල්‍ය ආධාර ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇත. රටේ පවතින ආර්ථික අර්බුද මධ්‍යයේ වුවද, අවශ්‍යතා ඇති සිසුන්ට තම අධ්‍යයන කටයුතු සාර්ථකව කරගෙන යාමට සහාය වීම මෙහි අරමුණ විය. එපමණක් නොව, වෛද්‍ය පීඨය මගින් 2023 වර්ෂයේ දී පවුල් වෛද්‍ය අධ්‍යයනාංශයේ දී සතියේ දිනවල පෙරවරු 8.00 සිට සවස 4.00 දක්වා ක්‍රියාත්මක කරනු ලබන පවුල් වෛද්‍ය සායනය මගින් රු.100/-ක් වැනි වඩාත් දැරිය හැකි උපදේශන ගාස්තුවක් අය කරමින් මහජනතාව සඳහා ගුණාත්මක සෞඛ්‍ය සේවා පිරිනැමීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.

## 10.3.2. SDG 02: කුසගින්න තුරන් කිරීම

කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ හරිත ප්‍රායෝගික කමිටුව (GPC) මගින් හරිත ගොවිතැනට සම්බන්ධ ක්‍රියාකාරකම් ඇතුළු බොහෝ ක්‍රියාකාරකම් සඳහා සිසුන් සක්‍රීයව සම්බන්ධ කර ගනිමින් තිරසාර සංවර්ධනය සඳහා එහි ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී. පීඨය විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජා එළවළු උද්‍යානවල සේවය කිරීමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වීම සඳහා සිසුන්ට මග පෙන්වීම පිණිස අඛණ්ඩ 'ශ්‍රමදාන' ව්‍යාපාර සංවිධානය කරන ලදී. වල් නෙලීම, නව බෝග සඳහා ඉඩම එළිපෙහෙළි කිරීම සහ නව බෝග වගා කිරීම මෙම ක්‍රියාකාරකම්වලට ඇතුළත් විය.

## 10.3.3. SDG 03: නිරෝගී බව සහ යහපැවැත්ම

2023 වර්ෂයේ දී, විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය SDG 3 - නිරෝගී බව සහ යහපැවැත්ම දියුණු කිරීම සම්බන්ධයෙන් විශිෂ්ටත්වයට පත් විය. ශිෂ්‍ය සුභසාධන මධ්‍යස්ථානය පිහිටුවීම, CPR තරඟයෙන් සිසුන් සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීම සහ විද්‍යාත්මක පර්යේෂණ සම්බන්ධයෙන් අධ්‍යයන සාමාජිකයින් 25 දෙනෙකුට ජනාධිපති සම්මාන ලැබීම කැපී පෙනෙන ජයග්‍රහණ අතරට ඇතුළත් විය. සෞඛ්‍ය ප්‍රගමනය සඳහා පීඨයේ කැපවීම





ශක්තිමත් කරමින් පවත්වන ලද අධිකරණ වෛද්‍ය විද්‍යා පිළිබඳ ජාත්‍යන්තර සංගමය වැනි සම්මන්ත්‍රණවලින් පීඨයේ ගෝලීය බලපෑම පැහැදිලි විය. එපමණක් නොව, ලේ දන්දීමේ ව්‍යාපාර සහ සෞඛ්‍ය කඳවුරු වැනි ප්‍රජා-නැඹුරු මුල පිරීම්, සමාජ යහපැවැත්ම සඳහා එම පීඨයේ කැපවීම ප්‍රදර්ශනය කරයි. 'LEAPS' වැනි ව්‍යාපෘති සහ ශිෂ්‍ය ආධාර වැඩසටහන මගින් සෞඛ්‍ය සම්පන්න ජීවිත සහතික කිරීම සහ සැමට යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ SDG 3 හි ඉලක්කය සමඟ සමගාමී වන සාකල්‍ය ප්‍රවේශයක් පිළිබිඹු කරයි.

## 10.3.4. SDG 04: ගුණාත්මක අධ්‍යාපනයක්

2023 වසරේ කැලණිය විශ්වවිද්‍යාලය ගුණාත්මක අධ්‍යාපනය ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් කිහිපයක නිරත විය. මෙම ක්‍රියාකාරකම්වලට මූලික උපාධි හා පශ්චාද් උපාධි පාඨමාලා සඳහා පිරිනමන වැඩසටහන්වල ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රජාවගේ දැනුම හා කුසලතා මට්ටම වර්ධනය කිරීම සඳහා වූ ක්‍රියාකාරකම් ද ඇතුළත් විය. අවබෝධතා ගිවිසුම් කිහිපයක් විදේශීය විශ්වවිද්‍යාල සහ කර්මාන්ත හවුල්කරුවන් සමඟ අත්සන් කරන ලද අතර, සිසුන් සහ ප්‍රජාව සඳහා කීර්තිමත් දේශීය හා විදේශීය විද්වතුන් සහ කර්මාන්ත හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් සම්මන්ත්‍රණ, වෙබිනාර් සහ වැඩමුළු රාශියක් සංවිධානය කරන ලදී. එයට අමතරව, අනධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය ඇතුළු කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි ද විශේෂ අවධානය යොමු විය. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරි කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා නවීන තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගැනීම පිණිස ඔවුන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීමේ (EUS) ව්‍යාපෘතිය ආරම්භ කර අරමුදල් සපයන ලදී. 2023 වසරේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සවිබල ගැන්වීමේ (EUS) ව්‍යාපෘතිය යටතේ වැඩමුළු මාලාවක් පවත්වන ලදී.

## 10.3.5. SDG 05: ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

කැලණිය විශ්වවිද්‍යාලයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය (CGS) මගින් 2023 ජුලි මාසයේ දී 'නිමක් නැති සාධාරණත්වය සහ අඛණ්ඩතාව' යන තේමාව යටතේ ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතා පිළිබඳ 2 වන අන්තර්ජාතික සමුළුව - ICGD '23 සංවිධානය කරන ලදී. මෙම සමුළුව කීර්තිමත් දේශීය හා ජාත්‍යන්තර බුද්ධිමතුන්ට සහ නැගී එන විද්වතුන්ට ස්ත්‍රී පුරුෂ භාවයේ සියලුම අංශ පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් සහ පර්යේෂණ හුවමාරු කර ගැනීමේ සහ බෙදා ගැනීමේ වේදිකාවක් විය. තවද, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය (CGS) මගින් ඩිජිටල් ලෝකයේ කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා නවෝත්පාදන සහ සමාජ සංවර්ධනය සඳහා වූ පදනම සමඟ එක්ව TECHNO 2023 නමින් ජාත්‍යන්තර කාන්තා දින වැඩසටහනක් සංවිධානය කරන ලදී. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය/සමානාත්මතා මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ලෙස පත් වූ මහාචාර්ය එස්.ඒ.පී.එම්. මනුරත්න ඇතුළු අධ්‍යයන සාමාජිකාවන් කිහිප දෙනෙකු ජාතික හා ජාත්‍යන්තර සංවිධානවල උසස් තනතුරු සඳහා පත් කරන ලදී. පරිගණකකරණය සහ තාක්ෂණය සඳහා කර්මාන්ත අන්තර්ක්‍රියා කුටිය (IICFCT), විශ්ව විද්‍යාල ව්‍යාපාර සම්බන්ධක කුටිය (UBLC) සහ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය එක්ව සංවිධානය කරන ලද කාන්තා ව්‍යවසායකත්ව ඇරඹුම් කඳවුරක් ද කැලණිය විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී. එහි හැකතන් ජයග්‍රහණ ලැබූ සිසුවියන් කිහිප දෙනෙකු ද සිටීම විශේෂත්වයක් වූ අතර එය තාක්ෂණය සම්බන්ධ මාධ්‍ය වැඩසටහන්වල විශේෂ අවධානයට ද ලක් විය.

## 10.3.6. SDG 06: පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

මහාචාර්ය අරුණ රණවීර මහතාගේ මඟපෙන්වීම යටතේ කැලණිය විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික සැලසුම් සහ නවෝත්පාදන මධ්‍යස්ථාන (EDIC) කණ්ඩායම විසින් "ස්වයංක්‍රීය හුදකලා රැහැන් රහිත ජල තත්ත්ව අධීක්ෂණ සහ වැසි ජලය රැස්කිරීමේ පද්ධතියක්" සංවර්ධනය කරන ලද අතර එම පද්ධතිය මගින් ස්වයංක්‍රීයව වැසි ජලය රැස් කර අධීක්ෂණය කරන ලද ගුණාත්මකභාවය අනුව එම ජලය විවිධ ටැංකි වලට ලබා දෙයි. තත්‍ය කාලීන ජල තත්ත්ව අධීක්ෂණ හැකියාවන් සක්‍රීය කිරීම මගින් ශුෂ්ක සහ ග්‍රාමීය ප්‍රදේශ ස්මාර්ට් ලෝකයට සම්බන්ධ කිරීමට මෙම ස්මාර්ට් පද්ධතියට හැකියාව ලැබී ඇත. දකුණු ආසියානු කලාපයේ තරුණ අයදුම්කරුවන් 100කට අධික සංඛ්‍යාවකින් ලැබුණු වඩාත් නව්‍යකරණ අයදුම්පත් 31 සම්බන්ධයෙන් ජාතික හා ජාත්‍යන්තර විශේෂඥයන්

කණ්ඩායමකින් සමන්විත වූ කීර්තිමත් මණ්ඩලයක් විසින් සිදු කරන ලද ඇගයීම් මාලාවකින් පසුව, EDIC කණ්ඩායම 2023 දකුණු ආසියානු තරුණ ජල අභියෝගය (SAYWC) හි පළමු ස්ථානයට පත්විය. පරීක්ෂා කරන ලද මෙම නිෂ්පාදනය වෙළඳපොළට නිපදවීම කිරීම සඳහා ව්‍යාපෘතියට මූල්‍යමය සහාය ලැබෙනු ඇත.

### 10.3.7. SDG 07: දැරිය හැකි පිරිසිදු බලශක්තිය

අදියර 01 - පරිගණක හා තාක්ෂණ පීඨයේ විද්‍යාගාර ගොඩනැගිල්ල 2023 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. ගොඩනැගිලි සංකීර්ණය බලශක්ති කාර්යක්ෂම ආලෝකකරණය, කැළිකසළ පිරියම් කළ ජලය එකතු කිරීමේ පොකුණක්, වැසි ජලය රැස් කිරීමේ ටැංකි සහ ජල-කාර්යක්ෂම සවිකිරීම් වලින් සමන්විත විය. මෙම සැලසුම මගින් තාප දූපත් ආවරණය අඩු කිරීම, ඉහළ සූර්ය පරාවර්තක දර්ශක අගයන් සහිත ද්‍රව්‍ය භාවිතා කිරීම, විවෘත ජාලක පදික වේදිකා සහ භූගත වාහන නැවැත්වීම මගින් පාරිසරික බලපෑම සඳහා විසඳුම් සොයයි. ගොඩනැගිලි සංකීර්ණය ගොඩනැගිලි කළමනාකරණ පද්ධතියකින් (BMS) ද එය සමන්විත වේ.

### 10.3.8. SDG 07: දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය

මානව ශාස්ත්‍ර පීඨය පීඨාධිපතිවරයා සහ ආබාධ සහිත සිසුන් සමඟ ඇතුළත් කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සහ ප්‍රවේශ විය හැකි අධ්‍යයන පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් ආරම්භ කරන ලදී. ජාතික භාෂා සමානාත්මතා අභිවෘද්ධි ව්‍යාපෘතිය (NLEAP) සහ සංවර්ධන පර්යේෂණ සහ මැදිහත්වීම් මධ්‍යස්ථානය (CDRI) විසින් සංවිධානය කරන ලද සහ විශ්වවිද්‍යාලයේ වාග් විද්‍යා දෙපාර්තමේන්තුව විසින් සත්කාරකත්වය සපයන ලද කැලණිය විශ්වවිද්‍යාලයේ පරිවර්තන අධ්‍යයන උපාධි අපේක්ෂකයින් සඳහා ශිෂ්‍ය සංසදයක් ස්ථාපනය කිරීමේ විශේෂ උත්සවයක් 2023 වසරේ කැලණිය විශ්වවිද්‍යාලයේ දී පවත්වන ලදී. මානවශාස්ත්‍ර පීඨය මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහා දෙමළ භාෂාව පිළිබඳ දේශන ද පවත්වන ලදී. ඔවුන් ආබාධ සහිත සිසුන් සඳහා "වර්තමානයේ අවශ්‍ය ප්‍රායෝගික නායකත්වය සහ කළමනාකරණ කුසලතා" මැයෙන් ආරාධිත සැසියක් ද පවත්වන ලදී.

### 10.3.9. SDG 12: වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය

විද්‍යුත් අපද්‍රව්‍යවල බලපෑම පිළිබිඹු කිරීම සඳහා මෙන්ම විශ්වවිද්‍යාල ප්‍රජාව අතර ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා විද්‍යුත් අපද්‍රව්‍ය එකතු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ තිරසාර විසඳුම් මධ්‍යස්ථානය කැලණිය විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික සංවර්ධන හා නවෝත්පාදන මධ්‍යස්ථානය (EDIC) සහ පරිසර කමිටුව සහ ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS) E2 අංශය සමඟ සමායෝජනයෙන් කටයුතු කරන ලදී. 2023 වර්ෂයේදී වැඩසටහන් දෙකක් පවත්වන ලදී. තවද, කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ආචාර්යවරුන්ගේ සංගමය විසින් නැවත භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ අපද්‍රව්‍ය අවම කිරීම, පරිසර හිතකාමී පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ ශිෂ්‍ය ආහාර සඳහා අනුග්‍රහය දැක්වීම සඳහා භාවිත කළ අයිතම අලෙවි කිරීමක් සංවිධානය කරන ලදී.





## 10.4. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අදාළ පර්යේෂණ නිමැවුම

2023 වර්ෂයේදී, එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවල (SDGs) දක්වා ඇති ප්‍රධාන ගෝලීය අභියෝග සඳහා විසඳුම් සෙවීම සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම සාඩම්බරයෙන් ඉස්මතු කරන ලදී. දරිද්‍රතාවයෙන් තොර, කුසගින්නෙන් තොර, යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම, ගුණාත්මක අධ්‍යාපනය, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය, අව අසමානාත්මතා, තිරසාර නගර සහ ප්‍රජාවන්, වගකීම් සහිත පරිභෝජනය සහ නිෂ්පාදනය, සහ ජලය තුළ ජීවය වැනි තිරසාර සංවර්ධන ඉලක්ක ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් බලපෑම් සහිත පර්යේෂණ සමාරම්භක මාලාවක් වසර පුරා සිදු කරන ලදී. ප්‍රකාශන සංඛ්‍යාවේ සාරාංශයක් 40 වගුවේ දක්වා ඇත.

වගුව 41: තිරසාර සංවර්ධන ඉලක්ක ආශ්‍රිත පර්යේෂණ නිමැවුම්

| තිරසාර සංවර්ධන ඉලක්කක | පර්යේෂණ සංඛ්‍යාව |
|---|---|
| **SDG 01 - දරිද්‍රතාවය තුරන් කිරීම** | 01 |
| **SDG 02 - කුසගින්න තුරන් කිරීම** | 24 |
| **SDG 03 - නිරෝගී බව සහ යහපැවැත්ම** | 281 |
| **SDG 04 - ගුණාත්මක අධ්‍යාපනයක්** | 87 |
| **SDG 05 - ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය** | 13 |
| **SDG 06 - පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව** | 19 |
| **SDG 07 - දැරිය හැකි සහ පිරිසිදු බලශක්තිය** | 10 |
| **SDG 10 - අව අසමානාත්මතා** | 03 |
| **SDG 11 - තිරසාර නගර සහ ප්‍රජාවන්** | 09 |
| **SDG 12 - වගකීමෙන් යුතු පරිභෝජනය සහ නිෂ්පාදනය** | 10 |
| **SDG 14 - ජලය තුළ ජීවය** | 02 |




# 11 මූල්‍ය ප්‍රකාශන 2023

## 11.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

වගුව 42: මූලය කාර්ෂයසාධනය පිළිබඳ ප්‍රකාශනය

| දෙසැම්බර් 31වන දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023 | 2022 (යළි ප්‍රකාශිත) |
|---|---|---|---|
| | | (ශ්‍රීලං. රු.) | (ශ්‍රීලං. රු.) |
| **ආදායම** | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම** | | | |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම - ජංගම** | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 5 | 4,781,740,843 | 4,464,375,299 |
| ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව සහ ප්‍රදාන - මහපොළ | | 273,360,500 | 240,398,250 |
| ශිෂ්‍යයින් සඳහා ශිෂ්‍යත්ව සහ ප්‍රදාන - ශිෂ්‍යාධාර | | 166,264,000 | 90,108,000 |
| STHRD ව්‍යාපෘති ප්‍රදාන | | 33,229,570 | 19,525,676 |
| AHEAD ව්‍යාපෘති ප්‍රදාන | | 753,899 | 76,171,166 |
| බාහිර පර්යේෂණ ආධාර | | 108,103,203 | 138,740,069 |
| උපපාදන අරමුදල්වලින් ලද පරිත්‍යාග | | 5,829,896 | 1,736,567 |
| **විනිමය නොවන ගනුදෙනු වලින් මුළු ආදායම - ජංගම** | | **5,369,281,910** | **5,031,055,028** |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද ආදායම - ප්‍රාග්ධන** | | | |
| භාණ්ඩාගාර අරමුදල්වලින් ප්‍රාග්ධන ආයෝජනය | | 206,471,419 | 202,187,959 |
| අක්මා රෝග සඳහා වන උතුරු කොළඹ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා ප්‍රාග්ධන ආයෝජනය | | 60,918,242 | 89,355,180 |
| අතිරේක බඳවාගැනීම් සඳහා AHEAD ව්‍යාපෘතියෙන් සිදුකරන ලද ප්‍රාග්ධන ආයෝජනය | | 82,429,776 | 90,508,283 |
| තොරතුරු තාක්ෂණ යටිතලපහසුකම් සංවර්ධන අරමුදල වෙතින් සිදුකරන ලද ප්‍රාග්ධන ආයෝජනය | | 5,174,520 | 6,356,050 |
| ප්‍රාග්ධන ප්‍රදාන - AHEAD ව්‍යාපෘතිය | | 136,080,281 | 156,422,314 |
| ප්‍රාග්ධන ප්‍රදාන - STHRD ව්‍යාපෘතිය | | 2,120,440,538 | 2,564,388,776 |
| පරිත්‍යාග | | 1,163,442 | 1,460,511 |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම - ප්‍රාග්ධන** | | **2,612,678,219** | **3,110,679,073** |
| **විනිමය නොවන ගනුදෙනුවලින් ලද මුළු ආදායම** | | **7,981,960,129** | **8,141,734,101** |
| **විනිමය ගනුදෙනුවලින් ලද ආදායම** | | | |
| ආයෝජන පොළිය | | 761,153,339 | 689,716,924 |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් ලද ආදායම | | 286,832,794 | 297,768,405 |
| ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්/ විශේෂ සේවාවලින් ලද ආදායම | | 493,574,608 | 440,890,612 |
| අභ්‍යන්තර ආදායම | 6 | 821,057,275 | 1,126,381,859 |
| **විනිමය ගනුදෙනුවලින් මුළු ආදායම** | | **2,362,618,016** | **2,554,757,799** |
| **මුළු ආදායම** | | **10,344,578,146** | **10,696,491,899** |

වගුව 42: (සම්බන්ධයි).

| දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා | සටහන | 2023 (ශ්‍රීලං. රු.) | 2022 (යළි ප්‍රකාශිත) (ශ්‍රීලං. රු.) |
|---|---|---|---|
| **මෙහෙයුම් ප්‍රතිඵල** | | | |
| **පුනරාවර්තන ආදායම** | | | |
| විනිමය නොවන | | 5,369,281,910 | 5,031,055,028 |
| විනිමය | | 2,362,618,016 | 2,554,757,799 |
| **මුළු ආදායම** | | **7,731,899,927** | **7,585,812,826** |
| **වියදම් - ජංගම (ප්‍රාග්ධන නොවන)** | | | |
| පුද්ගල පඩිනඩි | 7 | 4,260,421,693 | 4,289,329,578 |
| ගමන් වියදම් | 8 | 2,395,888 | 6,958,279 |
| සැපයුම් | 9 | 204,101,403 | 170,924,179 |
| නඩත්තු වියදම් | 10 | 72,520,733 | 85,541,250 |
| කොන්ත්‍රාත් සේවා | 11 | 754,992,714 | 431,312,517 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 12 | 215,401,054 | 101,339,393 |
| සංවර්ධන අරමුදලින් දරනලද වියදම් | 13 | 312,746,755 | 100,866,902 |
| ව්‍යාපෘති වියදම් | 14 | 33,983,468 | 95,696,843 |
| දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපනය මධ්‍යස්ථානය සඳහා වියදම් | 15 | 195,289,620 | 89,225,433 |
| ගාස්තු අයකරන පාඨමාලා / විශේෂ සේවා සඳහා වියදම් | | 243,127,634 | 273,486,005 |
| පාරිතෝෂික ප්‍රතිපාදන | | 327,026,673 | 258,806,037 |
| වියදම් - ශිෂ්‍යාධාර | | 166,264,000 | 90,108,000 |
| වියදම් - මහපොළ | | 273,360,500 | 240,398,250 |
| බාහිර පර්යේෂණ ආධාර | | 108,103,203 | 102,275,724 |
| විදේශ විනිමය පරිවර්තනය කිරීමේදී ලද පාඩුව | | 3,580,159 | - |
| **මුළු වියදම්** | | **7,173,315,498** | **6,336,268,389** |
| **කාල සීමාව සඳහා ජංගම අතිරික්තය/(හිඟය)** | | **558,584,428** | **1,249,544,437** |
| **විනිමය නොවන ආදායම - ප්‍රාග්ධන ප්‍රදාන** | | **2,612,678,219** | **3,110,679,073** |
| **වියදම් - ජංගම (ප්‍රාග්ධන)** | | | |
| ප්‍රාග්ධන ප්‍රදානවලින් දරන ලද පුනරාවර්තන වියදම් | 16 | 19,740,843 | 17,875,299 |
| ක්ෂය වීම් | | 827,960,564 | 722,074,988 |
| අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂ කිරීම | | 1,327,568 | 6,895,474 |
| **මුළු වියදම් - ජංගම/ (ප්‍රාග්ධන)** | | **849,028,974** | **746,845,760** |
| **ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීමෙන් පසු කාලසීමාව තුළ අතිරික්තය/(හිගය)** | | **1,763,649,245** | **2,363,833,313** |
| **කාල පරිච්ඡේදය තුළ අතිරික්තය/(හිඟය)** | | **2,322,233,673** | **3,613,377,751** |



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

## 11.2. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

වගුව 43: මූලය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2023 (ශ්‍රීලං. රු.) | 2022 (යළි ප්‍රකාශිත) (ශ්‍රීලං. රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත සහ උපකරණ | 17 | 15,526,169,769 | 13,404,001,206 |
| පුස්තකාල පොත් සහ උපාධි කබා | 18 | 6,547,941 | 13,566,094 |
| කෙරීගෙන යන ප්‍රාග්ධන කටයුතු | 19 | 5,146,670,869 | 5,140,139,094 |
| අස්පෘෂ්‍ය වත්කම් | 20 | - | 14,533,961 |
| මූල්‍ය වත්කම් | 21 | 3,764,140,210 | 3,551,284,238 |
| | | **24,443,528,788** | **22,123,524,593** |
| **ජංගම වත්කම්** | | | |
| ගබඩා භාණ්ඩ | 22 | 52,125,107 | 53,009,093 |
| විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු | 23 | 382,597,397 | 392,647,553 |
| කාර්ය මණ්ඩලය සඳහා අත්තිකාරම් | 24 | 826,680 | 1,389,630 |
| අත්තිකාරම් සහ පෙරගෙවුම් | 25 | 44,078,242 | 108,980,127 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 26 | 922,727,669 | 683,668,229 |
| | | **1,402,355,096** | **1,239,694,632** |
| **මුළු වත්කම්** | | **25,845,883,883** | **23,363,219,226** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| සමුච්චිත අරමුදල- අතිරික්තය/(හිගය)- ප්‍රාග්ධන | 27 | 9,583,912,000 | 7,820,262,755 |
| වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | 28 | 118,483,827 | 101,342,609 |
| අමාත්‍යමණ්ඩල අනුමැතිය ලත් ගොඩනැගිලි ව්‍යාපෘතිය | 29 | 1,665,966 | 1,227,570 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය | | 8,298,179,471 | 8,298,179,471 |
| රඳවාගත් ඉපැයීම් | | 2,904,199,771 | 2,731,495,331 |
| | | **20,906,441,035** | **18,952,507,737** |
| අත්තිකාරම් වශයෙන් ලද ආදායම | 30 | 1,129,108,546 | 1,106,685,841 |
| | | **1,129,108,546** | **1,106,685,841** |
| **සංචිත සහ සීමිත අරමුදල්** | | | |
| අභ්‍යන්තර සීමිත අරමුදල් | 31 | 1,710,386,041 | 1,394,640,256 |
| දායාද අරමුදල් | 32 | 38,151,004 | 27,900,792 |
| පර්යේෂණ ආධාර | 33 | 123,827,638 | 170,479,452 |
| | | **1,872,364,683** | **1,593,020,500** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන | 34 | 1,507,316,311 | 1,373,753,063 |
| | | **1,507,316,311** | **1,373,753,063** |
| **ජංගම වගකීම්** | | | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 35 | 107,003,047 | 100,730,215 |
| උපචිත වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු | 36 | 323,650,262 | 236,521,867 |
| | | **430,653,309** | **337,252,081** |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | **25,845,883,883** | **23,363,219,226** |

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස්කර ඉදිරිපත් කර ඇත.

ඩබ්.එල්.එස්.විජේසේකර
වැඩබලන මූල්‍යාධිකාරී

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් වගකීම දරනු ලබයි.

පාලක සභාව වෙනුවෙන් සහ සඳහා අත්සන් කරනු ලැබුවේ

ජ්‍යේෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා
උපකුලපති

මහාචාර්ය එම්.එම්. ගුණතිලක
පාලක සභා සාමාජික

ජ්‍යේෂ්ඨ මහාචාර්ය එස්.ආර්.ඩී.කාලිංගමුදලි
පාලක සභා සාමාජික

කැලණිය විශ්වවිද්‍යාලය
2024 ජූනි 11





# 11.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

වගුව 44: මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා | 2023<br>ශ්‍රී ලංකා රු. | 2022<br>(යළි ප්‍රකාශිත)<br>ශ්‍රී ලංකා රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් අතිරික්තය/ (හිගය) | 558,584,428 | 1,249,544,437 |
| **ගැලපුම්** | | |
| දේපල පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ලාභය | (227,185) | - |
| චලනය නොවන, සෙමින් චලනය වන සහ යල් පැන ගිය තොග සඳහා ප්‍රතිපාදන | 348,060 | - |
| ආයෝජනවලින් ලද පොලී | (761,153,339) | (689,716,924) |
| පාරිතෝෂික ප්‍රතිපාදන | 327,026,673 | 258,806,037 |
| රජයේ ප්‍රදානය - පුනරුත්ථාපන සහ නඩත්තු | (19,740,843) | (17,875,299) |
| විශ්වවිද්‍යාල අරමුදල්/මූල්‍ය නොවන ගැලපුම් සඳහා දායක වූ ආදායම | (1,052,946,558) | (1,389,786,471) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(948,108,764)** | **(589,028,219)** |
| ගබඩා භාණ්ඩ (වැඩිවීම)/අඩුවීම | 535,926 | (12,518,179) |
| විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු (වැඩිවීම)/අඩුවීම | (421,422) | (94,933,200) |
| කාර්ය මණ්ඩල අත්තිකාරම් (වැඩිවීම)/අඩුවීම | 562,950 | (18,678,121) |
| අත්තිකාරම් සහ පෙර ගෙවීම් (වැඩිවීම)/අඩුවීම | 64,901,885 | (41,969,082) |
| උපචිත සහ ගෙවිය යුතු වෙනත් වියදම් වැඩි වීම/ (අඩු වීම) | 115,588,367 | 17,989,174 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු වැඩි වීම/ (අඩු වීම) | 6,272,833 | (1,474,720) |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ ජනිත මුදල් ප්‍රවාහය** | **(760,668,225)** | **(740,612,347)** |
| පාරිතෝෂිත ගෙවීම් | (75,033,026) | (98,344,482) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(835,701,251)** | **(838,956,829)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම | (510,570,691) | (967,676,506) |
| දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම | 916,500 | - |
| ආයෝජනවලින් ලද පොලී | 771,624,917 | 609,457,204 |
| ප්‍රදානය කරන ලද ණය මුදල් | (6,094,592) | - |
| කෙරීගෙනයන ප්‍රාග්ධන කටයුතු | (171,344,383) | (137,346,763) |
| අස්පෘශ්‍ය වත්කම් | - | (12,407,271) |
| ආයෝජන | (206,761,379) | 552,607,169 |
| සීමිත අරමුදල් සහ ප්‍රදාන | 10,250,212 | 53,981,316 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(111,979,417)** | **98,615,149** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ** | | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන | 413,647,687 | 174,500,000 |
| වෙනත් විශේෂ ප්‍රදාන- වෙනත් මූලාශ්‍රවලින් ප්‍රාග්ධන සහ ප්‍රාග්ධන දායකත්වය | 481,575,746 | 50,658,464 |
| බාහිර අරමුදල් භාවිතා කිරීම | 291,516,676 | 41,489,353 |
| මූල්‍ය නොවන ගැලපීම | - | 728,132,434 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය** | **1,186,740,109** | **994,780,251** |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම/ (අඩු වීම) | 239,059,441 | 254,438,571 |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 683,668,229 | 429,229,657 |
| **වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ** | **922,727,669** | **683,668,229** |

# 11.4. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

45 වගුව: හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා - ශ්‍රී ලංකා රු. | විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අතිරික්තය/(හිගය) ප්‍රාග්ධන | කැබිනට් අනුමැතිය ලද ගොඩනැගිලි ව්‍යාපෘති | ප්‍රත්‍යාගණන අතිරික්තය | රඳවාගත් ඉපැයුම් | සංචිත සහ සීමිත අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2022 ජනවාරි 01 දිනට ශේෂය** | 5,368,452,809 | 137,005,107 | 5,368,452,809 | 1,011,848 | 8,129,394,471 | 2,385,744,227 | 2,409,592,981 | **23,799,654,252** |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11 අනුව නැවත වර්ගීකරණය-ශුද්ධ සංචලන | - | - | - | - | - | 2,712,661,482 | - | **2,712,661,482** |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11- අනුව නැවත වර්ගීකරණය- සමුච්චිත අතිරික්තය /(හිගය) -ප්‍රාග්ධන | (2,712,661,482) | - | - | - | - | (2,712,661,482) | - | **(5,425,322,965)** |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11- අනුව නැවත වර්ගීකරණය- රජයේ ප්‍රදානය ක්‍රමක්ෂ කිරීම | (2,655,791,326) | - | - | - | - | - | - | **(2,655,791,326)** |
| ප්‍රතිලෝම ප්‍රාග්ධනීකරණය සඳහා ප්‍රතිලෝම ක්ෂයවීම් | | | | | | 4,843,263 | | **4,843,263** |
| **2022 ජනවාරි 01 දිනට ශේෂය-යළි ප්‍රකාශිත** | - | 137,005,107 | 5,368,452,809 | 1,011,848 | 8,129,394,471 | 2,390,587,490 | 2,409,592,981 | **18,436,044,707** |
| වර්ෂය තුළ අතිරික්තය/ (හිගය) | - | - | - | - | - | 3,613,377,751 | - | **3,613,377,751** |
| මාරු කිරීම් / ශුද්ධ සංචලන | - | (3,320,312) | - | 215,722 | 168,785,000 | (799,763,340) | 54,319,769 | **(579,763,162)** |
| MBBS ප්‍රදාන වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (55,810,334) | 55,810,334 | - |
| ගාස්තු අයකිරීමේ පාඨමාලාවලින් අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (167,404,607) | 167,404,607 | - |
| පුස්තකාල අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (10,842,083) | 10,842,083 | - |
| දායාද අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (1,736,567) | 1,736,567 | - |
| පූර්ව වර්ෂ ගැලපීම් | - | - | 57,553,506 | - | - | (36,442,453) | - | **21,111,053** |
| PV-DBO හි තත්‍ය (ලාභ)/අලාභය | - | - | - | - | - | 158,547,503 | - | **158,547,503** |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11- අනුව වර්ගීකරණය- සමුච්චිත අරමුදල්-ප්‍රාග්ධන | - | - | 2,363,833,313 | - | - | (2,363,833,313) | - | - |
| පූර්ව වර්ෂ ගැලපීම් | - | (32,342,186) | 30,423,128 | - | - | 4,815,284 | - | **2,896,226** |
| **2022 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **101,342,610** | **7,820,262,755** | **1,227,570** | **8,298,179,471** | **2,731,495,331** | **2,699,706,341** | **21,652,214,078** |

| | විලම්භිත ප්‍රාග්ධන ප්‍රදාන | වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | සමුච්චිත අතිරික්තය/(හිගය) ප්‍රාග්ධන | කැබිනට් අනුමැතිය ලද ගොඩනැගිලි ව්‍යාපෘති | ප්‍රත්‍යාගණන අතිරික්තය | රඳවාගත් ඉපැයුම් | සංචිත සහ සීමිත අරමුදල් | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| **2023 ජනවාරි 01 දිනට ශේෂය** | - | 101,342,610 | 7,820,262,755 | 1,227,570 | 8,298,179,471 | 2,731,495,331 | 2,699,706,341 | **21,652,214,078** |
| පූර්ව වර්ෂ ගැලපීම් | - | - | - | - | - | (6,745,572) | - | **(6,745,572)** |
| වර්ෂය තුළ අතිරික්තය/ (හිගය) | - | - | - | - | - | 2,322,233,673 | - | **2,322,233,673** |
| මාරු කිරීම් / ශුද්ධ සංචලනයන් | - | 17,141,217 | - | 438,396 | - | (102,500,000) | (93,297,929) | **(178,218,316)** |
| MBBS ප්‍රදාන වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (63,954,994) | 63,954,994 | - |
| ගාස්තු අයකිරීමේ පාඨමාලාවලින් අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (318,998,674) | 318,998,674 | - |
| පුස්තකාල අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (6,281,251) | 6,281,251 | - |
| දායාද අරමුදල් වෙත අරමුදල් මාරු කිරීම | - | - | - | - | - | (5,829,896) | 5,829,896 | - |
| PV-DBO හි (ලාභ)/අලාභය | - | - | - | - | - | 118,430,400 | - | **118,430,400** |
| ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11- අනුව වර්ගීකරණය- සමුච්චිත අරමුදල්-ප්‍රාග්ධනය | - | - | 1,763,649,245 | - | - | (1,763,649,245) | - | - |
| **2023 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **118,483,827** | **9,583,912,000** | **1,665,966** | **8,298,179,471** | **2,904,199,771** | **3,001,473,228** | **23,907,914,262** |





# 11.5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශයක් සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත 2023 වර්ෂයේ සටහන්

## 11.5.1. ආයතනික තොරතුරු

### අ. වාර්තාකරණ අස්ථිත්වය

කැලණිය, දළුගම පිහිටි කැලණිය විශ්වවිද්‍යාලය, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සහ ඊට පසුකාලීනව සිදුකරන ලද සංශෝධන යටතේ පිහිටුවන ලද පූර්ණවශයෙන් රජය සතු උසස් අධ්‍යාපන ආයතනයකි. මෙම විශ්වවිද්‍යාලය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

### ආ. විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වල ස්වභාවය සහ ප්‍රධාන ක්‍රියාකාරකම්

මෙම විශ්වවිද්‍යාලය වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, මානව ශාස්ත්‍ර පීඨය, සමාජ විද්‍යා පීඨය, විද්‍යා පීඨය, වෛද්‍ය පීඨය, පරිගණක හා තාක්ෂණ පීඨය සහ උපාධි අධ්‍යයන පීඨය යනුවෙන් වන පීඨ හතකින් සමන්විත වේ.

තිරසාර සංවර්ධනය උදෙසා දැනුම බිහි කිරීමේ සහ බෙදා හැරීමේ විශිෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම විශ්වවිද්‍යාලයේ දැක්ම වේ. ශික්ෂණය, ඉගෙනුම සහ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම විශ්වවිද්‍යාලයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ . විශ්ව විද්‍යාලයේ අරමුණු පහත සඳහන් පරිදි වේ.

- උසස් ගුණාත්මක හා නව්‍යශීලී ශික්ෂණ හා ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම.
- විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස උසස් ගුණාත්මක පීඨ සහ කාර්ය මණ්ඩලයක් ගොඩනැගීම.
- ගෝලීය ප්‍රමිතියෙන් යුතු බහුවිෂයික පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය කිරීම.
- ආර්ථික හා සමාජීය සබඳතාහි නිරතවීමේ පරාසය පුළුල් කරමින් විශ්වවිද්‍යාලයේ ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.
- කාර්යක්ෂම හා ඵලදායී පරිපාලනය සහ මූල්‍ය කළමනාකරණය තුළින් විශිෂ්ට පාලන ක්‍රමයක් ගොඩනැගීම.

### ඇ. මූල්‍ය ප්‍රකාශන සඳහා බලය දුන් දිනය

2024 පෙබරවාරි 26 වැනි දින පැවති පාලක සභාවේ විශේෂ රැස්වීමේදී විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය ලබා දෙන ලදී.

**ඈ. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වගකීම**

ශ්‍රී ලංකා රාජ්‍යංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීමත් වංචාව හෝ දූෂණය හේතු කරගෙන සැලකිය යුතු වැරදි වලින් තොර මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම සඳහා අවශ්‍ය බවට කලමනාකාරීත්වය තීරණය කරන අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන්ද කළමනාකාරීත්වය වගකීම දරයි.

- මූල්‍ය කාර්ය සාදනය පිළිබඳ ප්‍රකාශනය
- මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය
- ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- අයවැය සහ තත්වය අගයන් සැසඳීමේ ප්‍රකාශනය
- වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනත් පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත සටහන්.

**ඉ. වාර්තාකරණ කාල පර්ච්ඡේදය**

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාල පරිච්ඡේදය 2023 ජනවාරි 01වැනි දින සිට 2023 දෙසැම්බර් 3 වැනි දින දක්වා වූ මාස දොළහක කාලපරිච්ඡේදය නිරූපණය කරයි.

## 11.5.2. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

**අ. අනුකූලතා ප්‍රකාශය**

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම්/හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැයගත සහ තත්ත්ව අගයන් සංසන්දනය කිරීමේ ප්‍රකාශය මෙන්ම වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති  පිළිබඳ සාරාංශයක් සහ පැහැදිලි කිරීමේ සටහන් වලින් සමන්විත වේ. මෙම ප්‍රකාශයන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද  සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් එහි මූල්‍ය චක්‍රලේඛ අංක 2/2018 මගින් සම්මත කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං. රා.ගි.ප්‍ර.) I, II සහ III වෙළුම් අනුව සකස් කර ඇත. අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර මූල්‍ය වර්ෂයේ භාවිතා කළ ප්‍රතිපත්තිවලට අනුකූල වේ. කෙසේ වෙතත්, රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් නොමැති ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් වන කල්හි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රී ලං. ගි.ප්‍ර.) භාවිතා කර ඇත.

**ආ. මිණුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනමක් මත සකස් කර ඇති අතර සංගතව අදාළ කර ඇත. සාධාරණ වටිනාකමට මනිනු ලබන දේපල, පිරියත සහ උපකරණ සහ ආයුගණක තක්සේරු ක්‍රමය මත පදනම්ව මනිනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් හැර මූල්‍ය ප්‍රකාශනවලට බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් සිදු කර නොමැත. විශේෂිත ප්‍රතිපත්ති මතුවට ඉදිරිපත් කරනු ලබන සටහන්වල පැහැදිලි කර ඇත.





**ඇ. අඛණ්ඩ පැවැත්ම**

විශ්වවිද්‍යාලය අඛණ්ඩ පැවැත්මක් සහිතවේ යැයි යන උපකල්පන මත  මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත. අපේක්ෂිත අනාගත කාලයක් සඳහා විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පවතින බවට පාලක සභාව තක්සේරු කර ඇත. තවද, විශ්වවිද්‍යාලයට අඛණ්ඩව පවත්වාගෙන යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති විය හැකි තරමේ අවිනිශ්චිතතාවයන් පවතින්නේ යැයි පාලක සභාවේ අදහස් නොකරයි. ඔවුන් විශ්වවිද්‍යාලය ඈවර කිරීමට හෝ නතර කිරීමට අදහස් කරන්නේ නැත. එබැවින්, මූල්‍ය ප්‍රකාශන තවදුරටත් අඛණ්ඩව පැවැත්ම පිළිබඳ පදනම මත සකස් කෙරේ.

**ඈ. ගිණුම්කරණයේ උපචිත පදනම**

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ තොරතුරු හැර මූල්‍ය ප්‍රකාශන ගිණුම්කරණයේ උපචිත පදනම අනුගමනය කරමින් පිළියෙල කර ඇත

**ඉ. කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල්**

විශ්වවිද්‍යාලය විසින් භාවිතා කරනු ලබන සහ ඉදිරිපති කරනු ලබන ව්‍යවහාර මුදල්වර්ගය වන ශ්‍රී ලංකා රුපියල්වලින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත.

**ඊ. වැදගත්භාවය සහ සමූහනය**

සමාන අයිතමවල සෑම වැදගත් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම වැදගත් නොවන්නේ නම් මිස වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කර ඇත.

**උ. සංසන්ධනාත්මක තොරතුරු**

මූල්‍ය ප්‍රකාශන හා සම්බන්ධ අදාළ වන පරිදි ප්‍රමාණාත්මක, විස්තරාත්මක තොරතුරු ඇතුළු තුලනාත්මක තොරතුරු හෙළිදරව් කර ඇත. වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සහ ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමග තුලනය කිරීම සඳහා අදාළ වන විට පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සහ වර්ගීකරණය සංසෝධනය කර ඇත.

**ඌ. හිලව් කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලින් නියම කරනු ලැබ හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් සහ වගකීම් හෝ ආදායම් සහ වියදම් එකිනෙක හිලව් කර නොමැත.

**එ. විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සහ ශේෂයන්**

අදාළ ගනුදෙනු සිදුවන දිනවලදී පවතින විනිමය අනුපාත භාවිතයෙන් හෝ අයිතම ප්‍රත්‍යාගණනය කර ඇති කල්හි එම අගය අනුව විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු කෘත්‍ය ව්‍යවහාර මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගණුදෙණු නිරවුල් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සහ විදේශ ව්‍යවහාර මුදල්වලින් නාමනය කර ඇති මුදල් වත්කම් සහ බැරකම් වසර අවසානයේ පවතින විනිමය අනුපාතවලට පරිවර්තනය කිරීම මගින් ඇතිවන විදේශ විනිමය ලාභ සහ අලාභ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයන තුළ හඳුනා ගැනේ.

## 11.5.3.වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

### අ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනයකිරීම

2023 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී විශ්ව විද්‍යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇත.

### ආ. ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සැලකිය යුතු තරමේ වෙනස්කම් සිදු නොවූ අතර පෙර වසරවල අනුගමනය කරන ලද ප්‍රතිපත්ති තවදුරටත් භාවිතා කර ඇත.

### ඇ. වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකාරීත්වය විසින් මූල්‍ය වර්ෂය අවසානයේ දී ආදායම, වියදම්, වත්කම්, වගකීම්, සහ අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් හෙළිදරව් කිරීමට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ.

### ඈ. වත්කම් සහ එම වත්කම් තක්සේරු කිරීමේ පදනම

#### i. දේපල, පිරියත සහ උපකරණ

විශ්වවිද්‍යාලය සේවා සැපයීමේදී හෝ පරිපාලන කටයුතු සඳහා තබා ඇති සහ භාවිත කරන සහ වසරකට වැඩි කාලයක් භාවිත කිරීමට අපේක්ෂා කරන ඊට අයත් වත්කම් ගිණුම්ගතකිරීමේදී දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ශ්‍රීලං.රා.ගි.ප්‍ර 07 හි නියමයන් යොදා ගනියි. දේපල, පිරියත සහ උපකරණ යන්නට ඉඩම්, ගොඩනැගිලි සහ වැඩිදියුණු කිරීම්, කාර්යාල ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ, මෝටර් රථ, ජල සහ විදුලි සැපයුම් යෝජනා ක්‍රම, පිරියත සහ යන්ත්‍රෝපකරණ, පරිගණක උපකරණ/පරිගණක උපාංග, පරිගණක මෘදුකාංග, විදුලිජනක සහ බල සැපයුම් පද්ධති, ජලාපවහන සහ මලාපවහන පද්ධති, ක්‍රීඩා භාන්ඩ/ උපකරණ, වෙනත් උපකරණ, පුස්තකාල පොත් සහ වාර සඟරා, සහ උපාධි ලෝගු ඇතුළත් වේ.

#### ii. හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාව තිබේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වසනීයව මිනුම් කළ හැකි නම් දේපල, පිරියත සහ උපකරණ හඳුනාගනු ලැබේ.

#### iii. මූලික හඳුනාගැනීම

දේපල, පිරියත සහ උපකරණ ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්ත්වයට පත්කිරීම සඳහා දරන ලද කිසියම් ආනුෂාංගික වියදම් ද සහිතව මිල දී ගැනීමේදී දැරූ පිරිවැය ඇතුළුව පිරිවැයට මූලිකව හඳුනාගනු ලබන අතර මූලික හඳුනාගැනීමෙන් අනතුරුව පිරිවැය අඩුකරන ලද සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභයට අනුව දේපල, පිරියත සහ උපකරණ මනිනු ලැබේ.

**මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධයෙන් වන සීමා.**

කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණයේ පහසුව සඳහා සහ අඩු මූල්‍ය වටිනාකම් සහිත අයිතම විශාල සංඛ්‍යාවක් සඳහා ගිණුම් පවත්වාගෙන යාම පිණිස දැරීමට සිදුවන අධික පිරිවැය සහ වැඩි කාලසීමාව අවම කර ගැනීම සඳහා මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේදී රුපියල් 15,000 ක සීමාවක් හඳුන්වා දී ඇත. ඒ අනුව, පුස්තකාල පොත් සහ වාර සටහන් හැර රුපියල් 15,000 හෝ ඊට වැඩි වත්කම් මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන වාර්තා කළ යුතුය.





#### iv. පසුකාලීන පිරිවැය

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක අංගයක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එකී කොටසේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා එන්නේ නම් සහ එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් අයිතමයේ ධාරණ අගයට හඳුනාගනු ලැබේ. පහත දක්වා ඇති හඳුනානොගැනීමේ ප්‍රතිපත්තියට අනුකූලව ප්‍රතිස්ථාපිත කොටසෙහි ධාරණ අගය හඳුනා නොගනී.

දේපල, පිරියත සහ උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම සඳහා අදාළ වන පිරිවැය දැරූ පරිදි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

#### v. හඳුනා නොගැනීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ධාරණ අගය එම අයිතමය බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හෝ හඳුනා නොගනී. හඳුනා නොගැනීම හේතුවෙන් ඇතිවන කිසියම් ලාභයක් සහ අලාභයක් (ශුද්ධ අපහරණ ආදායම සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කරන ලද) මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ. ලාභ ආදායම් ලෙස වර්ගගීකරණය නොකරයි.

#### vi. ක්ෂයවීම්

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් දේපල, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් අංගය මත සරළ මාර්ග පදනමක් අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත. කිසියම් වත්කමක් භාවිතයට සඳහා තබා ඇති අවස්ථාවේ සිට එහි ක්ෂය වීම ආරම්භ වන අතර වත්කම විකිණීමට තබා ඇති ලෙස වර්ගීකරණය කළ දිනය සහ වත්කම හඳුනා නොගන්නා දිනය යන දින අතරින් කලින් එළැඹි දිනයේදී ක්ෂය වීම් නතර වේ.
ප්‍රවර්තන සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ:

වගුව 46: තක්සේරු කරන ලද වත්කම්වල ඵලදායි ජීව කාලය

| වත්කම් කාණ්ඩය | තක්සේරු කරන ලද ඵලදායි ජීව කාලය |
|---|---|
| ගොඩනැගිලි සහ වැඩිදියුණු කිරීම් | වසර 20 යි |
| කාර්යාලීය ගෘහභාණ්ඩ | වසර 10 යි |
| කාර්යාලීය උපකරණ | වසර 05 යි |
| රසායනාගාර සහ ශික්ෂණ උපකරණ | වසර 05 යි |
| මෝටර් වාහන | වසර 05 යි |
| ජල සහ විදුලි සැපයුම් යෝජනා ක්‍රමය | වසර 10 යි |
| පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන | වසර 05 යි |
| උපාධි කබා | වසර 05 යි |
| යන්ත්‍රෝපකරණ | වසර 05 යි |
| වෙනත් වත්කම් | වසර 05 යි |
| පරිගණක උපකරණ/ උපාංග | වසර 05 යි |
| පරිගණක මෘදුකාංග | වසර 05 යි |
| විදුලි උත්පාදක යන්ත්‍ර සහ බල සැපයුම් පද්ධතිය | වසර 10 යි |
| ජලාපවහන සහ මලාපවහන පද්ධතිය | වසර 10 යි |
| ක්‍රීඩා උපකරණ | වසර 04 යි |

වත්කමක  ධාරණ අගය එහි ඇස්තමේන්තුගත අයකරගත හැකි මුදලට වඩා වැඩි නම් වත්කමෙහි ධාරණ වහාම එහි අයකරගත හැකි මුදලට ලියා හරින බැවින්, එක් එක් වාර්තාකරණ කාල සීමාව අවසානයේ වත්කම්වල අවශේෂ අගයන් සහ ප්‍රයෝජනවත් ආයු කාලය, යෝග්‍යවන්නේනම්, සමාලෝචනය කර ගළපනු ලැබේ.

අපහරණය නිසා සිදුවන ලාබ සහ පාඩු තීරණය කරනු ලබන්නේ එමගින් ඇතිවන මුදල ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර ලාභය/ (අලාභය) විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

### vii. දේපලවලට එරෙහිව පවතින නඩු

සින්නක්කර අයිතිය කැලණිය විශ්වවිද්‍යාලයට පැවරී තිබුණද, විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කරන ලද පහත ඉඩම් කැබලි දෙකට සම්බන්ධයෙන් අධිකරණයේ නඩු විභාග වෙමින් පවතී.

47 වගුව: අධිකරණ නඩු

| දේපළ | නීති කෘත්‍යය |
|---|---|
| දුම්මලදෙණියේ දම්මින්නගහවත්තේ<br><br>කැබලි අංක බී<br><br>ප්‍රමාණය - රූඩ්:01 පර්:23.23 | දිසා අධිකරණය මාරවිල නඩු අංක 1538/L<br><br>1961 දී පී ඒ පේද්‍රික් පෙරේරා චන්ද්‍රසේකර යන අය විසින් විශ්වවිද්‍යාලයට පරිත්‍යාග කරන ලද පුත්තලම දිස්ත්‍රික්කයේ දුම්මලදෙණියේ පිහිටි දම්මින්නගහවත්ත නම් ඉඩමේ අයිතිය ප්‍රකාශ කරන ලෙස ඉල්ලා අජිත් යූ පීරිස් මහතා විසින් විශ්වවිද්‍යාලයට එරෙහිව ඉහත නඩුව පවරා ඇත. |
| රාගම තලගොල්ලෙහි පිහිටි තලගොල්ලවත්ත ඉඩම (පරිත්‍යාගයකි) | ගම්පහ දිසා අධිකරණයේ නඩු අංක 1225/L<br><br>වෛද්‍ය පීඨය පිහිටි අක්කර 4 රූඩ් 2 පර්චස් 33කින් සමන්විත රාගම තලගොල්ලවත්ත නම් ඉඩමට පැමිණිලිකරුවන් සම අයිතිකරුවන් ලෙස ප්‍රකාශ කරන ලෙස ඉල්ලා පැමිණිලිකරුවන් 15 දෙනෙකු විසින් ගම්පහ දිසා අධිකරණයේ ඉහත නඩුව ගොනු කර ඇත. |

### viii. උරුම වත්කම්

සමාජ විද්‍යා පීඨයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශය මගින් සිදු කරන ලද පුරාවිද්‍යා කැනීම්වලදී හමුවූ ඓතිහාසික කෞතුක භාණ්ඩ වැනි උරුම වත්කම් කිහිපයක් කැලණිය විශ්වවිද්‍යාලය සතුව පවතී. ප්‍රධාන පුස්තකාලයේ ඇති පැරණි කාසි සහ පොත් එකතුවක් සහ පුස්තකාල හා තොරතුරු විද්‍යා අධ්‍යයනාංශය  විසින් පවත්වාගෙන යනු ලබන පෞරාණික පුස්කොළපොත් එකතුවක් ද විශ්වවිද්‍යාලය සතුය. පුරාවිද්‍යාත්මක වටිනාකම තහවුරු කළ නොහැකි බැවින් මෙම වත්කම් තක්සේරු නොකෙරේ.

### ix. පිරිවැය ආකෘතිය

ප්‍රත්‍යාගණනය  කරන ලද වත්කම් පන්ති හැර දේපල පිරියත සහ උපකරණ එහි පිරිවැය අඩුකරන ලද සමුච්චිත ක්ෂයවීම් අනුව ගණනය කෙරේ. ඉඩම් ක්ෂය නොකරනු ලබන අතර එය පිරිවැය/ප්‍රත්‍යාගණ අගයට අනුව ගණනය කරනු ලැබේ.



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

### x. ප්‍රත්‍යාගණන ආකෘතිය

මූලික හඳුනාගැනීම්වලින් අනතුරුව සාධාරණ වටිනාකම මැනිය පහත දක්වා ඇති දේපල, පිරියත සහ උපකරණ (ඉඩම්, ගොඩනැගිලි, උපාධි ලෝගු සහ මෝටර් රථ) පන්ති ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකමට දක්වා ඇති අතර, එය ප්‍රත්‍යාගණන දිනයට ඇති සාධාරණ වටිනාකමින් කිසියම් පසුකාලීන සමුච්චිත ක්ෂයවීම් සහ පසුකාලීන සමුච්චිත හාණිකරණ පාඩු අඩුකර ගණනය කරනු ලැබේ. මෙම වත්කම් පන්ති සෑම වසර පහකටම වරක් ප්‍රත්‍යාගණනය කරනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්වල කිසියම් හානිකරණ ස්වභාවයක් පෙන්නුම් කෙරේදැයි යන්න තීරණය කිරීම සඳහා සෑම වාර්තා කරන දිනයේදීම එකී දේපල, පිරියත සහ උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් සමාලෝචනය කරනු ලබන අතර එවැනි හානිකරණ ස්වභාවයක් පිළිබඳ කිසියම් ඇඟවීමක් තිබේ නම් එම වත්කම්වල ආපසු අයකරගත හැකි ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමේ ධාරණ අගය එහි ආපසු අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන්නේ නම් හානිකරණ පාඩුව හඳුනා ගැනේ. හානිකරණ පාඩුව මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනයේ හඳුනා ගැනේ.

### xi. ආයෝජන

ආයෝජනය යන්නෙන් ස්ථාවර තැන්පතුවල සහ ඉතිරිකිරීමේ ගිණුම්වල සිදුකරන ලද ආයෝජන නිරූපනය වේ. මෙම ආයෝජන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 - මූල්‍ය උපකරණවලට අනුකූලව ගිණුම්ගත කර ඇත. ස්ථාවර තැන්පතු සහ ඉතුරුම් ගිණුම්වල ආයෝජනය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ක්‍රමක්ෂිත පිරිවැයට වර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ඒවා මූලිකව සාධාරණ වටිනාකමින් මනිනු ලබන අතර පසුව එලදායී පොලී අනුපාතයක් භාවිතා කරමින් සාධාරණ වටිනාකම අඩුකරන ලද ක්‍රමක්ෂිත පිරිවැයට මනිනු ලැබේ.

### xii. කාර්ය මණ්ඩල ණය

කාර්ය මණ්ඩල ණය යන්නට ආපදා ණය, පරිගණක ණය, විශේෂ ආපදා ණය, වාහන ණය, කාර්ය මණ්ඩල ණය සහ උපකුලපති අරමුදල් ණය ඇතුළත් වේ. කාර්ය මණ්ඩල ණය ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ක්‍රමක්ෂිත පිරිවැයට ගණනය කරන ලද මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09හි නියම කර ඇති පරිදි කිසියම් කාර්ය මණ්ඩල ණයක හානිකරණ පාඩුවක් අපේක්ෂිත පිරිවැය ක්‍රමය මත හඳුනා ගනී.

### xiii. කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

වාර්තා කරන දිනට නිමා නොකළ දේපළ, පිරියත සහ උපකරණ මත දරන ලද ප්‍රාග්ධන වියදම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ලෙස පෙන්වනු ලබන අතර කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ සඳහා දරන ලද පිරිවැය දේපල, පිරියත සහ උපකරණ භාවිතය සඳහා තබා ඇති විට ඒවා වෙත මාරු කරනු ලැබේ.

### xiv. අස්පෘශ්‍ය වත්කම්

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ගලා ඒමේ සම්භාවිතාව ඇති විට සහ වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට මාර්ගගත සඟරා අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇත. අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරන පාඩු අඩුකරන ලද පිරිවැයට දක්වනු ලැබේ. මෙම වියදම් වසර 5 ක කාලයක් තුළ ක්‍රමක්ෂ කරනු ලැබේ.

### xv. ජංගම වත්කම්

මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වර්ගීකරණය කර ඇති ජංගම වත්කම් යනු විශ්වවිද්‍යාලයේ  සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ උපලබ්ධි වන හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කරන සහ වාර්තා කළ දිනට පසුව මාස දොළහක් ඇතුළත උපලබ්ධිවේයැයි අපේක්ෂා කරන අයිතම හෝ මුදල් හෝ මුදල් සමාන දෑ වේ.

### xvi. ගබඩා භාණ්ඩ

ගබඩා භාණ්ඩ පිරිවැයට දක්වනු ලබන අතර පළමු ගැනුම් පළමු නිකුතු පදනම මත තීරණය වේ. ගබඩා භාණ්ඩ ප්‍රධාන වශයෙන් ලිපිද්‍රව්‍ය සහ අමතර කොටස්වලින් සමන්විත වේ. ගබඩා භාණ්ඩ පරිභෝජනය සඳහා මිස ප්‍රති අලෙවිය සඳහා නොවේ.

### xvii. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ යනු අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි, වටිනාකමෙහි සැලකිය යුතු වෙනස් වීමේ අවදානමකට භාජනය නොවන කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ලෙස අර්ථ දැක්වේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් සහ මුදල් සමාන දෑ යන්නට අතැති මුදල් සහ බැංකුවල තැන්පතු ඇතුළත් වේ. අත්පත් කරගත් දින සිට මාස හයක් හෝ ඊට අඩු කෙටිකාලීන කල්පිරීමක් සහිත ආයෝජන ද මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය මත සකස් කරනු ලැබේ.

### ඉ. ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම

### i. පුනරාවර්තන ප්‍රදාන

පුනරාවර්තන ප්‍රදාන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ මුදල් පදනම මත හඳුනාගනු ගනී. දේපළ, පිරියත සහ උපකරණ පුනරුත්ථාපනය සඳහා දරනු ලබන පිරිවැය සහ ඉදිකිරීම් සහ නව වැඩ සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන අවශ්‍ය අවස්ථාවලදී කෙරීගෙන යන වැඩ ලෙස හෝ ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනාගනු ලැබේ.

### ii. ප්‍රාග්ධන ප්‍රදාන

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත - 11 - විනිමය නොවන ගනුදෙනු වලින් ලැබෙන ආදායම අනුව ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

### ඊ. බාහිර ප්‍රදාන වලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායකත්වය

උත්පාදිත අරමුදල්වලින් සහ විවිධ ව්‍යාපෘති අරමුදල්වලින් මිල දී ගත් දේපළ, පිරියත සහ උපකරණවල වටිනාකම "බාහිර ප්‍රදානවලින් ප්‍රාග්ධන වියදම් සඳහා දායක වීම" ලෙස පෙන්වා ඇත.

### උ. අභ්‍යන්තරව සීමා කළ අරමුදල්

විශේෂිත අරමුණු සඳහා වෙන්කළ අරමුදල් අභ්‍යන්තරව සීමා කරන ලද අරමුදල්වලට ඇතුළත් වේ. සංවර්ධන අරමුදල් මගින් වසර අවසානයේ ශුද්ධ වියදම් නොකළ ශේෂයන් සහිත විශ්වවිද්‍යාලයේ,පීඨවල සහ අධ්‍යයනාංශ අරමුදල්වල සමුච්චිත තත්ත්වය නිරූපනය කෙරේ.

### ඌ. උපපාදන අරමුදල්

උපපාදන අරමුදල්වලට විශ්වවිද්‍යාලයට ලැබෙන සීමිත පරිත්‍යාග සහ පරිත්‍යාගශීලීන් විසින් ස්ථාපිත කරන ලද විවිධ අරමුණුවලට අනුකූලව භාවිතා කරනු ලබන උපපාදන අරමුදල්වලින් උත්පාදිත ආයෝජන ප්‍රතිලාභ ඇතුළත් වේ.

### එ. බදු

### i. ආදායම් බදු

පවතින බදු රෙගුලාසිවලට අනුව විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතුවලින් ලැබෙන ආදායම මත ආදායම් බදු ගෙවීමට විශ්වවිද්‍යාලය බැඳී නැත.





### ii. එකතු කළ අගය මත බදු

පවතින බදු රෙගුලාසිවලට අනුව එකතු කළ අගය මත බදු ගෙවීමේ අවශ්‍යතාවයෙන් විශ්වවිද්‍යාලය නිදහස් කර ඇත.

### iii. පූර්ව පුද්ගලික ආදායම් බද්ද (APIT)

විශ්වවිද්‍යාල වියදම්වල කොටසක් නොවන, ආදායම් බදු ගෙවීම සඳහා බැඳීමක් ඇති සේවකයින්ගේ මාසික වැටුපෙන් අඩු කරන ලද පූර්ව පුද්ගලික ආදායම් බද්ද විශ්වවිද්‍යාලය විසින් දැනට ප්‍රේෂණය කරයි. එබැවින් පූර්ව පුද්ගලික ආදායම් බදු ගෙවීම විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ගිණුම්ගත කර නොමැත.

### ඒ. සේවක ප්‍රතිලාභ

### i. අර්ථ දැක්වීම්

#### කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

අදාළ සේවාව සපයන විටදී කෙටිකාලීන සේවක ප්‍රතිලාභ සඳහා වියදම් දරනු ලැබේ. සේවකයා විසින් සපයන ලද අතීත සේවාවේ ප්‍රතිඵලයක් ලෙස මෙම මුදල ගෙවීමට විශ්වවිද්‍යාලයට වර්තමාන නෛතික හෝ වාස්තවික බැඳීමක් තිබේ නම් සහ වගකීම විශ්වාසදායක ලෙස තක්සේරු කළ හැකි නම් ගෙවීමට බලාපොරොත්තු වන මුදල සඳහා වන බැරකම හඳුනා ගැනේ.

#### නිශ්චිත දායක සැලැස්ම

සේවකයින් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (UPF), සේවක භාර අරමුදල (ETF), විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා හිමිකම් ලබන අතර දායක මුදල් අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුකූල වේ. කැලණිය විශ්වවිද්‍යාලය සිය සේවකයින්ගේ මූලික වැටුප් සහ ජීවන වියදම් දීමනා, අධ්‍යයන දීමනා සහ මාසික වන්දි දීමනා මත විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට, සේවක භාරකාර අරමුදලට සහ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට ස්ථාවර දායක මුදල් ගෙවන අතර වැඩිදුර මුදල් ගෙවීම සඳහා නීතිමය හෝ වාස්තවික බැඳීමක් නොමැත. මෙම බැඳීම සේවක ප්‍රතිලාභ පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 19හි අර්ථ දක්වා ඇති දායකත්ව සැලැස්මේ විෂය පථයට අයත් වේ. නිශ්චිත දායක සැලැස්මට දායක වීමේ වගකීම අදාළ සේවාව සපයනු ලබන විට ලාභ හෝ අලාභවල හඳුනා ගැනේ.

#### නිශ්චිත ප්‍රතිලාභ බැඳීම

1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා ගෙවීමේ පනතට අනුව සේවකයින් සඳහා නිශ්චිත ප්‍රතිලාභ වගකීමක් සඳහා වගකීමක් ඇතිවේ. එවැනි නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක් යනු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත19හි විෂය පථයට ඇතුළත් වන පශ්චාද් සේවානියුක්ත ප්‍රතිලාභ බැඳීමකි.

#### නිශ්චිත ප්‍රතිලාභ බැඳීම මිනුම්කිරීම

මූල්‍යතත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම යනු වාර්තා කරන දිනයේ දී නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ පවතින වර්තමාන වටිනාකමයි. සුදුසුකම් ලත් ආයුගණකවරයෙකු විසින් ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය (PUC) භාවිතා කරමින් වාර්ෂිකව ගණනය කිරීම සිදු කෙරේ. ආයුගණක ලාභ සහ අලාභයන්ගෙන් සමන්විත නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් නැවත මැනීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වහා හඳුනා ගැනේ. වර්ෂය තුළ සේවකයින් විසින් සපයනු ලබන සේවාවන් සඳහා (වර්තමාන සේවා පිරිවැය) ආරෝපණය කළ හැකි නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වැඩිවීම විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනාගනී. වට්ටම් අනුපාතය ව්‍යුත්පන්න කර ඇති අතර දළ වශයෙන් වාර්ෂික 18% (2022-18% සහ 2021-11.5%) ක දිගු කාලීන පොලී අනුපාතයක් අනාගත වගකීම් වට්ටම් කිරීමට භාවිතා කර ඇත. වගකීම් සඳහා බාහිරව අරමුදල් සැපයීමක් සිදු නොකෙරේ.

### ගිණුම්කරණ ඇස්තමේන්තුව

වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩිවීම් සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පය කිරීම් ආයුගණක තක්සේරුවට ඇතුළත් වේ. බැඳීම් පිළිබඳ විශේෂයෙන් දක්වනු ලබන උපකල්පන සහ එහි දිගුකාලීන ස්වභාවය හේතුවෙන් තක්සේරුකරණයේ ඇතිවන සංකීර්ණත්වය හේතුවෙන් උපකල්පනවල වෙනස්වීම්වලට නිශ්චිත ප්‍රතිලාභ බැඳීම ඉතා සංවේදී වේ. සෑම උපකල්පනයක්ම වාර්තා කරන දිනයේදී සමාලෝචනය කෙරේ.

### විශ්‍රාම පාරිතෝෂිතයේ ආයුගණක තක්සේරුව

වෘත්තීය ආයුගණක සමාගමක් වන Actuarial & Management Consultants (Pvt) Ltd විසින් 2023 දෙසැම්බර් 31 දිනට ආයුගණක තක්සේරුවක් සිදු කරන ලදී. ආයුගණක තක්සේරුවේ සාරාංශගත වාර්තාව පහත පරිදි වේ:

වගුව 48: විශ්‍රාම පාරිතෝෂිකය පිළිබඳ ආයුගණක තක්සේරුව

| උපකල්පනය | 2023 | 2022 |
|---|---|---|
| **මූල්‍ය වට්ටම් අනුපාතය** | වාර්ෂික 13% | වාර්ෂික 18% |
| **වැටුප් වර්ධක අනුපාතය** | | |
| **අධ්‍යයන** | මූලික වැටුප් සහ දීමනා: වාර්ෂික 12.00% | මූලික වැටුප් සහ දීමනා: වාර්ෂික 16.00% |
| **අනධ්‍යයන** | මූලික වැටුප් සහ දීමනා: වාර්ෂික 10.00% | මූලික වැටුප් සහ දීමනා: වාර්ෂික 14.00% |
| **ජනවිකාසමය මාර්තයතාවය** | A 1967/70 මාර්තයතා වගුව, ලන්ඩනයේ Institute of Actuaries ආයතනය විසින් නිකුත් කරන ලදී. | |
| **විශ්‍රාම වයස** | | |
| **අධ්‍යයන** | අවුරුදු 65 යි | අවුරුදු 65 යි |
| **අනධ්‍යයන** | අවුරුදු 60 යි | අවුරුදු 60 යි |
| **කාර්ය මණ්ඩල පිරිවැටුම් අනුපාතය** | | |
| **අධ්‍යයන** | වයස අවුරුදු 54 දක්වා වාර්ෂිකව 1.00% ඉන්පසු ශුන්‍ය වේ | වයස අවුරුදු 54 දක්වා වාර්ෂිකව 1.00% ඉන්පසු ශුන්‍ය වේ |
| **අනධ්‍යයන** | වයස අවුරුදු 54 දක්වා වාර්ෂිකව 0.50% ඉන්පසු ශුන්‍ය වේ | වයස අවුරුදු 54 දක්වා වාර්ෂිකව 0.50% ඉන්පසු ශුන්‍ය වේ |
| **ආබාධිත** | | |
| **අධ්‍යයන සහ අනධ්‍යයන** | මාර්තයතා වගුවේ 10% | මාර්තයතා වගුවේ 10% |





### සංවේදීතා විශ්ලේෂණය

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන අගය පිළිබඳ සංවේදීතා විශ්ලේෂණය (ශ්‍රී ලංකා රුපියල්)

| | | |
|---|---|---|
| වට්ටම් අනුපාතිකයේ සියයට එකක වැඩිවීමක් (+1%) | = | 1,391,973,627 |
| වට්ටම් අනුපාතිකයේ සියයට එකක අඩුවීමක් (-1%) | = | 1,640,428,625 |
| වැටුප් වර්ධක අනුපාතයේ සියයට එකක වැඩිවීමක් (+1%) | = | 1,640,658,727 |
| වැටුප් වර්ධක අනුපාතයේ සියයට එකක අඩුවීමක් (-1%) | = | 1,389,900,101 |

### ඔ. බැරකම් සහ ප්‍රතිපාදන

#### ජංගම බැරකම්

ජංගම බැරකම් ඒවායේ පොත් වටිනාකමට දක්වනු ලබයි.

#### ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාලයට පවතින වර්තමාන බැඳීමක් නිරවුල් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය කරන විට සහ බැඳීම් ප්‍රමාණය පිළිබඳ විශ්වසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි විට ප්‍රතිපාදන හඳුනා ගනී. ප්‍රතිපාදන උපචිත වියදම් යටතේ දක්වා ඇත. විශ්වවිද්‍යාලය ඇස්තමේන්තුවකට පැමිණෙන්නේ බොහෝදුරට සිදුවීමට ඉඩ ඇති ප්‍රතිඵලය පිළිබඳ ඇගයීමක පදනම මතය. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා ප්‍රතිපාදන සියල්ල ගිණුම්ගත කර ඇත.

### ඕ. අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකමක් යනු වැඩසටහනේ පාලනයෙන් බැහැර අනපේක්ෂිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීම හෝ සිදු නොවීමෙන් මතුවන බැඳීමක් හෝ බැඳීම් නිරවුල් කිරීම සඳහා සම්පත් පිටතට ගලායාමක් අවශ්‍ය විය හැකි බවට නිශ්චිත නොවීම හේතුවෙන් හඳුනා නොගන්නා වර්තමාන බැඳීමක් වේ.

එමෙන්ම විශ්වසනීය ලෙස මැනිය නොහැකි වගකීමක් පවතින අතිශය දුර්ලභ අවස්ථාවන්හිදී ද අසම්භාව්‍ය බැරකමක් පැන නැගිය හැකිය. අවිනිශ්චිත තත්ත්වය බැරකමක් හඳුනා නොගන්නා නමුත් මූල්‍ය ප්‍රකාශනවල එහි පැවැත්ම හෙළිදරව් කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු විශ්වවිද්‍යාල පාලනයෙන් බැහැර අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් සිදුවීමෙන් හෝ සිදු නොවීම මගින් එහි පැවැත්ම තහවුරු වන අතීත සිදුවීම් වලින් පැන නගින වත්කමකි. විශ්වවිද්‍යාලය අසම්භාව්‍ය වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදුවිය හැකි නමුත් සැබැවින්ම නිශ්චිත නොවන අවස්ථාවලදී එහි පැවැත්ම හෙළිදරව් කරයි.

### ක. ආදායම් හඳුනා ගැනීම

#### i. හුවමාරු ගනුදෙනු

පර්යේෂණ ප්‍රදාන, විවිධ ව්‍යාපෘති සහ අනෙකුත් ප්‍රදානවල ආදායම, අධ්‍යයන පැවරුම් ඇතුළු ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ අනෙකුත් සියලුම ආදායම් උපචිත පදනම මත හඳුනාගෙන ඇත.

### ii. හුවමාරු නොවන ගනුදෙනු-ප්‍රාග්ධන

හුවමාරු නොවන ගනුදෙනු-ප්‍රාග්ධනවලින් ලැබෙන ආදායම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11ට අනුව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත. ඒ අනුව, හුවමාරු නොවන ගනුදෙනු-ප්‍රාග්ධන ප්‍රදානවලින් ලැබෙන ආදායම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ආදායම ලෙස හඳුනාගෙන සමුච්චිත අරමුදල් අතිරික්ත ප්‍රාග්ධන ගිණුම වෙත මාරු කරනු ලැබේ. එය සමුච්චිත මුදලක් ලෙස මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සංචිත ගිණුමක් ලෙස දැක්වේ.

### iii. මූල්‍ය ආදායම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත නොමැති වීම හේතුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09ට අනුව ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් පොලී ආදායම උපචිත පදනමක් මත හඳුනා ගැනේ.

### iv. වියදම් හඳුනාගැනීම

විශ්වවිද්‍යාලයේ සියලුම ක්‍රියාකාරකම් සිදු කිරීමේදී දරන වියදම් උපචිත පදනම මත හඳුනා ගෙන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කෙරේ.

### v. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර ඇති අතර එමඟින් මෙහෙයුම් ක්‍රියාකාරකම්, මූල්‍ය ක්‍රියාකාරකම් සහ ආයෝජන ක්‍රියාකාරකම්වල දළ මුදල් ලැබීම් සහ දළ මුදල් ගෙවීම් හඳුනාගෙන ඇත. මුදල් සහ මුදල් සමානදෑ දන්නා මුදල් ප්‍රමාණයට පහසුවෙන් පරිවර්තනය කළ හැකි වටිනාකමේ වෙනස්වීම් පිළිබඳ සැලකිය යුතු අවදානමකට භාජනය නොවන කෙටි කාලීන, ඉහළ ද්‍රවශීල ආයෝජනවලින් සමන්විත වේ.





## 11.5.4. පැහැදිලි කිරීමේ සටහන්

### අ. උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය

උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන කඩිනම් කිරීමේ (AHEAD) මෙහෙයුම, 2018 සිට 2023 දක්වා දිවයිනේම උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට අනුග්‍රහය දැක්වීම ඉල්ක්ක කරගත් ලෝක බැංකු අරමුදල් සම්පාදිත ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියේ විෂය පථයට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති උසස් අධ්‍යාපන ක්‍රියාකාරකම් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ එහි විෂය පථය යටතේ පවතින විශ්වවිද්‍යාල, SLIATE, ATIs සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද උපාධි වැඩසටහන් පිරිනමන රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල උසස් අධ්‍යාපන ක්‍රියාකාරකම් ඇතුළත් වේ.

**උපායමාර්ගික ප්‍රතිඵල ක්ෂේත්‍රඃ**

**AHEAD ව්‍යාපෘතියේ මෙහෙයුම් මගින් උපායමාර්ගික ප්‍රතිඵල ක්ෂේත්‍ර තුනක් කෙරෙහි අවධානය යොමු කරන ලදීඃ**

1. සිසුන් බඳවා ගැනීම් ඉහළ නැංවීමඃ ආර්ථික සංවර්ධනය සඳහාවන විෂය ධාරාවන් සඳහා ප්‍රමුඛත්වය දීම.
2. උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වැඩි දියුණු කිරීමඃ ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම (ELTA), ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම (ELSE), වෘත්තීය සංවර්ධනය සහ තත්ත්ව සහතිකකරණය.
3. පර්යේෂණ, සංවර්ධනය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමඃ පර්යේෂණ, සංවර්ධනය, නවෝත්පාදන සහ වාණිජකරණය (RDIC) සංස්කෘතියක් ඇතිකිරීම සඳහා දිරිමත් කිරීම.

**කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමඃ**

අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුතු විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් තාක්ෂණික ලේකම් කාර්යාලය (OTS), එහි මූල්‍ය, ප්‍රසම්පාදන, පරිපාලනය සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ ඒකාබද්ධ වූ අධ්‍යාපන අමාත්‍යාංශයේ මෙහෙයුම් හා අධීක්ෂණ සහයෝගී කණ්ඩායම, ව්‍යාපෘති මෙහෙයුම් අධීක්ෂණය කරන ජාතික ඉහළම ආයතනය ලෙස ක්‍රියා කරයි.

**කැලණිය විශ්වවිද්‍යාලය ලද ජයග්‍රහණඃ**

ප්‍රතිඵල ක්ෂේත්‍ර තුනම (RA) හරහා බෙදා හරින ලද සමස්ත ප්‍රදාන විස්සක් සාර්ථකව ලබා ගැනීමට කැලණිය විශ්වවිද්‍යාලය සමත් වියඃ

**ප්‍රතිඵල ක්ෂේත්‍ර 01 - රුපියල් මිලියන 142 ක් වූ ප්‍රදාන හයක්**

වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය, කාර්මික කළමනාකරණ අධ්‍යයනාංශය (අදියර I සහ II), රසායන විද්‍යා අධ්‍යයනාංශය, ගණිත අධ්‍යයනාංශය, භෞතික විද්‍යා අධ්‍යයනාංශය, සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය.

**ප්‍රතිඵල ක්ෂේත්‍ර 02 - රුපියල් මිලියන 673ක් වූ ප්‍රදාන අටක්**

පීඨ තුනක් සඳහා පීඨ මට්ටමේ ප්‍රදානඃ වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය, මානව ශාස්ත්‍ර පීඨය සහ විද්‍යා පීඨය.

අධ්‍යයනාංශ හතරක් සඳහා අධ්‍යයනාංශ මට්ටමේ ප්‍රදානඃ ගණකාධිකරණ අධ්‍යයනාංශය, වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයනාංශය, කාර්මික කළමනාකරණ අධ්‍යයනාංශය සහ ශාක සහ අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශය.

2022 වර්ෂයේදී, සමාජ විද්‍යා පීඨය හරහා ක්‍රියාත්මක කරන ලද කලා සඳහා තොරතුරු තාක්ෂණ වැඩසටහන සඳහා අමතර උපකරණ ප්‍රදානයක් කැලණිය විශ්වවිද්‍යාලය වෙත ලැබුණි.

### ප්‍රතිඵල ක්ෂේත්‍ර 03 - රුපියල් මිලියන 160 ක් වූ ප්‍රදාන හයක්

මානව ශාස්ත්‍ර පීඨයේ සංකතන පර්යේෂණ හා ලේඛනාගාර මධ්‍යස්ථානය, විද්‍යා පීඨය සහ සමාජ විද්‍යා පීඨය සඳහා සංවර්ධනාභිමුඛ පර්යේෂණ (FOR) ප්‍රදාන තුනක් පිරිනමන ලදී.

රසායන විද්‍යා අධ්‍යයනාංශය සහ භෞතික විද්‍යා හා ඉලෙක්ට්‍රොනික අධ්‍යයනාංශය වෙත පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රදාන දෙකක් පිරිනමන ලදී.

පර්යේෂණ සහ වාණිජකරණ කටයුතු සඳහා විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර සම්බන්ධතා ගොඩනැගීම සහ වැඩිදියුණු කිරීම සඳහා විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා සහාය සේවා මධ්‍යස්ථානයට සහාය වීම පිණිස තවත් ප්‍රදානයක් පිරිනමන ලදී.

### විශ්වවිද්‍යාල මට්ටමේ ප්‍රතිඵල:

වඩාත් හිතකර ඉගැන්වීම්-ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දායක වෙමින් සහ නව්‍ය පර්යේෂණ සංස්කෘතියක් පෝෂණය කරමින් විශ්වවිද්‍යාලය විසින් සියලු ව්‍යාපෘති සාර්ථකව නිම කරන ලදී.

එම ප්‍රතිපල තුළ:

- නවීන තාක්ෂණය සමඟ හිතකර ඉගැන්වීම්-ඉගෙනුම් පරිසරයක් බිහිවීම
- STEM වැඩසටහන් සඳහා වැඩි ප්‍රමාණයකට අවකාශ සැලසීම පඅණිස අමතර සම්පත් ලබාගැනීම.
- ශාස්ත්‍රපීඨ සිසුන් අතර ඩිජිටල් සාක්ෂරතාවය සහ තොරතුරු තාක්ෂණ කුසලතා වැඩි දියුණු කිරීම.
- ආබාධ සහිත සහ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා ඇතුළත්වීමට අවකාශ සැලසීම
- වාණිජකරණය කළ හැකි නිෂ්පාදන සංවර්ධනය සමඟ නව්‍ය පර්යේෂණ සංස්කෘතියක් නිර්මාණය වීම යන කරුණු ඇතුළත් විය.

### දර්ශන ශූරී උපාධි ශිෂ්‍යත්ව:

කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 24 දෙනෙකුට විදේශයන්හි විවිධ විශ්වවිද්‍යාලවල අධ්‍යාපනය හැදෑරීම සඳහා දර්ශන ශූරී උපාධි ශිෂ්‍යත්ව පිරිනමන ලදී.

### මූල්‍ය සහාය සහ සහයෝගීතාව:

මෙහෙයුම් කළමනාකරණ සහාය කණ්ඩායම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා සම්බන්ධීකරණයෙන් යුතුව, විශ්වවිද්‍යාල උපකරණ ප්‍රසම්පාදනය සහ අතිරේක යටිතල පහසුකම් අවශ්‍යතාවලට අදාළ සිවිල් කටයුතු සඳහා මූල්‍ය ආධාර සැපයීමේ සැලැස්මක් ආරම්භ කරන ලදී. පීඨ සහ අධ්‍යයනාංශ මට්ටමින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමේදී සම්බන්ධීකාරකවරුන්, නියෝජ්‍ය සම්බන්ධීකාරකවරුන්, ක්‍රියාකාරකම් සම්බන්ධීකාරකවරුන්, පර්යේෂණ සහකාරවරුන්, පර්යේෂණ සිසුන් සහ ව්‍යාපෘති සහකාරවරුන් විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරන ලදී.

AHEAD ව්‍යාපෘති මෙහෙයුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ පරිපාලනය තීරණාත්මක සැපයුම් සහය සහ අවශ්‍ය අනෙකුත් සහාය ලබා දී ඇත.

AHEAD ව්‍යාපෘති මෙහෙයුම නවෝත්පාදන, අදාළත්වය සහ පර්යේෂණ විශිෂ්ටත්වය වැඩිදියුණු කරමින් කැලණිය විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපනයේ ප්‍රගතිය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.





### උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධන මෙහෙයුම් කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය

49 වගුව: AHEAD ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්

| ප්‍රධාන අයිතම | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | TOTAL LKR |
|---|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | - | - | - | - | 35,110,106.64 | - | **35,110,106.64** |
| පරිගණක සහ උපාංග | 410,700.00 | 12,472,805.00 | 38,033,879.89 | 49,082,750.00 | 55,503,199.50 | 52,175,972.52 | **207,679,306.91** |
| | විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන | 33-5 | 9,864,443 | 10,406,583 |
| | **කාල සීමාව අවසානයේ ශේෂය** | | **123,827,638** | **170,479,452** |

| | | | |
|---|---|---|---|
| 33.1 | **ජාතික විද්‍යා පදනමෙන් ලැබුණු ප්‍රදාන (ජා.වි.ප)** | | |
| | වසර ආරම්භයේ ශේෂය | 4,664,735 | 5,485,149 |
| | **එකතුකළා** | | |
| | වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | - | 1,242,108 |
| | **අඩුකළා** | | |
| | වර්ෂය තුළ ගෙවීම් | 2,227,751 | 2,062,522 |
| | **වසර අවසානයේ ශේෂය** | **2,436,984** | **4,664,735** |
| 33.2 | **විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රදාන** | | |
| | වසර ආරම්භයේ ශේෂය | 1,263,557 | 1,356,285 |
| | **එකතුකළා** | | |
| | වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 2,010,000 | 745,000 |
| | **අඩුකළා** | | |
| | වර්ෂය තුළ ගෙවීම් | 1,014,142 | 837,728 |
| | **වසර අවසානයේ ශේෂය** | **2,259,416** | **1,263,557** |
| 33.3 | **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලැබුණු ප්‍රදාන (විප්‍රකො)** | | |
| | වසර ආරම්භයේ ශේෂය | 1,633,850 | 1,648,850 |
| | **එකතුකළා** | | |
| | වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 700,000 | - |
| | **අඩුකළා** | | |
| | වර්ෂය තුළ ගෙවීම් | 1,502,800 | 15,000 |
| | **වසර අවසානයේ ශේෂය** | **831,050** | **1,633,850** |
| 33.4 | **වෙනත් ආයතනවලින් ලැබුණු ප්‍රදාන** | | |
| | වසර ආරම්භයේ ශේෂය | 152,510,727 | 117,123,131 |
| | **එකතුකළා** | | |
| | වර්ෂය තුළ ලැබුණු ප්‍රදාන | 58,215,109 | 131,767,209 |
| | **අඩුකළා** | | |
| | වර්ෂය තුළ ගෙවීම් | 98,273,651 | 96,379,614 |
| | ගැලපුම් | 4,016,440 | - |
| | **වසර අවසානයේ ශේෂය** | **108,435,744** | **152,510,727** |
| 33.5 | **University research grants** | | |
| | Balance at the beginning of the year | 10,406,583 | 10,555,500 |
| | **Add** | | |
| | Grants received/ Adjustment during the year | 4,542,720 | 2,524,941 |
| | **Less** | | |
| | Payments during the year | 5,084,860 | 2,673,858 |
| | **Balance at the end of the year** | **9,864,443** | **10,406,583** |



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

| | දෙසැම්බර් 31 වන දිනට | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලං.රු. | ශ්‍රීලං.රු. |
| 34 | **විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන** | | |
| | ජනවාරි 1 වන දිනට PV/DBO සඳහා ප්‍රතිපාදන | 1,373,753,063 | 1,371,839,011 |
| | කාල සීමාව සඳහා පොලී පිරිවැය | 247,275,551 | 157,761,486 |
| | අතීත සේවා පිරිවැය | - | 17,440,079 |
| | කාල සීමාව සඳහා ජංගම සේවා පිරිවැය | 79,751,122 | 83,604,471 |
| | අඩුකළා: වර්ෂය තුළ සිදු කරන ලද ගෙවීම් | (75,033,026) | (98,344,482) |
| | PV-DBO හි තත්‍ය (ලාභ)/අලාභය | (118,430,400) | (158,547,503) |
| | **දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය** | **1,507,316,311** | **1,373,753,063** |

| | දෙසැම්බර් 31 වන දිනට | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලං.රු. | ශ්‍රීලං.රු. |
| 35 | **ආපසු ගෙවිය යුතු තැන්පතු** | | |
| | ටෙන්ඩර් තැන්පතු | 1,013,500 | 1,153,850 |
| | ආරක්ෂක තැන්පතු | 55,678,401 | 56,444,919 |
| | පුස්තකාල තැන්පතු | 50,311,146 | 43,131,446 |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **107,003,047** | **100,730,215** |

| | දෙසැම්බර් 31 වන දිනට | 2023 | 2022 |
|---|---|---|---|
| | | ශ්‍රීලං.රු. | ශ්‍රීලං.රු. |
| 36 | **උපචිත වියදම් සහ අනෙකුත් ගෙවිය යුතු** | | |
| | උපචිත විගණන ගාස්තු | 2,180,640 | 1,687,000 |
| | කොන්ත්‍රාත් සේවා සඳහා උපචිත වියදම් | 62,001,922 | 27,854,000 |
| | ගාස්තු අයකිරීමේ පාඨමාලා සඳහා උපචිත වියදම් | 16,662,066 | 7,882,717 |
| | උපචිත නඩත්තු වියදම් | 508,500 | 36,138,903 |
| | උපචිත අනෙකුත් පුනරාවර්තන වියදම් | 81,699,394 | 16,496,424 |
| | උපචිත සැපයුම් වියදම් | 4,034,397 | 1,180,350 |
| | උපචිත පුද්ගල පඩිනඩි | 75,611,798 | 57,552,600 |
| | උපචිත ගබඩා සැපයුම් | 8,081,845 | 15,004,477 |
| | උපචිත ගමන් වියදම් | 100,000 | 96,044 |
| | SSCL ගෙවිය යුතු | 3,908,097 | - |
| | ගෙවිය යුතු ස්ථාවර වත්කම් | 10,382,617 | 29,350,558 |
| | වෙනත් | 28,872,305 | 22,372,832 |
| | කාර්ය මණ්ඩල ආරක්ෂක තැන්පතු | 59,066 | 65,449 |
| | මුද්දර තැන්පතු | 64,175 | 64,175 |
| | විවිධ ණය හිමියන් | 943,580 | 5,837,961 |
| | විවිධ තැන්පතු | 28,539,858 | 14,938,377 |
| | **එකතුව** | **323,650,262** | **236,521,867** |

52 වගුව: අයවැයගත සහ සත්‍ය ප්‍රමාණ සංසන්දනය කිරීමේ ප්‍රකාශනය

**කැලණිය විශ්වවිද්‍යාලය**
**අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් සංසන්දනය කිරීමේ ප්‍රකාශය- 2023**

| ඛාණ්ඩය / විෂය මාතෘකාව | අයවැයගත - 2023 | සත්‍ය- 2023 | විචලනය | ශ්‍රීලං. රු. විචලනයහි ප්‍රතිශතය ඇ/අ * 100 |
|---|---|---|---|---|
| | අ | ආ | ඇ | |
| **ආදායම්** | | | | |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන | 4,808,000,000 | 4,762,000,000 | (46,000,000) | |
| රජයේ ප්‍රදාන - ප්‍රාග්ධනය | 250,000,000 | 248,528,000 | (1,472,000) | |
| අභ්‍යන්තර ආදායම | 881,632,000 | 1,028,668,561 | 147,036,561 | |
| සංවර්ධන අරමුදලින් මාරු කිරීම | 320,000,000 | 553,552,053 | 233,552,053 | |
| **මුළු ආදායම** | **6,259,632,000** | **6,592,748,614** | **333,116,614** | **5%** |
| | | | | |
| **වියදම්** | | | | |
| **පුද්ගල පඩිනඩි** | | | | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 3,314,350,000 | 3,227,376,851 | 86,973,149 | |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 1,118,650,000 | 1,033,044,842 | 85,605,158 | |
| **එකතුව** | **4,433,000,000** | **4,260,421,693** | **172,578,307** | **4%** |
| | | | | |
| **ගමන් වියදම්** | | | | |
| දේශීය | 800,000 | 721,010 | 78,990 | |
| විදේශ | 9,500,000 | 1,674,878 | 7,825,122 | |
| **එකතුව** | **10,300,000** | **2,395,888** | **7,904,112** | **77%** |
| | | | | |
| **සැපයුම්** | | | | |
| ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 67,500,000 | 64,550,205 | 2,949,795 | |
| ඉන්ධන සහ ලිහිසි තෙල් | 35,500,000 | 37,475,199 | (1,975,199) | |
| නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු | 13,177,368 | 10,204,454 | 2,972,915 | |
| යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ | 1,800,000 | 1,817,816 | (17,816) | |
| රසායන ද්‍රව්‍ය සහ වීදුරු භාණ්ඩ | 18,163,801 | 18,618,462 | (454,661) | |
| වෛද්‍ය සැපයුම් | 4,600,000 | 4,915,614 | (315,614) | |
| වෙනත් සැපයුම් | 54,268,968 | 66,519,652 | (12,250,684) | |
| **එකතුව** | **195,010,138** | **204,101,403** | **(9,091,265)** | **-5%** |
| | | | | |
| **නඩත්තු වියදම්** | | | | |
| වාහන | 35,000,000 | 26,630,505 | 8,369,495 | |
| පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 75,000,000 | 43,545,691 | 31,454,309 | |
| ගොඩනැගිලි සහ ව්‍යුහයන් | 3,500,000 | 1,733,610 | 1,766,390 | |
| ගෘහභාණ්ඩ | 4,500,000 | 403,195 | 4,096,805 | |
| වෙනත් | 1,500,000 | 207,733 | 1,292,268 | |
| **එකතුව** | **119,500,000** | **72,520,733** | **46,979,267** | **39%** |
| | | | | |
| **කොන්ත්‍රාත් සේවා** | | | | |
| ප්‍රවාහන | 100,000 | 127,844 | (27,844) | |
| විදුලි සංදේශ | 55,093,964 | 64,516,558 | (9,422,594) | |
| තැපැල් ගාස්තු | 5,075,000 | 2,760,270 | 2,314,730 | |
| විදුලිය | 238,363,585 | 291,090,420 | (52,726,834) | |
| ආරක්ෂක සේවා | 45,859,561 | 103,987,887 | (58,128,326) | |
| ජලය | 20,156,160 | 54,093,217 | (33,937,057) | |
| පිරිසිදු කිරීමේ සේවා | 61,150,000 | 112,143,343 | (50,993,343) | |
| කුලී ගාස්තු | 80,929,062 | 27,203,547 | 53,725,514 | |
| පළාත්පාලන ආයතන සඳහා ගාස්තු සහ බදු | 91,505,747 | 22,995,851 | 68,509,895 | |
| මුද්‍රණය, ප්‍රචාරණය ආදිය. | 98,610,459 | 55,502,498 | 43,107,961 | |
| වෙනත් | 24,000,000 | 20,571,277 | 3,428,723 | |
| **එකතුව** | **720,843,538** | **754,992,714** | **(34,149,176)** | **-5%** |





Table 52: (Continued)

**කැලණිය විශ්වවිද්‍යාලය**
**අයවැය සහ සත්‍ය ප්‍රමාණයන් සංසන්දනය කිරීමේ ප්‍රකාශය- 2023**

| ඛාණ්ඩය / විෂය මාතෘකාව | අයවැයගත - 2023 | සත්‍ය- 2023 | විචලනය | ශ්‍රීලං. රු. විචලනයහි ප්‍රතිශතය ඇ/අ * 100 |
|---|---|---|---|---|
| | අ | ආ | ඇ | |
| **වෙනත් පුනරාවර්තන වියදම්** | | | | |
| විශේෂ සේවා - සභාව සහ කමිටු | 10,000,000 | 7,487,001 | 2,512,999 | |
| -එම- වෘත්තීය සහ වෙනත් ගාස්තු | 700,000 | 119,500 | 580,500 | |
| වැඩමුළු, සම්මන්ත්‍රණ | 17,091,361 | 193,925 | 16,897,435 | |
| ශාස්ත්‍රීය පර්යේෂණ සහ ප්‍රකාශන | 4,500,000 | 4,666,744 | (166,744) | |
| කාර්ය මණ්ඩල සංවර්ධනය (ගුරුවරුන්, පරිපාලකයින් සහ අනෙකුත් සේවකයින් සඳහා පුහුණුව) | 4,000,000 | 3,079,017 | 920,983 | |
| නිවාඩු අවසරපත්‍ර සහ වාර ප්‍රවේශපත් | 7,500,000 | 5,839,458 | 1,660,542 | |
| උපාධි ප්‍රදානෝත්සව වියදම් | 77,650,000 | 16,055,164 | 61,594,836 | |
| සංග්‍රහ වියදම් | 8,500,000 | 5,220,006 | 3,279,994 | |
| දායකත්ව සහ සාමාජික ගාස්තු | 4,500,000 | 6,393,231 | (1,893,231) | |
| විභාග වියදම් | 220,000,000 | 141,744,536 | 78,255,464 | |
| වෙනත් | 111,080,241 | 24,602,471 | 86,477,770 | |
| **එකතුව** | **465,521,602** | **215,401,054** | **250,120,548** | **54%** |
| **මුළු පුනරාවර්තන වියදම්** | **5,944,175,278** | **5,509,833,485** | **434,341,793** | |
| | | | | |
| **ප්‍රාග්ධන වියදම්** | | | | |
| පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම් | 97,192,000 | 75,331,318 | 21,860,682 | |
| වත්කම් අත්පත් කර ගැනීම් | 39,893,000 | 146,121,011 | (106,228,011) | |
| ඉදිකිරීම් ව්‍යාපෘති | 112,831,000 | 171,344,383 | (58,513,383) | |
| මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය | 84,000 | 3,709,757 | (3,625,757) | |
| පර්යේෂණ දිරිමත් කිරීම | - | - | - | |
| **මුළු ප්‍රාග්ධන වියදම්** | **250,000,000** | **396,506,469** | **(146,506,469)** | **-59%** |
| | | | | |
| **මුළු වියදම්** | **6,194,175,278** | **5,906,339,954** | **287,835,323** | |

# 12. විගණකාධිපති වාර්තාව

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } HED/G/UOK/1/23/19 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2024 අගෝස්තු 21 දින |

23 AUG 2024

DIA, R, B
FMA pls
23/8/2024

උපකුලපති,
කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

සහතික කරන ලද ගිණුම් සහ යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එච්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-

01. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
02. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
03. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව





**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. } HED/G/UOK/1/23/19 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2024 අගෝස්තු 21 දින |

උපකුලපති
කැලණිය විශ්වවිද්‍යාලය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කැලණිය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමුඛ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

## 1.3 විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙමෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.





## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**2.2** අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.





| | නීතිරීති/ විධානය යොමුව | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මුදල් රෙගුලාසි 371 | අවස්ථා 48 කදී ලබාදී තිබුණු එකතු වටිනාකම රු.7,551,320 ක අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | වසර 2 කට වැඩි කාලයක සිට පවතින ටෙන්ඩර් තැන්පතු හා ආරක්ෂක තැන්පතු රු.14,096,353 ක් ද වසර 5 කට වැඩි කාලයක සිට පවතින පුස්තකාල තැන්පතු රු.9,536,491ක් ද නියාදනය කර නොතිබුණි. |
| (ආ) | 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04(ii) වගන්තිය | අන්තර් පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකළ ආචාර්යවරුන් 31 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළ පර්යේෂණ දීමනා වශයෙන් රු.11,382,909 ක් ගෙවා තිබුණි. |

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

### 2.3 වෙනත් කරුණු

(අ) වාණිජ හා කළමනාකරණ පීඨයට මහල් 10 කින් යුතු පීඨ ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කර්මාන්තය සඳහා උපදේශන සේවා සපයන ආයතනය වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවලදී එකතුව රු.15,013,437 ක් උපදේශන සේවා ගාස්තු ලෙස ගෙවා තිබුණ ද, ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු 2023 දෙසැම්බර් 31 දක්වාම ආරම්භ කර නොතිබුණි.

(ආ) 2020 අගෝස්තු 10 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු මහල් 4 කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු විශ්වවිද්‍යාලය හා කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැර හේතු මත අවසන් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (යටිතල පහසුකම් සංවර්ධන) ගේ 2021 ජුනි 21 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී තිබුණි. ඒ අනුව දෙපාර්ශවයේ එකඟතාවයෙන් කොන්ත්‍රාත්තුව අතරමග අවසන් කිරීමට කටයුතු කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.4,029,430ක් අමතරව ගෙවීමට සිදුව තිබුණි. එමෙන්ම,

2023 වර්ෂය අවසන් වන විටත් සිසුන් සඳහා අවශ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ලක් ඉදිකිරීමට කටයුතු කර නොතිබුණු අතර වැයකර තිබුණු රු.65,457,463ක් නිෂ්ඵල වියදමක් වී තිබුණි.

(ඈ) ප්‍රධාන ආරක්ෂක නිලධාරී විසින් 2021 නොවැම්බර් 30 දින මුරකුටි 9ක අවශ්‍යතාවයක් ඉදිරිපත් කර වසරකටත් අඩු කාලයක් තුළ තවත් මුරකුටි 8ක අවශ්‍යතාවයක් ඉදිරිපත් කර තිබුණි. පළමු ප්‍රසම්පාදනයේදී මුරකුටියක පිරිවැය රු.276,000ක් වුවත් දෙවන ප්‍රසම්පාදනයේදී එය රු.521,000 ක් දක්වා වැඩි වී තිබීමෙන් දෙවන වර ඉදිකරන ලද මුරකුටි 7 ක් සඳහා රු.1,715,000 ක් වැඩිපුර වැය කිරීමට සිදුවී තිබුණි. එමෙන්ම මුරකුටිවල ගැල්වනයිස් තහඩු වල ඝනත්වය අපේක්ෂිත පිරිවිතර වලට වෙනස්ව පැවතුණි.

(ඇ) අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගැනීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මිලදීගෙන තිබුණු ලිපි ද්‍රව්‍ය හා නඩත්තු ද්‍රව්‍ය භාණ්ඩවලින් 2023 දෙසැම්බර් 31 දිනට චලනය නොවන භාණ්ඩ තොගවල වටිනාකම රු.5,736,393 ක්ද සෙමින් චලනය වන භාණ්ඩ තොගවල වටිනාකම රු.1,334,240 ක්ද හානිවූ තොග වටිනාකම රු.401,834 ක්ද විය.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල් ආයෝජනයෙන් ලැබී තිබූ එකතුව රු.18,995,650 ක් වූ පොළී ආදායම අදාළ අරමුණු වෙනුවෙන් වැය නොකර ඌන උපයෝජිතව පැවතුණි.

(ඊ) 2023 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන පීඨ 6 සඳහා අනුමත ස්ථිර අධ්‍යයන කාර්යමණ්ඩලය 829 ක් වුවද සත්‍ය කාර්යමණ්ඩලය 690 ක් වූ අතර ඉන් 125 දෙනකු සජක වාර්ෂික නිවාඩු හා අධ්‍යයන නිවාඩු ලබාගෙන තිබුණි. එමනිසා විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථයින් 15310 කට සක්‍රිය ලෙස අධ්‍යයන කටයුතු සිදු කිරීමට හා විෂය නිර්දේශ ආවරණය කිරීමට බාහිර දේශකයින්ගේ සහය ලබා ගෙන සමාලෝචිත වර්ෂය සඳහා පමණක් රු.36,105,195 ක් බාහිර දේශක ගාස්තු ලෙස ගෙවා තිබූ අතර එය 2022 වර්ෂයට සාපේක්ෂව සියයට 28 ක වැඩිවීමක් විය.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

# 13. විගණකාධිපති වාර්තාව ආශ්‍රිතව විශ්වවිද්‍යාලයේ පාලක සභාවේ නිරීක්ෂණ

කැලණිය විශ්වවිද්‍යාලය
களனிப் பல்கலைக்கழகம்
UNIVERSITY OF KELANIYA

මගේ අංකය / எனது இல / My No.
ඔබේ අංකය / உமது இல / Your No.

මගේ අංකය :- UK/IA/04/HED/G/UOK/1/23/19
ඔබේ අංකය :- HED/G/UOK/1/23/19

2024 සැප්තැම්බර් 30 දින

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල

කැලණිය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

ඔබගේ ඉහත සමාංකය සහ 2024 අගෝස්තු 21 දින දරන 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවට අදාළ පැහැදිලි කිරීම් පහත ඉදිරිපත් කෙරේ.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධාන වලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

i. මුදල් රෙගුලාසි 371

2023.12.31 දිනට අවස්ථා 48ක දී ලබා දී තිබුණු එකතු වටිනාකම රු.7,551,320 ක අත්තිකාරම් ශේෂය අතුරින් අවස්ථා 34ක දී ලබා දී තිබූ රු. 4,116,600.00 ක ශේෂයක් පියවීමට කටයුතු කර ඇත. තව දුරටත් නොපියවූ අත්තිකාරම් ශේෂය රු.3,434,720.00 ක් වන අතර විස්තර පහත සපිදි වේ.

University of Kelaniya, Kandy Road, Dalugama, Kelaniya 11600, Sri Lanka.
Web: www.kln.ac.lk | Email: info@kln.ac.lk
Tel: +94 112 903903

1

| අංකය | අත්තිකාරම් ලබාදුන් දිනය | විස්තර/අත්තිකාරම් ලබා ගත් අය | මුදල (රු.) | විස්තරය |
|---|---|---|---|---|
| 1. | 2023.01.16 | තුසිත විශුමසිංහ<br>වෛද්‍ය පීඨ නිම්හෙර 2023 ප්‍රසංගය සඳහා | 100,000 | පියවා නොමැත |
| 2. | 2023.03.16 | සචින්ත පිරිගල<br>මතක 2023 ප්‍රසංගය | 100,000 | පියවා නොමැත |
| 3. | 2023.04.10 | එස්.එම්.යූ.පී. සුහසිංහ එතනෝල්<br>ප්‍රවාහනය සඳහා | 20,000 | පියවා නොමැත |
| 4. | 2023.12.07 | පී.කේ.සී. සෙහරත් | 10,000 | පියවා නොමැත |
| 5. | 2023.11.24 | පී.ඒ.එස්.පී ගොඩමුණේ | 390,000 | පියවා නොමැත |
| 6. | 2023.12.11 | එස්.එම්.එස්. ප්‍රියදර්ශනී<br>එල්.ඒ. ද සිල්වා | 100,000<br>100,000 | පියවා නොමැත |
| 7. | 2023.12.12 | විජයානන්ද රූපසිංහ<br>එල්.ඩී. ලියනගේ<br>ආර්.එස්.පී. රාජපක්ෂ | 100,000<br>100,000<br>100,000 | පියවා නොමැත |
| 8. | 2023.12.13 | ජේ.එන්. දසනායක | 15,000 | පියවා නොමැත |
| 9. | 2023.12.15 | වී.එල්.ඩී.ඒ.එම්. විජේසිංහ | 1,100,000 | පියවා නොමැත |
| 10. | 2023.12.15 | චානක උදයන්ත | 100,000 | පියවා නොමැත |
| 11. | 2023.03.16 | ජනනි මධුරිකා<br>තේරීම් කමිටු සඳහා | 48,000 | අවලංගු කර ඇත.<br>ඉදිරියේදී අවලංගු කළ අත්තිකාරම් සඳහා අදාල නිලධාරියාගේ අත්සන ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ |
| 12. | 2023.09.06 | ඩබ්.පී.ඩී.එස් වැතිගල්දෙනියල<br>14 වන විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල සඳහා | 100,000 | අවලංගු කර ඇත.<br>ඉදිරියේදී අවලංගු කළ අත්තිකාරම් සඳහා අදාල නිලධාරියාගේ අත්සන ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ |
| 13. | 2023.08.07 | ඩබ්.ඒ. සරත් කුමාර | 950,000 | රු.950,000 ක මුදලක් W.A.සරත් කුමාර මහතා වෙත අත්තිකාරම් ලෙස ලබා දී නොමැත |
| 14. | 2023.07.18 | එම්.පී.කේ.ඩී බුද්ධි කුමාර | 1,720 | 2023.07.18 දිනට මෙ නමින් අත්තිකාරම් මුදලක් නොමැත |
| | | එකතුව | 3,434,720.00 | |





ii. මුදල් රෙගුලාසි 571

<u>ටෙන්ඩර් තැන්පතු හා ආරක්ෂක තැන්පතු</u>

වසර 02කට වඩා පවතින ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පතු වලින් බොහෝ ප්‍රමාණයක් සම්බන්ධයෙන් අදාළ අංශවල (සාමාන්‍ය පාලන හා ව්‍යාපෘති කාර්යාල) අනුමැතිය යටතේ 2024 වර්ෂයේ අප්‍රේල් 30 වන විට මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර ඇත. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොමැති ටෙන්ඩර් හා ආරක්ෂක තැන්පතු සඳහා අදාළ අංශවල අධීක්ෂණයට යොමු කර ඇත.

<u>ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු</u>

ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු නැවත ගෙවනු ලබන්නේ අදාළ ශිෂ්‍යයා විසින් පාඨමාලාව අවසන් කර එම තැන්පතුව නැවත ගෙවන ලෙස ඉල්ලීම් කිරීමෙන් පසුව ය. කෙසේ වුවත් පැවති Covid 19 වසංගත තත්ත්වය හමුවේ පශ්චාද් උපාධි සිසුන්ගේ පාඨමාලා ලියාපදිංචි කාලය දීර්ඝ කරන ලද බැවින් 2017, 2018 වර්ෂ වලදී ලියාපදිංචි වූ සිසුන් තවමත් එම තැන්පතු නැවත ගෙවීම් ඉල්ලීම් කරමින් පවතී. එබැවින් වර්ෂ 05 ඉක්මවූ ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතුවල වටිනාකම විශ්විද්‍යාලයීය ආදායමට ගැනීම 2024 වර්ෂය තුළ දී සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04 (ii) වගන්තිය

විගනකාධිපති වාර්තාවේ 2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන චක්‍රලේඛය පර්යේෂණ දීමනාවලට අදාළ චක්‍රලේඛය වන අතර විමසීම් කර ඇත්තේ අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළ දත්ත පදනම් කරගෙනය. එබැවින් මෙම පැහැදිලි කිරීම අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘතිවලට අදාළව ඉදිරිපත් කර ඇත.

2023 වර්ෂය තුළ ලැබුණු පර්යේෂණ යෝජනා අයදුම්පත් 31 ක්වන අතර එයින් 14 ක් 2023 වර්ෂය තුළදීම ප්‍රදානය වූ අතර එම ප්‍රතිපාදනවල එකතුව රු.4,250,000.00 වේ. ඉතිරි 17 න් ව්‍යාපෘති 12 ක් 2024 වර්ෂයේ දී ප්‍රදානය වූ අතර ඉන් එක් ව්‍යාපෘතියක් අවලංගු කරගෙන ඇත. ඉතිරි ව්‍යාපෘති 5 සඳහා විමර්ෂණ ක්‍රියාවලියට කල්ගත වූ බැවින් පාලක-සභා අනුමැතිය දැනට ලැබී නොමැත. ඒ අනුව 2024 දී ප්‍රදානය කරන ලද ප්‍රතිපාදනවල එකතුව රු4,282,500.00 වේ. ඒ අනුව සක්‍රිය ව්‍යාපෘති ගණන 30කි.

අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති යෝජනාවල පර්යේෂණ කාලය එකිනෙකට වෙනස් වන අතර ඒවා වසරකට සීමා නොවේ. වසරකින් නිමා නොවන පර්යේෂණ සඳහා අරමුදල්, ව්‍යාපෘති කාලය අවසන් වන තුරු උපයෝජනය කළ හැක. ඇතැම් ප්‍රායෝගික හේතූන් මත පර්යේෂණ කාලය දීර්ඝ කර ගැනීමක්ද සිදුවන අතර එවිට අරමුදල් උපයෝජනයට ගතවන කාලය වැඩි විය හැක.

3

පර්යේෂණ ප්‍රතිපාදන ලිපිය නිකුත්කර ගිවිසුම් අත්සන් කිරීමෙන් පසුව මුදල් නිදහස් කරනු ලබන්නේ ප්‍රතිපාදන මුදලින් 25 % කට නොවැඩි මුදල් අත්තිකාරම් ලෙසය. එක් අත්තිකාරමක් පියවීමෙන් පසුව පමණක් ඊළඟ මුදල් අත්තිකාරම නිකුත් කරනු ලබන අතර එක් එක් අත්තිකාරම් මුදල් උපයෝජනයට ගතවන කාලය පර්යේෂකවරුන්ගේ පර්යේෂණ කටයුතු අනුව වෙනස් වේ. විශේෂිත අවස්ථාවලදී පර්යේෂකවරුන්ගේ ඉල්ලීම මත 25%ට වැඩි ප්‍රමාණයක මුදල් මුදා හැරීම පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේ නිර්දේශ මත සිදු කෙරේ.

මෙලෙස ප්‍රදානය කරන ලද පර්යේෂණ ප්‍රතිපාදනවලින් 2023 දී උපයෝජනය රු. 138,826.25ක් වන අතර අත්තිකාරම් මුදල් ඉල්ලා ඇත්තේ පර්යේෂණ දෙකක් සඳහා පමණි. 2024 වර්ෂය තුළදී උපයෝජනය වූ මුදල රු.114,500.00ක් වන අතර මුදල් අත්තිකාරම් ඉල්ලා ඇත්තේ පර්යේෂණ ව්‍යාපෘති තුනක් සඳහා වේ. ඒ අනුව 2023/12/31 වන විට 2023 ව්‍යාපෘති යෝජනාවල සමස්ත උපයෝජනය රු.253,326.25ක් වේ.

ඉහත සඳහන් වූ පරිදි 2023 වසර තුළදී 2023 දී අනුමත වී නිකුත් කළ අත්තිකාරම් හා ඊට පෙර වර්ෂවල අනුමත වූ ප්‍රතිපාදන ව්‍යාපෘති වල අරමුදල් ද උපයෝජනය වී ඇත. ඒ අනුව 2023 වර්ෂය තුළ සමස්ත උපයෝජනය රු. 4,193,452.76 කි.

ඉහත ක්‍රියාවලියට අමතරව විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රතිපාදන ලබාදීමේ සහ අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය වර්ධනය කර ගැනීමට පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

- සියලුම පර්යේෂණ ප්‍රතිපාදන වල ප්‍රගතිය පර්යේෂණ හා ප්‍රකාශන කමිටුවේදී මාසිකව සමාලෝචනය කිරීම.
- පර්යේෂණ ව්‍යාපෘති ඇගයීම් සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා අභ්‍යන්තර විමර්ශකවරු වෙත යොමු කිරීමේ ප්‍රතිපාදන සීමාව ඉහළ නැංවීම.
(පෙර රු 150,000.00 ට වැඩි ඇස්තමේන්තුගත ව්‍යාපෘති බාහිර විමර්ශකවරුනට යොමු කර ද වර්තමානයේ රු.300,000.00 දක්වා අභ්‍යන්තර විමර්ශකවරු වෙත යොමු කරයි)
- අභ්‍යන්තර පර්යේෂකයන් උනන්දු කිරීම සඳහා ප්‍රතිපාදන මුදල රු.500,000.00 දක්වා ඉහල නැංවීම. මෙය පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රගතිය සලකා බලමින් අත්තිකාරම් කොටස් වශයෙන් නිදහස් කරනු ලැබේ.
- පර්යේෂණ ව්‍යාපෘති අවසාන වූ පසු පර්යේෂණ වාර්තාව, සම්මන්ත්‍රණ සහ ශාස්ත්‍රීය සඟරාවල පළ කිරීම කොන්දේසියක් බවට පත් කිරීම.
- අවසන් වාර්තාව වෙනුවට කීර්තිමත් පර්යේෂණ සඟරාවල සම්පූර්ණ පර්යේෂණ වාර්තාව පළ කර එය ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබා දීම.

4





- පර්යේෂණ ප්‍රතිපාදනවලට උපරිම සහ අවම කාලසීමාවක්ද, කාලය දීර්ඝ කිරීම සඳහා උපරිම කාලසීමාවක් ද ලබාදීම. (කාලය දීර්ඝ කරගැනීමත් සමග පර්යේෂණ ප්‍රතිපාදන සඳහා ලබාදෙන උපරිම කාලසීමාව වසර 05 කි)

2.3 වෙනත් කරුණු

(අ) ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හා 04/2022 අනුව රජයේ ඉදිකිරීම් කටයුතු නවතා දමන ලෙස උපදෙස් ලබාදී ඇති බැවින් අදාළ කොන්ත්‍රාත්තුවේ ඉදිකිරීම් කටයුතු නවතා ඇති අතර මේවන තෙක් ප්‍රාග්ධන ඉදිකිරීම් සඳහා අනුමැතිය ලබා නොදීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැත.

(ආ) 2020 අගෝස්තු 10 දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ මහල් 4 කින් යුතු හෙට්ටියාවත්ත පඤ්ඤාරාම නේවාසිකාගාරය විද්‍යාලංකාර පිරිවෙනේ අකමැත්ත මත නතර කිරීමට සිදුවුණි. ඉදිකිරීම් කටයුතු නතර කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුට රු.4,029,430 ක අමතර ගාස්තුවක් ගෙවීමට සිදුවුණි.

උක්ත කරුණ පිළිබඳව 2023 දී අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකාවට (Memo No 23/0296/607/26 කැබිනට් තීරණ 2023/03/08 අදාළව) කැබිනට් අමාත්‍යවරුන් විසින් මුදල් අමාත්‍යාංශ ලේකම්ට දන්වා තිබුයේ විශ්වවිද්‍යාලය සමග සාකච්ඡා කර අනුමත කර ගන්නා ලද සවිස්තරාත්මක වාර්තාවක් ලබා දෙන ලෙසය.

2023/03/08 දිනැති කැබිනට් තීරණය අනුව විශ්වවිද්‍යාලය විසින් පත්කළ කමිටුවක් විසින් ව්‍යාපෘතියේ අරමුණ, මුදල් පසුබිම, සමාජීය බලපෑම, ඵලදායිතාව හා විශ්වවිද්‍යාලය මගින් මුදල් ආයෝජනය යන කරුණු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් සකස් කර 2024/04/19 දින ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සම්පූර්ණ වාර්තාව විශ්ලේෂණය කර වැඩ බිම නිරීක්ෂණ වාර්තාවකින් පසු, රුපියල් මිලියන 245 ක මුදලකට කැලණිය විශ්වවිද්‍යාලයේ විදේශීය භික්ෂූන් සඳහා තනි තට්ටුවේ ගොඩනැගිල්ලක් විශ්වවිද්‍යාලය මගින් උපයාගත් අරමුදල් වලින් ඉදිකිරීමට 2024/07/30 (Letter No/HRD/HE/PP/UOK/24) දින නිර්දේශ කරන ලදි.

පහත පරිදි කැබිනට් යෝජනාව කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අමාත්‍යාංශ ලේකම්ට 16/08/2024 දින යවන ලදි.

ඒ අනුව

(i) සවිස්තරාත්මක වාර්තාවේ කරුණු සැලකිල්ලට ගෙන විදේශීය ස්වාමීන් වහන්සේලාට ලැගුම් ගැනීමට අවශ්‍ය මෙම නේවාසිකාගාරය විශ්වවිද්‍යාලය විසින් උපයාගත් අරමුදල් වලින් රුපියල් මිලියන 245 ක මුදලකට වර්ග මීටර් 560 කින් යුත් තනි මහල් ගොඩනැගිල්ලක් ලෙස ඉදිකිරීමට.

5

(ii) එය මැනීම් කර ගෙවීමේ පදනම (Measure & Pay) යටතේ මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම (Central Engineering Service (Pvt) Ltd) මගින් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති ස්ථාවර තාක්ෂණික කමිටුව මගින් අනුමත කරන ලද මිල ගණන් අනුව ගෙවීම් කිරීමට

(ආ) 2021 නොවැම්බර් මස 30 දින මුරකුටි ඉල්ලුම් කරන අවස්ථාවේදී අවශ්‍ය වූයේ මුරකුටි 20 ක පමණි වුවත් එවකට පැවැති මූල්‍ය දුෂ්කරතා නිසා ඉතාම හදිසි ස්ථාන 09 ක් සඳහා මුරකුටි ඉල්ලුම් කල අතර, ඉන් පසුව පවතින මූල්‍ය ප්‍රතිපාදන සලකා දෙවනවර නවත් මුරකුටි 08 ක් ඉල්ලුම් කර උපායමාර්ගිකව ආරක්ෂාව සපයන සැලැස්මට අනුව ස්ථාන ගත කරන ලදී.

විශ්වවිද්‍යාලය තුළට පැමිණෙන සොර සතුරන්ගේ ක්‍රියාකාරකම් සහ සොරකම් වාර්තා වීම ඇතුළු සිසු ක්‍රියාකාරකම් හා ඔවුන්ගේ ආරක්ෂාවද සලකා වරින්වර ආරක්ෂක මුරකුටි ස්ථානගත කරන ප්‍රදේශයන් මෙන්ම ආරක්ෂක මුර ස්ථාන ද වෙනස් කිරීම සිදු කරයි.

මිල ගණන් කැඳවීම සැපයුම් අංශය විසින් සිදු කරනු ලබන අතර, ලැබී ඇති මිල ගණන් අනුව තාක්ෂණික ඇගයීම් කමිටුමේ නිර්දේශ අනුව සැපයුම්කරු තෝරීපත්ව ඇත. දෙවනවර මිල ගණන් කැඳවන විට එවකට වෙළඳපොළ පැවති භාණ්ඩ මිල අනුව මිල ගණන් වෙනස් වීම සිදුව ඇති අතර, මුරකුටි වල ගැල්වනයිස් තහඩු වල ඝනත්වය පරීක්ෂා කිරීම වැඩ ඉංජිනේරු විසින් සිදුකර ඔහුගේ නිර්දේශයන් මත සැපයුම්කරුට ගෙවීම් කර ඇත.

(ඇ) කැලණිය පරිශ්‍රයේ පිහිටි ගබඩාවන්හි ඇති චලනය නොවන තොග, සෙමින් චලනය වන තොග, හානි වී ඇති තොග පිළිබඳව පරීක්ෂා කර බැලීමට පත්කළ කමිටුවේ නිර්දේශය ලද පසු ගබඩාවලින් ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

(ඉ) මේ වන විට ශිෂ්‍යත්ව හා ත්‍යාග මගින් විද්‍යාර්ථීන්ට ලැබෙන ප්‍රතිලාභ වැඩි කිරීම අරභයා පවතින නිර්ණායක වෙනස් කර එක් විද්‍යාර්ථයකු සඳහා පිරිනමන ත්‍යාග මුදල වැඩි කිරීම හා ශිෂ්‍යත්ව ප්‍රදානය කරන විද්‍යාර්ථීන් ප්‍රමාණය වැඩි කිරීම යන ක්‍රියාමාර්ග ගෙන ඇත.

මෙහිදී පවත්නා නිර්ණායකය සංශෝධනය කර පීඨ මගින් සනාතන සභා හා පාලක සභා අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කරනු ලබයි. එම සංශෝධිත නිර්නායක ක්‍රියාත්මක වන්නේ එතැන් සිට ඉදිරියට බලපාන අධ්‍යයන වර්ෂයට වේ.

ශිෂ්‍යත්ව හා ත්‍යාග අරමුදල් පවත්වා ගෙන යනු ලබන්නනේ අදාල අධ්‍යයන අංශ මගින් වේ. අධ්‍යයන අංශ මගින් ඒ ඒ නිර්ණායක මත තෝරා ගන්නා ශිෂ්‍යත්ව ලාභීන්ගේ නාම ලේඛනය හෝ නම පීඨ මණ්ඩලයට යොමු කරණු ලැබේ. එහි නිර්දේශය ලැබීමෙන් පසු සනාතන සභා හා පාලක සභා අනුමැතිය ලබා ගත යුතුව ඇත. එම ලැබෙන අනුමැතිය මත ශිෂ්‍යත්ව පිරිනැමීමේ කාර්යය සඳහා අවශ්‍ය චවුචර් පිළියෙළ කිරීම ශාස්ත්‍රීය අංශය මගින් කරනු ලැබේ. තවද අදාළ අධ්‍යයන වර්ෂයට අදාළව ඒ ඒ ශිෂ්‍යත්වවල නිර්නායක සපුරන විද්‍යාර්ථීන් සිටිය යුතුය.

ඒ අනුව 2023 ජනවාරි මස සිට 2024 අගෝස්තු දක්වා විද්‍යාර්ථීන් සඳහා ප්‍රදානය කර ඇති ශිෂ්‍යත්ව හා ත්‍යාග වල සමස්ථ උපයෝජනය ඇමුණුම 01 පරිදි වේ.

(ඊ) මේ වන විට අධ්‍යයන පීඨ 06 හි නත්‍ය කාර්යමණ්ඩලය 685 කි. අධ්‍යාපන අමාත්‍යාංශය මගින් "රාජ්‍ය වියදම් සමාලෝචනය" මැයෙන් නිකුත් කර ඇති 2022.02.22 දිනැති ලිපියට අනුව බඳවා ගැනීම් සීමා කර ඇත. ඒ අනුව 2022 සහ 2023 වර්ෂ වල සේවයෙන් විශ්‍රාම ගැනීම්, සහ සේවයෙන් ඉල්ලා අස්වීම් වලට සමාන වන ලෙස අධ්‍යයන කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.

අධ්‍යයන නිවාඩු සහ සප්ත වාර්ෂික නිවාඩු අයදුම් කිරීමේදී එම ඉල්ලීම් නිවාඩු හා ප්‍රදාන කමිටුවට ඉදිරිපත් කරන අතර එහිදී අධ්‍යයන අංශයේ කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙනයාමේ නිර්ණායකයන්ට අනුව අංශාධිපතිගේ සහ පීඨාධිපතිගේ නිර්දේශය මත නිවාඩු අනුමත කිරීම සිදු කරනු ලැබේ. අධ්‍යයන අංශ තම අවශ්‍යතාවය අනුව ඇතැම් විෂය ක්ෂේත්‍ර ආවරණය සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගනී.

ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා
උපකුලපති

| | | | | |
|---|---|---|---|---|
| පිටපත් :- | 01 | ලේකම් | :- | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | 02 | ලේකම් | :- | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය |
| | 03 | සභාපති | :- | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව |

ඇමුණුම 01

Payment Details for scholarship awarded in 2023.

| No. | Name of the Scholarship | Date of Scholarship awarded | Scholarship-Medal/Cash | Amount Rs. |
|---|---|---|---|---|
| 01 | Prof.F.R.Jayasooriya Prize Fund | 18.09.2023 | Plated gold Medal<br>Cash | 9,000.00<br>2,000.00 |
| 02 | Egnas Peduru Scholarship | 20.11.2023 | Cash | 20,000.00 |
| 03 | Prof.S.B.P.Wickramasooriya Prize Fund | 04.10.2023 | Cash | 5,000.00 |
| 04 | Linus Silva | 04.102023 | Plated gold Medal | 4,500.00 |
| 05 | S.Jayawardena Scholarship Fund | 23.06.2023 | Plated gold Medal | 9,000.00 |
| 06 | Prof.H.H.Costa Memorial Scholarship | 18.05.2023 | Cash | 72,000.00 |
| 07 | Prof.Sheltan Gunarathne Memorial Scholarship | 21.09.2023 | Cash | 180,000.00 |
| 08 | J.K.P.Ariyarathne Scholarship | 21.08.2023 | Plated gold Medal | 4,500.00 |
| 09 | Prof.K.M.P. Kulasekara | 17.02.2023 | Cash | 9,468.00 |
| 10 | Dilakshi Sandaken Memorial Scholarship | 10.07.2023 | Cash | 60,000.00 |
| | | | | 375,468.00 |

Payment Details for scholarship awarded from January to May 2024.

| No. | Name of the Scholarship | Date of Scholarship awarded | Scholarship-Medal/Cash | Amount Rs. |
|---|---|---|---|---|
| 01 | Prof.D.J. Wijerathna Foundation Prize Fund | 26.01.2024 | Plated gold Medal | 4,500.00 |
| 02 | Medha Sri Ariyawansa Prize Fund | 01.04.2024 | Cash | 5,000.00 |
| 03 | Prof.F.R.Jayasooriya Prize Fund | 26.04.2024 | Plated gold Medal<br>Cash | 4,500.00<br>1,000.00 |
| 04 | Dr. P.D. Kannangara Prize Fund | 09.01.2024 | Cash | 20,000.00 |
| 05 | Mary's Friends Scholarship Prize Fund | 09.01.2024 | Cash | 50,000.00 |
| 06 | Prof.S.B.P.Wickramasooriya Prize Fund | 24.04.2024 | Cash | 5,000.00 |
| 07 | S.Jayawardana Scholarship Fund | 15.03.2024 | Plated gold Medal-two | 7,000.00 |
| 08 | Prof.Sheltan Gunarathne Memorial Scholarship | 01.04.2024 | Cash | 180,000.00 |
| 09 | Plant & Molecular Biology Fund | 01.04.2024 | Cash | 20,000.00 |
| 10 | Prof.J.K.P.Ariyarathne Prize Fund | 15.03.2024 | Plated gold Medal | 3,500.00 |
| 11 | Prof.Piyadasa Ranasinghe Scholarship Fund | 24.04.2024 | Plated gold Medal | 2,600.00 |
| 12 | Dr.Dilukshi Sandaken Hettiarachchi Scholarship Fund | 01.02.2024 | Cash | 120,000.00 |
| 13 | Laxmi and Dharmasena Memorial Scholarship Fund | 01.02.2024 | Cash | 100,000.00 |
| 14 | Prof.Sudath Kalingamudali & his family Scholarship Fund | 12.01.2024 | Cash | 160,000.00 |
| 15 | Prof. Mangala Illangasinghe | 15.03.2024 | Plated gold Medal | 3,500.00 |
| 16 | Bank of Ceylon Scholarship | 15.03.2024 | Plated gold Medal | 3,500.00 |
| 17 | Rajamanthree Scholarship into M. P. Perera | 22.03.2024 | Plated gold Medal | 2,700.00 |
| 18 | Student Welfare Trust Fund -HRM | 10.01.2024 | Cash | 100,000.00 |
| | | | TOTAL | 792,800.00 |



වාර්ෂික වාර්තාව හා ගිණුම් 2023 | කැලණිය විශ්වවිද්‍යාලය

# 14. විගණන කමිටු වාර්තාව - 2023

<u>විගණන කමිටු වාර්තාව - 2023</u>

**විගණන කමිටුවේ සංයුතිය**

පාලක සභාවට වගකිව යුතු උප කමිටුවක් ලෙස ස්ථාපනය කර ඇති විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව විධායක නොවන සභා සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වේ. 2023 වසරේ දී පහත සඳහන් සාමාජිකයින් විගණන කමිටු කාර්යයන්හි නියුක්ත වූහ.

| සාමාජික | 2021 වසරේ දී කමිටුවට සහභාගී වීම (සහභාගී වීම/සහභාගී වීමට නියමිත) |
|---|---|
| 1. එල්.ජී. සුසන්ත සිල්වා මහතා (සභාපති) | 6/6 |
| 2. මෙරී ඊ. විජ්මන් මිය | 2/6 |
| 3. සම්මානිත මහාචාර්ය එන්. ආර්. අර්තනායක | 6/6 |

ඉහත සඳහන් සාමාජිකයින්ට අමතරව ජාතික විගණන කාර්යාලයේ සාමාජිකයින්ටද නිරීක්ෂකයින් ලෙස සහභාගී වීම සඳහා ආරාධනා කරන ලදී.

**රැස්වීම**

පොදු ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී./31 අනුව වසරකට සිව් වතාවක් කමිටුව රැස් විය යුතුය. සලකා බලන ලද වර්ෂය තුළ කමිටුව හය වතාවක් රැස් වූ අතර මෙම රැස්වීම්වල දී අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සාකච්ඡාවට ගන්නා ලදී. දැන ගැනීම සහ අවශ්‍ය කටයුතු සඳහා කමිටු වාර්තා විශ්වවිද්‍යාලයේ පාලක සභාවට ලබා දෙන ලදී.

**මූලික වගකීම**

විගණන කමිටුවේ ප්‍රධාන පරමාර්ථය වන්නේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කළමනාකරණ කටයුතු ඵලදායී ලෙස කරගෙන යාම සඳහා පාලක සභාවට සහාය වීමයි.

මූලික වගකීම් වනුයේ,

1. මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වාර්තාකරණය සහ විගණන ක්‍රියාවලියේ අඛණ්ඩතාවය සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
2. විශ්වවිද්‍යාලයේ මූල්‍ය සහ ඒ ආශ්‍රිත කටයුතු වලට අදාළ ඕනෑම කාරණයක් පරීක්ෂා කිරීම.
3. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැසුම් සහ වැඩසටහන් අනුමත කිරීම.
4. අභ්‍යන්තර විගණන සැලැස්ම හා වැඩසටහන අධීක්ෂණය කිරීම.
5. බාහිර සහ අභ්‍යන්තර විගණන වාර්තා විමර්ශනය කිරීම සහ නිර්දේශයන් සම්බන්ධව පසුවිපරම් කටයුතු සිදුකිරීම.
6. අභ්‍යන්තර පාලන පද්ධති වල ඵලදායී ක්‍රියාකාරීත්වය සමාලෝචනය කිරීම, අනුකූලතාවය පරීක්ෂා කිරීම හා අධීක්ෂණය කිරීම.
7. ව්‍යවස්ථාපිත අවශ්‍යතාවන් නීතිරීති රෙගුලාසි සහ චක්‍රලේඛයන්ට අනුකූලව කටයුතු කරන්නේද යන්න සොයා බැලීම.

8. පිරිවැය ඵලදායීත්වය ඇතිකිරීම සහ අනවශ්‍ය වැය කපාහැරීම සඳහා නිශ්චිත කාල පරිච්ඡේදයකට වරක් ආයතනයේ ක්‍රියාකාරීත්වය ඇගයීම.

**වසර තුළ ක්‍රියාකාරකම්**

විමර්ශනයට ලක් කරන ලද වසර තුළ කමිටුව පහත සඳහන් ක්‍රියාකාරකම් වල නිරත විය.

**1. අභ්‍යන්තර විගණන සැලසුම් සහ වැඩ සටහන් අනුමත කිරීම සහ අධීක්ෂණය කිරීම.**

2023 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම සහ අභ්‍යන්තර විගණන වැඩසටහන, කමිටුව අනුමත කර වසර මුළුල්ලේම එහි තත්ත්වය අධීක්ෂණය කළේය. කමිටුව අභ්‍යන්තර විගණනයේ ඵලදායීතාවය, විමසුම් වල ක්‍රියාකාරීත්වය සහ අභ්‍යන්තර විගණන අංශයේ ක්‍රියාකාරීත්වය සමාලෝචනය සහ අධීක්ෂණය කිරීම සිදු කර ඇත.

**2. නීති සහ රෙගුලාසි සමඟ අනුකූලතාවය.**

බාහිර සහ අභ්‍යන්තර විගණකවරු විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව අදාළ නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම සමාලෝචනය කරන ලදී. විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, පාරිතෝෂිත ගෙවීම, විශ්‍රාම අරමුදල් නිදහස් කිරීම සහ අර්ථසාධක අරමුදල් නිදහස් කිරීම යනාදී ව්‍යවස්ථානුකූල ගෙවීම් නිරවුල් කිරීම පිළිබඳව තවදුරටත් කමිටුව විසින් පසුවිපරම් කරන ලදී.

**3. ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් අඛණ්ඩ සමාලෝචනය සහ අධීක්ෂණය.**

බැඳුම්කර කඩකරන ලද කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් ආපසු අයකර ගැනීමේ ක්‍රියාවලිය අඛණ්ඩව කමිටුව විසින් සමාලෝචනය සහ අධීක්ෂණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය තුළ බැඳුම්කර කඩකරනු ලැබූ පුද්ගලයින්ගෙන් රුපියල් මිලියන 178 කට ආසන්න මුදලක් විශ්වවිද්‍යාලයට අයකර ගැනීමට හැකියාව ලැබුණි. 2023 වර්ෂය ආරම්භයේ බැඳුම්කර කඩවූවන් 35 දෙනෙකු සිටින ලදී. 17 දෙනෙකුගෙන් මුළු බැඳුම්කර වටිනාකම වර්ෂය තුළ අයකර ගැනීමට හැකියාව ලැබුණි. 02 දෙනෙකුගෙන් අයවිය යුතු මුදල් වාරික වශයෙන් නිසි පරිදි ගෙවමින් සිටින අතර ගෙවීම් පැහැරහැර ඇති 02 දෙනෙකුට එරෙහිව නීතිමය පියවර ගෙන ඇත. වාරික මුදල් ගෙවීම ප්‍රමාද වූ පුද්ගලයන් 16 දෙනෙකුට නිසි පරිදි මුදල් ගෙවන ලෙස සිහිකැඳවීම් යැවීමට කටයුතු කර ඇත.

**4. අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම හා ශක්තිමත් කිරීම.**

ස්ථාවර වත්කම් පාලනය, කොන්ත්‍රාත් කටයුතු සඳහා වියදම් ක්‍රමවත් කිරීම, පුස්තකාල පොත් බැහැර දීම, වාර්ෂික ගබඩා තොග සමීක්ෂණ/ස්ථාවර වත්කම් සමීක්ෂණ, බැඳුම්කර මුදල් අයකර ගැනීමට කටයුතු කිරීම, හඳුනා නොගත් සහ අයකර ගත නොහැකි ණය ශේෂයන් විසඳීම හා පෞද්ගලික ආරක්ෂක අංශයේ කටයුතු පරීක්ෂා කිරීම යන අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබා දෙන ලදී. තවද විගණකාධිපති විසින් 2023 වර්ෂය තුළ නිකුත් කරන ලද විගණන වාර්තා හා විගණන විමසුම් වලින් පෙන්වා දෙන ලද දුර්වලතාවයන් නිවැරදි කිරීමට ගනු ලැබූ පියවරයන් පිළිබඳව අඛණ්ඩව සමාලෝචනය කරන ලදී.

2





**5. විගණන කමිටු රැස්වීම.**

2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර තුළ විගණන කමිටුව හය වතාවක් රැස් විය. සාමාජිකයින් විගණන කමිටු සඳහා ක්‍රියාකාරී ලෙස දායක විය. ආරාධිත නිරීක්ෂකයකු ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙක් සෑම විගණන කමිටු රැස්වීමකටම සහභාගී වූ අතර, 2023/02 විගණන කමිටුවේ සිට මහා භාණ්ඩාගාරයේ නියෝජිත වරියක ද ආරාධිත නිරීක්ෂකයකු ලෙස සෑම විගණන කමිටු රැස්වීමකටම සහභාගී විය. විශ්වවිද්‍යාලයේ අනෙකුත් කාර්යමණ්ඩල සාමාජිකයින්ට අවශ්‍ය වූ විට පැමිණීම සඳහා ආරාධනා කරන ලදී. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක විගණන කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

**6. ගබඩා තොග පරීක්ෂාව**

2023 වර්ෂය තුළ කාර්තුමය ගිණුම් පරීක්ෂාවට අනුකූලව විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පවත්වාගෙන යන ප්‍රධාන ගබඩාවන් සහ, රාගම වෛද්‍ය පීඨ පරිශ්‍රයේ පිහිටි ගබඩාවෙහි 2023 ජූලි 05 දිනට පැවති තොග ශේෂ සහ 2023 දෙසැම්බර් 15 දිනට පැවති තොග ශේෂ සත්‍යාපනය කිරීමට කටයුතු කරන ලදී. ඒ ඒ තොග සමීක්ෂණයට අදාළව තොග සමීක්ෂණ වාර්තාවන් ද නිකුත් කරන ලදී.

**7. කාර්තුමය ගිණුම් පරීක්ෂාව**

පාලක සභා තීරණයක් අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් 2022 වර්ෂයේ සිට විශ්වවිද්‍යාලයේ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම සඳහා කටයුතු කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයේ සෑම කාර්තුවක් සඳහාම පිළියෙළ කළ මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කරන ලද අතර එම පරීක්ෂා කිරීම් වලට අදාළව පිළියෙළ කරන ලද වාර්තා විගණන කමිටුවට හා පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදී. තවද කැලණිය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව විගණකාධිපති වාර්තාව මගින් 2023.12.31 දිනෙන් අවසන්වූ වර්ෂය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව සත්‍ය හා සාධාරණ මතයක් ලබාදී ඇත.

**නිගමනය**

2023 වසර තුළ කමිටුව විසින් සළකා බලන ලද කරුණු සම්බන්ධයෙන් ලබාදෙන ලද නිර්දේශ මත පසුවිපරම් කටයුතු සිදුකිරීමේ කාර්යක්ෂමතාවය පිළිබඳව කමිටුව සෑහීමකට පත්විය.

සභාපති,
විගණන කමිටුව,
කැලණිය විශ්වවිද්‍යාලය

3